පුරාන සන්න සහිත

# සැලලිහිණි සන්දේශ වර්ණනාව.

දෙමටදෙණිකන්දේ ජයසුන්දරාරාමාධිවාසි

ආචාර්ය්‍ය

**බෝමුණුවේ සාරානන්ද ස්ථවිරයන්වහන්සේ**

වි සි න්

සම්පාදිතයි.

---

දෙමටගොඩ ධර්මප්‍රාසාද විහාරාධිවාසී

ආචාර්ය්‍ය පණ්ඩිත

**මාඑවිට ඥාණානන්ද ස්ථවිරපාදයන් වහන්සේ**

වි සි න්

කරනලද ශුද්ධියෙන් යුක්තයි.

——)o(——

මාදම්පාමහවැව

**ජේ. ඩී. ඇම්. සපරමාදු මහත්මයා**

වි සි න්

ලඞ්කාභිනවවිශ්‍රැත යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

(ද්විතීය සංස්කරණය.)

බු. ව. 2472.

ක්‍රි. ව. 1929.

# විඥාපනය.

---

**කාව්‍ය සංඥාව.** ශ්‍රී කල්‍යාණීපුරාධීශ්වරවූ විභීෂණ සුරේන්ද්‍රයා ගෙන් පුත්‍රප්‍රාර්ථනය කොට ශාරිකා (සැළලිහිණි) පක්ෂියකු දූත ක්‍රියායෙහි ප්‍රයුක්තව්‍යාජයෙන් රචනාකොට ඔප්පුකරනලද හෙයින් මෙම මධුර මනොහර කාව්‍යය "සැළලිහිණිසන්දෙශ" නම් විය. ඒ මෙහි විශෙෂ සංඥාව වේ. 'කාව්‍යය නොහොත් සන්දෙශ කාව්‍යය' යනු සාමාන්‍ය සංඥාව වේ. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජධානිය කොට ලංකා රාජ්‍යය කළ ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගේ දුහිතෘවූ ගරුතර නන්නුරුතුනයා නැමැති මැතිඳුන්ගේ පත්නීවූ උලකුඩය (ලොකනාථා) නම් දේවිය අපුත්‍රකවූ බැවින් ඇයට පුත්‍රවර ප්‍රාර්ථනය මෙහි බාහිර නිමිත්ත වේ. ඔවුන් කෙරෙහි වූ කරුණාව හා රාජවංශ ස්ථිතිය පිණිස කර්තෘහු තුළ පැවැති ආශංසාව අභ්‍යන්තර නිමිත්ත වේ. තොටගමුවේ ශ්‍රී සඞ්ඝබොධි විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර ශ්‍රී රාහුල මහා ස්වාමිපාදයන් වහන්සේ මෙහි කර්තෘවරයාණෝ වෙත්.

**රචනා ප්‍රමාණය.** පොතට ඇතුළත් නොවේයයි සලකන අන්තිම කවි තුන හැර සෙසු ගී දසපද සැහැලි සහිත කවි එකසිය අටක් මෙහි ප්‍රමාණය වේ.

**ප්‍රයෝජනය.** පතිපත්නීවූ නන්නුරුතුනයා උලකුඩයදේවී යන දෙදෙනාහට පුත්‍රලාභයද එයින් වංශ ප්‍රවෘත්තිය හා ඔවුන් තුළ පැවැති අපුත්‍රක බැවින්වූ ශොකය දුරුවීමද මෙහි ප්‍රයොජනය වශයෙන් සැලකිය යුත්තේය.

**රචනා කාලය.** ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 1955 වෙනි වර්ෂය සහ 1958 වෙනි වර්ෂය දැයි ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගේ රාජප්‍රාප්ති වර්ෂ දෙකක් විසදෘශව පෙනෙතත් මුළු ලකට අගරජ යයි වොටුනු පළන් වර්ෂය 1958 වර්ෂය බව පිළිගෙන මේ කාව්‍යයෙහි අවසානයෙහි පෙනෙන "පැරකුම් රජුට පන්තිස් වන නවම් මස" යන්නෙහි වර්ෂය හා එකතුකරගත් විට බුද්ධ වර්ෂ 1993 වෙනි වර්ෂය හෙවත් මෙයින් අතීත 479 වෙනි වර්ෂයෙහි නවම් මාසය මෙහි රචනා කාලය වේ,

ශ්‍රී රාහුල සඞ්ඝරාජයන් වහන්සේ සියලු රචනා ගෞරවය. සිංහල කවිත්ව මුදුන් මල්කඩක් වූ බවට උන්වහන්සේගේ කාව්‍යශෙඛරාදි කාව්‍යයෝම සාක්‍ෂ්‍ය වෙත්. සිංහල පඬිවරු සියබසින් බොහෝ සන්දෙශ කාව්‍යයන් රචනා කළහ. ඒ සන්දෙශයන් අතුරෙහි මෙම සැළලිහිණි සන්දෙශය සියලු කාව්‍යරසයෙන් අග්‍රවූ හෙයින් එය ශ්‍රෙෂ්ඨ සිංහල සන්දෙශ කාව්‍යය විය.

**ශ්‍රී පරාක්‍රමබාහු රජතුමා සහ ඔහුගේ වංශය**

මෙතුමා ලම්බකණ්ණ වංශිය නරේන්ද්‍ර රචනා කාලයෙහි රජවූ යෙකි. ලම්බකණ්ණ වංශය මෞර්‍ය්‍ය රාජ වංශයෙහි ප්‍රභෙදයකි. දඹදිව කපිලවස්තු පුර විසූ සුපරිශුද්ධ සූර්‍ය්‍යවංශික ශාක්‍ය රජුන් සමග විඩූඩභයා යුද ඇරඹූණු කල්හි එයින් භීතියට පත් ශාක්‍ය රාජයෝ ගඞ්හා නම් ගඟ අසලට පැමිණ එහි මෝරිය නමින් නුවරක් ඉදිකොට ගෙන විසූහ. ඒ නුවර අධිපති රජ්ජුරුදු මොරිය නමින්ම ප්‍රසිද්ධ වූහ. ඔවුන්ගේ වංශය මොරිය වංශ නම් විය. මෙහි දක්වුණු මොරිය වංශයෙහි උපන් වීරවික්‍රමාන්විත චන්ද්‍රගුප්ත නම් කුමාරයෙක් තෙම චාණක්‍ය නම් බ්‍රාහමණාමාත්‍යයාගේ සහායයෙන් පාටලිපුත්‍ර නගරයෙහි රජ විය ඔහු පුත් බින්දුසාර තෙමේ මොරිය නුවරින් ධර්‍මා නම් කුමරියක් ගෙන්වා මහෙෂිකා කොට එනුවර රජවිය ධර්‍මාශොක මහරජ තුමා ඔවුන්ගේ පුත්‍ර තෙමේ වී.

මහබෝ වඩා ලක්දිවට පැමිණි සුමිත්‍ර රාජකුමාරයාද අසම්භින්න මෞර්‍ය්‍ය වංශවතෙකි, ඔහුගෙන් ආරම්භවූ වංශය ලම්බකණ්ණවංශයයි ව්‍යවහාර ප්‍රාප්ත වූයේය. මහාසෙන, ශ්‍රී සඞ්ඝබොධි, කිත්ති ශ්‍රී මෙඝවර්‍ණ, බුද්ධදාස, කුමාරදාස, අග්‍රබොධි, විජයබාහු, මහාපරාක්‍රමබාහු ආදී ලක්රජුන් මේ වංශයෙහි උපන්නෝ වූහ. මෑත භාගයෙහි මෙම වංශයෙන් සවුළු විජය බාහු නම් රජෙක් ලක්දිව රජ විය. ඒ රජුගේ පුත්‍රවූ ජයමහලාන නම් ක්‍ෂත්‍රියොත්තමයාණෝ ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමාගේ පිතෘවරයා වූයේය. සුනෙත්‍රාදෙවී තොමෝ මාතෘ වූවාය.

## "පරාක්‍රමබාහු කුමරුගේ වර්‍ධනය හා රාජ්‍යලාභය"

පරාක්‍රමබාහු කුමාරයා ළදරු අවස්ථාවෙහිම තම මෑණිවූ සුනෙත්‍රාදෙවිය විසින් * වීදගම මහාස්ථවිරයන් වහන්සේ වෙතට

* මුන්වහන්සේ වීදගම මෛත්‍රෙය මහාස්ථවිරයන්වහන්සේගෙන් පෙර එම විහාරාධිපතිව සිටි මෙධඞ්කර නමින් ප්‍රසිද්ධ ස්ථවිරයාණෝයි සුනෙත්‍රා දෙවියගේ ගුණභාදරයෙකැයිද කියත්.

භාරදෙනලද්දේය. උන්වහන්සේ කුමාරයාගේ ජන්ම පත්‍රාදියත් නිසඟීයෙන් පිහිටි පුණ්‍යවන්ත භාවයත් සලකා නිසැකයෙන් රජ වන බැව් දැන එවකට රයිගම්පුරාධීශ්වරව විසූ අලකේශ්වර තුමාගෙන් අනතුරක් වේයයි සැකකොට සතරකෝරළේ පොල්වත්ත නම් ගමෙහි රාළටත් එම ගම ආචාරියාටත් භාරකර යැවූයේය, පැරකුම්බ කුමරු දවල් ආචාරියාගේ පුත්‍රයා සමග ක්‍රීඩා කොට රාත්‍රියෙහි රාළගේ ගෙදරට පැමිණ නිදිනේය. කුමාරයා එගම්හි වාසය කරන බැව් දත් අලකේශ්වර තුමා පණිවුඩකාරයන් එහි යැවූවිට ආචාරීතෙම පතුවැලක් ගෙන ඔහුගේ පුත්‍රයාට පහරක් ගසා සාමාන්‍ය ළමයෙකුගේ වෙස් ගත් කුමාරයා සමග හරක් බලන්ට යැවූයේය. පණිවුඩකරුවෝ කුමාරයා නොහැඳින පෙරළා රයිගමට පැමිණියාහුය. මීට පසු අන්‍ය ගමක රදළ කෙනකුගේ ගෙදරකද නැවතී සිට සොළොස් හැවිරිදි වියපත්වූ පසු පැරකුම්බා කුමරු ගෙන්වා වීදාගම මහාස්ථවිරයන්වහන්සේ අන්‍ය ප්‍රධානීන් සමග කථාකර සියලුදෙනාගේ සම්මතයෙන් ශ්‍රී බුද්ධ වර්ෂ 1955 වැන්නෙහි හවෙනි ශ්‍රී පරාක්‍රමබාහු නමින් රාජ්‍ය ශ්‍රියට පත්කළෝය.

බුදුවසිනෙක් දහ ස
නවසිය අටපනස් ව ස
රිවිසද තෙද යස ස
පතල නිරිඳෙක් පැමිණි ලෝකු ස

යනුවෙන් කාව්‍යශේඛරයෙහි පෙනෙන ලෙසද තම මෑණියන් නමින් පරාක්‍රමබාහු රජු විසින්ම කරවන ලද පැපිළියානේ සුනේත්‍රාදේවී පිරුවන්හි සිලාලේඛනයෙහිද 1958 වැන්නෙහි රජවූ බැව් ප්‍රකාශව තිබේ. මේ එකිනෙකට විරොධව පෙනෙනත් 1955 වැන්නෙහි රජ වන විට දැදිගම් පුරයෙහි පරාක්‍රමබාහු රජුද අන්‍ය ප්‍රදෙශ කිපයකම අධිපතීහු කිපදෙනෙක්ද ප්‍රදෙශ රජවරු වශයෙන් සිටි නිසා මෙතුමාද එම වර්ෂයෙහි ප්‍රදෙශ රජෙක් වශයෙන් රජවීමත් 1958 වැන්නෙ සියලු සතුරන් සාධාලක්දිව අගරජ වශයෙන් වොටුනු පැලඳීමත් සිදුවීයයි සලකා ගත් විට 1955 වැන්නද කාව්‍යශෙඛර ශිලාලෙඛන යන දෙක්හි තිබෙන 1958 වැන්නද නිවැරදියයි අවබොධ වන්නේය.

† ශ්‍රී බුද්ධ වර්ෂ 1958 වැන්නෙහි රජවූ බැව් මහාවංශයෙහි දක්වා තිබේ.

**රජතුමාගේ පුත්‍ර දුහිතෘන්.**

පරාක්‍රමබාහු මහරජතුමාට පුත්‍රයෝ නොසිටියාහ. චන්ද්‍රවතී නම් වූද ලොකනාථා (උලකුඩය) නම් වූද දියණියෝ දෙදෙනෙක් පමණක් වූහ. චන්ද්‍රවතී කුමරියගේ තරුණ අවස්ථාවෙන් පසුව කිසිම තොරතුරක් පොතපතෙහි සඳහන්ව නැති හෙයින් ඕතොමෝ තරුණ අවස්ථාවෙහිම මරුමුවට පැමිණෙන්ට ඇතැයි සිතියයුතු. ලොකනාථා දෙවී තොමෝ "නන්නූර්තුන් මිණිසන්හස්" නම් කුමාරයාට පාවාදෙන ලද්දීය.

රජතුමාට පුත්‍රයන් නොසිටි නිසා පුත්‍රස්ථානයෙහි තබා වැඩූ කුමරුවෝ තුන්දෙනෙක් වූහ. ඔවුහු නම්—සෙනාපති සෙම්බගප්පෙරුමාල් (සපුමල්) කුමාරයා, අම්බුළුගල කුමාරයා, පසු කාලයෙහි ශ්‍රී රාහුල යන නමින් ප්‍රසිද්ධවූ කුමාරයාද යන තුන්දෙන වෙත්.

**සෙම්බගප් පෙරුමාල් කුමාරයා.**

මේතෙම පරාක්‍රමබාහු රජු ජීවත්ව සිටි කාලයෙහි සෙනෙවි තනතුරු ලබා සිටිඉයේ මහරජ තුමාගේ අනුදැනීමෙන් යාපාපටුනට පැමිණ එහි සිටි ආර්‍ය්‍ය චක්‍රවර්ති රජු සමග යුද්දකොට ඒ රජු පලවා එහි ප්‍රදෙශරජව විසුවේය. මෙසේ යාපාපටුනෙහි වාසය කරන කාලයෙහිදී දෙවි නුවර ඉරුගල් කුලතිලක පරිවෙණාධිශ්වර ෂඩ්භාෂා පරමෙශ්වර මහාස්ථවිරපාදයන් විසින් කෝකිල සන්දේශය එතුමා වෙත යවන ලදහ. ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමාගේ අභාවයෙන් පසු රජවූ ලොකනාථා දෙවියගේ පුත්‍රවූ දෙවෙනි ජයබා* රජු මරා මෙතෙම සවෙනි බුවනෙකබාහු නමින් ජයවර්ධන පුරයෙහි රජවිය. කල්‍යාණී ප්‍රකරණාදියෙහි සඳහන් රාමඤ්ඤදෙශිය භික්ෂූන්ගේ උපසම්පදා මහොත්සවය මේ රජුගේ කාලයෙහි සිදු විය. මෙතුමාගේ රාජ්‍ය කාලය වර්‍ෂ 7 කි.

**අම්බුළුගල කුමරයා.**

සවෙනි බුවනෙකබාහු රජු ඇවෑමෙන් ඔහු වෙතම සිටියේයි කියන දෙවෙනි ජයබා රජුගේ පුත්‍රයා හත්වෙනි පණ්ඩිත පරාක්‍රමබාහු නමින් රජ විය. අම්බුළුගල කුමාරයා ඒ රජු මරා අටවෙනි වීරපරාක්‍රමබාහු නමින් රජව විසි (20) වර්ෂයක් රාජ්‍යය කෙළේය.

---

* වීරපරාක්‍රමබාහුයයි රාජාවලියෙහි දක්වා තිබේ.

ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගේ පුත්‍රස්ථානයෙහි ශ්‍රී රාහුල. වැඩුණාවූ අනන්‍යවූ කුමාරයෝ නම්, පසු කාලයෙහි තොටගමුවේ ශ්‍රී සංඝබොධි ශ්‍රී විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂාපරමේශ්වර ත්‍රිපිටක වාගීශ්වර ශ්‍රී රාහුල සංඝරාජ ස්වාමිපාදයෝ යන නමින් ප්‍රසිද්ධවූ මෙම සැලලිහිණි සන්දෙශ' කර්තෘවරයාණෝ වූහ.

## උන්වහන්සේගේ ජාතග්‍රාමය හා වංශය.

"කු ල ග මි ණි පි වි තු රු දෙමටාන ගම කදවු රු
තොටහමු වැසි සොඳුරු උතුරුමුල මහතෙරිඳු මුණුවු රු"

යනුවෙන් ශ්‍රී රාහුල මාහිමියාණෝ දෙමටාන නම් ගමෙහි සකන්ධාවාරවංශයෙහි ජනිතවූ බැව් ප්‍රකාශ වෙයි. එසේද වුවත් ජාතග්‍රාමයවූ දෙමටාන මෙතෙක් අවිනිශ්චිත වූවකි. ඇතමෙක් මෙම ග්‍රාමය කොළඹ දෙමටගොඩ යයිද ඇතමෙක් දඹදෙණියට නුදුරුව පිහිටා තිබෙන දෙමටවත්ත යයිද ඇතමෙක් සීතාවක ආසන්නයෙහි පිහිටි දෙම්ටාන යයිද ඇතම්හු ජයවර්ධනපුරාසන්නයෙහි පිහිටි මෙකල දෙමටලන්ද නමින් ප්‍රසිද්ධ ප්‍රදෙශ යයිද කියති.*

සකන්ධාවාර වංශය මෞර්‍ය්‍ය රාජවංශයෙහි ප්‍රභෙදයකි.

"රාහුල නාමා මුනිරති විමාන්
සද්ගුණහාරි ත්‍රිපිටකධාරී
මෞර්‍ය්‍යකුලාබ්ධි ප්‍රභව සුධාංශුර්
ජනමනි ජනමන්‍යපි මම මිත්‍රම්"

යනුවෙන් ශ්‍රී චන්ද්‍රභාරතීන් විසින් ප්‍රකාශ කරන ලද්දේ එහෙයිනි මේ කුමරු කුඩාකාලයෙහිම ශ්‍රී පරාක්‍රම පුත්‍රස්ථාන ප්‍රාප්තිය බාහු රජුගේ පුත්‍රස්ථානයට පත්විය. හා රජතුමා ළදරු කුමාරයා කෙරෙහි පුත්‍ර භාසෙන්‍රාද්ග්‍රහණය. ස්නෙහ උපදවා ඉතෙනිම පිණිස රජතුමාගේ ආචාර්‍ය්‍යවූ මහ වීදගම මහාස්ථවිරයන් වහන්සේට භාරදුන්නේය. කුමරු පසළොස් අවුරුදු විය පැමිණෙන විටම මහාප්‍රාඥ බවටද පත්වූයේය. එම වයසෙහිදීම සකන්ධවරප්‍රසාදය ලබාගත් බැව්ද පරෙවි සන්දෙශයෙහි:—

---

* දෙමටානෙහි විසූ වික්‍රමබාහු නමැති කුමාරයෙක්ද සීලවති නම් ක්ෂත්‍රියාවක්ද මූන්වහන්සේගේ පිතෘ මාතෘ වූහයි මුඛපරම්පරා කථාහි,

“කද කුමරිඳුන් වරලැබ උපසෙලොස් වය ස
ව ද හල රහල් වැඩිතැන් කළ රැවි සදෙ ස”

යනුවෙන් ශ්‍රී රාහුල මාහිමියන් විසින්ම ප්‍රකාශ කොට තිබේ.

**ප්‍රව්‍රජ්‍යාව හා ශාස්ත්‍රඥභාවය.** තිසගීයෙන් පිහිටි ශ්‍රද්ධාධ්‍යාශ ඇති මේ කුමරු සවකීයාචාර්යවූ වීදාගම මහා ස්ථවිරයන් වහන්සේ වෙත පැවිදි වූයේය. තියුණු නැණින් යුත් වූයේ සංස්කෘත, ප්‍රාකෘත, මාගධි, පෛශාචි, ශෞරශෙනි, අපභ්‍රංශ යන ෂඩ්භාෂාවන්හිද ත්‍රිපිටක බුද්ධ වචනයෙහිද විශාරදත්වයට පැමිණියේ ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටක වාගීශ්වර යන නාමය ලද්දේය. සුදුසු අවස්ථාවෙහි තොටගමුවේ ශ්‍රී සංඝබොධි ශ්‍රී විජයබාහු පරිවෙණාධිපතිත්වයටද කැරගල පද්මවතී පරිවෙණාධිපති ශ්‍රී රාජගුරු වනරතන සංඝරාජ මාහිමියාණන් වහන්සේගේ ඇවෑමෙන් සංඝරාජ පදවියටද පත්වූයේය.

**ශාස්ත්‍රීය කෘති.** මොග්ගල්ලායන පඤ්චිකාවට ග්‍රන්ථිපද උන්වහන්සේගේ ස්වරූප කොට ලියනලද පඤ්චිකා ප්‍රදීපයද ප්‍රියදර්ශි මහාස්ථවිරයන් වහන්සේ විසින් සම්පාදනය කරනලද පදසාධන ව්‍යාකරණයට පාලිභාෂාවෙන් තිපදවාලූ බුද්ධිප්‍රසාදනී නම් ටීකාවද චන්ද්‍රවතී කුමරියට සමාන වංශික වල්ලභයකු හා පුත්‍රයකු ඉල්වීම් වශයෙන් දෙවිනුවර දෙවම්න්දිරයෙහි ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා අයැද වරප්‍රාර්ථනාවක් කිරීම කථා ශරීර කොට රචනා කළ පාරාපත සන්දේශයද තන්නුරුතුන් මිණිසන්හස් මැතිඳුන්ගේ ආරාධනායෙන් ලොකනාථා දෙවියට පුත්‍රයකු ඉල්වීම් වශයෙන් විභීෂණ දිව්‍යරාජයා අයැද වරප්‍රාර්ථනාවක් කිරීම කථාශරීර කොට රචනා කරනලද මෙම සැළලිහිණි සන්දේශයද ලොකනාථා දෙවියගේ ආරාධනාවෙන් රචනා කරනලද කාව්‍යශෙඛර මහා කාව්‍යයද යන මහාර්ඝ ග්‍රන්ථ ශ්‍රීරාහුල මාහිමියන් වහන්සේගේ කෘති වූහ. මෙම ග්‍රන්ථ නිපදවාලීමෙහි යෙදෙන අතරම තොටගමුවේ විජයබාහු පිරුවන මගින් අනල්ප ශිෂ්‍ය සමූහයකට ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමද කළහ. වෑත්තෑවේ ස්වාමිප්‍රාදයෝ රණස්ගල්ලේ ස්වාමීපාදයෝ ශ්‍රීරාමචන්ද්‍ර භාරතී ආචාර්ය බ්‍රාහ්මණ පඬිතුමා ආදී උතුමෝ ශ්‍රී රාහුල මහාස්වාමිපාදයන්ගේ ශිෂ්‍යයෝ වෙත්.

**සමකාලීන පඬිවරුන් හා නිපන් ග්‍රන්ථ.**

මේ කාලයේ ශාස්ත්‍රාගම දෙකින් ලක්දිව අතිශය දීප්තිමත්ව පැවැත්තේය. ධර්මකීර්ති මහාස්ථවිරයන් වහන්සේ විසින් ලියනලද සද්ධර්මරත්නාකරය, බෞද්ධානම් චක්‍රවර්ති ශ්‍රීරාමචන්ද්‍ර භූසුරාචාර්ය බ්‍රාහ්මණ පඬිතුමා විසින් සම්පාදිත බෞද්ධශතකය, වෘත්තමාලාඛ්‍යාව, වෘත්තරත්නාකර පඤ්චිකාව, ඉරුගල්කුලතිලක, පරිවෙණාධිපති ෂඩ්භාෂාපරමේශ්වර මහාස්ථවිරයන් වහන්සේ විසින් රචනා කරනලද කෝකිල සන්දේශය, නන්නූරුතුන් මිණිසන්හස් මැතිතුමා විසින් ගොතනලද නාමාවලිය, ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් ගොතනලද රුවන්මල් නිඝණ්ඩුව, වෑත්තෑවේ ස්වාමිපාදයන් විසින් රචනාකළ ගුත්තිල කාව්‍යය, රණස්ගල්ලේ ස්වාමිපාදයන් විසින් රචනා කරනලද ලෝකෝපකාරය, විදාගම මෛත්‍රෙය මහාස්ථවිරයන් වහන්සේ විසින් රචනා කරනලද බුදුගුණ අලංකාරය, ලෝවැඩසඟරාව, යනාදී වශයෙන් දතයුතු. හංස සන්දේශය, ගිරා සන්දේශය, තිසර සන්දේශය යන ග්‍රන්ථද ඒ කාලයෙහිම යම් කිසි පඬිවරුන්ගේ කෘතීහු වෙත්.

**වෘද්ධ අවස්ථාව හා ස්වර්ගප්‍රාප්තිය.**

මුන්වහන්සේ පිතෘස්ථානීය රජතුමාට අනුශාසනා කිරීමෙන් කෝට්ටේ විජයබා පිරිවෙන් මගින් නානා ශාස්ත්‍ර හදාරවමින් තොටගමු විහාරයෙහිද කලින්කල ජයවර්ධනපුර කෝට්ටේද වැඩ සිටිසේක. වෘද්ධ අවස්ථාව හා ස්වර්ගප්‍රාප්තිය සම්බන්ධ වැඩි තොරතුරක් පොත පතෙහි සඳහන්ව නැත්තේය. එහෙත් ඇදහියයුතු මුඛ පරම්පරා කථානුසාරයෙන් නොයෙක් තොරතුරු පවත්නේය. මුන්වහන්සේ වෘද්ධ අවස්ථාවෙහි පස්දුන්කෝරළේ ඉඳුරුගල නම් පර්වතයෙක්හි ගල්ලෙනක වැඩ වාසය කළ බැව්ද ඊට හේතුව මුන්වහන්සේ ඉතා ඇලුම්ව සිටිනාවූද ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ අදහස පරිදි රජවූද ජයබා රජු මැරීමෙන් කළ අපරාධය නිසා බුවනෙකබාහු රජ කෙරෙහි හටගත් අප්‍රසාද යයි සිතිය හැකිය. පරාක්‍රමබාහු ජයබාහු යන දෙරජුන්ගේ කාලයන්හි රාජකුලූපගව විසූ මුන්වහන්සේ බුවනෙකබා රජු කාලයෙහිද ඒ රජු කෙරෙහි තද අප්‍රසාදයකින් නොසිටියා නම් රාජකුලූපග වීමට බාධාවක් නැත. එසේම බුවනෙකබා රජු කාලයෙහි සිදුකළාවූ රාමඤ්ඤදෙශීය භික්ෂූන්ගේ උපසම්පදා මහොත්සවයට පැමිණි බවක් කල්‍යාණී ප්‍රකරණාදියෙහි සඳහන්ව නැත. ඒ මහොත්සවයට පැමිණිය යුතුමවූ මුන්වහන්සේ රජු කෙරෙහි පවත්නා අප්‍රසාදය නිසාම එහි නොපැමිණියා වනැයි සිතිය හැකි වේ. කලක් සංස්ථාකත ඉඳුරුගල

ගල්ලෙනෙහි වනගතව විවෙක සුවයෙන් කල්යැවූ මුන්වහන්සේ තමන්වහන්සේගේ මෘතදෙහය අඳුනා ගැනීම පිණිස රචනා කළ කවි දෙකක් ලියා ළඟ තබාගෙන එම ගල්ලෙනෙහිදීම ස්වර්ගස්ථවූ බැව් කියත්.

"කඳ කුමර වර ල ද
සිදු අලුරස වැළඳූ තෙ ද
දස ලක් දිනා ල ද
රහල් හිමි නැගූ දියත දිය ද ද

විරුදු බුවනෙක බා
බලය නෙවිටක් පසු බා
මරයුදයෙහි නො බා
මමය පැරකුම් රජුගෙ ජය බා"

යනු ඒ කවි දෙකයි.

මෙසේ ගල්ලෙනෙහිදී ස්වර්ගස්ථවූ මේ මාහිමියාණන්ගේ මෘත ශරීරය එහිම කලක් තිබී පෘතුගීසීන්ට හමුව ගෝවේට ගෙනගිය බැව්දු මුඛපරම්පරාගත කථායි.

මේ කරුණු සඳහන් පැරණි කවියක්ද පරම්පරාගතව තිබේ. එනම්:—

"ස තු රු සිංහල සාවියර් සෙන්පතිහු යුදයට පත් වනා වේ
ඉ ඳු රු ගල ගල්ලෙනේයක්සෙන් අරක්ගතිමින් තිබුමනාවේ
අ තු රු අවුරුදු දහස් ගණනක් පවතිනුව කළ මතුරු ජී වේ
ම ග රු රාහුලතෙරිඳුගේ මළසිරුරගෙනගොස්තැබියගෝවේ"

යනුයි. මේ කරුණු ඇදහිය හැකි මුඛපරම්පරා කථා හෙයින් මේ උත්තමයාණන් වහන්සේගේ අගනා ජීවිතාවසානය සම්බන්ධයෙන් මේ ප්‍රවෘත්ති විශ්වාස කට හැකිවේ.

**ශාරිකාදූත ගමන් මාර්ගය.**

සන්දේශ හාරක ශාරිකා පක්ෂී හට විජයයොග ලත් වේලාවෙහි පිට කෝට්ටයෙන් පිටත්ව දළදාමන්දිරයට පැමිණ චන්දනාකර රාජමන්දිර ප්‍රවේශව සිංහාසනාරූඪව උන් ශ්‍රී පරාක්‍රමබාහු නරේන්ද්‍රයා දැක වැඳ අවසරගෙන පියාසර කොට කොතනගංතොටින් අවුත් ඊශ්වර කෝවිලෑ ලැග පසුදින උදය අහසට නැග නැගෙනහිර දකුණු උතුරු දිශාවන්හි පැනෙන සමනොළගිර මහසෙන්

දෙව්රදපාන මහා සමුද්‍රය බලා ගමන්ගත් කල්හි යාපාපටුන්හි සිටි කණ්ණාම සේනාව ජයගෙන පරාක්‍රමබාහු මහරජාණන් දශනයට එන්නාවූ සේනා සහිත සපුමල් කුමාරයා හමුව කසිකාවල, වල්අම්බලම, සුමුවාන වනය, ගුරුබැවුල දියහෙබ, ගුරුළු කෙත, වෙලඳගොඩ, වෙරලාන, මහවෙල, පහුකර පශ්චාත් භාගයෙහි කිත්සිරිමේ වෙහෙරට පැමිණ දාගැබ් මහබෝ පිළිම වැඳ සවල්ප වේලාවක් කැලණි ගඟබඩ සිට විඩා නිවා සන්ධ්‍යා සමයෙහි මස්කෙළිනෙන් එතරව බස්නාහිර වාසලින් කල්‍යාණි නගරයට ප්‍රවේශව මහවීදියැ සිරි නරඹමින් නොස් කැලණි මහ වෙහෙරට වැද ලක්තිලක ගෙය, සලපිළිමනිම්, පස්මහල්පායෙහි ප්‍රතිමාව, වටදාගෙහි දාගැබ, පැළදිගපායැ වැදහොත් පිළිමහිමි, මහදාගැබ්වහන්සේ, නාපිළිමය, සමාධිපිළිමය, බෝධිද්‍රැමරාජයා, තිවංක දෙපිළිම, සිවුරුදාගැබ, තෙල්කටාරගෙයි පිළිමය, වැඳ විභීෂණ දෙවමන්දිරයට පැමිණ එහි බැලියයුතු. බලා විභීෂණ සුරේන්ද්‍රයා දැක වැඳ ආශිර්වාද කොට සන්දේශය ඔප්පුකොට (ලෝකනාථා දෙවියට පුත්‍රයකු ලැබෙනසේ ඉල්වා) විභීෂණ මහෙෂිකා දෙව් දුවටද, දෙව්පුතු කුමරුටද මේ බව නැවතත් සැලකරන ලෙසද විධාන කිරීම මෙහි පිළිවෙළයි.

**සැලලිහිණි සන්දේශ වර්ණනාව.**

මේ සන්දේශ කාව්‍යය සිංහල භාෂා විජානනාභිලාෂිවූ ආධුනිකයන්ට ඉතා මත් ප්‍රයෝජන ඇත්තේ වේ. සුධීහුද අත්‍යන්තාදර ගෞරවයෙන් භාවිතා කරත්. මෙසේ පැවති මෙම සන්දේශයට යම් කිසි ආචාර්යවරයකු විසින් නැතහොත් සම්භාවනීය පණ්ඩිත මත පරිදි සන්දේශ කර්තෘ මාහිමියන් විසින් විරචිතව ලිපිදෝසින් දූෂිතව පැවැති පුරාණ සන්නයද ආධුනිකානුග්‍රහ පූර්වකොට භාවසන්නයක් හා ග්‍රන්ථිපද විවරණයක්ද යුක්ත කොට ප්‍රසිඞ කරවා ලීමෙන් අප ආචාර්යොත්තමවූ සවගීසථවිචදළ සමස්ත කවිජන ශෙඛරායමාණ පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය උපාධ්‍යාය ධුරන්ධර ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාමාභිධාන කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියාණන් වහන්සේ මහත් ශාස්ත්‍ර සංග්‍රහයක් කර වදාළෝය.

මෙසේ පවත්නා කල්හි ආධුනිකයන්ට මෙම සන්දේශ කාව්‍යය සුවසේ අවබෝධ කටහැකි පරිද්දෙන් ඉගෙන ගතයුතු සියලු ශාස්ත්‍රීය ක්‍රම විස්තර වශයෙන් ලියා මෙම වර්ණනාව සම්පාදනය කොට ප්‍රථම වාරයෙහි මුද්‍රණයට පමුණුවා ප්‍රසිඞ කෙළෙමු. එම පුස්තකය අවලෝකනය කිරීමෙන් ප්‍රසාදයට පත්

ප්‍රාචීන භාෂා ශාස්ත්‍රාභිවෘද්ධිකාමී කැලණියේ වරාගොඩ ජින තිලක වලව්වේ නිවැසි ගම්සභාවෙහි විනිශ්චයකාර ධුරන්ධර ඩී. ඒ. ජයතිලක මැතිතුමන් විසින් කරනලද ආරාධනාවෙන් මෙම විනය සංස්කරණය ප්‍රථම වාරයට වඩා විශේෂ විස්තර යෙදීමෙන්ද පුරාණ සන්නයද ඇතුළත් කිරීමෙන් සිදු කෙළෙමු.

මෙම කෘතිය ප්‍රථම වාරයෙහි ප්‍රතිග්‍රහණය කර වදාළ අස්මදාචාර්‍ය්‍යොත්තමවූ පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධීශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය උපාධ්‍යාය ධුරන්ධර **රත්මලානේ** ධර්‍ම කීර්ත්තිශ්‍රී ධර්‍මානන්දාභිධාන කොළඹ හලාවත දෙදිගාවේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියාණන් වහන්සේටද, මෙහි ශුද්ධපත්‍ර බලා සංස්කරණයෙන් උපකාරකර වදාළ දෙමටගොඩ ධර්‍මප්‍රසාද විහාරාධිවාසී ආචාර්‍ය්‍ය පණ්ඩිත **මාද්‍යෙව්ට ඥානානන්දාභිධාන** ස්ථවිරපාදයන් වහන්සේටද අපගේ කෘතඥතා පූර්‍වක ගෞරවාදරය පිරිනමමු. මෙහි නැවත මුද්‍රණය අප අදහස් පරිදි විය යුතුයි.

B. Sarananda.

1929 පෙබරවාරි මස 20 වෙනි දින
දෙමටදෙණිකන්දේ ජයසුන්දරාරාමයේදීය.

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 5 | 25 | දශසමාතනවය | දශසමාතනවසද |
| 10 | 4 | පැපිණි | පැමිණි |
| 10 | 21 | උපමාපීඨයෙහි | උපමාද්‍යෝතනයෙහි |
| 12 | 31 | උපමාපීඨයෙහි | උපමාද්‍යෝතනයෙහි |
| 20 | 15 | ජයවර්ධනා | ජයවර්ධන |
| 20 | 29 | සතු | යතු |
| 20 | 21 | උපමාපීඨයෙහි | උපමාද්‍යෝතනයෙහි |
| 22 | 4 | මේපුරතුල | මෙපුරතුල |
| 26 | 10 | සියදනන් | සියනදන් |
| 34 | 17 | මතුර | මධුර |
| 34 | 18 | රූපසමපතතියන් | රූපසමපත්තියෙන් |
| 37 | 24 | යතු යන | යත යන |
| 39 | 35 | කරකාපීඨයෙහි | කාරකාපීඨයෙහි |
| 50 | 19 | පිපිපිමල් | පිපිමල් |
| 60 | 1 | ශලිගොපි | ශාලිගොපි |
| 75 | 6 | රශ්මිසහස්‍රභාර්‍යාවගෙන් | රශ්මි සහස්‍රයක් ඇති බැවින් සහසකර නම් වේ. මොහුද කාශ්‍යප ස්වාමිහුගේ අදිති නම් භාර්‍යාවගෙන් |
| 75 | 18 | කචවර | කවවර |
| 78 | 12 | කැලණි | කැලණිය |
| 86 | 34 | රන්තාඹිලි | රන්තැඹිලි |
| 88 | 18 | තිර්වාණදායක | නිර්වාණදායක |
| 91 | 6 | සතු | යතු |
| 92 | 5 | රුවීරා | රුවිරා |
| 92 | 31 | ක්‍රි: කා: ජ: ස: | ක්‍රි: කා: ප: ස: |
| 93 | 3 | නොදී මතු | නොදී යතු |
| 98 | 16 | නමදෙහස | නමදෙහය |
| 103 | 5 | අන්අරුත් සමස් | වෙසෙසුන් සමස් |
| 111 | 1 | විභීෂණනනම් | විභීෂණ නම් |
| 123 | 29 | දෙෂයෙන් | දෙෂයන් |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 125 | 29 | වළු | වළුව |
| 127 | 13 | උපමාරූපක ගැභීන | උපමාරූපක ගැභී |
| 127 | 23 | පෙරදූරික්ර | පෙරදූරිකොට |
| 130 | 20 | මනනදන —— | මනනඳන |
| 182 | 4 | සිහස්‍රකිරණයා | සහස්‍රකිරණයා |
| 132 | 12 | පැරකුම් | පැරැකුම් |
| 132 | 14 | පිරිසිඳු | පිරිසිඳු |
| 136 | 1 | ධම්ජීකාම | ධම්මාජීකාම |
| 136 | 12 | වණත් | වනත් |

---

## සඞ්කේත නිරූපණය.

ක්‍රි: කා: ප: සං=ක්‍රියාකාරක පදසම්බන්ධය.

උ. වි=උක්තානුක්ත විශේෂණ විශේෂ්‍යාදිය.

ස. වි=සමාස විග්‍රහ.

1 විදුලකර පිරුවන්—හිම්වු තිදස පුර වන්

තැ ණ තැවි නෙතෙර වැද විදුසතර සමුදු ර
ගු ණ හිවි ප ව ර පඬිසක්විතිවැ පුවත ර

තෙවලා වදතිසුරු—උවදූ පදවි ලද ගරු

කො ල ඹ ස ලා ව ත සගපති පදවි දූ රු
පු ර ඹ දු ලා ව ත සරසවි නොහැර සැ රු

ද හ මි ස ත් විනය සිඳු සිරිලක මහ රු
උ ද මි ප ත් විලස කළ තරිඳුන් අසු රු
ද හ ම් කි ත් සිරිදම්රම් හිමි ඇදු රු
ව දි මි අ ත් මුදුන් දී බැතියෙන් සපි රු

2 හොබවත බැ ති න සිරිගත සපුන ස රුවත
හි මි ව න මෙ ව න සෙම විදුලකර පි රුවන
පි න ව න නෙ ද න සිරිදම්නඳ හිමි රුවන
මන මෙන න ඳ න අපහට සිතුමිණි රුවන

3 නි ර තු රු සුදන සෙවුනාවන් සිරිමැඳු රු
වි සි තු රු සැදි වෙහෙර හිමිවන් ජය සොඳු රු
පි වි තු රු සමිඳු සුරපුරවන් සරණකු රු
අ ප ගු රු සිහිකරම් බැතියෙන් ගුණ මහ රු

4 සොඳුරු විදුලකර පිරුවන්හිමි නි දෙ ස
ඇ සු රු කර බැතිනි පදරුත් දූන වෙසෙ ස
ඇ දු රු පදවි ලද සරනඳ යති සතො ස
ම හ රු මෙම වැණුම් කොළෙ දුහුනන් පි ණි ස

——)o(——

පුරාණ සන්න සහිත

# සැළලිහිණි සන්දේශ වර්ණනාව.

## නමඃ ශ්‍රීඝනාය.

**දයාඥානාම්බුධිං බුද්ධං නත්වා සර්වාර්ථදර්ශිනං
සත්ප්‍රණාමෙන ශුෂ්‍යන්ති සර්වේ ප්‍රත්‍යූහසාගරාඃ
මයා බාලාවබෝධාය සාරානන්දෙන භික්ෂුණා
ශාරිකාවාචිකස්‍යායං වර්ණනා ප්‍රවිධීයතෙ.**

---

ප්‍රසිද්ධං නායකී කෘත්‍ය පුරුෂං වා'ථ යොෂිතම්
සන්දේශං ප්‍රේෂයෙද්විද්වාන් දූතෛර්වංශාදිභිශ් ශුභෛඃ
ඉතිහාසකථාපූර්ව මාශීඃපූර්වමථාපි වා
දූතන්තු වර්ණයෙදාදෞ කුශලප්‍රශ්නපූර්වකම්
වර්ණනානන්තරං තස්‍ය ගන්තව්‍යස්ථාන කීර්තනම්
පශ්චාත්තච්ඡ්‍රොෂ්‍යසීත්‍යුක්ත්වා මාර්ගදේශාදි වර්ණයෙත්
තත්තද්දේශනගරී නායකානාං ගුණස්තුතිඃ
තතො වෘත්තාන්තකථනං දූතස්‍යාශීර්වචඃ පරම්—

විද්වාන්, ප්‍රාඥවූ කවිතෙම; ප්‍රසිද්ධම්, (ත්‍යාගකෘතප්‍රණ්‍ය කුලීනත්වාදි ගුණයෙන්) ප්‍රකටවූ; පුරුෂංවා, පුරුෂයකු හෝ; අථ, නොහොත්; යොෂිතම්, ස්ත්‍රියක හෝ; නායකීකෘත්‍ය, කාව්‍ය නායක කොට; වංශාදිභිඃ, වංශාදි ගුණයන් කරණකොටගෙන; ශුභෛඃ, ශොභනවූ; දූතෛඃ, දූතයන්ලවා; ඉතිහාසකථාපූර්වම්, පුරාවෘත්තකථනයන් පෙරටුකොට ඇති; අථාපි වා, නොහොත්; ආශීර්පූර්වම්, ආශිර්වාදයක් පෙරටුකොට ඇති; සන්දේශම්, වාචිකය හෙවත් හස්න; ප්‍රේෂයෙත්; යවන්නේය—

දූතන්තු, දූතයා වනාහි; ආදෞ, පළමුකොට; කුශලප්‍රශ්න පූර්වකම්, ආරොග්‍ය ප්‍රශ්නය පෙරදැරිකොට; වර්ණයෙත්, වර්ණනා කරන්නේය; තස්‍ය, ඒ දූතයාගේ; වර්ණනානන්තරම්, ගුණකථනයෙන් ඉක්බිති; ගන්තව්‍යස්ථානකීර්තනම්, (පණිවුඩය ගෙන) යා යුතු ස්ථානයාගේ වර්ණනාව (කරන්නේය;) පශ්චාත්, ඉන්පසු; තත්, එහෙයින්; ශ්‍රොෂ්‍යසි ඉති, අසන්නෙහියයි; උක්ත්වා, කියා; මාර්ගදේශාදි, මාර්ගදේශාදිය; වර්ණයෙත්, වර්ණනා කරන්නේය; තතඃ, ඉක්බිති; තද්දේශනගරීනායකානාම්, ඒ දේශාධිපතීන් හා නගරාධිපතීන්ගේ; ගුණස්තුතිඃ, ගුණවර්ණනය; (කටයුතුවේ) තතඃ,

ඉක්බිති; වෘත්තාන්තකථනමී, සන්දේශයාගේ ප්‍රවෘත්ති කථනය වේ; පරමී, එයින් මත්තෙහි; දූතස්‍ය, දූතයා පිළිබඳවූ; ආශීර්වාදඃ, ආශීර්වාදය වේ—

යනාදි දූතකාව්‍යලක්‍ෂණයෙන් යුක්තවූ **විභීෂණ දෙව්රජහු** දූත වරප්‍රාර්ථනාවක් කිරීම කථාශරීරකොට ඇත්තාවූ සන්දේශයක් ශාරිකාපක්‍ෂිහු දූතක්‍රියාවෙහි යොදා රචනාකරනු කැමැත්තාවූ **සංස්කෘත ප්‍රාකෘත මාගධි අපභ්‍රංශ පෛශාචි සෞරසේනී යන ෂඩ්භාෂා** කවිත්වයෙහි සමර්ථවූ ශ්‍රී සඞ්ඝබෝධි විජයබාහු පරිවෙණාධිපති **ශ්‍රී රාහුල ස්වාමිපාදයෝ** ත්‍රිවිධ කාව්‍යමුඛයන් අතුරෙන් ආශීර්වාද පුරස්සරකොට "සැරදෙ සුලකළකුරු" යනාදි කව කිහු:-

මෙහි පූර්වාර්ධයෙන්,

> තදර්ථමධ්‍යාප්‍ය ජනෛත තමනෙ
> ශුකා විමුක්තාඃ පටවස්තමස්තුවන්
> ස්වරාමෘතෙනෝපජගුශ්ච ශාරිකා
> ස්තථෛව තත් පෞරුෂ ගායනී කෘතාඃ-සී.

තදර්ථම්, (ඒ නලරජහට)ස්තුතිපිණිස; අධ්‍යාප්‍ය, ස්තුතිවාදයන් උගන්වා; ජනෛත, සම්පවත්ති ජනයා විසින්; ඥ්‍යහෝ නොහොත් උද්‍යානපාල ජනයා විසින්; තමනෙ, ඒ වෙනෙහි; විමුක්තාඃ, (පඤ්ජරබන්ධනයෙන්) මුදා හරනලද; පටවඃ, වියත් නෙපුල් ඇති; ශුකාඃ, කිරපක්ෂිහු; (ගිරවු) තම්, ඒ නලරජහට; අස්තුවන්, ස්තුති කළහ; තථෛව, ඒ කිරපක්ෂීන් මෙන්ම; තත්පෞරුෂගායනී කෘතාඃ, ඒ නලරජහුගේ වික්‍රමය පිළිබඳ ගායනීන් කරනලද; ශාරිකාශ්ච, (කිරාඬගනාවූ) සැළලිහිණිහුද; ස්වරාමෘතෙන, අමා බඳු ස්වරයෙන්; හෙවත් මධුරස්වරයෙන්; උපජගුඃ, සඞ්ගීත කළාහුය.

නෛෂධමහාකාව්‍යෙහි කීහෙයින් සියලු පක්ෂීන් අතුරෙන් මධුරාක්‍ෂරවචනයෙන් ප්‍රසිද්ධවූ ශාරිකා පක්ෂිරාජයාහට එම විශ්‍රාමනවූ නෛසර්ගික ගුණයෙන් ස්තුති කළහ—අපරාර්ධයෙන්,

> කෘතෙන චො'ගුඃ කවිතෘත්ව මුජ්ජගුඃ
> කලම්පිකාඃ පඤ්චමමඤ්ජුවචවඃ
> ගෘහාඞ්ගණං චඤ්චුකිණො, මෘජංස්තරාං
> වචොහරා යත්‍ර වධූඤ්ච ශාරිකාඃ-

යත්‍රවධූඤ්, යම් අඞ්ගනා කෙනකුන් වෙනෙහි; පඤ්චමමඤ්ජුවච වඃ, පඤ්චමස්වරයෙන් මධුරවූ බස් ඇති හෙවත් තුඩු ඇති; පිකාඃ, කොකිල පක්ෂිහු; කලම්, මධුරකොට හෙවත් මියුරු අවියත්හඬින් යුක්තව; උජ්ජගුඃ, උස්නාද කළාහුද; චඤ්චුකිණාඃ, මයූරයෝ;

නෘත්‍යාඩම්බරං, (යම් කෙනකුන්ගේ) ගෙම්දූල; අවෘජංසතරාම්, අතිශයින් ඇමද පිරිසිදුකළාහුද; ශාරිකාඃ, සැළලිහිණිනු; වචෝහරාඃ, (යම් කෙනකුන්ගේ) පණිවුඩ ගෙනයන්නාහුද; (එබඳුවූ) චෘ කෘතෙ, තොප පිණිස; (කවිවරයෝ) කවිත්‍වම්, කවිකෘතීඃබවට; නැලජ්ජගුඃ, නොපැමිණියාහුය; කවීන්ගේ වර්ණනාශක්තිය ඉක්මිණැයි සේයි—

ශ්‍රී සන්නාහනදකාව්‍යයෙහි තිහෙයින්ද වාසවාදනතා කාව්‍යයෙහි ශාරිකාපක්ෂිහු ලවා සන්දේශපත්‍ර ගමන්කරවා වාසවදත්තා වගේ මනොරථසිද්ධිය වූයේය. යනු පෙනෙන හෙයින්ද මේ පක්ෂිරාජයා රහස්‍යසම්භාෂණයෙහි සමර්ථබව ප්‍රකාශකොට තිමෙන් තදර්ථසාධකවූ දූතක්‍රියාවද එහිම අන්තර්ගතවන හෙයින් මේ පක්ෂිහු රාජකුලයනට දූතාමාත්‍යයන්ට බඳු බුද්ධියෙන් යුක්තයයි සංස්කාරජන්‍යගුණවිශෙෂයෙන් සතුතිකළහ; යනු මෙහි සමුදායාර්ථය—

1 සැරදෙ සුලකළ කුරු—මියුරුතෙපලෙන් රඳනා
රජකුල රහස මැතිනිය—සියනිහි සැළලිහිණිසඳ.

"සුලකළකුරු මියුරු තෙපලෙන් රඳනා රජකුලරහසැ මැතිනිය සැළලිහිණිසඳ සියන් ඉහි සැර දෙ'' යනු මෙහි වාක්‍යයොජනායි.

1 සුලකළකුරු, මනාකොට හොබවනලද අක්ෂරයෙන් යුක්තවූ; මියුරු, ශ්‍රවණමධුරවූ; තෙපලෙන්, වචනයෙන් හෙවත් කාව්‍යසුභාෂිතාදිපද්‍යනයෙන්; රඳනා, රඤ්ජමානවූ නොහොත් ජනරඤ්ජනය කරන්නාවූ; රජකුලරහසැ, රාජකුලයාගේ රහස්‍යවිෂයෙහි හෙවත් ගුප්තභාෂණවිෂයෙහි; මැතිනිය, මන්ත්‍රින්ගේ ඥනයට බඳු ඥන ඇති; සැළලිහිණිසඳ, ශාරිකාපක්ෂිරාජෝත්තමය; සියන් ඉහි, ස්වකීය බන්ධුන් හා එක් වැ; සැර දෙ, චිරාත් කාලයක් ජීවත් වා;-බොහෝ කලක් පවතු.

'සැළලිහිණිසඳ තෝ සැරදෙ' යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි

උක්තානුක්ත විශෙෂණ විශෙෂ්‍යාදිය.

සැරදෙ යනු ආශීර්හි විධික්‍රියායි, තො යනු අධ්‍යාහෘතඋක්ත කර්තෘයි, සැළලිහිණිසඳ යනු සම්බොධනයි, රඳනා යනුද මැතිනිය යනුද සම්බොධනවිශෙෂණයි, සුලකළකුරු මියුරු තෙපලෙන් යනු රඳනා යන අර්ථක්‍රියාවට අනුක්ත කරණයි, රජකුල රහසැ යනු විෂයාර්ථයෙහි අනුක්තාධාරයි, ඉහි යනු සහාර්ථයෙහි නිපාතයි, සියන් යනු ඉහි යොගයෙහි කර්මවිබත්‍යි.

**සමාසවිග්‍රහ,**

සු (ඉතා) ලකල-සුලකළ, සුලකළවූ අකුරු=සුලකළකුරු, මියුරු වූයේද එම තෙපුල් වූයේද=මියුරුතෙපුල්, සුලකළ කුරෙන් යුත් මියුරුතෙපුල්=සුලකළකුරු මියුරුතෙපුල්, එත් සුලකළකුරු මියුරුතොපලෙත්, ප ඈ සමස් වෙසෙසුන්සමස් ගැබි විබත් සමස්. රජුගේ කුල-රජකුල, රජකුලෙහි රහස්-රජකුල රහස්, එහි රජකුල රහසැ, විබත්සමස් ගැබි විබත්සමස්. සැළද එම ලිහිණිද-සැළලිහිණි, සැළලිහිණිද එම (උතුම් හෙයින්) සඳද-සැළලිහිණිසඳ, වෙසෙසුන් සමස් ගැබි වෙසෙසුන්සමස්; මැතින්ගේ නිය බඳු නිය ඇත්තේ යමකුහටද හෙතෙම-මැතිනිය, අන් අරුත්සමස්:-

මේ වනාහි **යහගි** නම් වෘත්තය වේ.

**එහි ලක්ෂණ,**

"නවෙකොළොස් වසමැ-එකොළොස් බැගින් සෙමෙහි
ලුහු බහලින් බඳුයෙ-යහගිය මේ නිදසුන්"

යනුවෙන් කියනලදී.

විෂම පාදයන්හි හෙවත් ප්‍රථම තෘතිය පාදයන්හි ක්‍රමයෙන් නවයක් හා එකොළොසක්ද සමපාදයන්හි හෙවත් ද්විතීය චතුර්ථ පාදයන්හි එකොළොස බැගින් ද සියලු මාත්‍රාවන් දෙසාළියක්වද බඳනාලද්දේ යහගි නම් වෘත්තයයි.

අලඞ්කාර විසින් **ආශීර්අලඞ්කාරයි.** කියනලදමැයි. ශ්‍රී **සඞ්ඝරක්ඛිත** මාහිමිපාණන් විසින්:—

"ආසීනාම සියාඉට්ඨස්ස-ඉඪස්සාසිංසනං යථා
තිලොකෙකගතීනාථො-පාතු ලොකමපායතො" යි.

"සැළලිහිණිසඳ සැරදෙ" කියා ධනුර්ගුණ සම්බන්ධන්‍යායයෙන් යොජනය කොට කීහයි දතයුතු.

ධනුර්ගුණ සම්බන්ධන්‍යාය නම්—යම්සේ ධනුර්ගුණය ධනුයෂ්ටියෙහි දෙකෙළවර සම්බන්ධයෙන් යුක්තව දුන්න ප්‍රකට වන්නාක් මෙන්, මෙහිදු පූර්වූ සැරදෙ යන ක්‍රියාපදයාගේද අවසානයෙහි සැළලිහිණිසඳ යන කතෘපදයාගේද සම්බන්ධයෙන් වාක්‍යාර්ථ ප්‍රකටවිනුයි ධනුර්ගුණ සම්බන්ධන්‍යාය නම් වේ.

**සැරදෙ**—යනු සැර යන නිපාතය පෙරටුකොට ඇති 'දිව්-පණ දූරීමෙහි' යන ධාතුවෙන් නිෂ්පන්නයි. චිරං යන පාලි සංස්කෘතවයට සමාන චිරකාලාර්ථ නිපාත ශබ්දයෙන් සැර යනු තද්භවයි. ප්‍රාණධාරණාර්ථවාචී ජීව ධාතුවෙන් දිව් යනු තද්භව ධාතුප්‍රකෘතියි. ධාත්වන්තලොපය හා ඒ ප්‍රත්‍යය කොට පූර්වස්වරලොපසන්ධි විධියෙන් හා හ්‍රස්ව කිරීමෙන් 'සැරදෙ' යනු සිඬයි.

මෙහි සැරදෙ යන ආශීර්භිඅර්ථක්‍රියාපදය "සැරද"යි ඈතම් තවීන පණ්ඩිත යන් විසින් චිරකාලාභ්‍යස්ත හෙයින් නිරවද්‍යයයි සලකනු ලැබේ.

ආශීර්වාදක්‍රියාපදයෙහි "සැරදේ" යනුම ප්‍රයෝගයෙහි යෙදූ ආචාර්ය සම්ප්‍රදායයි.

හෙතු කවරේද යත්—

සිඩාහන සඩ්ගහයෙහි සඹද අත්‍යසඹද සම්බන්ධයනට විධික්‍රියාවිධානය දක්වන්නාවූ **ප්‍රතිරාජ පරිවෙණ ස්වාමීහු** කෙවලවිධික්‍රියා ආශීර්විධි ක්‍රියාවිෂයෙහි හා එකවචන බහුවචන දෙක්හිද මිශ්‍රව (භෙදයක් නොකියා) මෙහි **අ ඒ. අන්නෙ. අන්නැ අව්. උ. පස රුසි,** යි කිවද ලක්ෂ්‍යානුසාර ගෙන් එහි කෙවල විධියද ආශීර්විධියද එකවචන හා බහුවචනද හැඳිනගත යුත්තාහ. එහි ප්‍රථම, තෘතීය, පචම, ප්‍රත්‍යයයෝ කෙවල විධියටද; ද්විතීය, චතුර්ථ, ෂෂ්ඨ ප්‍රත්‍යයයෝ ආශීර්විධියටද උදාහරණ වශයෙන් යොදනලද බව පෙනෙත්. මෙසේ ලක්ෂ්‍යානුසාරයෙන් විශෙෂ සලකා නොදනලද ප්‍රත්‍යය ෂට්කයම අවිශෙෂයෙන් කියනලද දෙඅර්ථයෙහිම යෙදෙත්යයි සලකා සමහරු කෙවලවිධියෙහි නොහොත් අනාදරාර්ථවිධියෙහි යෙදෙන අප්‍රත්‍යය දිව්ධාතුවෙන් පරව යොදා සැරදැයි යෙති. ඒ නොමැනවි. අවිශෙෂයෙන් එසේ යෙදෙත්නම් සැරදන්නැ, සැරදව්, සැරදුයි අනික් ප්‍රත්‍යය සමගද ගැලපියයුතු හෙයිනි. තමුන් එසේ ගැලපූ ක්‍රියාපද භාෂායෙහි නොලැබෙත්, එහෙයින් සැරදයි අප්‍රත්‍යයද ආශිෂ්අර්ථයෙහි නොයෙදේ.

**ප්‍රතිරාජ පරිවෙණස්වාමීන්** විසින්ම "සැරද නුවන් මිණි පඩුරෙන්" නොකියා "සැරදේ නුවන් මිණි පඩුරෙන්"යි දක්වීමද **ප්‍රතිරාජ පරිවෙණ ස්වාමීන්ගේ** සවභාෂානුරූපවූ මේ දක්වීම **ශ්‍රී රාහුල** මහා ස්වාමීන්ටත් එසේම අභිමත බව මෙහිම "සුරවර දෙ සැර විඹිසන නම් කැලණිපුර" යන්නෙහි දසැරයි නොයොදා දෙ සැර යි යෙදීමද මෙයට දෘෂ්ටාන්තයි.

තවද අනික් ධාතූන් කෙරෙන් පරවද ආශිෂ්අර්ථයෙහි අප්‍රත්‍යයගේ අදෘෂ්‍යමානත්වයද, කෙවලවූද අනාදරාර්ථවූද විධියෙහි අ ප්‍රත්‍යයාගේ දෘෂ්‍යමානත්වය මෙයට සාධකයි.

මෙහි පළමුවන යනගියෙන් ශාරිකාපක්ෂීහුගේ මධුරවචනය සියලු ජන යන්ගේ ශ්‍රවණ මනොහාරිය සන්තොෂජනකයයි. ශිෂ්ටාශිෂ්ටවූ ජල්පමානා වසථාව ගෙන දූතයාහටද මඞගල්‍යය පිණිස බන්ධු මිත්‍රයන් හා සමග චිරාත්කාල යක් ජීවත්වයි ආශීර්වාදකොට තමන් පළමුවෙන් නොකියනලද රූපවර්ණනා වෙන් ශාරිකාපක්ෂීහුගේ කුශලප්‍රශ්න කොට තමාගේ චිත්තප්‍රීති හඟවන්නාහු "පුල්මල්කෙසරු" යනාදි සැහැල්ල කීහු—

සැහැල්ලෙහි අටවැනි පදයෙන් "සබඳිනි" යනුද: "තොප" යනුද සිංහාව ලොකන න්‍යායයෙන් අනුවර්තනය කටයුතු.

2\. පුල් මල් කෙසරු මෙන්—රන්වනි තෙලෙ සරණයුග  
සපුමල් කැලෙව් තුඩ මද රතිනි මනහ ර  
නිලු පුල් දෙලෙව් සම්වනි පිය පියපත ර  
මලින්කල රුවෙව්—එබැවින් තුබින් එනවර  
නිලූද ළද සිදඹුවො දිගුවරලැ නි ලූ  
නිලූද වට බිගුපෙළ අද තුඹර නී ලූ

ව න දෙව් ලියෝ නොකොළොද සවණ අබර ණ
එ න මඟ දුකෙක් නොවීද සබඳිනි කල ණ
සෙ නෙ හස බැඳුණු තැනැ නොහරින කැරැ දියු ණ
වෙ න සැප කුමට තොප දකිනා එම පම ණ

2 සබඳිනි, මිත්‍රයාණෙනි; තොප, යුෂ්මතුන්ගේ; තෙලෙ සරණයුග, මේ (දෘශ්‍යමානවූ) චරණයුග්මය; පුල්මල්කෙසරු මෙන්, විකසිතකුසුමකෙසරයන් මෙන්; රන්වනි, පිජරවණී වන්නේය; (තෙල) තුඩ, (මේ) චංචුව; සපුමල්කැලෙව්, චම්පක කලිකාවක් මෙන්; මදරතිනි, ඊෂද්රක්තභාවයෙන්; මනහර, මනොඥ වන්නේය; (තෙලෙ, මේ;) පිය, ප්‍රියවූ; පියපතර, පක්ෂ පත්‍රසංහතිය; නිලුපුල්දෙලෙව්, නිලොත්පලපත්‍රයන් මෙන්; සම්වනි, ශ්‍යාමවණී වන්නේය; එබැවින්, ඒ භාවයෙන්; මලින් කළ රුවෙව්, පුෂ්පමය රූපයක් මෙන්; නුබින්, නභස්තලයෙන්; එනවර, එන් නාවූ කාලයෙහි; ළඳසිඳුබුවො, තරුණ සිඬාඞ්ගනාවෝ; නිලු, නිලවණීවූ; දිගුවරලැ, දීඝීවූ කෙශකලාපයෙහි; නිලුද, ප්‍රක්ෂෙප නොකොළෝද; තඹරනිලු, තාමරස නිලය කොට ඇත්තාවූ හෙවත් පද්මයෙහි වාසය කරන්නාවූ; බිඟුපෙළ, භෘඞ්ගාවලීනු; අද, අවුත්; වට නිලුද, පරික්ෂෙප නොකොළෝද හෙවත් සිසාරා නොගත්තාහුද; වනදෙව්ලියෝ, වනදිව්‍යස්ත්‍රීනු; සවන අබරණ නොකොළොද, කණීවතංස නොකොළෝද; එන, ආගමනය කරන්නාවූ; මඟ, මාගීයෙහිදී; දුකෙක් නොවීද, (සිඬාඞ්ගනා භෘඞ්ග වනදෙවතාවන් විසින්) කිසි පිඩාවක් නුවූයේද; බැඳුණු තැනැ, (මනො) බන්ධනය කළාවූ ස්ථානයෙහි; දියුණු කැර, අධික කොට; සෙනෙහස, සෙනහාධ්‍යාශය; නොහරින, පරිත්‍යාග නොකරන්නාවූ; කලණ සබඳිනි, කල්‍යාණමිත්‍රයාණෙනි; තොප, යුෂ්මත්හු; දකිනා, දර්ශනය කරන්නාහට; එම, ඒ (දර්ශනය) ම; පමණ, පර්‍ය්‍යාප්ත වන්නේය; වෙන සැප, අන්‍ය සෞඛ්‍ය සම්පත්ති යක්; කුමට, කිමපිද? කවර ප්‍රයොජනයෙක්ද?

පුල් මල් කෙසරු මෙන්—රන්වනිතෙලෙ සරණයුග

"**තෙලෙ සරණයුග රන්වන් වේ**" යනු, ක්‍රි: කා: ප: ස:

**උ,** වි-වේ යනු අධ්‍යාහාර ක්‍රියායි, **සරණයුග** යනු උක්ත කත්‍ෘයි, **රන්වන්** යනු කතෘවිශෙෂණයි, **තෙලෙ** යනු නාතිදූරාර්ථයෙහි නිපාතයි, **මෙන්** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, **පුල් මල් කෙසරු** යනු උපමාකතෘවිශෙෂණයි;

**ස,** වි—පුල්වූයේද එම මල්වූයේද-පුල්මල්, පුල්මල්හි කෙසරු-පුල්මල් කෙසරු, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්. රන්හුගේ

මෙන් වන් ඇත්තේ යමක්හටද හෙතෙම-රන්වන්, අන්අරුත් සමස්; නොහොත් රන්හුගේ වන්-රන්වන්, විබත්සමස්. ඉ යනු පරිසමාප්තියෙහි අව්‍යයයි, සරණුන්ගේ යුග-සරණයුග, විබත් සමස්;—

සරණ—යනු චරණ යන මාතෘශබ්දයෙන් සිද්ධයි. බොහෝ සෙයින් මාතෘශබ්දගත චකාරය හෙළයෙහි සකාරව දක්නා ලැබේ. චිත්ත-සිත්-ජන්ත-සත්-යනාදී තන්හි මෙනි—

සපුමල් කැලෙව් තුඩ මඳරතිනි මනහ ර
නිලුපුල් දෙලෙව් සම් වනි පිය පිය පත ර

'තුඩ මනහර වේ'-යනු ක්‍රි: කා: ප: ස:

වේ යනු අධ්‍යාහාර ක්‍රියායි, තුඩ යනු උක්තකර්තෘයි, මනහර යනු කර්තෘවිශෙෂණයි, මඳරතිනි යනු අනුක්තකරණයි, එව් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, සපුමල්කැල යනු උපමාකර්තෘ විශෙෂණයි.

ස, වි—මනහරණන්-මනහර, උපපද සමස්; සපුවූයේද එම මල්වූයේද-සපුමල්, සපුමලුන්ගේ කැල-සපුමල්කැල, වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්.

'පියපතර සම්වන් වේ'-යනු ක්‍රි: කා: ප: ස:

වේ යනු අධ්‍යාහාරක්‍රියායි, පියපතර යනු උක්තකර්තෘයි, පිය යනු කර්තෘවිශෙෂණයි, සම්වන් යනු කර්තෘවිශෙෂණයි, ඉ යනු පරිසමාප්තියෙහි අව්‍යයයි, එව් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි නිලුපුල්දෙල යනු උපමාකර්තෘ විශෙෂණයි;

ස, වි—නිල්වූයේද එම උපුල්වූයේද-නිලුපුල්, නිලුපුලන්ගේ දෙල-නිලුපුල්දෙල, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්. සම්වූයේද එම වන්වූයේද-සම්වන්, වෙසෙසුන් සමස්. නොහොත් සම්වූ වන් ඇතියේ යමක්හටද හෙතෙම-සම්වන්, අන් අරුත් සමස්. පියන්ගේ පතර-පියපතර, පියවූ පියපත~~ර-පියපියප~~තර, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්.

දෙළෙව් යන තන්හි 'දල' යනු පාලියෙහි අනුවාවිවූ දලශබ්දය හා තත්සම ශබ්දප්‍රකෘතියි. දල එව් යනු සන්ධිව ස්වරවිපර්‍යාසයෙන් දෙළෙව් යනු වේ—

සම්වන්—යනු ශ්‍යාමවර්ණ ශබ්දයෙන් සිද්ධයයි. ශ්‍යාමශබ්දය කෘෂ්ණ වර්ණයෙහිද නිල පීත දෙකින් මිශ්‍රවර්ණයෙහිද වැටේ. මෙතැන්හි නීල පීත මිශ්‍රවර්ණය වේ,

මිලින්කල රුවෙව් — එබැවින් තුබින් එනවර

නි ලූ ද ළදසිදඹුවො දිගුවරලැ නි ලූ
නි ලූ ද වට බිඟුපෙල අද තඹර නි ලූ

**'සිදඹුවො කා නිලූද'** යනු-ක්‍රි: කා: ප: ස:

**නිලූ** යනු අසුකල් අන්කරු බුහුබස් කතුකිරියයි; **ද** යනු ප්‍රශ්නාර්ථයෙහි අව්‍යයයි; **ළඳසිදඹුවො** යනු එයට උක්තකර්තෘයි; (කා) යනු අධ්‍යාහාර අනුක්තකර්මයි; **දිගුවරලැ** යනු අනුක්තාධාරයි; **නිලූ** යනු ආධාරවිශෙෂණයි; **තුබින්** යනු අනුක්තාපාදනයි; **එබැවින්** යනු හෙත්වර්ථයෙහි අනුක්තාපාදනයි; **එව්** යනු උපමාද්‍යෝතකයෙහි අව්‍යයයි; **රු** යනු උපමාකර්මවිශෙෂණයි; **කල** යනු රුශබ්ද විශෙෂණයි; **මලින්** යනු අනුක්තකරණයි; **එනවර** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි.

**ස, වි**-සිදුන්ගේ අඹු-සිදඹු, ළදවූවාහුත් ඔහුමය සිදඹුවූවාහුත් ඔහුමනුයි-ළදසිදඹුවො, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්. දිගුවූයේද එම වරල්වූයේද-දිගුවරල්, එහි, දිගුවරලැ; වෙසෙසුන් සමස්.

**'බිඟුපෙල වට නිලූද'** යනු-ක්‍රි: කා: ප: ස:

**නිලූ** යනු ක්‍රියායි; **බිඟුපෙල** යනු උක්තකර්තෘයි; **වට** යනු අනුක්තකර්මයි; **අද** යනු පූර්වක්‍රියායි; **ද** යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාතයි, **තඹරනිලූ** යනු කර්තෘවිශෙෂණයි.

**ස, වි**—බිඟුන්ගේ පෙල-බිඟුපෙල, විබත්සමස්; තඹර නිල වූයේ යම්කුන්ටද ඔහු-තඹරනිලූ, අන්අරුත්සමස්;

**'නිලූ'** යනු නි පූර්ව ලා ලීමෙහි—යන ධාතුවෙන් සිඩයි.

**සිඩයෝ**—නාම් දෙවමිනත්‍රාදිය ධරමින් අහසෙහි හැසිරෙන්නාවූ දෙවතා විශෙෂයකි. මොවුන්ගේ භාර්‍ය්‍යාවෝ සිදඹුවො වෙති.

**තඹරනිලූ**—සංස්කෘත තාම්රස ශබ්දයෙන් තඹරයිද නීලශබ්දයෙන් නිලයිද තද්භවයි. අත්‍යාර්ථසමාසවිෂයෙහි අන්තයට උකාරාදෙශයි. මධුග්‍රහණය පිණිස පද්මයෙහි නිරන්තරවාසය භෘඞ්ගයන්ගේ ධර්මතායි. එහෙයින් මෙසේ තාමරසනිලයනවය භෘඞ්ගයන් කෙරෙහි කීම සුදුසුමැයි.

**'වනදෙව්ලියෝ සවන අබරණ නොකොලොද'**-යනු-ක්‍රි: කා: ප: ස: **නොකොලො** යනු ක්‍රියායි, **වනදෙව්ලියො** යනු උක්තකර්තෘයි, **සවනඅබරණ** යනු අනුක්තකර්මයි, **ද** යනු ප්‍රශ්නාර්ථයෙහි අව්‍යයයි,

**ස, වි**—වෙනෙහිදෙව්-වනදෙව්, වනදෙවියන්ගේ ලිය-වන දෙව්ලිය, ඔව්හු-වනදෙවලියො, විබත්සමස් ගැබ් විබත්සමස්; සවන්හි අබරණ—සවන අබරණ, විබත්සමස්;

වනයෙහි අධිෂ්ඨිත දෙවතාවෝ වනදෙවතා නම්.

එනමඟ දුකෙක් නොවීද සබඳිනි කලණ—

'**දුකෙක් නොවීද**' යනු-ක්‍රි: කා: ප: ස:

**නො වී** යනු ක්‍රියායි, **දුකෙක්** යනු උක්තකර්තෘයි, **එනමඟ** යනු අනුක්තාධාරයි, **ද** යනු ප්‍රශ්නාර්ථයෙහි අව්‍යයයි.

**ස, වි**—ඒම පිණිස මඟ—එනමඟ, එහි-එනමඟැ, වෙසෙසුන් සමස්;

සෙනෙ හස බැඳුණු තැනැ නොහරින කැරැ දියු ණ
වෙ න සැප කුමට තොප දකිනා එම පම ණ

'**සැප කුමට වේ**' යනුද '**එ පමණ වේ**' යනුද-ක්‍රි; කා: ප: ස:

**උ, වි** - **වේ** යනු අධ්‍යාහාර ක්‍රියායි, **සැප** යනු උක්තකර්තෘයි, **කුමට** යනු තාදර්ථ්‍යයෙහි චතුර්ථියි, **වෙන** යනු කර්තෘවිශෙෂණයි, **සබඳිනි** යනු ආමන්ත්‍රණයි, **කලණ** යනුද **නොහරින** යනුද ආමන්ත්‍රණ විශෙෂණයි, **සෙනෙහස** යනු නොහරින යන අසමාප්ත ක්‍රියාවට අනුක්තකර්මයි, **කැරැ** යනු පූර්වක්‍රියායි, **දියුණ** යනු ඊට අනුක්තකර්මයි, **බැඳුණුතැනැ** යනු අනුක්තාධාරයි, **වේ** යනු අධ්‍යාහාර ක්‍රියායි, **එ** යනු උක්තකර්තෘයි, **ම** යනු අවධාරණයෙහි අව්‍යයයි, **පමණ** යනු කර්තෘවිශෙෂණයි, **දකිනා** යනු අනුක්ත සම්ප්‍රදානයි **තොප** යනු දකිනක්‍රියාවට අනුක්තකර්මයි.

මේ **උපජාති** නම් සහැල්ලයි.

**එහි ලක්‍ෂණ,**

"කඩවක්හි පිරියනැ—සිවුපෙදෙහි යම් විරිතක්
බහා බඳහොත් දන්නේ—උවදූනම් සැහැලිනම්"–

සිහිලිහි දෙකිත්වූ කඩවක් නම් සපදවෘත්තයාගේ අන්තයෙහි සිවුපදවෘත්ත යක් ලා බඳ හොත් ඒ උපජාති සැහැලි නම් වෘත්තය වේ.

## උපමාලඞ්කාරයි.

8. ල ප නොමවන් සඳවන් සොමිගුණ ගිහි ණි
ඔ ප වැඩිගත හෙල්මැලි සියුමැලි පැමි ණි
සැ ප රිසිදෙන වැනි රසබසැති සිතුමි ණි
තොප දැකුමෙන් අප පින්කළබව දැනි ණි

3. ලප නොම වන්, ලාඤ්ඡනප්‍රවේශයක් නුවූ; සඳවන්, චන්ද්‍රයා බඳුවූ; සොමිගුණගිහිණි, සෞම්‍යගුණග්‍රහණය ඇත්තාවූ; නොහොත්-සොමිගුණ, සෞම්‍යගුණයෙන්; ගිහිණි, ගහනවූ; හෙල්මැලි, කහ්ලාරයට බඳුවූ; සියුමැලි පැමිණි, සෞකුමාර්‍ය්‍ය ප්‍රාප්තවූ; ඔපවැඩි, කාන්තියෙන් අතිරික්තවූ; ගත, ගාත්‍රයක් ඇත්තාවූ; රිසි සැප දෙනා, අභිමත සෞඛ්‍යසම්පත්ති ප්‍රදානය කරන්නාවූ; රසබසැති, මධුරවචනොපෙතවූ; සිතුමිණි වැනි, චින්තාමාණික්‍යයක් බඳුවූ; තොප දකුමෙන්; යුෂ්මත්හුගේ දර්ශනයෙන්; අප අසමද්ශබ්දවාච්‍යයන්ගේ; පින් කළබව, කෘතපුණ්‍යභාවය; දුනිණි, පරිඥාත වී.

'අප පින්කළබව දුනිණි' යනු-ක්‍රි: කා: ප: ස:

**උ-වි.** දුනිණි යනු නිරුපාඛ්‍යාන ක්‍රියායි; **පින්කළබව** යනු ස්වයං කර්තෘ ස්වයං කර්මයි; **දකුමෙන්** යනු අනුක්තකරණයි; **තොප** යනු අනුක්ත සම්බන්ධයි; **දෙනා** යනු සම්බන්ධ විශෙෂණයි; **සැපරිසි** යනු ඊට කර්මයි; **පැමිණි** යනු සම්බන්ධ විශෙෂණයි; **අප** යනු අනුක්තසම්බන්ධයි; **රසබසැති** යනුද **සිතුමිණි** යනුද **සොමිගුණ ගිහිණි** යනුද **ඔපවැඩිගත** යනුද **තොප** යන සම්බන්ධයට විශෙෂණයි; **වන්** යනු උපමායෙහි අව්‍යයයි; **සඳ** යනු උපමාන විශෙෂණයි; **ලපනොමවන්** යනු එම උපමානයහට විශෙෂණයි; **හෙල්මැලි සියුමැලි** යනු ඔපවැඩිගත යන්නට විශෙෂණයි; **වන්** යනු උපමාර්ථයෙහි නිපාතයි—

**ස. වි.** ලපනොම වූයේ=ලපනොමවන්, කම්විබත්සමස්; සොමිද එමගුණද=සොමිගුණ, සොමිගුණයෙන් ගිහිණි=සොමිගුණ ගිහිණි, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; ඔපෙන් වැඩි=ඔපවැඩි, ඔපවැඩිගත යමක්හුගේද හෙතෙම=ඔපවැඩිගත; විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; හෙල්මැලි වන් සියුමැලි=හෙල්මැලි සියුමැලි, හෙල්මැලි සියුමැලියට පැමිණි=හෙල්මැලි සියුමැලි පැමිණි; වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; රසින් යුත් බස්=රසබස්, රසබස් ඇතියේ=රසබසැති; විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; සිතූ දෙන මිණි=සිතුමිණි, විබත් සමස්; කරනලද පින්=කළ පින්, (පදවිපර්‍යාසයෙන් පින්කළ) පින්කළාහුගේ බව=පින්කළබව, විබත් සමස් ගැබ් විබත් සමස්.

මේ සමුද්‍රඝොෂ නම් වෘත්තයයි.

එහි ලක්ෂණ,

"දෙසෙන් අපින් යති—අමලොස් මතින් බඳහොත්
වේ සමුදුර ගොස් නම්—තිදසුන් ද දනු මෙමෙසේ."

මාත්‍රා දශයකින්ද අටකින්ද යති ඇතිව අෂ්ටාදශමාත්‍රාවකින් බන්ධනය කෙළේ නාම් ඒ සමුද්‍රඝොෂ නම් වෘත්තයයි.

## උපමාලඞ්කාරයයි.

**හෙල්මැලි**—ජලජවූ ඉතා සියුමැලි පුෂ්පවිශෙෂයකි.

**සිතුමිණි**—සිහිවී මාත්‍රයෙන් චින්තිත වස්තුප්‍රදානයකිරීමට සමර්ථවූ පුණ්‍යවතුන්ගේ පුණ්‍යමහිමයෙන් පහළවන්නාවූ දුර්ලභ මාණික්‍යයකි.

4. මි තු රු තු මෝ දුක් සැප දෙකෙහිම පැවැ ති
බි තු සි තු වම් රූ මෙන් පිටුනොපා වි ති
යු තු ම තු වැඩ මතෙපල එවැනි ගුණ ඇ ති
සි තු න තු කැරැ අස යහළුව වඩන රු ති

**4.** මිතුරුතුමෝ, මිත්‍රොත්තමයෝ; පැවැති, ප්‍රවෘත්තවූ; දුක් සැප දෙකෙහිම, දුඃඛසෞඛ්‍ය (අවස්ථා) ද්වයෙහිම; බිතුසිතුවම් රූමෙන්, භිත්තියෙහි (අඳනාලද) චිත්‍රකර්මරූපයන් මෙන්; පිටු නොපාවිති, පරාඞ්මුඛ නොවෙති; එවැනි ගුණ ඇති, තාදෘශ ගුණයෙන් යුක්තවූ; රුතිවඩන, අභිලාෂවර්ධනය කරන්නාවූ; යහළුව, මිත්‍රය; මතු, අනාගතකාලයෙහි; වැඩයුතු, අභිවෘද්ධියෙන් යුක්තවූ; මතෙපල, මාගේ වචනය; සිතුනතු කැරැ, චිත්තය අවනත කොට; අස, ශ්‍රවණය කර.

**'මිතුරුතුමෝ පිටු නොපාවිති'**—යනුද,

**'තෝ මතෙපල අස'** යනුද—ක්‍රි: කා: ප: ස:

**උ—වි. නොපාවිති** යනු වත්මන් අන්කරු බුහුබස් කතු කිරියයි; **මිතුරුතුමෝ** යනු උක්ත කර්තෘයි; **පිටු** යනු අනුක්ත කර්මයි; **මෙන්** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි; බිතුසිතුවම්රූ යනු උපමාන විශෙෂණයි; **දුක් සැප දෙකෙහි** යනු අනුක්තාධාරයි; ම යනු අවධාරණයෙහි අව්‍යයයි; **පැවැති** යනු ආධාර විශෙෂණයි.

**අස** යනු විධික්‍රියායි; **තෝ** යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි; **මතෙපල** යනු අනුක්තකර්මයි; **යුතු** යනු කර්මවිශෙෂණයි; **මතු වැඩ** යනු අනුක්තකරණයි; **යහළුව** යනු සම්බොධනයි; **වඩන** යනු තද්විශෙෂණයි; **රුති** යනු වඩන යන අවික්‍රියාවට අනුක්ත කර්මයි; **එවැනි ගුණ ඇති** යනු සම්බොධන විශෙෂණයි; **නතු කැරැ** යනු සොපපද පූර්ව ක්‍රියායි; **සිතු** යනු ඊට අනුක්තකර්මයි;—

**ස, වි**—මිතුරෝද ඔව්හු උතුමෝද=මිතුරුතුමෝ, වෙසෙසුන් සමස්; දුක්ද සැපද=දුක්සැප, දුක්සැපම දෙක=දුක්සැප දෙක, එහි-දුක්සැප දෙකෙහි, දුරුත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; සිතුවම්හි රූ=සිතුවම් රූ, බිතුහි සිතුවම් රූ=බිතුසිතුවම්රූ; විබත් සමස් ගැබ් විබත් සමස්; ඒහා වැනි=එවැනි, එවැනිද එම ගුණද=එවැනිගුණ, එවැනිගුණ ඇත්තේ යමෙක් හටද හෙතෙම=එවැනි ගුණ ඇති, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්;

## උපමාලඞ්කාරයි.

යථොක්ත ක්‍රමයෙන් ශාරිකා පක්ෂිරාජයාහට මිත්‍රයන්ට සුදුසුවූ ප්‍රිය සම්භාෂණය කොට ඔහු විසින් කලම්හාදෙයට නියොග කරන්නාහු **පව්රදකඳ** යනාදි කව කිහු.

5. ප ව් රද කඳ නාලෝ මුල් දිගතු බ ර
ලෙව් තුරු සුසැදු යස මිණිමුතු මල් පත ර
ස ව් සිරි පිරි සුරපුරවන් කැලණි පු ර
දෙව් මෙහසුන් විබිසණ සුරිඳුට පව ර

5. **පව්රදකඳ**, පර්වතරාජ නැමැති හෙවත් මහාමෙරුපර්වත නැමැති ස්කන්ධයක් ඇත්තාවූ; නාලෝමුල්, නාගලොක නැමැති මූලයෙන් යුක්තවූ; දිගතුබර, දිශානැමැති ශාඛාභාර ඇත්තාවූ; ලෙව්තුරු, ලොක නැමැති වෘක්ෂයෙහි; යස, කීර්ති නැමැති; මිණිමුතු, ප්‍රබුඛවූ; මල්පතර, පුෂ්පසමූහය; සුසැදු, සුසජ්ජිතකළාවූ; සුරපුරවන්, දිව්‍යපුරය මෙන්; සව්සිරි, සකලසම්පත්තියෙන්; පිරි, සම්පූණිවූ; කැලණිපුර, කල්‍යාණිපුරයෙහි; පවර, ප්‍රවරවූ; විබිසණසුරිඳුට, විභීෂණසුරෙන්ද්‍රයාහට; මෙහෙසුන්, මේ සන්දෙශය; දෙව්, දුනය කරව්.

**'නෝ මෙහසුන් දෙව්'** යනු ක්‍රි: කා: ප: ස:

**උ—ව්, දෙව්** යනු විධික්‍රියායි; **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි; **මෙහසුන්** යනු අනුක්ත කර්මයි; **විබිසණ සුරිඳුට** යනු අනුක්තසම්ප්‍රදානයි; **පවර** යනු සම්ප්‍රදාන විශෙෂණයි; **කැලණි පුර** යනු අනුක්තාධාරයි; **සව්සිරිපිරි** යනු ආධාරවිශෙෂණයි; **වන්** යනු උපමාර්ථයෙහි අව්‍යයයි; **සුරපුර** යනු උපමා ආධාර විශෙෂණයි; **සුසැදු** යනු සුරපුර යන්නට විශෙෂණයි; **යසමිණි මුතුමල්පතර** යනු සුසැදූ යන අපි ක්‍රියාවට අනුක්ත කර්මයි; **ලෙව්තුරු** යනු අනුක්තාධාරයි; **පව්රද කඳ** යනුද **නාලෝමුල්** යනුද **දිගතුබර** යනුද ආධාර විශෙෂණයි,—

**ස—වි,** පව්තට රද=පව්රද; පව්රදම කඳ වූයේ යමක් හට්ද හෙතෙම=පව්රද කඳ, විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; නයින්ගේ ලෝ=නාලෝ, නාලෝම මුල්වූයේ යමක් හට්ද හෙතෙම=නාලෝමුල්, විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; දිග්ම අතු=දිගතු, දිගතුවල බර=දිගතුබර, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; ලෙව්ම තුරු=ලෙව්තුරු, වෙසෙසුන් සමස්; මනාසැදු=සුසැදු, ප ඈ සමස්; මිණියෙන් මුතු=මිණිමුතු, මල්වල පතර=මල්පතර, මිණිමුතුද එම මල්පතරද=මිණිමුතුමල්පතර, යසම මිණිමුතුමල් පතර යමෙක්හිද හෙතෙම=යස මිණිමුතු මල් පතර, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; සව්ද එම සිරිද=සව්සිරි, සව්සිරින් පිරි=සව්සිරිපිරි, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; සුරන්ගේ පුර=සුරපුර, සුරපුර වැනිවූයේ=සුරපුර වන්; විබත් සමස් ගැබ් විබත් සමස්; කැලණි වූයේද එම පුර වූයේද=කැලණි පුර, වෙසෙසුන් සමස්; මෙද එම හසුන්ද=මෙහසුන්, වෙසෙසුන් සමස්; සුරනට ඉඳු=සුරිඳු, විබි සණද එම සුරිඳුද=විබිසණ සුරිඳු, ඔහට-විබිසණ සුරිඳුට, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්;

**පව්රද**—මෙහි පව්රද යත්තෙත් මහාමෙරු පර්වතය නිර්දිෂ්ටයි. මහමෙර වනාහි සියලු පර්වතයන්ට වඩා විසාලවූයෙන් පර්වතරාජ යන නාමය අත්පත්ව ලබයි. ඒ මහාමෙරුව සමුද්‍ර මධ්‍යයෙහි ත්‍රිකූටපර්වත මතුයෙහි පිහිටා සිටියේය. යොදුන් අසූහාරදහසක් සමුද්‍රයෙහි ගැලීද එසේම යොදුන් අසූහාර දහසක් උද්ගතවදූයි මෙසේ එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උස්ව පිහිටියේය. සටහන් වසයෙන් බෙරයක සටහන් ඇත්තේය. යුගන්ධර ඊසධර කරවීක සුදස්සන නෙමින්ධර විනතක අශ්වකර්ණ යයි පර්වත වලලු සතක් මහමෙර අවට පිහිටියාහුය. මේ මහමෙර මතුයෙහි දසදහසක් යොදුන් තව්තිසා දෙව්ලොව පිහිටියේය. මෙර පතුලෙහි අසුරභවනය පිහිටියේය. මහමෙර පූර්වදිග සුදු පැහැයෙන්ද දකුණුදිග නිල්පැහැයෙන්ද පශ්චිමදිග රත්පැහැයෙන්ද උතුරුදිග රන්වන් පැහැයෙන්ද සතර අනුදිග මිශ්‍ර වර්ණයන්ගෙන්ද බබලන්නේය.

**නාලෝ**—සමුද්‍රයෙන් යට රසාතලයෙහි හෙවත් පාතාලයෙහි නාගයන්ගේ ලොකය වෙයි. එහි වසන්නාවූ නාගයෝ වූකලි මනුෂ්‍යයන්මෙන් ශ්‍රී සම්පත්තියෙන් සම්බව රාජ රාජ මහාමාත්‍යාදි කුලදෙටුවන් ඇතිව ආචාර සම්පන්නව වාසයකරන්නාහුය. ඔවුහු පෙණ මඬුල්ලකින් යුත් මනුෂ්‍ය ශරීර වලින් යුක්තයෝය. කැමැතිවිටක දිව්‍ය මනුෂ්‍යාදි රූපයන් නිර්මිත කර ගැනීමට හැකි සෘද්ධියක්ද ඇතියහ. ඒ නාගයෝ වූකලි විද්‍යා ශිල්පයන් හදුරා ඥානොපාර්ජනය කිරීමෙන් ඉතා සුසිලයෝ වූහ.

**කැලණිපුර**—53 වෙනි කව බලනු.

විබිසණ සුරිඳු—“විශෙෂෙණ භීෂයතෙ ශත්‍රූන් ඉති විභීෂණඃ” මෙසේයින් සතුරන් බියගන්වානුයි යන අර්ථ ඇති විභීෂණ ශබ්දයෙන් තද්භවවූ ශබ්දප්‍රකෘතියකි.

බ්‍රහ්ම සම්භව පුලස්ති සෘෂීහුගේ පුත්‍රවූ විශ්‍රවස් නම් බ්‍රාහ්මණ කුමාර තෙමේ මොහුගේ පියාවිය. කෛකෂා නම් රාක්‍ෂස කුමාරිකා තොමෝ මාතෘ වූවාය. ලඞ්කාරාජ්‍යපදප්‍රාප්ත මහානුභාව සම්පන්න රාවණේශ්වර තෙමේද කුම්භකර්ණ තෙමේද මොහුගේ සහෝදරයෝ වූහ. සූර්පනඛා නම් සහෝදරියක්ද වූවාය.

එයින් කීහ:—“රාවණං කුම්භකර්ණඤ්ච-කන්‍යාං සූර්පනඛාං තථා
විභීෂණං චතුප්පාතු-කෛකෂා ජනයත් සුතම්”යි.

විශ්‍රවස්හුගේ පුත්‍රවූ වෛශ්‍රවණ තෙමේද මොහුගේ සහෝදරයෙක් වීනමුත් හෙතෙම විශ්‍රවස්හුගේ අන්‍ය භාර්‍ය්‍යාවකගෙන් උපන්නේය. විභීෂණ තෙමේ වනාහි ඉතා ධර්මිෂ්ඨවූවෙකි. රාම රාවණ යුද්ධයෙහිදී හෙතෙම සිය සොහොවුරාගේ අයුතු ක්‍රියාවන් නිසා කලකිරුණේ රාමකුමරුගේ පක්‍ෂය ගත. එය රාමකුමාරයාගේ ජයග්‍රහණයට ප්‍රධාන හේතුවක්වූ බැවිද ජයග්‍රහණයෙන් පසු රාමතෙම විභීෂණනට ලංකාරාජ්‍යය භාරදී වොටුණු පලඳවා සියරට ගියේයයිද රාමායණයෙහි දක්වා තිබේ. කැලණි විහාරයෙහි යටාලතිස්ස රජතුමන් විසින් කරවනලදුව අද දක්වාම පවත්වාගෙන එන විභීෂණ දේවාලයක්ද තිබේ.

කෝකිල සන්දේශයෙහිද විබිසණ සුරිඳු,

“න ද නිස සර මිරිඳුන් මන් සිද පසි ඳ
බ ඳ යස දද දිගු දිගුයටගෙහි හොම ඳ
න ඳ කළ සත සම්සිරි දීමෙන් නිබ ඳ
වැ ඳ අත තුරු එහි විබිසණ සුරිඳු ස ඳ”

යන්නෙන් වර්ණනාකර තිබේ.

## උපමායෙන් සංසෘෂ්ටවූ රූපකාලඞ්කාරයි.

එහි රූපකලක්‍ෂණ ශ්‍රී සඞ්ඝරක්‍ෂිත මහා ස්වාමිපාදයෝ

“උපමානොපමේයානං-අභේදස්ස නිරූපනා
උපමාව තිරොභූත-භේද රූපක මුච්චතෙ”

යන්නෙන් කීහ.

6. ග න ව න් මියුරු නඳදෙන ගුවන වන්වි ට
වි ල සි න් මෙමා කරවන මිතුරෙ මන් තු ට
එ හ සු න් පැසුළු පවසම් රස තුසුන් කො ට
අ ස ඳු න් නයන මහ සලකුණු මෙතැන් සි ට

6. ගුවන වන්විට, (සමුද්‍රයෙන් ජලග්‍රහණය කොට) ආකාශයට ප්‍රවිෂ්ටවූ කාලයෙහි; මියුරු නඳදෙන, මයූරයන්ට සන්තොෂ ජනනය කරන්නාවූ; ගනවන්, මෙඝයක් මෙන්; විලසින්, විලාසයෙන් (ශරීරලාවණ්‍යයෙන්); මෙ මා මන්තුට කරවන, මේ

මාගේ චිත්තසන්තොෂය කරවන්නාවූ; මිතුර, යහළුව; පැසුළු, පශ්චාත්කාලයෙහි හෙවත් මාර්ගවර්ණනාවට පසුව; එ හසුන්, ඒ සන්දේශ වාක්‍යය; රස නුසුන් කොට, මාධුර්ය්‍යවිච්ඡේදය නො කොට; පවසමි, ප්‍රකාශකෙරෙමි; දැන්, මේ අධුනාකාලයෙහි; මෙතැන්සිට, මේ (අප උන්නාවූ) ස්ථානයෙහි පටන්; තයන, තොප ගමනය කරන්නාවූ; මඟ සලකුණු, මාර්ගසඞ්කේතයන්; අස, ශ්‍රවණය කර.

දැන් ඒ පක්ෂිරාජයා නික්මෙන්නාවූ පුරය වර්ණනා කරන් නාහු "පොහොසද්දන ඇති" යනාදි කීහු.

'මම **එහසුන් පවසමි**'—යනුද

'**තෝ** මඟ **සලකුණු** අස'—යනුද ක්‍රි: කා: ප: ස:

**උ—වි, පවසමි** යනු වත්මන් මසද කරු එකබස් කතුකිරියයි; මම යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි; **එහසුන්** යනු අනුක්ත කර්මයි; **පැසුළු** යනු පශ්චාත් ශබ්දාර්ථයෙහි නිපාතයි; **නුසුන්කොට** යනු සොපපද පූර්වක්‍රියායි; **රස** යනු ඊට අනුක්ත කර්මයි; **මිතුරෙ** යනු සම්බොධනයි; **කරවන** යනු සම්බොධන විශෙෂණයි; **මන් තුට** යනු කරවන යන අපික්‍රියාවට අනුක්ත කර්මයි; **මෙමා** යනු අනුක්ත සම්බන්ධයි; **විලසින්** යනු අනුක්තකරණයි; **වන්** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි; **ගන** යනු ආමන්ත්‍රණ විශෙෂණයි; **දෙන** යනු උපමා විශෙෂණයි; **නද** යනු දෙන යන අපීක්‍රියාවට අනුක්ත කර්මයි; **මියුරු** යනු අනුක්ත සම්ප්‍රදානයි; **වන්විට** යනු කාලාර්ථයෙහි අනුක්ත ආධාරයි; **ගුවන** යනු අදර අරුතැ කම් විබති—

**අස** යනු විධික්‍රියායි; **තෝ** යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි; **සලකුණු** යනු ඊට කර්මයි; මඟ යනු අනුක්තාධාරයි; **තයන** යනු කර්ම විශෙෂණයි; **දැන්** යනු කාලාර්ථයෙහි අව්‍යයයි; **සිට** යනු පූර්වක්‍රියායි; **මෙතැන්** යනු අනුක්තාපාදානයි;

**ස—වි,** මෙද එම මම්ද=මෙමම්, ඔහුගේ-මෙමා, වෙසෙසුන් සමස්; එද එම හසුන්ද=එහසුන්, වෙසෙසුන් සමස්; මෙනෙහි තුටු=මන්තුටු, එය-මන්තුට, විබත් සමස්; මඟෙහි සලකුණු=මඟ සලකුණු, විබත් සමස්;

**ගනවන් මියුරු නද දෙන**—මෙඝය තෙමේ මියුරයන්ට අතිශයින් ප්‍රියජනකවේ, ඒ බැව් සසඳවතෙති:—

"වියොවුන් සිළෙයාකරු-සිළෙඹතුන් සතොස වඩමින්
ගිමන්හු මින් මහිමින්-මඟ මේ කලා සිකිකල්"

යත්හොත් දුක්වී, එසේහයින් මෙඝසන්තානයෙහි මයුරයෝ පිඤ්ජාවතිහය කරමින් (පිල්මදනමින්) නෘත්‍යාරම්භය කරති.

**උපමායෙන් සංසෘෂ්ටවූ ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

**පවසම්**—පවස පැවසීමෙහි යන ධාතුවෙන් සිඩයි.

**අස**—අස ඇසීමෙහි යන ධාතුයි විධික්‍රියාපීයෙහි 'අ' ප්‍රත්‍යයවැ සිඩයි.

7. පොහොසද් ද න ඇති තුනුරුවනැ බැති පෙ මා
මු ලු ව ද් ද න සුරපුර පිරි සිරින් හැ මා
ජ ය ව ද් ද න කිරුමෙන් සුසැදු නම න මා
ජ ය ව ද් ද න පුරවර දනු මිතුරු තු මා

7. තුනුරුවනැ (බුඩාදී) රත්නත්‍රයෙහි; බැතිපෙමා, භක්ති ප්‍රෙම ඇත්තාවූ; පොහොසද්දන ඇති, ප්‍රභූජනයා ඇත්තාවූ; පිරි, සම්පූර්ණවූ; හැමාසිරින්, සකලසම්පත්තියෙන්; සුරපුර, දිව්‍ය පුරය; මුලුවද්දන, කොණප්‍රවේශ කරවන්නාවූ; ජයවද්දන කිරුමෙන්, ජයවර්ධනකරණය හෙතුකොටගෙන, නමනමා, ස්වකීය නාමය; සුසැදු, (අර්ථාන්විතවූ හෙයින්) සුසජ්ජිතකළාවූ; ජය වද්දනපුරවර, ජයවර්ධන නම්වූ පුරවරය; මිතුරුතුමා, මිත්‍රොත්තමය; දනු, අවබොධනය කර.

**'තෝ ජයවද්දන පූරවර දනු'**—යනු ක්‍රි: කා: ප: ස:

**දනු** යනු විධි ක්‍රියායි; **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි; **ජයවද්දනපුරවර** යනු අනුක්තකර්මයි; **ඇති** යනුද **මුලුවද්දන** යනුද **සුසැදු** යනුද කර්මවිශෙෂණයි; **පොහොසද්දන** යනු ඇති යන ක්‍රියාවට කර්තෘයි; **බැතිපෙමා** යනු කර්තෘ විශෙෂණයි; **තුනු රුවනැ** යනු අනුක්තාධාරයි; **සුරපුර** යනු මුලුවද්දන යන අපි ක්‍රියාවට අනුක්තකර්මයි; **සිරින්** යනු අනුක්ත කරණයි; **පිරි** යනුද **හැමා** යනුද කරණ විශෙෂණයි. **නමනමා** යනු සුසැදු යන අපි ක්‍රියාවට අනුක්ත කර්මයි; **ජයවද්දන කිරුමෙන්** යනු අනුක්ත කරණයි; **මිතුරුතුමා** යනු සම්බොධනයි;

**ස—වි,** පොහොසත් වූවෝද ඔව්හු දන වූවෝද=පොහොසද් දන, වෙසෙසුන් සමස්; රුවන් තුනක් එක්කොට සලකන ලද්දේ= තුනුරුවන්, එහි-තුනුරුවනැ; වෙසෙසුන් සමස්; බැතිද පෙම්ද= බැතිපෙම්, බැතිපෙම් ඇත්තේ යමෙක් හටද හෙතෙම=බැතිපෙමා, දුරුත් සමස් ගැබ් අන් අරුත් සමස්; මුලුහි වද්දන=මුලුවද්දන, විබත් සමස්; සුරන්ගේ පුර=සුරපුර, විබත් සමස්; ජයෙහි වද්දන=

ජයවද්දන, ජයවද්දනගේ කිරුළ්=ජයවද්දනකිරුළ්; එසින්-ජය වද්දන කිරුළෙන්, විබත් සමස් ගැබ් විබත් සමස්; නමාගේ නම= නමනම; එය-නම නමා, විබත් සමස්; පුරනට වර=පුරවර, ජයවද්දනද එම පුරවරද=ජයවද්දන පුරවර; විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; මිතුරනට උතුළ්=මිතුරුතුළ්, විබත් සමස්; (නොහොත්)මිතුරුද එම උතුම්ද=මිතුරුතුම්, වෙසෙසුන් සමස්;-

**ජයවද්දන පුරවර**—යත්හෙත් කෝට්ටේ යන අපර නාමධෙය උතුම් ජයවර්ධනපුරය වාච්‍යවේ. මෙ නගරය වනාහි ගම්පල රාජ්‍යය කළ තුන්වෙනි වික්‍රමබාහු රජතුමාගේ කාලයෙහි ගිරිවංශජ අලගක්කෝනාර නම් මන්ත්‍රීශ්වරයන් විසින් ගොඩනගන ලද්දේය. පස්වෙනි භුවනෙකබාහු රජතුමා මෙහි පළමුවෙන් රජවිය. එතැන් පටන් (දොන් ජුවන්) ධර්මපාල රජහුගේ කාලය දක්වා රාජධානියව පැවැති බැව් පෙනේ.

**දනු**—දන දූනිමෙහි යන ධාතුයි. විධ්‍යර්ථයෙහි 'උ' ප්‍රත්‍යයව සිඬයි.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

එහි ලක්‍ෂණ ශ්‍රීමද් දණ්ඩ්‍යාචාර්‍ය්‍යයෝ-

'නානා වස්ථං පදර්ථානාං රූපං ශාක්‍ෂාත් විවෘණ්වතී
ස්වභාවොක්තිශ්ච ජාතිශ්චෙත්‍යාද්‍යා සාලඞ්කෘතිර්යථා.'

යනාදීන් කීහු.

8. සැ දි රත තඹර පෙළ රන තිසරුන් රුවැ ති
වි දි දිය දහර ලෙළදෙන දිගු නරු පමැ ති
රැ දි රළ රැලැති හොය දිය වන්නා නමැ ති
ඇ දි පුර අඟන පමසළු සිරි රැපැයි නි ති

8. රතනඹරපෙළ, රක්තවර්ණවූ තාමරසපඞ්ක්තියෙන්; සැදි, සජ්ජිතවූ; රනතිසරුන් රුවැති, ස්වර්ණහංසයන්ගේ රූපයෙන් යුක්තවූ; විදි දියදහර, (එක් දිශාභාගයෙකින් ආවරණ වශයෙන් බඳනාලද පාෂාණයෙහි) විකීර්ණවූ ජලධාරා නමැති; ලෙළදෙන, ලීලොපෙතවූ; දිගු, දීඝීවූ; නරුපමැති, නිර්පච්චයෙන් යුක්තවූ; රළ රැලැති, තරඞ්ග නමැති වලි ඇත්තාවූ; දියවන්නා නමැති, දියවන්නා යන නාමයක් ඇත්තාවූ; හොය, නදීතොමෝ; පුර අඟන, පුරනැමැති අඞ්ගනාව විසින්; නිති, නිරන්තරයෙන්; ඇඳි, ආච්ඡාදනය කළාවූ; පමසළු සිරි, පච්ඡවස්ත්‍රශ්‍රිය; ඇරැපැයි, ගෙනහැර දක්වූ.

**'හොය පමසළු සිරි ඇරපැයි'**—යනු ක්‍රි: කා: ප: ස:

**උ—වි. ඇරපැයි** යනු වත්මන් අන්කරු එකබස් කතු කිරියයි; **හොය** යනු උක්තකර්තෘයි; **පමසළු සිරි** යනු අනුක්ත කර්මයි; **සැදි** යනුද **ඇති** යනුද **විදිදිය දහර ලෙළදෙන දිගු**

නරු පමැති යනුද රළිඳිරළ රළැති දියවන්නා යනුද කර්තෘ විශේෂණයි; තිති යනු ක්‍රියා විශේෂණයි; ඇදි යනු කර්මවිශේෂණයි; පුර අගන යනු ඇළි යන අපි ක්‍රියාවට අනුක්ත කර්තෘයි; සැදි රත තඹරපෙල යනු අනුක්ත කරණයි; රුව යනුද නම යනුද අසත්‍යපි ක්‍රියාවට අනුක්ත කර්මයි; රන තිසරුන් යනු අනුක්ත සම්බන්ධයි;—

ස—වි. රත්වූයේද එම තඹරවූයේද=රතතඹර, රතතඹරැන්ගේ පෙළ=රතතඹරපෙළ, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; රන්වන්වූවාහුද ඔහු තිසරවූවෝද රනතිසර, ඔවුන්-රනතිසරුන්, වෙසෙසුන් සමස්; දියගේ දහර=දියදහර, විදිද එම දිය දහරද=විදිදිය දහර, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; ලෙළ දෙනුයේ=ලෙළදෙන, උපපද සමස්; නරුවූයේද එම පටවූයේද= නරුපට, වෙසෙසුන් සමස්; දිගුවූයේද එම නරුපට වූයේද= දිගුනරුපට, වෙසෙසුන් සමස්; ලෙළදෙනුයේත් එම දිගුරුපට වූයේත් එමනුයි=ලෙළදෙන දිගුනරුපට, වෙසෙසුන් සමස්; විදි දිය දහරවූයේද එම ලෙළදෙන දිගුනරුපට වූයේද=විදිදිය දහර ලෙළදෙන දිගුනරුපට, වෙසෙසුන් සමස්; විදිදියදහර ලෙළදෙන දිගු නරුපට ඇතියේ යමක්හටද හෙතෙම=විදිදියදහර ලෙළදෙන දිගුනරු පමැති, අන් අරුත් සමස්; රළන්ගේ රළ=රළරළ, රළිඳද එම රළරළද=රළිඳිරළරළ, රළිඳිරළරළ ඇතියේ යමක්හටද ඕතොමෝ=රළිඳිරළ රළැති, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; දියවන්නා යන නම=දියවන්නා නම, දියවන්නානම ඇතියේ යමක් හටද ඕතොමෝ=දියවන්නා නමැති, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්, පටවූයේද එම සළුවූයේද=පටසළු, පටසළුවල සිරි=පටසළුසිරි, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්;

## උපමා රූපකයි.

**රතතඹර**—රත්තඹර කියයුතු තැනැ අකාරාගමවැ රතාතතඹර යී වේ. ජයවර්ධනපුරය සිසාරා දියවන්නා නදිය පිහිටි බැව් කර්තෘහුගේ අදහසයි:- දියවන්නා හොය මෙකල ජුවන්නාව (රන් ජුවන්ගඟ) යයි ව්‍යවහාරයට පැමිණ තිබේ.

9. සමතොළ මුහුල මහ සමුදුර මෙවුල් බ ර
සුලකළ පුවල ලකඟන සිරි යොවුන් ව ර
තරකළ විසල් වාසල් යතුරු මෙනුව ර
බැඳහළ රුවන් කනපට කිය ලිය පවු ර

9. සමනොළමුහුළ, සමනතකූටපර්වත නැමැති ධම්මිල්ලයක් ඇත්තාවූ; මහසමුදුරමෙවුල්බර, (හාත්පසින් වටකරනලද) මහා සමුද්‍ර නැමැති මෙඛලාහාරයක් ඇත්තාවූ; සුලකළ, මොනවට අලඞ්කෘතවූ; පුවළ, (මේ වර්තමානකාලයට) ප්‍රෞඪවූ; ලකඟන, ලඞ්කාඞ්ගනාව; සිරි, ඓශ්වර්‍ය්‍යයෙන්; යොවුන්වර, යෞවනාවස්ථායෙහි; බැඳහළ, බන්ධනය කොට හරනලද්දාවූ; විසල් වාසල්, විශාලවූ ගොපුර නැමැති; තරකළ, ස්ථිරීකෘතවූ; යතුර, යන්ත්‍ර බන්ධන ඇත්තාවූ; රුවන්තනපට (සිරි) රත්නමය පයොධර පට්ට (ශොභාවක්); මෙ නුවර පවුර, මේ නගරයෙහි ප්‍රාකාරය තෙම; කියලිය, ප්‍රකාශ කෙළේයි.

**'පවුර රුවන් තනපට කියලිය—යනු ක්‍රි: කා: ප: ස:**

**උ—වි, කියලිය** යනු අයුකල් අන්කාරු එකබස් කතුකිරියයි; **පවුර** යනු කර්තෘයි; **රුවන්තනපට** යනු කර්මයි; **තරකළ විසල් වාසල් යතුරු** යනු කර්තෘ විශෙෂණයි; **මෙනුවර** යනු අනුක්තාධාරයි; **බැඳහළ** යනු කර්ම විශෙෂණයි; **ලකඟන** යනු බන්ධන ක්‍රියාවට අනුක්ත කර්තෘයි; **සමනොළ මුහුළ** යනුද **මහසමුදුර මෙවුල්බර** යනුද **සුලකළ** යනුද **පුවළ** යනුද අනුක්ත කර්තෘහට විශෙෂණයි; **සිරියොවුන්වර** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි.

**ස—වි,** සමනොළම මුහුළ=සමනොළමුහුළ, සමනොළ මුහුළ වූයේ යමක්හටද ඕතොමෝ=සමනොළ මුහුළ, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; මහවූයේද එම සමුදුර වූයේද=මහසමුදුර, මෙවුල්හුගේ බර=මෙවුල්බර, මහසමුදුරම මෙවුල්බර වූයේ යමක්හටද ඕතොමෝ=මහසමුදුර මෙවුල්බර, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; සු (ඉතා) ලකළ=සුලකළ, පඅැ සමස්; ලකවූවාද ඔම අඟනවූවාද=ලකඟන, වෙසෙසුන් සමස්; යොවුන්හුගේ වර=යොවුන්වර, සිරින් යොවුන් වර=සිරි යොවුන්වර, විබත් සමස් ගැබ් විබත් සමස්; බැඳ හරන ලද්දේ=බැඳහළ, උපපද සමස්; (පූර්ව ක්‍රියොපපද 'හර හැරීමෙහි' යන ධාතුයි;)තනෙහි පට=තනපට, රුවනින් කළ තනපට=රුවන්තන පට, විබත් සමස් ගැබ් විබත් සමස්; වාසල්ද ඔම යතුරුද=වාසල් යතුරු, විසල්වූයේද එම වාසල් යතුරු වූයේද=විසල්වාසල්යතුරු, තරකළ විසල් වාසල් යතුරු ඇතියේ යමෙක්හිද හෙතෙම=තර කළ විසල් වාසල් යතුරු, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; මෙද එම නුවරද=මෙනුවර, වෙසෙසුන් සමස්;

මෙවුල්—යනු මෙඛලා ශබ්දයෙන් සිද්ධවූ ශබ්ද ප්‍රකෘතියකි. මෙහි **නානාර්ථ ධ්වනි මාලා** යන නිරුක්ති විධියෙහි වර්ණ ලොපයෙන් මෙඛලා ශබ්දයාගේ නිෂ්පත්තිය වේ. ස්ත්‍රීන්ගේ කටියෙහි පලඳනා ආභරණදාම විශේෂය මෙයි නිර්දිෂ්ටයි.

## රූපකගර්භ උපමාලඞ්කාරයි.

10. දු ව න  බඳකිකිණි හයකුරපහරන  ද
සවන  තලනිනද ගිජිඳුන් සෙමර බ  ඳ
රවන  නොයෙක තුරු ජයසක්හඬ නොම  ඳ
දෙවන  මුහුද මෙන් ගුම් ගනි පුර නිබ  ඳ

10. දුවන, ධාවනය කරන්නාවූ; බඳකිකිණි, බඬකිඞකිණි ඇති; හය, අශ්වයන්ගේ; කුරපහරනද, ඛුරප්‍රහාරයෙන්වූ නාද යෙන් ද; සෙමෙරබඳ, චාමරබඬවූ; ගිජිඳුන්, ගජේන්ද්‍රයන්ගේ; සවනතලනිනද, කර්ණතාල ශබ්දයෙන් ද; රවන, නාද කරවනු ලබන්නාවූ; නොයෙකතුරු, අනෙක තූර්‍ය්‍යයෙන් ද; නොමඳ, අමන්දවූ, ජයසක්හඬ, ජයශඞ්ඛශබ්දයෙන් ද; පුර, (මේ ජයවර්ධනා පුරය තෙම; දෙවනමුහුද මෙන්, ද්විතීයසමුද්‍රයක් මෙන්; නිබඳ, අනවරතයෙන්; ගුම් ගනි, ඝොෂග්‍රහණය කෙරේ.

'පුර ගුම් ගනි'—යනු ක්‍රි; කා: ප: ස:

**උ. වි—ගනි,** යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, පුර යනු උක්ත කර්තෘයි, ගුම් යනු අනුක්ත කර්මයි, මෙන් යනු උපමාර්ථයෙහි අව්‍යයයි, දෙවන මුහුද යනු උපමාන කර්තෘ විශෙෂණයි, දුවනබඳ කිකිණිහයකුර පහරනද යනුද, සවනතලනිනද යනුද, රවන නොයෙක තුරු යනුද, ජයසක්හඬ යනුද, අනුක්තකරණයි, ගිජිඳුන් යනු අනුක්ත සම්බන්ධයි, සෙමෙරබඳ යනු සම්බන්ධ විශෙෂණයි, නොමඳ යනු ජයසක්හඬ යන කරණයට විශෙෂණයි, නිබඳ යනු ක්‍රියා විශෙෂණයි,

**ස, වි**—බඳනාලද කිකිණි ඇත්තේ යමකුගේද ඔහු=බඳකිකිණි, බඳකිකිණිද ඔහු හයවූවාහුද=බඳකිකිණිහය, දුවන්නාහුද ඔහු බඳ කිකිණිහයද=දුවනබඳ කිකිණිහය, කුරෙහි පහර=කුරපහර, දුවනබඳ කිකිණිහයන්ගේ කුරපහර=දුවනබඳ කිකිණිහය කුරපහර, දුවන බඳ කිකිණිහයකුරපහරෙහි නද=දුවනබඳ කිකිණිහයකුරපහරනද, අන් අරුත් සමස් වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් විබත් සමස්; සවනුන්ගේ තල=සවනතල, සවනතලෙහි නිනද=සවනතල නිනද, විබත් සමස් ගැබ් විබත් සමස්; ගජනට ඉඳු=ගිජිඳු, ඔවුන්-ගිජිඳුන්, විබත් සමස්; බඳනාලද සෙමෙර යමකුන්ගේද ඔහු=සෙමෙරබඳ, අන් අරුත් සමස්;

එකෙක් නොවනුයේ=නොයෙක්, නොයෙක් වූයේද ඔහු තුරු වූයේද=නොයෙක තුරු, රවන්නාහුද ඔහු නොයෙක තුරු වූවාහුද=රවනනොයෙකතුරු, අව්‍ය සමස් වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්; ජයෙහි සක්=ජයසක්, ජයසක්හි හඬ=ජයසක් හඬ, විබත් සමස් ගැබ් විබත් සමස්; මදනොවූයේ=නොමද, අව්‍ය සමස්; දෙවත වූයේද එම මුහුද වූයේද=දෙවත මුහුද, වෙසෙසුන් සමස්;

**සෙමෙර**—සෙමෙර යනු චාමර ශබ්දයෙන් සිත්නවූවකි. චමරිනම් මෘග විශෙෂයකි. ඔව්හු වනාන්ත දක්‍ෂිණිය සවකීය වාලධිය ජීවිතයටද වඩා සැලකීමෙන් රක්නෝය. ඔවුන්ගේ වාලධියෙන් කරනලද ව්‍යජනය (පවන් සලන උපකරණය) චාමර නම්. මේ වනාන්ත රාජපරිභොගාර්හ භාණ්ඩයන් අතුරෙහි පඤ්ච කකුදරාජ භාණ්ඩයෙන් එකක්ද වේ. එහි පඤ්චකකුදරාජභාණ්ඩ නම්:-

"ඛග්ගොච ජාතමුණ්හිසං පාදුකා වාලවිජනි
ඉමෙ කකුදභණ්ඩානි භවන්ති පඤ්ච රාජිනං"

යන්නෙන් කියනලදී. චමරිනම් මෘගයෝ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍ර යයි සතර වංශයට අයත් වූවාහු වෙති. ඔවුන්ගේ වාසස්ථාන නම්.

"සථලජං ජලජං චෙති චමරිං ද්විවිධං විදුඃ
මෙරෞ හිමාලයෙ වින්‍ධ්‍යෙ කෛලාසෙ මලයෙ තථා
උදයෙ'ස්තගිරෞ චෙව ගන්‍ධමාදන පර්වතෙ
එව මෙතෙෂු ශෛලෙෂු යාශ්චමර්‍ය්‍යෝ භවන්තිහි
තාසාං වාලස්‍ය ජායෙත චාමරත්‍යභිධා භුවි." යි

සථලජ ජලජයයි චමරීහු දෙපරිද්දකින් කියත්. මෙරු පර්වතයෙහිද හිමාලය පර්වතයෙහිද විංධ්‍ය පර්වතයෙහිද කෛලාස පර්වතයෙහිද මලය පර්වතයෙහිද එසේම උදයගිරි අස්තගිරි යන දෙක්හිද ගන්‍ධමාදන පර්වතයෙහිද යන මේ පර්වතයන්හි චමරී මෘගයෝ වෙසෙත්. ඔවුන්ගේ වාලධියට චාමර යන නමක් පෘථිවියෙහි හටගත්තේය යනු භාවයි.

**ගනි**—ගන්-ගැනීමෙහි යන ධාතුයි. වත්මන්හි ඉ ප්‍රත්‍යයව ගනි යි සිඩයි.

## උපමාලංකාරයි.

11. සි හි ල් සපු සුවඳ ගෙන එන උයන්ව ල
සි හි ල් නෙලෙන් හඬවන මිණිකිකිණිකැ ල
වි පු ල් රත්සෙමෙර බඳ රන්දද සස ල
ළ ක ල් මෙපුර තුළ වළහා රිවිතැවු ල

11. උයන්වල, ගෘහොද්‍යානයන්හි; සිහිල්සපුසුවඳ, චන්‍දන චම්පක පුෂ්පයන්ගේ සුගන්‍ධය, ගෙන එන, ග්‍රහණය කොට එන් නාවූ; සිහිල්නෙලෙන්, ශීතමාරුතයෙන්; හඬවන, ශබ්ද පවත්

වන්නාවූ; මිණිකිකිණිකැල, මාණික්‍ය කිඞ්කිණිසමූහ ඇත්තාවූ; විපුල්, මහත්වූ; රත්සෙමෙර බඳ, රක්තවර්ණ චාමර බඳනාලද්දවූ; සසල, චපලවූ; රන්දද, ස්වර්ණ (පට්ට) ධ්වජතෙම; ළකල්, මනොඥවූ; මෙපුරතුළ, මේ පුරාභ්‍යන්තරයෙහි; රිවිතැවුල, සූර්‍ය්‍යසන්තාපය; වළහා, පහ කෙරේ.

මෙහි සඳුන්මල්සපුමල්සුවඳින් මිශ්‍රවූ මාරුතවර්ණිතාවෙන් හා රක්තචාමර රන්පතාකා වර්ණනාකිරීමෙන්ද වසන්තකාලයෙහි එ නුවර පවත්නාවූ මකරධ්වජපූජොත්සව දක්වූනු.

'රන්දද රිවිතැවුල වළහා'—යනු ක්‍රි: කා: පා: ස:

උ, වි—වළහා යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, **රන්දද** යනු උක්ත කර්තෘයි, **රිවිතැවුල** යනු අනුක්ත කර්මයි, **සසල විපුල් රත්සෙමර** බඳ යනුද **හඬවන මිණි කිකිණිකැල** යනුද කර්තෘවිශෙෂණයි, **ගෙන** යනු පූර්වක්‍රියායි, **එන** යනු කර්ම විශෙෂණයි, **සිහිල්නෙලෙන්** යනු අනුක්ත කරණයි, **සිහිල් සපු** සුවඳ යනු ඊට අනුක්ත කර්මයි, **උයන්වල** යනුද මෙපුරතුළ යනුද අනුක්තාධාරයි, **ළකල්** යනු මෙපුරතුළ යන ආධාරයට විශෙෂණයි—

**ස,** වි—සිහිල්ද සපුද=සිහිල් සපු, ඔවුන්ගේ සුවඳ=සිහිල් සපු සුවඳ, දරුත් සමස් ගැබ් විබත් සමස්; සිහිල් වූයේද එම නලවූයේද=සිහිල් නල, එයින්—සිහිල් නෙලෙන්, වෙසෙසුන් සමස්; මිණියෙන් කළ කිකිණි=මිණිකිකිණි, මිණිකිකිණින්ගේ කැල=මිණිකිකිණිකැල, හඬවන මිණිකිකිණි කැල යමකුගේද හෙතෙම=හඬවන මිණි කිකිණිකැල (මධ්‍යපද ලොපී) විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; රත්වූයේද එම සෙමෙර වූයේද=රත්සෙමෙර, විපුල්වූයේද එම රත්සෙමෙර වූයේද=විපුල් රත්සෙමෙර, බඳනාලද විපුල් රත්සෙමෙර යමෙක්හිද හෙතෙම=විපුල් රත්සෙමෙර බඳ, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; රතින් කළ දද=රන් දද, (මධ්‍යපද ලොපී) විබත් සමස්; ළයට කල්=ළකල්, මෙද එම පුරද=මෙපුර, ළකල් වූයේත් එම මෙපුර වූයේත් එම්නුයි=ළකල් මෙපුර, ළකල් මෙපුරෙහි ඇතුළ=ළකල් මෙපුර තුළ, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; රිවිහුගේ තැවුල්=රිවිතැවුල්, එය රිවිතැවුල, විබත් සමස්;

රන්දද—සුවර්ණ වර්ණ පට්ට වස්ත්‍රයෙන් කරනලද හෝ රන් කාසි වලින් විසිතුරු කරනලද ත්‍රිකොණ චතුෂ්කොණාදී ආකාරවූ ධජ 'රන්දද' නම්.

**වළහා**—'වලහ වැළැක්මෙහි' යන ධාතුයි. 'ආ' ප්‍රත්‍යයව සිඬයි,

ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

12. තර සර හිවි මහල් මෙහි පහපෙළ නිතො ර<br>
සුර සිදු විදුදරන් සැදි සඳලු මනහ ර<br>
කර වන මඟුල්කෙළියෙන් නොමැති අවස ර<br>
පුර සිරි බලනලෙස බට සුරවිමන් යු ර

12. මෙහි, මේ පුරයෙහි; තරසර, සපිරසාරවූ; හිවි, උස්වූ; මහල්, ත්‍රිභූමිකා පච භූමිකාදීන් යුක්තවූ; පහපෙළ, ප්‍රාසාදපඞ්ක්ති යෙහි; නිතොර, නිරන්තරයෙන්; සුරසිදුවිදුදරන්, දෙව සිඬ විද්‍යාධර (ප්‍රතිමා) රූප යෙන්, සැදි, සැරහී සිටියාවූ; මනහර, මනොඥවූ; සඳලු, චන්ද්‍රශාලාවෝ; කරවන, (සන්තුෂ්ටවූ නාගරික ජනයන් විසින්) කායඝිමාණවූ; මඟුල්කෙළියෙන්, මඞ්ගලොත්සව ක්‍රීඩායෙන්; අවසර නොමැති, අවකාශයක් නැත්තාවූ; පුරසිරි, පුරශ්‍රීසමෘඬිය; බලනලෙස, නිරීක්ෂණය කරන පරිද්දෙන්; බට, (ආකාශයෙන් භූමියට) අවතීර්ණවූ; සුරවිමන් යුර, දෙවවිමානයන් හා සමාන වන්නාහුයි.

**'පහපෙළ සුරවිමන් යුර වෙත්'**—නොහොත්<br>
**'සඳලු සුර විමන් යුර වෙත්'**—යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි,—වෙත්** යනු වත්මන් අන්කරු බුහුබස් අකම්කිරියයි, **සහපෙළ** යනු උක්ත කතෘයි, **තරසර හිවි මහල්** යනුද **සැදි සඳලු මනහර** යනුද කතෘ විශෙෂණයි, **මෙහි** යනු අනුක්තා ධාරයි, **නිතොර** යනු ක්‍රියා විශෙෂණයි, **සුරසිදු විදුදරන්** යනු අනුක්ත කරණයි, **සුර විමන්** යනු උපමා විකෘති කතෘයි, **යුර** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, **බට** යනු ඊට විශෙෂණයි, **බලනලෙස** යනු අනුක්ත කරණයි, **පුරසිරි** යනු බලන යන අපික්‍රියාවට අනුක්තකර්මයි, **නොමැති** යනු කර්ම විශෙෂණයි; **අවසර** යනු නොමැති යන ක්‍රියාවට අනුක්ත කර්මයි; **කරවන මඟුල් කෙළියෙන්** යනු අනුක්ත කරණයි;

### සඳලු කතෘවූ පක්ෂයෙහි

**සඳලු** යනු උක්තකතෘයි; **සැදි** යනුද **මනහර** යනුද කතෘ විශෙෂණයි; **සුරසිදු විදුදරන්** යනු අනුක්ත කරණයි; **නිතොර** යනු ක්‍රියා විශෙෂණයි, **පහපෙළ** යනු අනුක්තාධාරයි; **තරසරහිවි මහල්** යනු ආධාර විශෙෂණයි; **මෙහි** යනු නගරාපෙක්ෂායෙහි අනුක්තාධාරයි;

**ස, වි**—තරද සරද හිවිද=තරසරහිවි, තරසරහිවි මහල් යම කුගේද හෙතෙම=තරසරහිවිමහල්, ද්වරූත් සමස් ගැබි අන් අරුත් සමස්; පහයන්ගේ පෙළ=පහපෙළ, විබත් සමස්; තොර

තොවුයේ=නිතොර, පඅෑ සමස්; විදුදරනුයේ=විදුදර, උපපද සමස්; (විදුශබ්දෙපපද දර දරීමෙහි යන ධාතුයි.) සුරහුද සිදුහුද විදුදරහුද=සුරසිදුවිදුදරෝ, ඔවුන් (කරණකොටගෙන) සුරසිදු විදුදරන්, දරැත් සමස්; සඳයේ අලු යමෙක්හිද ඒ=සඳලු, සැදිද එම සඳලුද=සැදිසඳලු, මනහරනේ=මනහර, (මන ශබ්දෙපපද හර හැරීමෙහි යන ධාතුයි.) සැදිසඳලුයෙන් මනහර=සැදිසඳලු මනහර, අන්අරුත්සමස් වෙසෙසුන් සමස් උපපද සමස් ගැබි විබත් සමස්; මඟුල් පිණිස කෙළි=මඟුල්කෙළි, කරවන්නේද එම මඟුල් කෙළිද=කරවන මඟුල්කෙළි, එයින්-කරවන මඟුල් කෙළියෙන්, විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්; නොම ඇතියේ=නොමැති, පඅෑ සමස්; පුරෙහි සිරි=පුරසිරි. විබත් සමස්; බැලිමෙහි ලෙස=බලනලෙස, විබත් සමස්; සුරන්ගේ විමන්=සුරවිමන්, සුර විමන්හි අයුර=සුරවිමන්යුර, විබත් සමස් ගැබි විබත් සමස්; (නොහොත්) සුරවිමන්ගේ අයුර යමකුන්ගේද ඔවුහු=සුරවිමන් යුර, අන් අරුත් සමස්;

**විදුදර**—මන්ත්‍ර ශාස්ත්‍රාදි විද්‍යාවන් ධරන හෙයින් විද්‍යාධර නම්වූ දෙව විශේෂයකි.

"විද්‍යාධරෙසවරාසෙතතු ඛෙ චරාඃ කාමචාරිණඃ"

යනු දක්වූ හෙයින් මොව්හු මන්ත්‍රාදි බලයෙන් කැමතිසේ අහස්හි හැසිරෙන දෙවියන් වැනි එක්ලෙසකින් බලසම්පන්නවූ ඛෙචර (අහස්හි හැසිරෙන) කොටසකි.

**සඳලු**—ප්‍රාසාදයන්ගේ උඩුබිම් භාගයෙහි විශේෂයෙන් ග්‍රීෂ්මකාලයෙහි හා අන්‍ය කාලයන්හිත් චන්ද්‍රාලොක සුඛය පිණිස චන්ද්‍රාලොක ස්පර්ශය ඇතිවන පරිද්දෙන් කරන ගෘහාඞ්ග විශේෂය සඳලු (චන්ද්‍රිකා ශාලා) නම් වේ.

**සුරවිමන්**—ඒ ඒ දෙවියන්ගේ පුණ්‍යමහත්වයේ ප්‍රමාණයට පහලවන්නාවූ ඔවුන්ගේ වාසභවනයෝ සුරවිමන් නම් වෙත්.

## උපමාලඞ්කාරයි.

13 සි සි වන වුවන ඉහසුහ ගතහැකි මිටි න
නිසි පුළුලුකුළ රියසකයුරු තිසර ත න
දි සි රනලියෙව් රූසිරියුත් මෙපුරඟ න
ඇසි පිය නෙළන පමණින් නොවෙති දෙවඟ න

13. සිසිවන, චන්ද්‍රයාට බඳුවූ; වුවන, මුඛ ඇත්තාවූ; මිටින ගතහැකි, මුෂ්ටිග්‍රහණය කළහැක්කාවූ; ඉහසුහ, කෘශවූ මධ්‍ය ප්‍රදෙශ ඇත්තාවූ; රියසකයුරු, රථචක්‍රාකාරවූ; නිසි, (අභිලාෂ කිරීමට) යොග්‍යවූ; පුළුලුකුළ, පෘථුලවූ ශ්‍රොණිභාග ඇත්තාවූ; තිසරතන, හංසයන්ට බඳුවූ පයොධරයුග්මයන් ඇත්තාවූ; රන ලියෙව්, ස්වර්ණලතාවන් මෙන්; දිසි, දෘශ්‍යමානවූ; රූසිරින් යුත්,

රූපශ්‍රීයෙන් යුක්තවූ; මෙපුරඟන, මේ පුරස්ත්‍රීහු; ඇසිපිය හෙළන පමණින්; අක්ෂිපක්ෂමස්පන්දනය කරන මාත්‍රයෙකින්; දෙවඟන නො වෙති, දිව්‍යස්ත්‍රීහු නො වෙත්; (සෙසු රූපවිලාසයෙන් දිව්‍ය ස්ත්‍රීන් හා සමානයහ යනු භාවයි).

**'මෙපුරඟන දෙවඟන නොවෙති'**-යනු, ක්‍රි: කා: ප: ස:

**නොවෙති** යනු මිත්මන් අන්කරු බුහුබස් කතුකිරියයි; **මෙපුරඟන** යනු උක්ත ප්‍රකෘති කර්තෘයි; **දෙවඟන** යනු උක්ත විකෘති කර්තෘයි; **සිසිවන වුවන** යනුද **ඉඟසුඟ** යනුද **නිසිපුළුලුකුල** යනුද **තිසරතන** යනුද **රනලිය** යනුද **දිසි** යනුද **රූසිරියුත්** යනුද ප්‍රකෘති කර්තෘවිශේෂණයි; **එව්** යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි. **ගතහැකි** යනු අසම්භාව්‍යක්‍රියායි, **මිපින** යනු ගතහැකි යන අසම්භාව්‍ය ක්‍රියාවට අනුක්ත කරණයි; **රියසකයුරු** යනු පුළුලුකුල යන්නට විශේෂණයි; **ඇසිපියහෙළන පමණින්** යනු අනුක්තකරණයි;—

**ස - වි,** සිසි හා වන=සිසිවන, සිසිවන වුවන යමකුගේද ඔහු=සිසිවන වුවන, විබත් සමස් ගැබ් අන්අරුත් සමස්; සුනවු ඉඟ යමකුගේද ඔහු=ඉඟසුඟ, අන් අරුත් සමස්; පුළුල්වූයේද එම උකුල වූයේද=පුළුලුකුල, නිසිවූ පුළුලුකුල යමකුගේද ඔහු= නිසි පුළුලුකුල, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; රියෙහි සක්=රියසක්, රියසක්හුගේ අයුරු යමකගේද හෙතෙම= රියසකයුරු, විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; රන්වූවානුද ඔහු ලියවූවානුද=රනලිය, වෙසෙසුන් සමස්; රුවගේ සිරි=රූසිරි, රූසිරින් යුත්=රූසිරියුත්, විබත්සමස් ගැබ් විබත්සමස්; මෙද එම පුරද=මෙපුර, මෙපුරෙහි අඟන=මෙපුරඟන, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; ඇස්වල පිය=ඇසිපිය, හෙළීමේ පමණ= හෙළනපමණ, ඇසිපියන්ගේ හෙළන පමණ=ඇසිපිය හෙළන පමණ-ඉන් ඇසිපිය හෙළන පමණින්, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්, දෙවියන්ගේ අඟන=දෙවඟන, විබත් සමස්;

**ඇසිපිය හෙළන පමණින් නොවෙත් දෙවඟන**--දිව්‍ය ස්ත්‍රීහු අමනුෂ්‍යයෝ අක්ෂිපක්ෂම ස්පන්දනය (ඇසිපිය හෙළීම) වුවමනා නොකරත්. ඔවුහු මනුෂ්‍යයන් මෙන් පෙනී සිටින අවස්ථාවලදී පවා ඔවුන් ඇඳිනගැනීමට ඇති එක් කාරණයක් මෙය වේ.

ජයවර්ධනපුරයෙහි වාසයකරන ස්ත්‍රීහු සියලු රූපලාවණ්‍යයන්ගෙන් දෙවඟනන් වැනි වුවාහුය, දෙවඟනන්ට වඩා ඔවුන්ගේ විද්‍යමාන වෙනස නම් ඇසිපිය හෙළීම පමණයයි මෙයින් විශේෂණය කෙරෙයි.

## විශේෂාලඞ්කාරයි.

එයින් කීහ.

"සදෘශාත්‍යාඃ සදෘශ වස්තුනෝ යේන කෙනාපි හෙතුනා
ව්‍යාවර්තක විශේෂස්‍ය ස්ඵුරණෙ ස්‍යාද් විශේෂකඃ" යි

යම්කිසි හේතුවකින් සමාන වස්තූන් දෙදෙනකුන්ගේ වෙනස හඟවන්නාවූ විශේෂයාගේ ප්‍රකාශීභාවයෙහි විශේෂක නම් අලඞ්කාරය වේ.

14\. සො ඳු රු  සිය නදන් අනතුරු දෙස සිටි  න
කි නු රු  නිස සරන් කදහස වෙත නොව  න
ඉ සු රු  දනද සිය නිකෙලෙස් තැන රඳ  න
උ තු රු  දිගිඳු පුර දිනි මෙපුර වැජඹෙ  න

14\. සොඳුරුසියදනන්– (අලකාපුරය මෙන් නවනිධාන පමණක් නොවී) සොඳුරු, සුන්දරවූ; සියනදන්, සියගණන් නිධාන ඇත්තාවූ; නොහොත්–සොඳුරු, මිතොඳුවූ; සිය, සව පක්ෂයන්ම; නදන්, නන්දනියවූ; අනතුරුදෙස සිටින– (අලකා පුරය මෙන් උත්තර දිශායෙහි නො පිහිටා) අනතුරුදෙස, තම හට ඉතිරියක්නු නැත්තාවූ දික්හි නොහොත් දක්ෂිණදිශායෙහි; සිටින, ස්ථිතිය කරන්නාවූ; කිනුරුනිසසරන්–(අලකාපුරය මෙන් අශ්වමුඛාදි කින්නරයන් හා යක්ෂයන් ආසන්න නො වී) කදහස, කිසිකාලයෙකත්; කිනුරු, කුත්සිතනරයන් හා; නිසසරන්, චෞරයන්; වෙත නො වන, සමීප නො වන්නාවූ; නිකෙලෙස් තැන— (අලකාපුරය මෙන් එකර්ශවරයක්හු එකධනයක්හු කෛලාසස්ථානයෙහි සේ වාසයනොකොට); නිකෙලෙස් තැන, නිඃකලශස්ථානයෙහි හෙවත් බාධාවක් නැත්තාවූ ස්ථානයෙහි; ඉසුරුදනදසිය, සියගණන් ඊශ්වරයන් හා සියගණන් ධනදයන්; රඳන, සචාරය කරන්නාවූ; වැජඹෙන, විජෘම්භමාණවූ; මෙපුර, මේ පුරයතෙම, උතුරුදිගිඳුපුර, උත්තරදිශාධිපතිවූ වෙසවුණු මහරජහුගේ අලකා නම් රාජධානිය; දිනි, ජයගත්තේයි.

'මෙපුර උතුරු දිගිඳුපුර දිනි'—යනු ක්‍රි: කා: ප: ස:

උ—වි, දිනි යනු අයුකල් අන්කරු එකබස් කතුකිරියයි, මෙපුර යනු උක්ත කර්තෘයි, උතුරු දිගිඳුපුර යනු අනුක්ත කර්මයි, සොඳුරු සියනදන් යනුද සිටින යනුද වෙත නොවන යනුද රඳන යනුද වැජඹෙන යනුද කර්තෘ විශේෂණයි, ඉසුරු දනද සිය යනු රඳන යන ක්‍රියාවට කර්මයි, නිකෙලෙස් තැන යනු අනුක්තාධාරයි, කිනුරුනිසසරන් යනු අනුක්තකරණයි, කදහස යනු කාලාර්ථයෙහි අව්‍යයයි, අනතුරුදෙස යනු අනුක්තාධාරයි;

**ස.--වි,** සියගණන් වූවාහුද ඔහු නදන් වූවාහුද=සියනදන්, සොඳුරුවූ සියනදන් යමෙක්හිද හෙතෙම=සොඳුරු සියනදන්, වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත්සමස්; උතුරු නොවන්නේ= අනතුරු, අනතුරු වූයේද එම දෙස වූයේද=අනතුරු දෙස, වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්; නිසසරනුවෝ= නිසසර, උපපද සමස්; නිදිලද නර=කිනුරු; අවිය සමස්; කිනුරුද නිසසරහුද=කිනුරු නිසසරෝ, ඔවුන් — කිනුරු නිසසරන්, දරුත් සමස්; වෙත්හි නොවනුයේ=වෙත නොවන, විබත් සමස්; දන දෙනුයේ=දනද, උපපද සමස්; ඉසුරුද දනදහුද=ඉසුරුදනද, සිය ගණන් ඉසුරු දනද යමෙක්හිද හෙතෙම=ඉසුරු දනද සිය, දරුත් සමස් ගැබ් අන් අරුත් සමස්; කෙලෙස් නැතියේ=නිකෙලෙස්, නිකෙලෙස්ද එම තැන්ද=නිකෙලෙස් තැන්, එහි-නිකෙලෙස් තැනැ, අන් අරුත් සමස් ගැබ් වෙසෙසුන්සමස්; උතුරුද එම දිග්ද=උතුරු දිග්, උතුරු දිගට ඉඳු=උතුරුදිගිඳු, උතුරු දිගිඳුගේ පුර=උතුරු දිගිඳු පුර, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; මේද එම පුරද=මෙපුර, වෙසෙසුන් සමස්;—

**කිනුරු**—කින්නර ශබ්දයෙන් සිත්නයි. පුලස්ති ඍෂිහුගේ පුත්‍රයෝයයි කියනු ලැබෙත්.

එයින් කීහ. මහාභාරතයෙහි:-

“රාක්ෂසාශ්ච පුලස්ත්‍යස්‍ය වානරාඃ කින්නරාස්තථා
යක්ෂාශ්ච මනුජව්‍යාඝ්‍ර! පුත්‍රාස්තස්‍යච ධීමතඃ” යි

මොවුහු වනාහි ගීතවාද්‍යයන්හි ඉතා සමර්ථයන් බවත් ඉතා මිහිරි සවර ඇත්තවුන් බවත් සවර්ගයෙහි ගන්ධර්වයන්සේම ප්‍රසිද්ධවූ ගායක පක්ෂයක් බවත් වෛශ්‍රවණ දිව්‍ය රාජයා සෙවනය කරමින් කෛලාස පර්වතයෙහි පිහිටි ආලකමන්ද රාජධානියෙහි වාසය කරන දෙවගොහි භේදයක් බවත් විස්තාර වර්ණනාවන්හි දක්වා තිබේ. මොවුහු අශ්ව ශරීරයෙන් හා මනුෂ්‍ය මුඛයෙන් යුක්තවූ පක්ෂයකින්ද මනුෂ්‍ය ශරීරයෙන් හා අශ්ව මුඛයෙකින් යුක්තවූ පක්ෂයකින්ද යන දෙපක්ෂයෙන් යුක්තවූවාහු වෙත්.

**නිසසරන්**—නිශාචර ශබ්දයෙන් සිත්නයි;

**කඳහස**—පාලි ‘කාදම්’ යන අව්‍යය පදයෙන් සිත්නයි;

**උතුරු දිගිඳුපුර**—උතුරු දිගිඳුවූයේ කුවෙර තෙමේයි, මොහු වනාහි විකෘතාකාරවූ ශරීරයකින්ද පාදත්‍රයකින්ද දත් අටකින්ද මහත් කයකින්ද ස්ථූල සිසකින්ද මහත්වූ හනුවකින්ද යුක්තවූවෙකි. මෙසේ විකෘත ශරීරයකින් යුක්තවූ හියා කුවෙරයයි කියත්. එයින් කීහ.-

"ජ්‍යෙෂ්ඨං වෛශ්‍රවණං යක්ෂ සුරූපං දෙවවර්ණිනි
ත්‍රිපාදං සුවිභාකායං ස්ථූලශීර්ෂං මහාහනුම්
අෂ්ටදංෂ්ට්‍රං හරිශ්මශ්‍රුං ශඞ්කුකර්ණං විලෝහිතම්
පිඞ්ගලං නාම සන්දෘෂ්ට්‍ය පිතා තස්‍යාබ්‍රවීත් තතඃ
කුත්සායාං ක්ෂිතු ශබ්දශ්ච ශරීරං බෙරමුච්‍යතෙ
කුශරීරත්වාච්ච නාම්නා තෙන වෛ ස කුබෙරකඃ" යි

විසාණා නම් රාජධානියෙහි අධිපති හෙයින් වෛශ්‍රවණයයි ව්‍යවහාර කරන බැව් ආටානාටිය සූත්‍රයෙහි—"කුවෙරස්ස බො පන මාරිස මහා රාජස්ස විසාණා නාම රාජධානි තස්මා කුවෙරො මහාරජා වෙස්සවණොති පවුච්චති" යනුවෙන් දක්වා තිබේ. විශ්‍රවස්නුගේ පුත්‍ර හෙයින් වෛශ්‍රවණයයි පුරාණයන්හි කියන ලදී. මොහු යක්ෂයන්ගේ රජය. කින්නරයන්ගේ අධිපතිය. සතරවරම් රජදරුවන්ගෙන් කෙනෙකි. මොහුගේ පුරය ආලකමන්ද රාජධානියයි. ආලකමන්ද රාජධානිය කෛලාසකූටයෙහි පිහිටා තිබෙන්නාවූ සමෘද්ධිමත් රාජධානියකි. 'මහාපද්ම පද්ම ශඞ්ඛ මකර කච්ඡප මුකුන්ද කුන්ද නීල වර' යන නවනිධානයක් ඇති හෙයින් මේ පුරය ධනසම්පත්තියෙන් ආඪ්‍යවූවකි.

පූර්වෝක්ත නවනිධානයන් ඇති අලකාපුරය සියගණන් නිධානයන් ඇති ජයවඩන පුරයට අඩුතරව වී යනු මෙහි නිෂ්කර්ෂයි.

## ශ්ලේෂාලඞ්කාරයි.

### එහි ලක්ෂණ

"ශ්ලිෂ්ට මිෂ්ට මනෙකාර්ථ මෙකරූපාන්විතං වචඃ
තදභින්නපදං භින්නපදප්‍රාය මිතිද්විධා"

යන්නෙන් කියනලදී. නොයෙක් අර්ථ ඇති එකශබ්ද ස්වරූපයෙන් යුක්තවූ වචනය ශ්ලේෂයයි කැමතිවනලදී. හේ වනාහි අභින්නපදය භින්නපදයයි දෙවැදෑරුම් වේ යනු භාවයි.

15. උ දේ සැපත් සුරගුරු අලුකර අව ට
ස දේ මුදුන් පත අස්විද නැකතැ සි ට
න දේ සිහින් තම කුල දෙවිය සිහි කො ට
යෙ දේ ගමන් යහළුව මෙපුරෙන් තොප ට

15. සුරගුරු, බෘහස්පතීන්; අවට, හාත්පසින්; අලුකැරු, ආලෝක කොට; උදේසැපත්, උදාවීමට පැමිණිකල්හි; අස්විද නැකතැ, අශ්විනීනක්ෂත්‍රයෙහි; සිට, අවස්ථිතවැ; සදේ මුදුන් පත, චන්ද්‍රයා (නභො) මධ්‍යයට පැමිණිකල්හි; නදේසිහින්, සනොභාෂ චින්තනයෙන්; තම්කුලදෙවිය, තමාගේ කුලදෙවතාවා; සිහිකොට, ස්මරණය කොට හෙවත් තුනුරුවන් සිහිකොට; යහළුව, මිත්‍රය; තොපට, භවත්හට; මෙපුරෙන්, මේ පුරයෙන්; ගමන් යෙදේ; ගමනාරම්භය යුක්ත වන්නේයි.

'ගමන් යෙදේ'—යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—සෙදේ යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, ගමන් යනු උක්ත කර්තෘයි, මෙපුරෙන් යනු අනුක්තාපාදානයි; නොපමා යනු අනුක්ත සම්බන්ධයි, සහළුව යනු ආමන්ත්‍රණයි; සිහිකොට යනු සොපපද පූර්ව ක්‍රියායි; නමකුලදෙවිය යනු ඊට අනුක්ත කර්මයි; නදේසිනින් යනු අනුක්ත කරණයි, පත යනු කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියායි, මුදුන් යනු එයට කර්මයි, සදේ යනු පත යන කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවට කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබති, සිට යනු පූර්ව ක්‍රියායි, අස්විද නැකතැ යනු අනුක්තාධාරයි, සැපත් යනු කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියායි; සුරගුරු යනු එයට විශේෂණ හෙයින් අදර අරුතැ කම් විබති, උදේ යනු එයට අනුක්ත කර්මයි, අලුකැරැ යනු සොපපද පූර්ව ක්‍රියායි, අවට යනු ඊට අනුක්ත කර්මයි,

**ස, වි**—සුරනම ගුරු=සුරගුරු, විබත් සමස්; කුලෙහි දෙවි=කුලදෙවි, විබත් සමස්; යහ (මනා) ළ (හද) නමක් හුයේද හෙතෙම=සහළු, අන් අරුත් සමස්; මෙද එම පුරද=මෙපුර, එන්-මෙපුරෙන්, වෙසෙසුන් සමස්;

**අස්විද නැකතැ**—අශ්විනී නක්ෂත්‍රය නම් චන්ද්‍රයාගේ භාර්යාවූ නක්ෂත්‍රයයි. **"ඝොටකමුඛාකෘති තාරාත්‍රයාත්මකං"** යනු දක්වූ හෙයින් අශ්වමුඛාකාරව තාරකා තුනකින් යුක්තවූයේ අශ්විනී නක්ෂත්‍රයයි. අශ්වාරූඪ පුරුෂයකු දෙවතා කොට පවත්නේය.

අස්විද නැකත මුදුන්පත්වූ කල කටක ලග්නය සම්භවවීමද ඒ ලග්නයෙහි සිටි බෘහස්පතිහු උච්චක්ෂේත්‍රගතව රශ්මි සහිතව බලවත් බව දක්වීමෙන් "ලග්නස්ථඃ සර්වදෝෂඝ්නඃ" යන නිර්දෝෂභාවය යෙදීමද.

"සන්ධ්‍යාකාලමතික්‍රම්‍ය කිඤ්චිද්දෘශ්‍යයානි තාරකාඃ
යොගො'යං විජයො නාම සර්වකාර්‍ය සුපූජිතඃ"

යන විජයයොගය යෙදීමද **'අශ්විනී ගමනෙ ශ්‍රේෂ්ඨා'** යන නක්ෂත්‍රයොගය යෙදීමද මෙයින් දක්වූහු.

## ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

ඉක්බිති සුබනිමිති දක්වන්නාහු "තල මුදු සුවඳ" යනාදි කීහු,

16. ත ල මුදු සුවඳ පිරි කුඹු මිහුරු අඹ ගෙ ඩි
පු ල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙ ඩි
ස ල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොද වැ ඩි
බ ල සුබ නිමිති පෙරමඟ නැකතටත් වැ ඩි.

16. සුවඳ, සුගන්ධයෙන් යුක්තවූ; මුදු, මොළොක්වූ; නල, (අනුකූල) මාරුතය ද; පිරිකුඹු, පූර්ණකුම්භයන් ද; මියුරු, මධුර යන් ද; නොහොත්-මියුරු, මධුරවූ; අඹගෙඩි, ආම්‍රඵල ද; පුල, ප්‍රඵුල්ලවූ; හෙළකුසුම්, (ජාතිමාලත්‍යාදිවූ) ශ්වේතපුෂ්පයන් ද; පිය තෙපල, ප්‍රියවචන කියන්නාවූ; ලිය, ස්ත්‍රීන් ද; රන්කෙඬි, (ජල හරිතවූ) ස්වර්ණභිඞ්කාර ද; සල, විද්‍යමානවූ හෙවත් සලනු ලබන්නාවූ; සුදුසෙමෙර, ශ්වේතචාමර ද; සේසත්, ශ්වේතච්ඡත්‍ර යන් ද; ඔදවැඩි, ඔජසින් අධිකවූ; ගිජිඳුන්, හස්තීන් ද (යන); පෙරමඟ, ප්‍රතිපථයෙහි; නැකතටත් වැඩි, නක්ෂත්‍රයොගයටත් වඩා (විශිෂ්ට)වූ; සුබනිමිති, ශුභනිමිත්තයන්; බල, නිරීක්ෂණය කර.

'තෝ සුබ නිමිති බල'—යනු ක්‍රි: කා: ප: ස:

ව, වි—බල යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, සුබ නිමිති යනු අනුක්ත කර්මයි, වැඩි යනු කර්ම විශෙෂණයි, නැකතට යනු අවදි අරුත්හි සබඳ විබත්, ත් යනු උක්තකර්මාර්ථයෙහි අව්‍යයයි, පෙරමඟ යනු අනුක්තාධාරයි, නල යනුද පිරිකුඹු යනුද අඹගෙඩි යනුද කුසුම යනුද ලිය යනුද රන් කෙඬි යනුද සෙමෙර යනුද සේසත් යනුද ගිජිඳුන් යනුද කර්ම විශෙෂණයි, මුදුසුවඳ යනු නල යන්නට විශෙෂණයි, මියුරු යනු අඹගෙඩි යන්නට විශෙෂණයි, සල යනුද සුදු යනුද සෙමෙර යන්නට විශෙෂණයි, පුල හෙළ යනු කුසුම යන්නට විශෙෂණයි, පිය තෙපල යනු ලිය යන්නට විශෙෂණයි, ඔදවැඩි යනු ගිජිඳුන් යන්නට විශෙෂණයි,

ස, වි—පිරිද එම කුඹුද=පිරිකුඹු, වෙසෙසුන් සමස්; අඹද එම ගෙඩිද=අඹගෙඩි, වෙසෙසුන් සමස්; පියවූ තෙපුල් යමක ගේද ඕතොමෝ පිය තෙපල, අන් අරුත් සමස්; රනින් කළ කෙඬි=රන්කෙඬි, විබත් සමස්; සුදු වූයේද එම සෙමෙර වූයේද= සුදුසෙමෙර, සලවූයේත් එම සුදුසෙමෙර වූයේත් එමනුයි=සල සුදු සෙමෙර; වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්; සේද එම සත්ද=සේසත්, වෙසෙසුන් සමස්; ගජනට ඉඳු=ගිජිඳු, ඔවුන්-ගිජිඳුන්, විබත් සමස්; වැඩිවූ ඔද යමකුගේද ඕහු=ඔදවැඩි, අන් අරුත් සමස්; සුබවූයේද එම නිමිති වූයේද=සුබනිමිති, වෙසෙසුන් සමස්; පෙරෙහි මඟ=පෙරමඟ, විබත් සමස්;

"බලසුබනිමිති පෙරමඟ නැකතටත් වැඩි" යනුයෙන් "නක්ෂත්‍රාවජකුනං වරම්" යන සෘෂිවාක්‍යය දක්වූහු.

බල—බල-බැලීමෙහි යන ධාතුයි, විධ්‍යර්ථයෙහි අ ප්‍රත්‍යය හා ප්‍රත්‍යය ලොපයෙන් සිද්ධයි;

## ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

ඉක්බිති ශ්‍රී දන්තධාතූන් වහන්සේට නමස්කාර දක්වන්නානු "ලොව විහිදු" යනාදිකීනු.

17. ලො වැ වි හි දු  සුදු පැහැ සඳ රැසෙව් සැ  දි
දෙ න නොම ඳු  සිරිසග මොක් සැප නිසැ  දි
ල ද මු නි ඳු  දම් කඳ පහස මන බැ  ඳි
ව ඳු ද ළ ඳු  හිමි තෙමහල් පහය රැ  ඳි

17. සඳරැසෙව්, චන්ද්‍රරශ්මියක් මෙන්; සැදි, සජ්ජිතවූ; සුදු පැහැ, අවදාතරශ්මීන්; ලොවැ, ලොකයෙහි; විහිදු, ව්‍යාප්ත කොට; නිසැදි, නිරන්තරයෙන්; නොමඳු, අනල්පවූ; සගසිරි, ස්වර්ගලොකයෙහි ඓශ්වර්‍ය්‍ය ද; මොක්සැප, මොක්ෂසෞඛ්‍යය ද; දෙන, දානය කරන්නාවූ; මුනිඳු, මුනීන්ද්‍රයාණන්වහන්සේගේ; මනබැඳි, මනොබද්ධවූ; දම්කඳ, සුවාසූදහසක් ධර්මස්කන්ධයාගේ; පහස ලද, ස්පර්ශය ලද්දාවූ; තෙමහල්පහය රැඳි, ත්‍රෛභූමිකප්‍රාසාදයෙහි පිහිටියාවූ; දළදුහිමි, ශ්‍රීදන්තධාතුස්වාමින්වහන්සේට; වඳු, නමස්කාර කර.

'තෝ දළඳු හිමි වඳු'—යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වඳු යනු විධි කිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, දළඳු හිමි යනු අනුක්ත කර්මයි, රැඳි යනුද ලද යනුද දෙන යනුද සැදි යනුද කර්ම විශෙෂණයි, තෙමහල් පහය යනු අනුක්තාධාරයි, පහස යනු ලද යන අතීත ක්‍රියාවට අනුක්ත කර්මයි, දම්කඳ යනු සම්බන්ධයි, මනබැඳි යනු තද්විශෙෂණයි, මුනිඳු යනු අනුක්ත සම්බන්ධයි, සිරි සග මොක් සැප යනු දෙන යන අතීත ක්‍රියාවට අනුක්ත කර්මයි, නිසැදි යනු ක්‍රියා විශෙෂණයි, නොමඳු යනු සිරි සග යන්නට විශෙෂණයි, විහිදු යනු පූර්ව ක්‍රියායි, සුදු පැහැ යනු ඊට අනුක්ත කර්මයි, සඳරැස් යනු උපමා කර්ම විශෙෂණයි, එව් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, ලොවැ යනු අනුක්තාධාරයි,

ස, වි—සුදුවූයේද එම පැහැවූයේද=සුදු පැහැ, වෙසෙසුන් සමස්; සඳගේ රැස්=සඳරැස්, විබත් සමස්; මඳනොවූයේ=නොමඳ, ප ඇ සමස්; සගෙහි සිරි=සිරි සග, විබත් සමස්; මොක්හි සැප=මොක්සැප, විබත් සමස්; මුනින්ට ඉඳු=මුනිඳු, ඔහුගේ-මුනිඳු, විබත් සමස්; දහමගේ කඳ=කම්කඳ, විබත් සමස්; දම්කඳෙහි

පහස=දම්කද පහස, විබත් සමස්; මෙනෙහි බැඳි=මනබැඳි, විබත් සමස්; දළවූවාද ඔම දවූවාද=දළඳ, දළඳ වූවාද එම හිමිවූයේද=දළඳහිමි, වෙසෙසුන් සමස් ගැබි වෙසෙසුන් සමස්; මහල් තුනක් එක්කොට සලකන ලද්දේ=තෙමහල්, තෙමහලින් යුතු පහය=තෙමහල් පහය, වෙසෙසුන් සමස් ගැබි විබත් සමස්;

වදු—'වද. වැඳීමෙහි' යන ධාතුවෙන් පරව උ ප්‍රත්‍යයව සිඬයි,

**සවභාවොක්ත්‍ය ලඞකාරයි.**

ඉක්බිත්තෙන් රාජගෘහ ප්‍රවේශයට හා රාජ දර්ශනාදියට නියොග කරන්නාහු "ගනරන් කොතින්" යනාදි කීහු.

13 ගනරන් කොතින් දිළිහෙන මිණිරුස් විහි දු
පවනින් ලෙළෙන පල අග මුතු ලැල් සිනි දු
සඳකැන් මිණෙන් බඳ යුතු බිතු පෙළින් රැ දු
එතනින් ගොසින් සැණෙකින් රජ විමන් ව දු

13. විහිදු, ව්‍යාප්ත කරනලද; මිණිරුස්, මාණික්‍යරශ්මි ඇත්තාවූ; ගනරන්කොතින්, ඝනකනක ශෘඞගයෙන්; දිළිහෙන, දීප්‍යමානවූ; පලඅග, ඡදනාග්‍රයෙහි; පවනින් ලෙළෙන, මාරුතයෙන් චලවන්නාවූ; සිනිදු, සනිඝවූ; මුතුලැල්, මුක්තාලතිකා ඇත්තාවූ; සඳකැන්මිණෙන්, චන්ද්‍රකාන්තපාෂාණයෙන්; බඳ, බඳනාලද්දවූ; රුදු, මහත්වූ; බිතුපෙළින් යුතු, භිත්තිපඞක්තියෙන් යුක්තවූ; රජවිමන්, රාජවිමානයට; එතනින් ගොසින්, ඒ ධාතුමන්දිරයෙන් ගොස්; සැණෙකින්, ක්ෂණයෙකින්; වදු, ප්‍රවෙශ වව.

**'තෝ රජ විමන් වදු'** යනු ක්‍රි: කා; ප: ස:

**උ, වි—වදු** යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **රජ විමන්** යනු අනුක්ත කර්මයි, **දිළිහෙන** යනුද **මුතුලැල්** යනුද **යුතු** යනුද කර්ම විශෙෂණයි; **ගනරන් කොතින්** යනු දිළිහෙන යන අප්‍ර ක්‍රියාවට අනුක්ත කරණයි, **මිණිරුස් විහිදු** යනු කරණ විශෙෂණයි, **ලෙළෙන** යනුද **සිනිදු** යනුද මුතුලැල් යන්නට විශෙෂණයි, **පවනින්** යනු ලෙළෙන යන අප්‍ර ක්‍රියාවට අනුක්ත කරණයි, **පලඅග** යනු අනුක්තාධාරයි, **බිතුපෙළින්** යනු යුතු යන අප්‍රක්‍රියාවට අනුක්ත කරණයි, **රුදු** යනුද **බඳ** යනුද කරණ විශෙෂණයි, **සඳකැන් මිණෙන්** යනු බඳ යන අප්‍රක්‍රියාවට අනුක්ත කරණයි, **සැණෙකින්** යනු ක්‍රියා විශෙෂණයෙහි කරණ විබත්, **ගොසින්** යනු පූර්ව ක්‍රියායි, **එතනින්** යනු අනුක්තාපාදනයි.

**ස වි,**—ගනවූයේද එම රන්වූයේද=ඝනරන්, ඝනරනින් කළ කොත්=ඝනරන් කොත්, එයින්-ඝනරන් කොතින්, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; මිණින්ගේ රුස්=මිණිරුස්, විබත් සමස්; පලයෙහි අග=පල අග, විබත් සමස්; මුතුයෙන් කළ ලැල්=මුතු ලැල්, මුතුලැල් වූවාද ඔම සිනිඳු වූයේද=මුතුලැල් සිනිඳු, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; සඳ කැමැති වේනුයි=සඳකැන්, සඳකැන්ද එම මිණද=සඳකැන් මිණ, එන්-සඳකැන් මිණෙන්, උපපද සමස් ගැබ් වෙසෙසුන් සමස්; බිතුන්ගේ පෙළ= බිතුපෙළ, ඉන්-බිතුපෙළින්, විබත් සමස්; එද එම තැන්ද=ඒතැන්, ඉන්-ඒතැනින්, වෙසෙසුන් සමස්; රජුගේ විමන්=රජ විමන්, විබත් සමස්;

**සඳකැන් මිණ**—මෙ චන්‍ද්‍ර චන්‍ද්‍රයා කැමැති වන අර්‍ථයෙන් සඳකැන් නම්වූ මාණික්‍ය භෙදයකි. චන්‍ද්‍රාලොකය සපයිවූ කල්හි මෙයින් ජලය වහනය වෙයි. ශීත බව සිනිදු බව ලේ දූවිලි නැසීම ග්‍රහයන් පිළිබඳ අශොභනත්වය නැසීම ඊශ්වර ප්‍රියඞ්කර බව ආදී ගුණ මෙහි විද්‍යමාන වෙත්. නිර්මල බව සැහැල්ලු බව පිත්තමූර්ජා පිත්තාස්‍ර දාහ කාස මදයන රොග නැසීම චන්‍ද්‍රකාන්ත පාෂාණයෙන් හටගන්නා ජලයෙන් ලැබෙන ගුණයෝයි.

## උදාත්තාලඞ්කාරයි.

19. රි වි බි ම් බා සුරු රිවිකුල කමලක ර
පි යු ම ම් බා නිතොරව රුඳි උරමැදු ර
මෙනරම් බා හිමි රුසිරිනි පැහැස ර
පැරකුම් බා නරනිඳු සඳ දකු මිතු ර

19 රිවිකුල, සූර්‍ය්‍යවංශ නමැති; කමලකර, පද්මාකරය (ප්‍රබොධ කිරීමට); රිවිබිම්බාසුරු, සූර්‍ය්‍යමණ්ඩලය හා සමානවූ; නිතොරව, නිරන්තරව; පියුමම්බා, ශ්‍රීකාන්තාව විසින්; රුඳි, වාසයකළාවූ; උරමැදුර, උරඃස්ථල නමැති මන්දිරයක් ඇත්තාවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; රුසිරිනි, රූපශ්‍රිය කරණකොට ගෙන; රම්බාහිමි මෙන, රම්භාවට වල්ලභවූ නලකූබරයා හා සමානවූ; පැරකුම්බා නරනිඳුසඳ, ශ්‍රී පරාක්‍රමබාහුමහාරාජොත්තමයාණන්; මිතුර, මිත්‍රය; දකු, නිරීක්ෂණය කර.

**'තෝ පැරකුම්බා නරනිඳු සඳ දකු'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—**දකු** යනු විධික්‍රියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **පැරකුම්බා නරනිඳු සඳ** යනු අනුක්ත කර්මයි, **මිතුර** යනු ආමන්ත්‍රණයි, **රිවිබිම්බා සුරු** යනුද **රුඳි** යනුද **පැහැසර** යනුද කර්ම විශෙෂණයි, **රිවිකුලකමලකර** යනු අනුක්ත සම්බන්ධයි, **පියු මම්බා** යනු **රුඳි** යන අසමාප්ත ක්‍රියාවට අනුක්තකර්තෘයි, **උරමැදුර** යනු

අනුක්තාධාරයි, නිතොරව යනු සොපපද පූර්වක්‍රියායි, රූසිරිනි යනු අනුක්ත කරණයි, මෙන යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, රම්බා හිමි යනු උපමා කර්මවිශේෂණයි.

ස, වි--රිවිහුගේ බිම්බ=රිවිබිම්බ, රිවිබිම්බයගේ අසුරු=රිවි බිම්බා සුරු, විබත් සමස් ගැබ් විබත් සමස්; රිවිහුගේකුල=රිවි කුල, කමලනට අකර=කමලකර, රිවිකුලම කමලකර=රිවිකුල කමලකර, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; උරම මැදුර=උර මැදුර, එහි-උරමැදුර, වෙසෙසුන් සමස්; රම්බාවගේ හිමි=රම්බා හිමි, විබත් සමස්; රුවගේ සිරි=රූසිරි, ඉනි-රූසිරිනි, විබත් සමස්; පැහැයෙන් සර=පැහැසර, විබත් සමස්; පැරකුමෙන් යුතු බා යමකුහටද හෙතෙම=පැරකුම්බා, නරනම ඉඳු=නරනිඳු, නරනිඳුවූයේද එම සඳවූයේද=නරනිඳු සඳ, පැරකුම්බාවූයේද එම නරනිඳු සඳ වූයේද=පැරකුම්බා නරනිඳු සඳ, අන් අරුත් සමස් විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්;

**රිවිකුල**—20 වෙනි කවියෙහි මනුරජ කුල සන්න බලනු.

**පියුමම්බා**—පියුමම්බා යනු ශ්‍රී කාන්තා තොමෝයි. දිව්‍යාසුරයන් විසින් මන්දර පර්වතය ක්ෂීර සාගරයෙහි ලා මථනය කරන කල්හි රූප සම්පත්ති යන් අග්‍රප්‍රාප්තවූ මෝ තොමෝ එයින් උද්ගතවූවා දිව්‍යාසුරයන් බලා සිටියදීම විෂ්ණුගේ වක්‍ෂඃස්ථලය කරා ගමන් කළාය. ශ්‍රී කාන්තාවගේ වාසස්ථානයවූ නිසා විෂ්ණු දිව්‍යරාජයාගේ උරඃස්ථලය අතිශය ශෝභමාන විය. එහෙයින් පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ උරඃස්ථලයාගේ ශොභනත්වය ඇඟවීම පිණිසද පියුමම්බා නිතොරව රැඳි උරමැදුර යනු කීහ. එයින්ම පරාක්‍රමබාහු නරෙන්ද්‍ර තෙමේද විෂ්ණු සදෘශත්වයෙන් හඟවන ලදැයි දතයුතු.

**රම්බා හිමි**—අලකා පුරාධිශ්වරවූ වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ පුත්‍රවූ නලකූබර තෙමේයි, රම්බා නම් දෙවඟන මොහුගේ භාර්‍ය්‍යාවූවාය. එහෙයින් මේ තෙම රම්බාහිමි යයි ප්‍රසිඬවිය. මොහු දුටුවන් මන නොහ් පිණවන රූප සම්පත්තියකින් යුතු දෙවියෙකි.

**දකු**—දිස් ධාතුවට දක් යි ආදෙශව 'උ' ප්‍රත්‍යයව සිඬයි.

## උපමාලඞකාරයි.

20. උ නු  නොව බරණ සිවු සැට වොටුනුත් පැල  ද
වෙ නු  මෙන් පසක් උන්සඳ සී හසුන් මැ  ද
ම නු  රජ කුලෙන් පැවතෙන පිළිවෙළ නොසි  ද
ග නු  අවසර එනිරිඳු සිරිපතුල් වැ  දූ

20 වොටුනුත්, කිරිට සහිතවූ හෙවත් වොටුන්න ඇතුළුවූ; සිවුසැට බරණ, චතුෂ්ෂෂ්ටි ආභරණයන්; උනුනොව, අඩුවක් නැතිව; පැලඳ, ප්‍රසාධනය කොට (ඒ නරෙන්ද්‍රයා); පසක්වෙනු

මෙන්, ප්‍රත්‍යක්ෂවිෂ්ණුහු මෙන්; සීහසුන්මැද, සිංහාසනමධ්‍යයෙහි; උන්සඳ, නිෂණ්ණකාලයෙහි; මනුරජකුලෙන්, මහාසම්මත රජහුගේ වංශයෙන්; පිළිවෙල නොසිඳ, සන්තතිවිච්ඡේදයම නොපැමිණ; පැවතෙන, ප්‍රවෘත්තව එන්නාවූ; එනිරිඳු, ඒ (පරාක්‍රමබාහු) නරේන්ද්‍රයාගේ; සිරිපතුල්, ශ්‍රීපාදයම; වැඳ, නමස්කාර කොට; අවසර ගනු, අනුඥග්‍රහණය කර.

'තෝ අවසර ගනු'-යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—ගනු යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **අවසර** යනු අනුක්තකර්මයි, **වැඳ** යනු පූර්ව ක්‍රියායි, **සිරි පතුල්** යනු ඊට අනුක්තකර්මයි, **එනිරිඳු** යනු අනුක්ත සම්බන්ධයි, **එන** යනු සම්බන්ධ විශේෂණයි, **පැවත** යනු පූර්වක්‍රියායි, **මනුරජ කුලෙන්** යනු අනුක්ත අපාදනයි, **නොසිඳ** යනු පූර්වක්‍රියායි, **පිළි වෙල** යනු ඊට කර්මයි, **උන්සඳ** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, **සීහසුන්මැද** යනු උන්සඳ යන අකර්මක්‍රියාපදයහට අනුක්තාධාරයි, **මෙන්** යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, **වෙනු** යනු උපමා කර්තෘ විශේෂණයි, **පසක්** යනු උපමා විශේෂණයි, **පැලඳ** යනු පූර්ව ක්‍රියායි, **වොවූනු** යනුද **බරණ** යනුද ඊට අනුක්ත කර්මයි, **ත්** යනු සමුච්චයාර්ථයෙහි අව්‍යයයි, **උනුනොව** යනු ක්‍රියා විශේෂණයි, **සිව්සැට** යනු කර්ම විශේෂණයි

**ස, වි**—සිවු (සතරින්) වැඩි සැට=සිවු සැට, විබත් සමස්; සිහරුවෙන් සැරසූ හසුන්=සිහසුන්, සීහසුනගේ මැද=සීහසුන් මැද, විබත් සමස් ගැබ් විබත් සමස්; මනුවූයේද හෙම රජ වූයේද=මනුරජ, මනුරජහුගේ කුල=මනුරජකුල, එයින්-මනුරජ කුලෙන්, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; නරනම ඉඳු=නිරිඳු, විබත් සමස්; එද එම නිරිඳුද=එනිරිඳු, සිරින් යුතු පතුල්=සිරි පතුල්, එනිරිඳුගේ සිරිපතුල්=එනිරිඳු සිරිපතුල්, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් විබත් සමස්;

**බරණ සිවු සැට**—චතුෂ්ෂෂ්ට්‍යා භරණ—රත්පට, රුවත්ජෝඩු, නාග වඩම්, කාදුකාප්ප, මුතුවැට, කච්චෝඩම්, බාහුදණ්ඩ, මිණිකයිවඩම්, ගිගිරි වළලු, හස්ත මුද්‍රිකා, හස්තාඞ්ගුලි, කයිපෝට්ටු, අඞගදාභරණ, එකාවැල, කර්ණිකා වතංස, ග්‍රීවාලඞ්කාර, පදක්කම්, කණ්ඨසූත්‍ර, මිණිබන්ධි, ගල්මුතුමාල, ගෙලමුතුමාල, මිණිමුතුමාල, දශිකමාල, නිල්මිණිමාල, රත්මුතුමාල, රත්පෙතිමාල, ලියරත්මාල, වටරත්මාල, රුවන්මාල, රත්මිණිමාල, තුන්කොත්මාල, සිවුකොත්මාල, හස්ත පෝට්ටු, මෙඛලාදම, පස්රූ, පස්පෙරහර, සත්රුවන්වැල, රන් සවඩි, රිදී සවඩි, මුතු සවඩි, සත්රුවන් සවඩි, රත්මිණි සවඩි, නිල්මිණි සවඩි, කෙයූරාභරණ, ඌරුජාලා, ඉන ඇදුම්, ඌරු බන්ධන, මකර පට, තළල් පට, පාද සඞ්ඛලා, පාදාභරණ, පාද ජාලා, කිඞ්කිණිකා ජාලා, පාදාඞ්ගුලි, පාද ජඞ්ඝා වළලු, පත්‍ර වළලු, රත්දම්, මුතුදම්, කක්දම්, රිදීදම්, මිණිදම්, මුතුහර, අඩුල්හර, වොටුනු දහ මොහු වෙත්.

**වෙනුමෙන්**--විෂ්ණු තෙමේ වනාහි ත්‍රිමූර්තිත්‍රයාන්තර්ගත ලෝක සංරක්ෂණයෙහි නියුක්තවූ මහානුභාව සම්පන්න දෙවියෙකි. මොහු කෘෂ්ණවර්ණය, බාහු සතරකින් යුක්තය, පීත වර්ණ වස්ත්‍රයක් නිවාසනය කොට ඇත්තේය. චක්‍රයක් ආයුධ කොට ඇත්තේය, ශ්‍රී කාන්තා තොමෝ භාර්‍ය්‍යාවූවාය, දිව්‍ය මනුෂ්‍ය සත්ව පීඩාකර අවස්ථාවලදී මේ තෙම ඊට පිටිවහල්ව ඒ පීඩාවන් වලක්වා සැප දෙතැයි වෛෂ්ණවයන්ගේ මතයි.

මොහුගේ අවතාර නම්-බ්‍රහ්ම, වරාහ, නාරද, නරනාරායණ, කපිල, දත්තාත්‍රෙය, යඥ වෘෂභදේව, පෘථු, මත්ස්‍ය, කූර්ම, ධන්වන්තරී, මොහිනී, නෘසිංහ, වාමන, පරශුරාම, වේදව්‍යාස, රාම, බලරාම, කෘෂ්ණ, බුද්ධ, කල්කි, යන මොහු වෙති.

මෙයින් ඉතා ප්‍රසිද්ධියට පැමිණි අවතාර දසයෙක් වෙත්.

**භාගවත් පුරාණයෙහි**--

> මත්ස්‍යඃ කූර්මෝ වරාහශ්ච නාරසිංහෝ'ථ වාමනඃ
> රාමෝ රාමශ්ච රාමශ්ච බුද්ධඃ කල්කි ච තෙදස යනුයි.

චතුෂ් ෂෂ්ට්‍යාභරණයන් අඩුනොව පැලඳ සිංහාසනයෙහි උන් පරාක්‍රමබාහු රජතෙම ප්‍රත්‍යක්ෂ විෂ්ණු මතැයි මෙයින් උපමිතයි.

**මනුරජකුල**--පරමෙශ්වරයා කෙරෙන් බ්‍රහ්මයා උපන්නේය. බ්‍රහ්ම පුත්‍ර තෙමේ මරීචි නම් විය කාශ්‍යප තෙමේ ඔහුගේ පුත්‍ර විය. ඔහුගෙන් සූර්‍ය්‍යයා උපන්නේය. සූර්‍ය්‍යයාගෙන් වෛවශ්වත මනු උපන්නේය. හෙතෙම බොහෝ දෙනාගේ සම්මතයෙන් රජවූ හෙයින් මහාසම්මත රජයයි ප්‍රසිද්ධ විය. ඔහුගේ වංශය මහාසම්මත වංශ නමැයිද මනු වංශ නමැයිද සූර්‍ය්‍ය වංශ නමැයිද ප්‍රකට භාවයට පැමිණියේය. ඒ මහාසම්මත රජතෙම සතර මහා සෘඩීන් ජරා විලිපිලි රොගව්‍යසනාදියක් නැතිව අසඞ්ඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. ඔහුගේ පුත්‍ර පෞත්‍රාදි පරම්පරාවෙහි වූ රොජවරරොජාදී අටවිසි රජ කෙනෙක්ම අසඞ්ඛ්‍යා යුෂ්ක වූහ. දිලීප රඝු රාමාදී රජුන්ගේ උත්පත්තියෙන් හෙබියාවූ මේ රාජ වංශයෙහි මඛාදෙව නම් රජෙක් විය. ඒ රජුගේ කාලයෙහි පටන් ඔක්කාක රජු දක්වා සූර්‍ය්‍ය වංශ නාමය පෙරළී මඛාදෙව වංශ නාමයෙන් පැවැත්තේය. ඔක්කාක රජුගේ කාලයෙහි පටන් අඹාළ නම් තෘතීය ඔක්කාක රජුගේ කාලය දක්වා ඔක්කාක වංශ නමින් ප්‍රකටව පැවැත්තේය. ඒ රජුගේ කාලයෙහිම ඔක්කාක වංශ නාමය අත්හැර ශාක්‍ය වංශයයි නම් කරගත්හ. මේ ශාක්‍ය වංශය ලක්දිව රජකළ පණ්ඩුවාසදෙව මහ රජුගේ කාලයෙහි පළමු වෙන් ලක්දිවට සම්ප්‍රාප්ත වූයේය. පණ්ඩුවාසදෙව රජතුමා සුඛෝදන මහ රජුගේ මලණුවූ අමිතෝදන ශාක්‍යරජුගේ මිනිබිරියක්වූ භද්‍රකාත්‍යායනා නම් කුමරියක් මෙහෙසිය කෙළේය. ඒ කුමරියගේ සහෝදරවූ රාම උරුවෙල අනුරාධ විජිත දීඝාවු රොහණ යන නම් ඇති කුමරුවෝ සදෙනෙක් ලක්දිවට පැමිණ ඒ ඒ තන්හි නගර නිර්මාණය කොට විසූහ, භද්‍රකාත්‍යායන මෙහෙසිකාවගේ දුහිතෘවූ උන්මාද චිත්‍රා නම් කුමරිය යටකී දීඝාවු කුමරුන් පුත් දීඝ ගාමණී නම් කුමාරයාහට සරණකොට දුන්හ. පණ්ඩුකාභය මහරජතුමා මොවුන්ගේ පුත්‍ර තෙමේ වී. මෙයින් ලඞ්කාරාජ වංශයද ශාක්‍යවංශයම වූ බැව් දතයුතු. මේයි

දක්වෙන පැරැකුම්බා රජු පණ්ඩුකාභය රාජ පරම්පරාවෙන් ආවෙක් නොවේ. ඒ රජු මහබෝ වඩා පැමිණි සුමිත්‍ර නම් ශාක්‍ය රාජකුමාරයාගේ පරම්පරාගත බැව් කාව්‍යශේඛරයෙහි ප්‍රකාශවේ. එයින් බලා දතයුතු.

ගනු—'ගත් ගැනීමෙහි' යන ධාතුයි, ගත් ධාතුහු කෙරෙන් උ ප්‍රත්‍යයවී ගනුයි සිඩයි.

## උපමාවෙන් සංඝටවූ සවභාවෝක්තියි.

21. පෙ ර ව සඳ කිරණ පිපි කුමුදු මල් ව පි න්
ප ර ව තඹරපෙති ගිලි දිය තලා පි පි න්
ත ර ව සිගි ඇතිව පරතෙරට යන අ පි න්
ක ර ව පියාසර සකි කොන්ත ගම් තො පි න්

21 සඳකිරණ, චන්ද්‍රකිරණයෙන්; පෙරව, ප්‍රාවෘත වැ; වපින්, හාත්පසින්; පිපි, ප්‍රබුඩවූ; කුමුදුමල්, කෛරවපුෂ්පයන් ඇත්තාවූ; පරව, පරිණතභාවයට පැමිණ; ගිලි, ගලිතවූ; තඹරපෙති, තාමරස පත්‍රයන් ඇත්තාවූ; දියතලාපිපින්, ජලතලමතුභාගයෙන් (උප ලක්‍ෂිතවූ); කොන්තගම්තොපින්, කොන්තගම්තොට යන නදී ප්‍රදෙශයෙන්; පරතෙරට, පරතීරයට; යනඅපින්, ගමනෙච්ඡා යෙන්; තරව, ස්ථිරීභූත ව; සිගි ඇතිව, සමෘතිමත් ව; සකි, සබිජනය; පියාසර කරව, (ආකාශ මාර්ගයෙන්) - පක්‍ෂප්‍රසාරණය කරව.

'තෝ පියාසර කරව'—යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—කරව යනු විදි කිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, පියාසර යනු අනුක්ත කම්යි, කොන්තගම් තොපින් යනු අනුක්තාපාදානයි, සකි යනු ආමන්ත්‍රණයි, යන අපින් යනු අනුක්ත කරණයි, පරතෙරට යනු යනු යන අර්ථක්‍රියාවට අනුක්ත කම්යි, සිගි ඇතිව යනු සොපපද පූර්වක්‍රියායි, තරව යනු සොප පද පූර්වක්‍රියායි, තඹර පෙති ගිලි දියතලා පිපින් යනු උප ලක්‍ෂණ යෙහි කරණ විබත්, පිපි කුමුදු මල් වපින් යනුද උපලක්‍ෂණ යෙහි කරණ විබත්, පරව යනු පූර්වක්‍රියායි, පෙරව යනු පූර්ව ක්‍රියායි, සඳකිරණ යනු ඊට අනුක්ත කම්යි,

ස—වි, සඳුගේ කිරණ=සඳ කිරණ, විබත් සමස්; කුමුදුවූයේද එම මල්වූයේද=කුමුදුමල්, පිපියේද එම කුමුදුමල් වූයේද=පිපි කුමුදුමල්, පිපි කුමුදුමල් අවට ඇත්තේ යමෙක්හිද=ඒ පිපි කුමුදුමල්වට, ඉන්-පිපිකුමුදුමල්වපින්, වෙසෙසුන් සමස් ගැබි අන් අරුත් සමස්; තඹරන්ගේ පෙති=තඹරපෙති, ගිලිහුණු තඹර පෙති යමෙක්හිද හෙතෙම=තඹරපෙති ගිලි, විබත් සමස් ගැබි අන්

අරුත් සමස්; දියගේ තලා=දිය තලා, දියතලාවගේ පිට=දිය තලාපිට, තඹරපෙති ගිලිද එම දියතලාපිටද=තඹරපෙති ගිලි දිය තලාපිට, ඉන්-තඹරපෙති ගිලි දියතලා පිටින්, විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්; පරද එම තෙරද=පරතෙර, එයට-පරතෙරට, වෙසෙසුන් සමස්; යනුව අට=යන අට, ඉන්-යන අටින්, විබත් සමස්; පියන්ගේ සර=පියාසර, විබත් සමස්; කොන්ත නම් අවි දරන්නන්ගේ ගම=කොන්තගම, කොන්තගමෙහි තොට= කොන්තගම් තොට, ඉන්-කොන්තගම් තොටින්, විබත් සමස් ගැබි විබත් සමස්;

**කොන්තගම්තොට**—මෙය ජයවර්ධන පුරය අසල පිහිටි තොටුපලකි. මෙය පිහිටි ස්ථානය මෙකල තුඩුවේ වත්ත නමින් ව්‍යවහාර බැව් ඇසීමු.

**කරව**—'කර කිරීමෙහි' යන ධාතුයි. කර ධාතුවෙන් පරව අප්‍රත්‍යය හා වකාරාගමව 'කරව' යි සිඩයි.

**ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.**

22. ක ළු වැ ල් කපුරු දුමතුළ ලෙලෙන දද පෙ ළ
සු වි ස ල් මිහිඟු සක්සන් මිණිහඬ පත ළ
කැ රැ ලො ල් සතන් පවසන තිසුගී දෙම ළ
ම න ක ල් ඉසුරු කෝවිලැ ලගිනේ ලක ළ

22 කළුවැල්කපුරුදුම්, කාලාගුරුකර්පූරධූමයන්විසින්; අතුළ, ආස්තරණය කරනලද්දවූ; නොහොත්-කළුවැල්කපුරුදුම්, කාලාගුරු කර්පූරධූමයන්ගේ; ඇතුළ, අභ්‍යන්තරයෙහි; ලෙලෙන, චඤ්චලවන්නාවූ; දදපෙළ, ධ්වජපාලි ඇත්තාවූ; සුවිසල්, අත්‍යන්ත යෙන් විශාලවූ; මිහිඟුසක්සන්, මෘදඞ්ගනාදශඞ්ඛනාදයන් හා; මිණිහඬ, ඝණ්ටාරාවයෙන්; පතළ, ව්‍යාප්තවූ; ලොල් කැරැ, (මහ දෙවියාගේ ගුණයෙහි) ලොභය කොට; පවසන, (අෂ්ටාදශරාග යෙන් කථනය කරනු ලබන්නාවූ; දෙමළතිසුගී, ද්‍රවිඩභාෂායෙන් කරනලද) ස්තුති ගීතිකාවන් ඇති; සතන්, (ශෛවසමයෙහි දීක්ෂිතවූ) සත්වයන් (ඇත්තාවූ); ලකළ, අලඞ්කෘතවූ; මනකල, මනොඥවූ; ඉසුරු කෝවිලැ, ශිවදෙවාලයෙහි; (සකි යනු රටින් වැටේ); සකි, සඛිය; ලගිනේ, නිවාසග්‍රහණය කරන්නෙහි.

(සකි) '**නෝ ලගිනේ**'—යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—**ලගිනේ** යනු න ශබ්ද කාරක විධි ක්‍රියායි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **මනකල් ඉසුරු කෝවිලැ** යනු අනුක්තාධාරයි, **ලකළ** යනුද **සතන්** යනුද **සුවිසල් මිහිඟු**

සක්සන් මිණි හඩ පතළ යනුද ලෙළෙන දද පෙළ යනුද ආධාර විශෙෂණයි, පවසන තියුගි දෙමළ යනු සතත් යන්නට විශෙෂණයි, කළුවැල් කපුරු දුමතුළ යනු අනුකතාධාරයි, කැරැ යනු පූර්ව ක්‍රියායි, ලොල් යනු එයට කර්මයි,

ස, වි—කළුවූයේද එම වැල්වූයේද=කළුවැල්, කළුවැල්ද කපුරුද=කළුවැල් කපුරු, කළුවැල් කපුරුවල දුම්=කළුවැල් කපුරු දුම්, කළුවැල් කපුරු දුම්වල තුළ=කළුවැල් කපුරු දුම්තුළ, වෙසෙසුන්සමස් දූරුත්සමස් විබත්සමස් ගැබි විබත් සමස්; දදගේ පෙළ=දදපෙළ, ලෙළන දදපෙළ යමෙක්හිද හෙතෙම= ලෙළෙන දදපෙළ, විබත් සමස් ගැබි අන් අරුත් සමස්; සු (ඉතා) විසල්=සුවිසල්, ප අෑ සමස්; මිහිගුද සක්ද=මිහිගු සක්, සුවිසල් වූයේද එම මිහිගුසක් වූයේද=සුවිසල් මිහිගු සක්, සුවිසල් මිහිගු සක්හුගේ සන්=සුවිසල්මිහිගුසක්සන්, දූරුත්සමස් වෙසෙසුන් සමස් ගැබි විබත්සමස්; මිණින්ගේ හඩ=මිණිහඩ, විබත් සමස්; සුවිසල් මිහිගු සක් සන්ද මිණිහඩද=සුවිසල් මිහිගුසක්සන්මිණි හඩ, දූරුත් සමස්; සුවිසල් මිහිගු සක් සන් මිණිහඩින් පතළේ යමක්ද එය=සුවිසල්මිහිගුසක්සන් මිණිහඩ පතළ, අන් අරුත් සමස්; තියු පිණිස කළ ගී=තියුගී, දෙමළෙන් කළ තියුගී=දෙමළ තියුගී (විපය්‍ය්‍යාස විධියෙන්) තියුගී දෙමළ, පවසන්නාවූ තියුගී දෙමළ යමෙක්හිද හෙතෙම=පවසන තියුගී දෙමළ, විබත් සමස් ගැබි අන් අරුත් සමස්; මනටකල්=මනකල්, ඉසුරුගේ කෝවිල=ඉසුරුකෝවිල, මනකල්වූ ඉසුරු කෝවිල=මනකල් ඉසුරුකෝවිල, එහි-මනකල් ඉසුරුකෝවිලැ, විබත්සමස් විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්;

මිහිගු—මෘදඞ්ගනම් වාද්‍යවිශෙෂයකි, උදෑසන දකිනය කටයුතු එකැන මිණි හෙමදපින ආදි වස්තූන් මෙන් මෘදඞ්ගයද ප්‍රාතර් දර්ශනීය වස්තුවකි.

ඒ බැවි, රොචනං චන්දනං හෙම් මෘදඞ්ගං දර්පණං මණිම්
ගුරුමග්නිං තථා සූය්‍ය්‍යං ප්‍රාතඃ පශ්‍යෙත් සදා බුධඃ."

යන්හෙන් ප්‍රකාශිතය, ගැඹුරුවූ හඬක්ඇති මෙය මෘතතිකා විශෙෂයකින් කරනලද්දක් බැවි "මෘත් අඞ්ගමස්‍යෙති මෘදඞ්ගඃ" යන නිර්වචන යෙන් ප්‍රකාශවේ, ප්‍රමාණ විසින් එක්රියන් සතරක් දිගද වාමපාර්ශ්වය දොළොස් අඟුලක් හෝ තොලස් අඟුලක් ද දක්ෂිණපාර්ශ්වය මෙයින් අර්ධාඞ්ගුලයක් ඌන වද මධ්‍යය මහත්වද නිර්මිත කරනලද්දකි.

ලගිනේ—'ලග ලැගීමෙහි' යන ධාතුයි. ලග ධාතුවෙන් පරව අනාකල් ත ශබ්ද ක රකාර්‍ථයෙහි අන්‍යකාරක නේ ප්‍රත්‍යය හා ධාත්වන්ත ස්වර විපය්‍ය්‍යාසව සිඬයි.

ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

23. වෙ ස  ඟන තුඟු තන යුග රොන් කොකුමඟ  ර
පි  ස  එන මඳ පවන් හැඳූ විල් ලිහිණි ස  ර
ඝොස  අලුයම පසතුරු සවනතෙහි කැ  ර
ඇ ස  නිදිගැට හැරැ නැගි සිටු උදු ගි  ර

23. වෙසඟන, (සම්පවත්තිවූ පුරවාසී) වේශ්‍යාවන්ගේ; තුඟු (ගජකුම්භාකාරයෙන්) උන්නතවූ; තනයුග, පයෝධරයුග්මයෙහි; කොකුමඟර රොන්, කුඞ්කුමාඞ්ගරාගරේණූන්; පිස, සම්මාජිතය කොට; විල්ලිහිණිසර, සාරසපක්ෂීන්ගේ නාදය; හැඳූ, ආකර්ෂණය කොට; මඳපවන් එන, මන්දමාරුතය හමන කාලයෙහි; අලුයම් පසඟතුරු, ප්‍රත්‍යූෂකාලයෙහි පවත්නා පචාඞ්ගික තූර්‍ය්‍යයන්ගේ; ඝොස, ඝෝෂය; සවනතෙහි කැර, ශ්‍රවණයෙහි පමුණුවා අසා; උදුගිර, සූර්‍ය්‍යෝදයකාලයෙහි; ඇස, අක්ෂියෙහි; නිදිගැට හැර, නිද්‍රාග්‍රන්ථිමොචනය කොට; (සකි, යහළුව;) නැඟිසිටු, (තා රාත්‍රියෙහි ශයනය කලාවූ ස්ථානයෙන්) උත්ථානය කර.

'තෝ සිටු'—යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—සිටු යනු විදි කිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, නැගි යනු පූර්වක්‍රියායි, **හැරැ** යනු පූර්වක්‍රියායි, නිදිගැට යනු ඊට කර්මයි, **ඇස** යනු අනුක්තාධාරයි, **කැර** යනු පූර්වක්‍රියායි, **පසතුරුඝොස** යනු ඊට කර්මයි, **සවනතෙහි** යනු අනුක්තාධාරයි, **උදුගිර** යනු කාලාපියෙහි අනුක්තාධාරයි, **එන** යනු කාලාපියෙහි අසම්භාව්‍ය ක්‍රියායි, **මඳ පවන්** යනු ඊට අනුක්ත කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබති, **හැඳූ** යනු පූර්ව ක්‍රියායි, **විල්ලිහිණිසර** යනු එයට අනුක්ත කර්මයි, **පිස** යනු පූර්ව ක්‍රියායි, **රොන්** යනු ඊට අනුක්ත කර්මයි, **කොකුමඟර** යනු අනුක්ත සම්බන්ධයි, **තන යුග** යනු අනුක්තාධාරයි, **තුඟු** යනු ඊට විශේෂණයි, **වෙසඟන** යනු අනුක්ත සම්බන්ධයි,

**ස, වි,**—වෙස් වූවාද ඔම අඟන වූවාද=වෙසඟන, තනයන්ගේ යුග=තනයුග, තුඟුවූයේද එම තනයුග වූයේද=තුඟු තනයුග, වෙසඟනන්ගේ තුඟු තනයුග=වෙසඟන තුඟුතනයුග, වෙසෙසුන් සමස් විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; කොකු මෙන් කළ අඟර=කොකුමඟර, විබත් සමස්; මඳවූයේද එම පවන් වූයේද=මඳපවන්, වෙසෙසුන් සමස්; විලෙහි ලිහිණි=විල් ලිහිණි, විල්ලිහිණින්ගේ සර=විල්ලිහිණිසර, විබත්සමස් ගැබි විබත්සමස්; තුරු පසක් එක්කොට කරනලද්දේ=පසතුරු, වෙසෙසුන් සමස්; සවනද එම අත්ද=සවනත්, එහි-සවනතෙහි,

වෙසෙසුන් සමස්; නිදිද එම ගැමද=නිදිගැම, වෙසෙසුන් සමස්; උදුවන ගිරු යම් කලෙක්හිද එය=උදුගිරු, එහි උදුගිර, අත් අරුත් සමස්;

**කොකුමගර**—කුඞ්කුමාඞ්ගරාගයයි, මේ වනාහි කොකුම් පොතුයෙන් කරනලද ඵලවුත් විශේෂයකි. සුගන්ධය පිණිසද වර්ණය පිණිසද මේය ශරීරයෙහි ආලෙපකරත්.

**පසතුරු**—"ආතතං චෙව විතත මාතත විතතං ඝනං
සුසිරං වෙති තුරියං පඤ්චාඞ්ගික මුදිරිතං"

යනුහෙයින් ආතතය විතතය ආතතවිතතය ඝනය සුසිරය යන තූර්ය පඤ්චකයයි.

**සම්භාවොක්ත්‍යලඞ්කාරයි.**

24. උ දු ගිරි කසුන් රිපිවැට හිස බැබ ළී
එ දු සහසකර පහනෙව් කරන හෙ ළී
යොදු නුවන් ඉසුරුම කරන පුදකෙ ළී
වි දු පියා නිලඹර යන් නොවි මැ ළී

**24** උදුගිරි, උදයපර්වත (ශිඛර) නමැති; කසුන්රිපිවැටහිස, කාංචනදීපයෂ්ටිමස්තකයෙහි; බැබළී, භ්‍රාජිතවූ; පහනෙව්, ප්‍රදීපයක් මෙන්; සහසකර, ආදිත්‍යයා; එදු, තද්දිනයෙහි; හෙළිකරන, පහන් කරනකල්හි; ඉසුරුම කරන පුදකෙළී, ඊශ්වරයාහට කරන්නාවූ පූජෝත්සවය; නුවන්, නෙත්‍රයෙහි; යොදු, යොජිත කොට; මැළිනොවී, (ශීතාදිකාරණයෙකින්) ආලස්‍යයකට නොපැමිණ; පියා විදු, පක්ෂප්‍රසාරණය කොට; නිලඹර, නීලවර්ණවූ ආකාශයට; යන්, ප්‍රයාණය කරන්.

'නෝ යන්'—යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—යන් යනු විදිකිරියයි, නෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, නිලඹර යනු අනුක්ත කර්මයි, විදු යනු පූර්වක්‍රියායි, පියා යනු එයට අනුක්ත කර්මයි, නොවි යනු පූර්වක්‍රියායි, මැළි යනු එයට අනුක්ත කර්මයි, යොදු යනු පූර්ව ක්‍රියායි, කරන පුදකෙළි යනු එයට අනුක්ත කර්මයි, ඉසුරුම යනු අනුක්ත සම්ප්‍රදානයි, නුවන් යනු අනුක්තාධාරයි, කරන යනු කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියායි, හෙළි යනු එයට කර්මයි, සහසකර යනු එයට අනුක්ත කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබත්, එව් යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, පහන් යනු උපමා කර්තෘ විශෙෂණයි, එදු යනු කාලාර්ථයෙහි අව්‍යයයි, බැබළි යනු සහසකර යන්නට විශෙෂණයි, උදුගිරිකසුන් රිපිවැට හිස යනු අනුක්තාධාරයි.

**ස වි**—උදුවිත් එම ගිරිවිත් එමනුයි=උදුගිරි, රිවිද එම වැටද= රිවිවැට, කසුනෙන් කළ රිවිවැට=කසුන් රිවිවැට, උදුගිරිම කසුන් රිවිවැට=උදුගිරි කසුන් රිවිවැට, උදුගිරි කසුන් රිවි වැටයේ හිස්=උදුගිරිකසුන් රිවිවැට හිස්, එහි උදුගිරිකසුන් රිවිවැටහිස, වෙසෙසුන්සමස් වෙසෙසුන්සමස් විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; සහසක්කර යමෙක්හුයේද=හෙතෙම සහසකර, අන් අරුත් සමස්; පුදද එම කෙළිද=පුදකෙළි, දරුත් සමස් (නොහොත්) පුද පිණිස කෙළි=පුදකෙළි, විබත් සමස්; නිල්වූයේද එම අඹරවූයේ=නිලඹර, එහි නිලඹර, වෙසෙසුන් සමස්;

**උදුගිරි කසුන් රිවිවැට හිස**—උදයපර්වතශිඛර නැමැති කාංචනදීප යෂ්ටි මස්තකයෙහි යි මෙහි භාවය ප්‍රධාන කොට අවගත් නමුදු පදනුපදිකව සලකනකල උදයපර්වත නමැති කාංචන යෂ්ටිවර්ති මස්තකයෙහි"යි අවගත යුතුවේ. මේහි වැට යනු ප්‍රදීප දශා (පහන්වැටි) වාචකවූ පාලි වට්ටි ශබ්දයෙන් තද්භව විය.

**උදුගිරි**—මෙයින් දක්වන්නේ හිරු උදවනස්ථානයයි. **යෛසර්යනු දෘශ්‍යතෙ භාස්වාන් ස තෙෂාමුදයඃ ස්මෘතඃ** දිනක් පාසා උදුගත්හි යම් ස්ථානයෙක්හි සිටි සූර්ය්‍යයා ලොකවාසීන්ට පළමුවෙන් දෘශ්‍යමානවේද ඒ ස්ථානය උදුගිරියයි කියනුලැබේ. (මෙහි පර්වතයක් නැතද උපචාරවශයෙන් පර්වතයයි ව්‍යවහාරයි) පූර්ව ශෛල පූර්ව පර්වත යනුදු මීට පර්‍ය්‍යාය නාමයෝයි.

**ඉසුරු**—ඊශ්වරතෙමේ වනාහි ත්‍රිමූර්තියට අයත් නෙත් තුනකින්ද අත් සතරකින්ද යුත් ආනුභාවසම්පන්න දෙවියෙකි. මොහුගේ භාර්‍ය්‍යා තොමෝ උමානම් දෙවඟනකි. ස්කන්ධකුමාර ගණේශ්වර යන දෙදෙනා මොහුගේ පුත්‍රයෝ වූහ. මොහුට ශුභ්‍රවර්ණ ශරීරයක් ඇත්තේය, මේ තෙම එක් වේෂයෙක්හි ශරීරයෙහි අළුතවරාගෙන දිවිසමක් හෝ මුවසමක් හැඳ අඩසඳ සිළුමිණිකොට ගෙන විවේකායෙන් යුක්තව තපස්කෙරේ, අනික් වේෂයෙක්හි හෙතෙම කෙසෙහි නාගයන් පැළඳ මිනිහිස්කබලින් සෑදූ මාලාවක් කරලා ඇත්සමක් දසරුවෙහිලා සොහොන් ආදියෙහි වාසයකෙරෙයි.

"සොවෙදෙව අයංලොකො සබ්බො ඉස්සර නිම්මිතො
ලොකස්මිං යං සුඛං දුක්ඛං සබ්බමිස්සර සත්තකං"යි.

යනුහෙයින් ඊශ්වරතෙම ලොකනිර්මාණ සාතිශයසිද ශෛවයන්ගේ මතයි.

**සන්**—සා ගමන්හි යන ධාතුවෙන් පරවැ අන්ප්‍රත්‍යය වැ සන් යි සිඬයි—

## රූපක උපමාදෙකින් මිශ්‍රිත සභාවොක්තියි.

25 සු ර ර ද සමන් සමගින් සුරඟන එව ර
පැ හැ න ද මදුරා පරසතු මල් පත ර
ක ර පු ද වඩින රැඳි මුනි සිරිපා තඹ ර
ස කි ස ඳ සෙනෝ සම්කොළගල නැඟෙනහි ර

25 සකිසඳ, මිත්‍රොත්තමය; එවර, (තොප ආකාශයට නැංගාවූ) ඒ කාලයෙහි; සුරඟන සමඟින්, දිව්‍යාඞ්ගනාවන් හා එක්ව;' සමන්සුරරද, සුමනදිව්‍යරාජයා විසින්; පැහැනද, ප්‍රභායෙන් ආර්ද්‍රවූ හෙවත් කාන්තියෙන් තෙමීගියාක් වැනිවූ; මඳරා පරසතුමල්පතර, මන්දාරපාරිජාතකුසුම සමූහය; පුදකර, පූජාකොට; වඳින, නමස්කාර කරනුලබන්නාවූ; මුනි, සර්වඥයන්වහන්සේගේ; සිරිපාතඹර, ශ්‍රීපාදපද්මය; රැඳි, පිහිටියාවූ; සමනොළ ගල, සමන්තකූටපර්වතය; නැඟෙනහිර, පූර්වදිග්භාගයෙහි; පෙනේ, දෘශ්‍යමාන වේ.

'සමනොළ ගල පෙනේ'—යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—පෙනේ යනු නිරුත්සාහ ක්‍රියායි, **සමනොළ ගල** යනු ඊට කර්තෘයි, **රැඳිමුනිසිරිපාතඹර** යනුද වඳින යනුද කර්ම විශේෂණයි, **නැඟෙනහිර** යනු අනුක්තාධාරයි, පුදකර යනු සොපපද පූර්ව ක්‍රියායි, **මඳරා පරසතු මල් පතර** යනු ඊට අනුක්ත කර්මයි, අද යනු කර්ම විශේෂණයි, **පැහැන්** යනු අනුක්තකරණයි, **සුරරද සමන්** යනු වඳින ක්‍රියාවට අනුක්ත කර්තෘයි, **සමඟින්** යනු උපලක්ෂණ අරුත්හි කරණ විබති, (නොහොත්) අව්‍යයයි, **සුරඟන** යනු සහාර්ථයෙහි කරණ විබති, **එවර** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, **සකිසඳ** යනු ආමන්ත්‍රණයි,

**ස,** වි--සුරනට රද=සුරරද, සුරරදද ඔහු සමන්ද=සුරරද සමන්, විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්; සුරන්ගේ අඟන=සුරඟන, විබත්සමස්; එද එම වරද=එවර, වෙසෙසුන් සමස්; මඳරාද පරසතුද=මඳරාපරසතු, මඳරාපරසතු වූහුද ඔහු මල්වූද=මඳරාපරසතුමල්, ඔවුන්ගේ පතර=මඳරාපරසතුමල්පතර, දුරුත් සමස් වෙසෙසුන්සමස් ගැබි විබත්සමස්; සිරින්යුත්පා=සිරිපා, සිරිපාම තඹර=සිරිපාතඹර, මුනිහුගේ සිරිපාතඹර=මුනිසිරිපාතඹර, රැඳි මුනිසිරිපාතඹර ඇතියේ යමෙක්හිද එය=රැඳිමුනිසිරිපාතඹර, විබත්සමස් වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි අන්අරුත්සමස්; සකිද එම සඳද=සකිසඳ, වෙසෙසුන් සමස්; සමනොළ වීත් එම ගලවීත්=සමනොළ ගල, වෙසෙසුන් සමස්; නැඟෙන්නාවූ හිර යමෙක්හිද එය=නැඟෙනහිර, අන්අරුත් සමස්;

**සමන්සුරරද—**මේ දිව්‍යරාජතෙම සමන්තකූට පර්වතාධිපතිවැ සිටී. මොහුගේ වාහනය සේවත හස්තියෙකි. බුදුරජාණන් වහන්සේ වෙතින් බණ ශ්‍රවණය කොට සෝවාන් මාර්ගඵල ලාභී ආර්‍ය්‍ය ශ්‍රාවක දෙවතාවකු බව ඉතිහාසයෙහි සඳහන් වේ. සමන්තකූට පර්වතයෙහිද මහනුවරද සපරගමු පලාතේද අන්‍ය බොහෝ තැන්වලද මේ නමින් දෙවාලයන් තනා තිබේ—

**මදුරා**—එනම්:—"පඤ්චෛතෙ දේව තරවො මන්දාරඃ පාරිජාතකඃ
සන්තානඃ කල්ප වෘක්ෂශ්ච පුංසිවා හරිචන්දනම්"
යන්නෙන් ප්‍රකාශිතවූ ස්වර්ගීය පඤ්චවෘක්ෂාන්තර්ගත වූවකි—

**පරසතු**—මෙද පූර්ව නාම වෘක්ෂ පඤ්චකයට ඇතුලත් වූවකි. සක්දෙව් රජහුගේ පුණ්‍යමහිමයෙන් තව්තිසා දෙව්ලොවැ ප්‍රාදුර්භූතවී තිබෙන්නාවූ මේ වෘක්ෂයාගේ මනඃකාන්තවූ එක් මලෙක්හි ස්‍රුගන්ධය ගව් සාරසියයක් පැතිර පවතී:—

**රුදිමුනිසිරිපානබර**—බුදුරජාණන් වහන්සේ බුඬත්වයට පැමිණි අටවෙනි හවුරුද්දෙහි මණිඅක්ඛික නාරජුගේ ආයාචනාවෙන් ලක්දිවට වැඩමවා කැලණි මහ සෑ පිහිටි ස්ථානයේ කරවන ලද විසිතුරු මණ්ඩපයෙහි වැඩ හිඳ ධර්මදේශනාකර වදාල ඉක්බිති සමන් දෙවිඳුගේ ආරාධනාවෙන් අහසින් වැඩ සමන්කුළු මතුයෙහි අටතුරාසියක් මඞ්ගල්‍ය ලක්ෂණයෙන් හෙබියාවූ වාමශ්‍රීපාද ලක්ෂණය නීලවර්ණ මණිමයාකයෙහි පිහිටුවා වදාලසේක. එහෙයින් එය පවිත්‍ර චෛත්‍යයක් වූයේය:—

**සමනොල**—සමන්තකූට ශබ්දයෙන් හෝ සුමනකූට ශබ්දයෙන් සිද්ධවූ සමන්කුළ ශබ්දයෙන් සිඬ වූවකි. සමන්කුළ යන්නෙහි කකාරය ලොප් වූවිට "සමන්උළ" යිද උ කාරයට ගුණාදේශ ඔ කාරය හා ස්වරාදේශ සන්ධි විධියෙන් සමනොළ යනු සිඬවේ. සුමනාලය ශබ්දයෙන් සමනල ශබ්දය තද්භවයයි ඇතැම් අවිශෙෂඥයන්ගේ සැලකීමක් වේද එය භ්‍රාන්තිගති. මෙහි මූලීජත්වය හා ගුණදෝෂ විධියද සලකන කල සුමනාලය ශබ්දය පිළිගතයුතු නොවන හෙයිනි:—

**පෙනේ**—පන පෙනීමෙහි යන ධාතුයි. පන ධාතුවෙන් පරවැ ඒ ප්‍රත්‍යය හා ස්වර විපර්‍ය්‍යාස වැ සිඬ වේ:—

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

26 ග නේ මිණි බැබළි කිරණෙව් සත පා ය
ර නේ යටග සැවුලිඳුදද ගල පා ය
අ නේ ලකර කළ පුර අප නර පා ය
පෙ නේ දකුණැ මහසෙන් දෙවුරද පා ය

26. අප නරපාය පුර, අපගේ නරොත්තමයාගේ පුරයෙහි; සතපාය, ශතරශ්මිහුගේ හෙවත් ආදිත්‍යයාගේ; කිරණෙව්, රශ්මි කදම්බයන් වැනිවූ; ගනේ, ඝනවූ; මිණි, මාණික්‍යයෙන්; බැබළි, භ්‍රාජිතවූ; රනේයටග, ස්වර්ණයෂ්ට්‍යග්‍රයෙහි; සැවුලිඳුදද, කුක්කුටෙන්ද්‍රධ්වජයන්; ගලපාය, සටනා කොට; අනේලකරකළ, අනෙකාලඞ්කාරයෙන් (අලඞ්කෘත) කරනලද්දවූ; මහසෙන්දෙව්රදපාය, ෂණ්මුඛදෙවරාජයාගේ ප්‍රාසාදය; දකුණැ, දක්ෂිණදිශා භාගයෙහි; පෙනේ, දෘශ්‍යමාන වේ.

**මහසෙන් දෙව්රද පාය පෙනේ**—යනු ක්‍රි: කා: ප: ස:

**ඉ, වි**—පෙනේ යනු නිරුක්ත ක්‍රියායි, මහසෙන් දෙව්රද පාය යනු ඊට ස්වයංකර්තෘ ස්වයංකර්මයි, දකුණැ යනු අනුක්තාධාරයි, පුර යනු අනුක්තාධාරයි, නරපාය යනු අනුක්තසම්බන්ධයි,

**අප** යනු අනුක්ත සම්බන්ධයි, **කල** යනු කර්මවිශෙෂණයි, **අනේලකර** යනු අනුක්තකරණයි, **ගලපාය** යනු පූර්ව ක්‍රියායි, **සැවුලිඳුදද** යනු ප්‍රථම අනුක්ත කර්මයි, **රණේසමග** යනු අනුක්තාධාරයි, **ගනේ මිණිබැබළි** යනු ආධාර විශෙෂණයි, **කිරණ** යනු උපමාකරණ විශෙෂණයි, **එව්** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, **සතපාය** යනු අනුක්ත සම්බන්ධයි.

**ස, වි**—ගනවූවාහුත් ඔහුමය, මිණිවූවාහුත් ඔහුමනුයි=ගන මිණි, ගනන්මිණියෙන් බැබළියේ යමක් ද එය=ගනේමිණිබැබළි, විබත්සමස් ගැබ් අන්අරුත් සමස්; සතපා යමක්හුගේද හෙතෙම සතපා, ඔහුගේ සතපාය, අන්අරුත් සමස්; යටන්ගේ අඟ=යටග, එහි යමග, විබත් සමස්; සැවුලනට ඉඳු සැවුලිඳු, සැවුලිඳු රුවින් යුතු දද=සැවුලිඳු දද, විබත් සමස් ගැබ් විබත් සමස්; අනේද එම ලකරද=අනේලකර, වෙසෙසුන් සමස්; තරන් පල්නේ තරපා, ඔහුගේ=තරපාය, උපපද සමස්; මහත් සෙන් යමෙක්හු ගේද හෙතෙම=මහසෙන්, දෙවිනට රද=දෙව්රද, මහසෙන්ද එම දෙව්රදද මහසෙන් දෙව්රද, මහසෙන් දෙව්රදහුගේ පාය= මහසෙන්දෙව්රදපාය, අන්අරුත්සමස් විබත්සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්;

**මහසෙන් දෙව්රද**—මහාසෙන දිව්‍යරජයා නම් ඊශ්වර පුත්‍රවූ ස්කන්ධ කුමාරයායි, කතරගම දෙවියෝ යනුදු මොහුටම ව්‍යවහාරකරන නාමයකි මොහු මුහුණු සයකින්ද අත් දොළසකින්ද යුක්තය. මොහුගේ වාහනය නම් මයුරයෙකි.

මු හු ණු සයකි අත් දොළසකි මයුරාපිට වාහ නේ
රු හු ණු රංවේ පිහිටි කත්ද කදිර දෙව රාජ [illegible]

සත්තොත් ජ් බැව් හැගේ-මෙහි මහසෙන් දෙව්රදපා [illegible] කුමාර දෙවාලය ප්‍රකාශිතයි.—

මෙහි 1. 2. 3. පාදගත යකාරය ජඅඳස් පිණිස යොද තිබේ.

## උපමායෙන් සංයුක්තවූ ස්වභාවොක්තියි.

27 ව ල දිත අදහසින් මෙන් සුරගඟ අඟ න
න ල බල සසල දළරළපෙළ නුබ නැගෙ න
වෙ ල ළසැ ගැවසි මුතුසක්පබළු බබල න
බ ල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙ න

27 සුරගඟඅඟන, ආකාශගඞ්ගා නමැති අඞ්ගනාව; වලදිත අදහසින් මෙන්, ආලිඞ්ගනය කරන අභිලාෂයෙන් මෙන්; නුබ නැගෙන, ගගනොල්ලඞ්ඝනය කරන්නාවූ; නලබල, මරුත ශක්තියෙන් හෙවත් වාතවෙගයෙන්; සසල, චචලවන්නාවූ; දළ රළපෙළ, මහත්වූ තරඞ්ගපඞ්ක්තියෙන් යුක්තවූ; වෙලළසැ, වෙලා

තටයෙහි; ගැවසී, සඤ්ජාතවූ; මුතුසක්පබළු, මුක්තාශඞ්ඛ ප්‍රවාල යෙන්; බබළන, භ්‍රාජමානවූ; එම සඳ, එම ක්‍ෂණයෙහි; උතුරෙන්; උත්තරදිශාභාගයෙන්; පෙනෙන, දෘශ්‍යමානවූ; මහමුහුද, මහා සමුද්‍රය; බල, නිරීක්‍ෂණය කර.

**'තෝ මහමුහුද බල'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි—බල** යනු විදි කිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, මහමුහුද යනු අනුක්ත කර්මයි, පෙනෙන යනුද බබළන යනුද **නලබලසසලදළරළපෙළ** යනුද කර්ම විශෙෂණයි, නැඟෙන යනු නලබලසසලදළරළපෙළ යන්නට විශෙෂණයි, නුබ යනු නැඟෙන යන අපි ක්‍රියාවට අනුක්තාධාරයි, **මෙන්** යනු අව්‍යයයි, **වලදිනා අදහසින්** යනු විශෙෂණාර්ථයෙහි තෘතීයායි, **සුරගඟ** අඟන යනු වලදිනා යන අපි ක්‍රියාවට අනුක්ත කර්මයි, **මුතුසක් පබළු** යනු බබළන යන අපි ක්‍රියාවට අනුක්ත කරණයි, **ගැවසී** යනු කරණ විශෙෂණයි, **වෙලලසැ** යනු අනුක්තාධාරයි, **එම සඳ** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, **උතුරෙන්** යනු අදර අරුත්හි අවදි විබත්:—

**ස, වි**—වලදිනුව අදහස=වලදිනා අදහස, ඉන්-වලදිනා අදහසින්, විබත් සමස්; සුරන්ගේ ගඟ=සුරගඟ, සුරගඟම අඟන=සුර ගඟ අඟන, විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්; නලන්ගේ බල=නලබල, නලබලින් සසල=නලබලසසල, රළන්ගේ පෙළ=රළ පෙළ, දළ වූවාද ඔම රළපෙළවූවාද=දළරළපෙළ, නලබල සසලවූ දළරළපෙළ යමක්හුගේද හෙතෙම=නලබලසසලදළ රළපෙළ, විබත්සමස් වෙසෙසුන් සමස ගැබි අන්අරුත් සමස්; වෙලළට අස=වෙලළස, (නොහොත්) වෙලළගේ අස්=වෙලළස්, එහි-වෙලළසැ, විබත් සමස්; මුතුද සක්ද පබළුද=මුතුසක්පබළු, ගැවසුණු මුතුසක්පබළු=ගැවසී මුතුසක් පබළු, දුරුත් සමස් ගැබි වෙසෙසුන් සමස්; මහවූයේද එම මුහුද වූයේද=මහමුහුද, වෙසෙසුන් සමස්;

**සුරගඟ**—සුරගඟ යනු මන්‍දාකිනී නදියයි, සොදුත් දස දහසක් දික්වූ සොදුනක් පුළුල්වූ ක්‍ෂීරාකාර ජලයෙන් පිරුණාවූ උස්වූ තරඞ්ග පඞ්ක්ති ඇති මේ ගඟ දිව්‍යලොකයෙහි පිහිටි හෙයින් ස්වර්ගඞ්ගායයි ව්‍යවහාර කරත්. සියලු ගඞ්ගාවෝ සමුද්‍ර නමැති ස්වාමිහුගේ පත්නීන් මෙන්ද සියලු ගඞ්ගා නමැති පත්නීන්ගේ ස්වාමිතෙම සමුද්‍රයයිද කවි සම්ප්‍රදායයි.

**වෙලලසැ**—වෙලාතට-ආසන්න යන ශබ්දවයෙන් සිත්නවූ වෙලළ-අස යන ශබ්ද දෙදෙනාගේ (නොහොත්) වෙලාතට-අංස යන ශබ්දමයෙන් සිත්නවූ වෙලළ අස් යන ශබ්ද දෙදෙනාගේ සාමාසානතයයි:—

**බල**—'බල බැලීමෙහි' යන ධාතුයි. අ ප්‍රත්‍යය වැ සිඞයි.

**උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයි.**

එහි ලක්ෂණ ශ්‍රීමද්දණ්ඩ්‍යාචාර්‍ය්‍ය වරයෝ

අන්‍යථෛවස්ථිතා වෘත්තිශ්චේතනස්‍යේතරස්‍ය වා
අන්‍යථෝත්ප්‍රේක්‍ෂ්‍යතෙ යත්‍ර තාමුත්ප්‍රේක්‍ෂාං විදුර්යථා

යන්නෙන් දක්වූහ.

සජීවයන්හුගේ හෝ අජීවයන්හුගේ අන් පරිද්දකින් සිටි පැවැත්ම අන් පරිද්දකින් සම්භාවනා කරනුලැබේද එය උත්ප්‍රේක්ෂායයි දතිත්.

28 ස න් ත න් සිහින්ගෙදි සෙවණලු වැලිතෙලෙ න
තැන් තැ න් වලම සැතපි සියුමැලි බැවි න
ර න් ව න් කරල්ගෙන එන ගිරවුන් අති න
ය න් ම න් තොසින් මහ තොරතුරු නියම දැ න

28 (සකිසඳ යනු යටින් වැටේ) සකිසඳ, සබ්ඳුය; නන්සිහින් ගෙදි, නොයෙක් සිහින්ගෙන්ද වෘක්ෂයන්ගේ; සෙවණලු, ඡායා මණ්ඩලාන්තර්ගතවූ; වැලිතෙලෙන, (ධවල) පුලිනතලයෙන්; සන්, ගැවසිගත්තාවූ; තැන්තැන්වලම, ඒ ඒ ස්ථානයන්හිම; සියුමැලි බැවින, සුකුමාරභාවයෙන් යුක්තවූ හෙයින්; සැතපි, විශ්‍රාමයට පැමිණ; රන්වන්කරල් ගෙන, (කල්‍යාණීපුර සමීප ශාලික්ෂෙත්‍ර වලින්) පිඤ්ජරවර්ණවූ (පරිණත) සස්‍යමඤ්ජරීන් ග්‍රහණය කොට; එන, අභිමුඛව එන්නාවූ; ගිරවුන් අතින, කීරපක්ෂීන් කෙරෙන්; මහ, (යන්නාවූ) මාර්ගයාගේ; තොරතුරු, විශෙෂවිභාගයෙහි; නියම දැන, නිශ්චය පරිඥනය කොට; මන්තොසින්, චිත්ත සන්තොෂයෙන්; යන්, ප්‍රයාණය කර.

'හෝ යන්' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**--**යන්** යනු විධි කිරියයි, **හෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **මන් තොසින්** යනු උපලක්ෂණාර්ථයෙහි කරණයි, **දැන** යනු පූර්ව ක්‍රියායි, **මහ තොරතුරු** යනු ඊට අනුක්ත කර්මයි, **නියම** යනු ක්‍රියාවිශෙෂණයි, **අතින** යනු අනුක්තාපාදානයි, **ගිරවුන්** යනු අනුක්ත සම්බන්ධයි, **එන** යනු සම්බන්ධ විශෙෂණයි, **ගෙන** යනු පූර්ව ක්‍රියායි, **රන්වන් කරල්** යනු ඊට අනුක්ත කර්මයි, **සැතපී** යනු පූර්වක්‍රියායි, **තැන් තැන් වල** යනු අනුක්තාධාරයි, **ම** යනු අවධාරණයෙහි අව්‍යයයි, **සියුමැලි බැවින** යනු හෙත්වර්ථයෙහි තෘතීයායි, **සන්** යනු ආධාර විශෙෂණයි, **නන් සිහින්ගෙදි සෙවණලු වැලිතෙලෙන** යනු සඤ්ජාත ක්‍රියාවට අනුක්ත කරණයි,

**ස,** වි--සිහින්වූයේද එම ගෙදිවූයේද=සිහින්ගෙදි, නන් (නොයෙක් වැදෑරුම්) සිහින්ගෙදි=නන් සිහින්ගෙදි, සෙවණින් අලුයේ=සෙවණලු, නන් සිහින් ගෙදිවල සෙවණලු=නන්සිහින්

ගෙඩි සෙවණලු, වැලියෙන් සැදි තල=වැලිතල, නන් සිහින් ගෙඩි සෙවණලුයෙන් (යුත්) වැලිතල=නන් සිහින්ගෙඩි සෙවණලු වැලිතල; එන්, නන් සිහින්ගෙඩි සෙවණලු වැලි තෙලෙන; වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්; තැන්ද තැන්ද=තැන් තැන්, එහි-තැන් තැන් වල, දුරුත් සමස්; සියුමැලිනුගේ බැව්=සියුමැලි බැව්, ඉන්-සියුමැලි බැවින, විබත් සමස්; රනගේ වනට බඳුවන් යමක්හුගේද හෙතෙම=රන්වන්, රන්වන්විද එම කරල්විද=රන්වන්කරල්, අන්අරුත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; මනගේ තොස්=මන්තොස්, ඉන්-මන්තොසින්, විබත් සමස්; මහෙහි තොරතුරු=මහතොරතුරු, විබත් සමස්;

**සෙවණලු**—ඡායා, වණණ, ආලොක, යන ශබ්දත්‍රයෙන් ක්‍රමයෙන් සෙ, වන්, අලු, යි සිත්න වෙයි, ඔවුන්ගේ සමාස ප්‍රකෘති තොමෝ සෙවණලු යනුවේ.

මෙයින් වාච්‍යවූ ඡායාමණ්ඩලාර්ථය මාතෘභාෂාවන්හි එකම ඡායා ශබ්දයෙන් යෙදෙන කාමුදු සිංහල භාෂායෙහි එබඳු තැන්වල අන්‍ය ගුණපද සමඟ යොදා එකම ශබ්දයක් කොට ව්‍යවහාර වන බව පෙනේ. දහවල් දවස, කඳෙපැනි, දරණ වැල, යනාදි ශබ්ද මෙනි.

### ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

29 නි ල තුරඟුට නැහෙමින් රිවිදෙව් සිරි න
දු ල කැරැ සේසත් මිණිබරණ කිරණි න
බ ල පිරිසෙන් සහ යාපාපටුන් ගෙ න
බ ල සේනානායක සපුකුමරු එ න

29 රිවිදෙව්සිරින, සූර්‍ය්‍යදෙවපුත්‍රයා හා සමානවූ ශොභායෙන් යුක්තව; නිලතුරඟුට නැහෙමින්, හරිතවණීවූ හෙවත් පලාවන්වූ අශ්වවාහනයකට ආරූඪව; මිණිබරණකිරණින, රත්නාභරණ කාන්තියෙන්; සේසත්, ඡත්‍රච්ඡායාව; දුලකැරැ, ජ්වලිත - කොට (බබුලුවා); බලපිරිසෙන් සහ, බලවත්වූ සෙනාව හා එක්ව; යාපා පටුන්ගෙන, යාපාපට්ටන නම් පුරය තමා වශහකොටගෙන; එන, (අභිමුඛව) එන්නාවූ; සේනානායක, චමූපතිස්ථානයට පැමිණියාවූ; සපුකුමරු, (සපුකුමරු, (උලකුඩයදෙවින්ගේ ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවූ) චම්පකාභිධාන රාජකුමාරයා; බල, අවලොකනය කර.

**නෝ සපුකුමරු බල** යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—**බල** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘ යි, **සේනානායක සපුකුමරු** යනු අනුක්ත කම් යි, **එන** යනු කම්විශෙෂණයි, **ගෙන** යනු පූර්වක්‍රියා යි, **යාපාපටුන්** යනු ඊට අනුක්ත කම්යි, **සහ** යනු අව්‍යයයි, **බලපිරිසෙන්** යනු සහ සබඳෙහි කතු විබත්, **දුලකැරැ** යනු සොපපද පූර්වක්‍රියායි, **සේසත්**

යනු අනුක්ත කර්‍ම යි, මිණිබරණකිරණින යනු අනුක්තකරණයි. නැගේමින් යනු පූර්‍ව ක්‍රියාපදයෙහි මිශ්‍රක්‍රියායි, තුරඟුව යනු අනුක්ත කර්‍මයි, නිල යනු ඊට විශෙෂණයි, රිවිදෙව්සිරිත යනු උපලක්‍ෂණයෙහි කාරණයි,

ස, වි—රිවි වූයේද එම දෙවි වූයේද=රිවිදෙව්, රිවිදෙවිහුගේ සිරි=රිවිදෙව්සිරි, ඉන්-රිවිදෙව් සිරින, වෙසෙසුන් සමස් ගැබි විබත්සමස්; සේ වූයේද එම සත් වූයේද=සේසත්, වෙසෙසුන් සමස්; මිණියෙන් කළ බරණ=මිණිබරණ, (නොහොත්) මිණියෙන් යුත් බරණ=මිණිබරණ, මිණිබරණ වල කිරණ=මිණිබරණ කිරණ, ඉන්-මිණිබරණ කිරණින්, විබත්සමස් ගැබි විබත්සමස්; බලද එම පිරිස්ද=බලපිරිස් එයින්-බලපිරිසෙන්; වෙසෙසුන් සමස්; යාපාවින් එම පටුන්වින්=යාපාපටුන්, වෙසෙසුන් සමස්; සේනාවට නායකවූයේ=සේනානායක, සපුවූයේද එම කුමරුවූයේද=සපු කුමරු, සේනානායක වීත් හෙතෙමේය සපුකුමරු වීත් හෙතෙමේ නුයි=සේනානායක සපුකුමරු, විබත්සමස් වෙසෙසුන්සමස් ගැබි වෙසෙසුන්සමස්;

**නැගෙමින්**—පූර්‍වක්‍රියාපදයෙහි මිශ්‍ර ක්‍රියායි.

**සපුකුමරු**—පරාක්‍රමබාහු මහරජාණන්ගේ පුත්‍රස්ථානයෙහි වැඩුනාවූ සෙම්බගප් පෙරුමාල් කුමර තෙමේයි. පරාක්‍රමබාහු රජු ඇවෑමෙන් රජවූද උලකුඩය දෙවියගේ පුත්‍රවූද දෙවෙනි ජයබා රජු මරා සවෙනි බුවනෙකබාහු නමින් රජවූයේ මේ තෙමෙයි.

යාපා පටුනෙහි විසූ ආර්‍ය්‍යචක්‍රවර්තිහු පලවා යාපාපටුන අත්පත්කොටගෙන පියමහරජු දක්නා පිණිස ඇත්අස් රිය පාබල සෙන් පිරිවරා හරිද් මණි අසකු පිට නැගි එන ආකාරය මේ කවෙන් ප්‍රකාශ වේ.

## උදාත්තාලඞ්කාරයි.

**එහි ලක්‍ෂණ:**—ආශයස්‍ය විභූතෙර්වා යන්මහත්වමනුත්තමම්
උදාත්තනාම තං ප්‍රාහු රලඞ්කාරංමනීෂිණඃ—

අභිප්‍රායයාගේ හෝ සම්පත්තියගේ හෝ යම් මහත්බවෙක් ප්‍රකාශවේද ගේ උදාත්ත නම් අලඞ්කාරයයි පණ්ඩිතයෝ කියත්—

30 අ ග පිපිමල්මලිගියලිය කැ ලේ යා
ව ග බැඳගෙන රජහස පුල් වී ලේ යා
ළ ඟ තුරුමල් ගිලිහුණු රොනවු ලේ යා
ම ඟ බැස යව පළ හෙළ වැලිතෙ ලේ යා

30 අග, ලතාග්‍රයෙහි; පිපිමල්, සුපුෂ්පිතපුෂ්පයන් ඇත්තාවූ; මලිගියලියකැලේයා, මාලතීලතාප්‍රතානයෙන් යුක්තවූ; වග බැඳ, වර්ගබන්ධනය කොට; ගෙන, (පෙළසැදී) පන්තිය වන්

නාවූ; රජහස, ("රාජහංසාස්තු තෙ චඤ්චුචරණෛර්ලොහිතෛඃ සිතාඃ" යනු හෙයින් රත්වූ තුඩු හා පා ඇති සර්වාඞ්ගධවලවූ) රාජහංසයන් ඇත්තාවූ; පුල්විලේයා, ප්‍රබුද්ධ පද්මාකරයන් ඇත්තාවූ; ළඟ, මාර්ගසමීපයෙහි සිටියාවූ; තුරු, වෘක්ෂයන්ගේ; මල් ගිලිහුණු, පුෂ්පයෙන් ගලිතවූ; රොනවුලේයා, මකරන්දකීර්ණවූ (රේණුවෙන් ගැවසිගත්තාවූ); පළ, ව්‍යක්තවූ; හෙළ, ධවලවූ; වැලිතෙලේයා, පුලිනතල ඇත්තාවූ; මහ බැස, මාර්ගයට අවතීර්ණ වැ; යව, ගමනය කර.

'තෝ යව' යනු ක්‍රි: කා: ප: ස:

ළ, වි—යව යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, බැස යනු පූර්වක්‍රියායි, මග යනු ඊට අනුක්ත කර්මයි, පළ හෙළ වැලිතෙලේයා යනුද ළඟ තුරුමල් ගිලිහුණු රොන වුලේයා යනුද හෙන රජහස පුල් විලේයා යනුද පිපිමල් මලි ගියලියකැලේයා යනුද කර්ම විශෙෂණයි, අග යනු පිපි යන් නට අනුක්තාධාරයි, බැඳ යනු පූර්වක්‍රියායි, වග යනු අනුක්ත කර්මයි,

ස, වි—පිපියාවූ මල්=පිපිමල්, අග පිපිමල් ඇතියේ යමක්ද ඒ= අගපිපිමල්, මලිගියද එම ලියද=මලිගියලිය, අග පිපිමල් ඇත්තීද එමමලිගියලියද=අගපිපිමල්මලිගියලිය, අගපිපිපිමල්මලිගිය ලියන් ගේ කැල යමෙක්හිද හෙතෙම=අගපිපිමල්මලිගියලිය කැල, එය= අගපිපි මල් මලිගිය ලිය කැලේයා, වෙසෙසුන් සමස් අන්අරුත් සමස් වෙසෙසුන්සමස් ගැබ් අන්අරුත්සමස්; පළවීත් එම හෙළ වීත්=පළහෙළ, වැලියෙන් සැදි තල=වැලිතල, පළ හෙළ වැලිතල යමෙක්හිද හෙතෙම=පළ හෙළ වැලිතල, එය-පළහෙළවැලිතෙලේයා, වෙසෙසුන්සමස් විබත්සමස් ගැබ් අන්අරුත්සමස්;

ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

31 අ යි රාවණ වුවත් නවතන රිසින් එ න
අ යි රා දහස් දිලි දුනු කොත් සිපත් ගෙ න
කා යි කාවලෙහි දුන සෙබළුන් රුක සිටි න
ව යි යා කරන් මල්තුරුගන වනගිසි න

31 එන, (විපක්ෂභාවයෙන් අභිමුඛ ව) එන්නාවූ; අයිරාවණ වුවත්, ඓරාවණ හස්තිරාජයා වී නමුත්; නවතන රිසින්, නිවාරණය කරන්නාවූ රුචියෙන්; අයිරාදහස්, සහස්‍රයෙන් අධිකවූ; දිලි, ජ්වලිතවූ; දුනුකොත්සිපත්, චාපකුන්තඛඩ්ගපත්‍රයන්; ගෙන, ග්‍රහණය කොට; කායිකාවලෙහි, කායිකාවලනම් වූ;

රක්‍ෂාස්ථානයෙහි හෙවත් කඩවතෙහි; රැක සිටින, රක්‍ෂා කොට සිටිනාවූ; සෙබළුන්, සුභටයන්; දැක, දක්නාන් කොට; මල්තුරු ගන, පුෂ්පවෘක්‍ෂයෙන් සාන්ද්‍රවූ; වනහිසින; වනමස්තකාකාශයෙන්; වයි, ශීඝ්‍ර ව; යා කරන්, යාත්‍රා කර.

**'නෝ යා කරන්'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—කරන් යනු විදි කිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **යා** යනු අනුක්ත කර්මයි, **වයි** යනු ක්‍රියා විශෙෂණයෙහි අව්‍යයයි, **මල්තුරුගනවනහිසින** යනු අනුක්තාපාදානයි, **දැක** යනු පූර්ව ක්‍රියායි, **සෙබළුන්** යනු ඊට අනුක්තකර්මයි, **සිටින** යනු කර්ම විශෙෂණයි, **රැක** යනුද **ගෙන** යනුද පූර්ව ක්‍රියායි, **අයිරා දහස් දිලිදුනුකොත් සිපත්** යනු ගෙන යන පූර්ව ක්‍රියාවට අනුක්ත කර්මයි, **කයිකාවලෙහි** යනු අනුක්තාධාරයි, **නවතන රිසින්** යනු අනුක්ත කරණයි, **වුවත්** යනු අසම්භාව්‍ය ක්‍රියායි, **අයිරාවණ** යනු නවතන යන අපි ක්‍රියා පදය හට අනුක්ත කර්ම හෝ වුවත් යන අසම්භාව්‍ය ක්‍රියාවට කර්තෘයි, **එන** යනු අයිරාවණ යන්නට විශෙෂණයි.

**ස, වි**—නවතනුව රිසි=නවතනරිසි, ඉන්-නවතන රිසින්, විබත් සමස්; දහසින් අයිරා (වැඩියේ)=අයිරාදහස්, අසිද ඔහු පත්ද=අසිපත්, දුනුද කොත්ද අසිපත්ද=දුනුකොත්සිපත්, අයිරා දහස් වූවාහුත් ඔහුමය දිලිදුනුකොත් සිපත්වූවාහුත් ඔහුමනුයි= අයිරාදහස් දිලිදුනු කොත්සිපත්, විබත්සමස් වෙසෙසුන්සමස් දුරුත් සමස් ගැබ් වෙසෙසුන්සමස්; සෙ වූවාහුත් ඔහුමය බළ වූවාහුත් ඔහුමනුයි=සෙබළ, උන්-සෙබළුන්, වෙසෙසුන් සමස්; මල් පදන්තුරු=මල්තුරු මල්තුරින් ගන=මල්තුරුගන, මල්තුරු ගනවීත් එම වනවීත් එමනුයි=මල්තුරු ගන වන, මල්තුරුගන වනයාගේ හිස්=මල්තුරුගනවනහිස්, ඉන්-මල්තුරුගනවනහිසින්, වෙසෙසුන්සමස් විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්;

**අයිරාවණ**—ඉන්ද්‍රහස්ති වාචක "ඓරාවණ" යන ඓකාරවත් ශබ්දයෙන් සිංහල භාෂාවට ශබ්දනු කරණ වශයෙන් "අයිරාවණ"යි තද්භව විය, මෙ හස්ති තෙමේද එක් දිව්‍ය පුත්‍රයෙකි, සක්දෙව් රජ තෙම උයන්කෙළි ආදියට නික්මෙන අවස්ථාවන්හි මේ දෙව්පුත් තම දිවඅත්බැව් හැර සසියයක් ගව් දිගින්ද තුන්සිය සැට ගව්වක් උසින්දයුත් සුවිශුභ අතිධවල වර්ණයෙන් ශොභාමත්වූ ඇත් වෙසක් ගෙන සිටී, මේ තෙම ඓරාවණ හස්ති නම් වේ.

**කයිකාවල**—මේ වනාහි එකල ආණ්ඩුවේ මුරපලක්ව තිබූ ස්ථානයකි.

**සෙබළුන්**—භට ශබ්දයෙන් සිද්ධවූ බල ශබ්දය සු යන උපසර්ග සමග එක්වූ කල, මහාබල, යන අර්ථවත් සුබල යන ශබ්දය වේ, සුබල ශබ්ද සවර්ණ විපර්යාසව සෙබළ යනු වේ, පුරාතන සන්නසෙහි අර්ථානුගතව මෙසේ සලකත් තත් නමුදු 'සේවා භට' ශබ්දයෙන් සෙබළ ශබ්දයාගේ තද්භවය සලකත් හොත් හෙද යොග්‍යසේ පැනේ.

## උපජීව්‍යාලඞ්කාරයයි.

32 නි ම ල් සඳපහන් වැනි වැලිපිට උදු ළු
සු පු ල් මල්යහන් ලියමඬු ලියගෙපෙ ළු
එ ක ල් කෙළන වනදෙව්ලිය දුක කොම ළු
ළ ස ල් රුකෙක සැතපෙව ළපලුසිහිල ළු

32 නිමල්, (මේඝාපගමයෙන්) නිර්මලවූ; සඳපහන්වැනි, චන්ද්‍රකාන්තිය හා සමානවූ; උදුළු, උජ්ජ්වලිතවූ; වැලිපිට, වාලුකාස්ථලයෙහි; සුපුල්, සුත්ඵුල්ලවූ; මල්යහන්, පුෂ්පශයනයෙහි ද; ලියමඬු, (මාධවී ආදී) ලතාමණ්ඩපයෙහි ද; ලියගෙපෙළ, ලතාගෘහපඞ්ක්තියෙහි ද; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; කොමළ, කොමලාඞ්ගිවූ; වනදෙව්ලිය, වනදිව්‍යස්ත්‍රීන්; දුක, දශීනයකොට; එකල්, ඒ (දෙවඟනන්ගේ මල්කෙළි දක්නා) කාලයෙහි; ළපලු, තරුණ පල්ලවයෙන්; සිහිලළ, ශීතලභාවය එළවූවාවූ; ළසල් රුකෙකැ, බාලශාලවෘක්ෂයෙක්හි; සැතපෙව, විශ්‍රාමය කර.

**'තෝ සැතපෙව'** යනු ක්‍රි: ප: ස:

**උ, වි—සැතපෙව** යනු විධි කිරියයි, **තෝ** යනු උක්ත කර්තෘයි, **ළසල් රුකෙකැ** යනු අනුක්තාධාරයි, **ළපලුසිහිලළ** යනු ආධාර විශේෂණයි, **දුක** යනු පූර්ව ක්‍රියායි, **වනදෙව්ලිය** යනු අනුක්ත කර්මයි, **කෙළන** යනුද **කොමළ** යනුද කර්ම විශේෂණයි, **එකල** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, **සුපුල්මල් යහන් ලියමඬු ලිය ගෙපෙළ** යනුද **වැලිපිට** යනුද අනුක්තාධාරයි, **උදුළු** යනු ඊට විශේෂණයි, **නිමල් සඳපහන්** යනු උපමා ආධාර විශේෂණයි,

**ස, වි**—සඳුගේ පහන්=සඳපහන්, නිමල් වීද එම සඳපහන් වීද=නිමල් සඳපහන්, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; වැනි යනු තුල්‍යාර්ථයෙහි අව්‍යයයි, වැලිහුගේ පිට=වැලිපිට, විබත් සමස්; සු (මනාව) පුල්=සුපුල්, මලින් කළ යහන්=මල්යහන්, සුපුල් වීද එම මල්යහන් වීද=සුපුල් මල්යහන්, වෙසෙසුන්සමස්. විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; ලියෙන් සැදි මඬු=ලියමඬු, විබත්සමස්; ලියෙන් සැදි ගෙ=ලියගෙ, විබත්සමස්; ඔවුන්ගේ පෙළ=ලියමඬු ලියගෙ පෙළ, විබත් සමස්; සුපුල්මල්යහන්ද ලියමඬුද ලියගෙපෙළද=සුපුල් මල්යහන් ලියමඬු ලියගෙ පෙළ

* ද්වන්ද්වසමස්; එද එම කල්ද=එකල්, විසෙසුන්සමස්; වෙනෙහි දෙවි=වනදෙවි, වනදෙවියන්ගේ ලිය=වනදෙවි ලිය, විබත්සමස් ගැබ් විබත්සමස්; ළද එම සල්ද=ළසල් ළසල් විද එම රුක්විද=ළසල්රුක්, එහි-ළසල් රුකෙක, විසෙසුන්සමස් ගැබ් විසෙසුන්සමස්; ළ වීත් එම පලු වීත්=ළපලු, සිහිල අළේ=සිහිලළ, ළපලුයෙන් සිහිලළ=ළපලුසිහිලළ, විසෙසුන්සමස් ගැබ් විබත් සමස්;-

**සැනපෙව**—ස්නප ස්නපනේ යන ධාතුයි. ස්නප ධාතුවෙන් පරව විධ්‍යර්ථයෙහි අප්‍රත්‍යව වකාරාගමව ධාත්වන්ත ස්වර විපර්යාසව "සැනපෙව" යනු සිඩයි.

**ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.**

33 ම ල් ද ම් සුවඳ දුම් දුන් සොඳ වරල සිනි
ක ල් ගි ම් නිවා සැනහෙන සිහිලසර සිනි
කො ල් ල ම් ගසින් නිල් ඉවුරැති පොකුණ සිනි
ව ල් අ ම් බලම දැක යාගන් සහ තො සිනි

33 මල්දම්, (මහනෙල් දෑසමන් ආදි) පුෂ්පදාමයන් හා; සුවඳ දුම්, (කාලගුරුධූපාදිවූ) සුගන්ධධූපයන්; දුන්, දෙනලද්දාවූ; වරල සිනි, කෙශකලාපයෙන් සොඳ, සුන්දරවූ; කල්, කාන්තාවන් විසින්; ගිම් නිවා, ග්‍රීෂ්ම නිර්වාපණය කොට; සැනහෙන, ස්නානය කරනුලබන්නාවූ; සිහිලසරසිනි, ශීතලජලයෙන් උපලක්ෂිතවූ; කොල්ලම්ගසින්, තමාලගච්ඡයන් කාරණකොටගෙණ; නිල්, නිල වණ්වූ; ඉවුරැති, (උභය) කූලයන් ඇත්තාවූ; පොකුණසිනි, පුෂ්කරනිපාර්ශ්වයෙන් යුක්තවූ; වල්අම්බලම, එනම් විශ්‍රාමශාලාව; දැක, නිරීක්ෂණය කොට; සහතොසිනි, සන්තොෂ සහිත ව; යාගන්, යාත්‍රාග්‍රහණය කර.

'තෝ යාගන්' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—ගන් යනු විදි කිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, යා යනු අනුක්ත කර්මයි, සහ තොසිනි යනු ක්‍රියා විශෙෂණයි, දැක යනු පූර්ව ක්‍රියායි, වල්අම්බලම යනු අනුක්ත කර්මයි, පොකුණසිනි යනු උපලක්ෂණ අරුත්හි කරණ විබති, නිල් ඉවුරැති යනු ඊට විශෙෂණයි, කොල්ලම් ගසින් යනු අනුක්ත කරණයි, සිහිලසරසිනි යනු අනුක්ත කරණයි, සැනහෙන යනු සිහිලසරසිනි යන්නට විශෙෂණයි, නිවා යනු පූර්ව ක්‍රියායි, ගිම් යනු ඊට අනුක්ත කර්මයි, කල් යනු සැනහෙන යන අසමාප්ත ක්‍රියා පදයනට අනුක්ත කර්තෘයි, වරලසිනි යනු උපලක්ෂණ අරුත්හි කරණ විබති, සොඳ යනුද මල්දම්සුවඳදුම්දුන් යනුද ඊට විශෙෂණයි,—

* ප්‍රහසුව සලකා අර්ථසයන් ප්‍රාසා නම් යෙදිනි.

**ස, වි**—මලින් කළ දම්=මල්දම්, සුවඳ වූ දුම්=සුවඳදුම්, මල් දම්ද සුවඳදුම්ද=මල්දම්සුවඳදුම්, දෙන ලද මල්දම්සුවඳදුම් යමෙක්හිද හෙතෙම=මල්දම් සුවඳදුම් දුන්, විබත්සමස් වෙසෙසුන්සමස් දරුත්සමස් ගැබ් අන්අරුත්සමස්; වරල්හුගේ අස්=වරලස්, ඉනි, වරලසිනි, විබත් සමස්; සිහිල්අස් ඇසුරු කෙළේ=සිහිලස, සිහිලසින් යුත් රස=සිහිලසරස, ඉනි, සිහිලසරසිනි, විබත්සමස් ගැබ් විබත්සමස්; කොල්ලම් ද එම ගස් ද=කොල්ලම් ගස්, ඉන්, කොල්ලම් ගසින්; වෙසෙසුන් සමස්; නිල්වූයේද එම ඉවුරු වූයේද=නිල්ඉවුරු, නිල්වූ ඉවුරු ඇතියේ යමක්හුගේද හෙතෙම=නිල්ඉවුරැති, වෙසෙසුන් සමස් ගැබ් අන්අරුත්සමස්; පොකුණගේ අස්=පොකුණස්, ඉනි පොකුණසිනි, විබත් සමස්; වල්හි අම්බලම=වල්අම්බලම, විබත් සමස්; තොස සහවූයේ යමෙක්හිද ඒ=සහතොස, ඉනි සහතොසිනි, අන් අරුත් සමස්;

**පොකුණසිනි**—පුෂ්කරණී පාර්ශ්වයන් යනාර්ථයි, මෙහි අස යනු අංශ ශබ්දයෙන් සිද්ධයි.

**වල්අම්බලම**—කොට්ටාවතත ආසන්නයෙහි පිහිටා තිබෙන්නාවූ වල් පොලනම් ග්‍රාමයෙහි මේ නමින් ප්‍රසිද්ධව තිබූ විශ්‍රාම ශාලාවක් විය යුතුයි. මේ නම මූල්කරගෙන වල්පොල යනු ව්‍යවහාරවූයයි අපගේ කල්පනාවයි.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

31 කස්තුරිතිලක සැදි නළලත සුම — මා න
පුල්මහනෙල් මල්දම් හිස දව — මා න
සලෙළුන් යනෙන නිති කැරැ කෙළිකව — මා න
රිවිමුදුනත වනමැද වදු සුමූ — මා න

31 සුමටාන, සුමෘෂ්ටවූ හෙවත් මනොඥවූ සිලුටු ඇත්තාවූ; කස්තුරිතිලක, කස්තුරිතිලකයෙන්; සැදි, අලඞ්කෘතවූ; නළලත, ලලාට ඇති ව; පුල්, පිපුණාවූ; මහනෙල්මල්දම්, රක්තොත්පල පුෂ්පදමයන්; හිස, ශිර්ෂයෙහි; දවටාන, වෙෂ්ටනය කොට; කෙළිකවටාන, ක්‍රීඩාපරිහාසයන්; කැරැ, කොට; නිති; නිරන්තරයෙන්; සලෙළුන්, සංලාලසන්ගේ; යනෙන, ගමනා ගමන ඇත්තාවූ; සුමූටාන වනමැද, සුමූටාන නම්වූ වනමධ්‍යයට; රිවිමුදුනත, මධ්‍යාහ්නකාලයෙහි; වදු, ප්‍රවිෂ්ට වව.

'**තෝ වන මැද වදු**' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—වදු යනු විදි කිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෲයි, **වනමැද** යනු අනුක්තකර්මයි, **සුමූටාන** යනුද **යනෙන** යනුද කර්මවිශෙෂණයි, **සලෙළුන්** යනු යනෙන යන අර්ථ ක්‍රියා පදයහට අනුක්තකර්තෲයි, **කැරැ** යනු පූර්ව ක්‍රියායි, **කෙළිකවටාන**

යනු ඊට අනුක්ත කර්මයි, නිති යනු ක්‍රියාවිශේෂණයි, රිවිමුදුනත යනු 'කාලාත්‍යන්තයෙහි අනුක්තාධාරයි, දවටාන යනු පූර්ව ක්‍රියායි, පුල්මහනෙල් මල්දම් යනු ඊට අනුක්ත කර්මයි, හිස යනු ඊට අනුක්තාධාරයි, කස්තුරිතිලක සැදිනළලත යනු සළෙළුන් යන කර්තෘපදට විශේෂණයි, සුමවාන යනු කස්තුරිතිලක යන්නට විශේෂණයි,

**ස, වි**—කස්තුරියෙන් කළ තිලක=කස්තුරි තිලක, සැදියාවූ නළලත=සැදිනළලත, කස්තුරි තිලකයෙන් සැදිනළලත යමෙක් හුයේද හෙතෙම=කස්තුරිතිලකසැදිනළලත, විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් අන්අරුත්සමස්; අතිශයින් මට=සුමට, ප ඇ සමස්; පුල් වූයේද එම මහනෙල් වූයේද=පුල්මහනෙල්, පුල්මහනෙල් වූයේද එම මල්වූයේද=පුල්මහනෙල්මල්, පුල්මහනෙල් මලින් කළ දම්=පුල්මහනෙල් මල්දම්, වෙසෙසුන් සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; කෙළිද කවටද=කෙළිකවට, එම කෙළි කවටාන, දරුත් සමස්; මුදුනතෙහි රිවි යම් සමයෙක්හිද හෙතෙම=රිවිමුදුනත, එහි රිවිමුදුනත, අන් අරුත් සමස්; වන යාගේ මැද=වනමැද, විබත් සමස්;

**කස්තුරිතිලක**—ලලාට මධ්‍යයෙහි කස්තුරියෙන් කරන ලකුණකි. සඳුන් කොකුම් කස්තුරි ආදි සුගන්ධ වර්ගයකින් තිලක කිරීම සින්ධුදේශවාසීහු පවත්වාගෙන එන සිරිතකි.

සුමුවාන යනු සිඹුවාන නමින් ප්‍රසිද්ධ ග්‍රාමප්‍රදේශයයි.

**වදු**—වද වැදීමෙහි යන ධාතුයි උ ප්‍රත්‍යයවැ සිද්ධයි.

## පරිකරාලඞ්කාරයයි.

"උක්තිර් විශේෂණෛඃ සාභිප්‍රායෛඃ පරිකරෝ මතඃ" යි

දක්වූ හෙයින් අභිප්‍රාය සහිතවූ විශේෂණපද සමූහයකින් ප්‍රස්තුතාර්ථයට උපකාරය ඇතිකල්හි එහි පරිකරාලඞ්කාරය වේ.

35 ම හ නි ල මි න් සිටි නා දොඹ නී පිය ල
පි ය ස ල මි න් මලගෙහි කෙළැ රොතිනව ල
ත තු ඩ ල මි න් බිඳ විලිකුන් මියුරැ ප ල
ඉ සු ඹු ල මි න් යෙහි සැළ දඹපඳුරැව ල

35 මහ, මාර්ගයෙහි; නිලමින් සිටි, ශ්‍යාමමාන ව පෙනෙමින් සිටිනාවූ; නා, නාගවෘක්ෂය; දොඹ, පුන්නාග වෘක්ෂය; නී, නීප වෘක්ෂය හෙවත් ලක්ම්වෘක්ෂය; පියල, පියාලවෘක්ෂය හෙවත් මොරවෘක්ෂය යන මේ වෘක්ෂයන්ගේ; රොතිනවල පරාගයෙන් ගැවසී ගත්තාවූ; මලගෙහි, පුෂ්පාග්‍රයෙහි පියසලමින්, පක්ෂ චලනය කෙරෙමින්; කෙළැ, ක්‍රීඩා කොට; විලිකුන් මියුරුපල,

පක්වමධුරඵලයෙහි; තතුඩලමින්, තාගේ චඤ්චුව ප්‍රක්ෂෙප කෙරෙමින්; බිඳ, කෑදනාය කොට නොහොත් අනුභව කොට; දඹපඳුරුවල, ජම්බුස්තම්බ සමූහයෙහි; ඉසුඹුලමින්, විශ්‍රාමය කෙරෙමින්; සැළ, ශාරිකාපක්ෂිය; යෙහි, ගමනාය කරන්නෙහි.

**තෝ යෙහි** - යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි—යෙහි** යනු වත්මන් තසදකරු එකබස් කතුකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **ඉසුඹුලමින්** යනු මිශ්‍රක්‍රියායි, **දඹපඳුරුවල** යනු ඊට අනුක්තාධාරයි, **සැළ** යනු ආමන්ත්‍රණයි, **බිඳ** යනු පූර්වක්‍රියායි, **මියුරුපල** යනු ඊට අනුක්ත කර්මයි, **විලිකුන්** යනු කර්මවිශෙෂණයි, **ලමින්** යනු මිශ්‍රක්‍රියායි, **තතුඩ** යනු ඊට අනුක්ත කර්මයි, **සොළු** යනු පූර්වක්‍රියායි, **මලගෙහි** යනු අනුක්තාධාරයි, **අවල** යනු ආධාර විශෙෂණයි, **රොණින්** යනු අනුක්ත කරණයි, **සලමින්** යනු මිශ්‍රක්‍රියායි, **පිය** යනු අනුක්ත කර්මයි, **නාදෙබ නි පියල** යනු අනුක්ත සම්බන්ධයි, **සිවි** යනු සම්බන්ධ විශෙෂණයි, **නිලමින්** යනු මිශ්‍රක්‍රියායි, **මග** යනු අනුක්තාධාරයි.

**ස, වි**—නාද දෙබඳ නිද පියලද=නාදෙබනිපියල; දරුත් සමස්; මල්හි අග්=මලග්, එහි මලගෙහි, විබත් සමස්; තාගේ තුඩ= තතුඩ, විබත් සමස්; මියුරුද එම පලද=මියුරුපල, වෙසසුනු සමස්; දඹගේ පඳුරු=දඹපඳුරු, එහි දඹපඳුරුවල, විබත් සමස්;

තතුඩලමින්—ඉසුඹු ලමින් යන දෙතැන්හිම පූර්වක්‍රියාවෙහි මිශ්‍රක්‍රියායි.

විලික්ෂ, ජම්බු, විශ්‍රාම, පඤ්ජර යන ශබ්දයන්ගෙන් පිළිවෙළින් විලිකුන්, දඹ, ඉසුඹු, පඳුරු—යන ශබ්ද සිද්ධවෙත්—

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

36 රිවි තැ වු ලේ පිපි ක ම ලේ විල් ගැව සි
මතකො වු ලේ තුරු ව ද ලේ හඬන නි සි
වන සැ වු ලේ ම ග අ ස ලේ පොරසැල සි
ගුරු බැ වු ලේ ය ව අ වු ලේ නොවී කි සි

36 රිවිතැවුලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපිකමලේ පුෂ්පිත පද්මයන් ඇත්තාවූ; විල්, තඩාගයෙන්; ගැවසි, සංකීර්ණ වූ; නිසි, (සමාරයට) යොග්‍යවූ; තුරු, (ආම්‍රාදි) වෘක්ෂයන්ගේ; වදලේ, මුවාහෙහි; හඬන, නාද කරන්නාවූ හෙවත් රැවිපිළිරැව් පවත්වන්නාවූ; මතකොවුලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මගඅසලේ, මාර්ගාසන්නයෙහි; පොර සැලසි, සුඛප්‍රවෘත්තවූ; වන සැවුලේ, විලිකුළන් ඇත්තාවූ; ගුරුබැවුලේ, ගුරුබැවුල නම්වූ උන්නතභූමිප්‍රදෙශයෙහි, කිසිඅවුලේ නො වී, ස්වල්ප මාත්‍රවූ ද ආකුලයක් (බාධාවක්) නැති ව; යව, ප්‍රයාණය කරව.

**'තෝ යව'** යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—සව යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, නොවී යනු පූර්ව ක්‍රියායි, අවුලේ යනු ඊට අනුක්ත කර්මයි, කිසි යනු කර්ම විශේෂණයි, ගුරුබැවුලේ යනු අනුක්තාධාරයි, වනසැවුලේ යනු උපලකුණු අරුත්හි කරණ විබත්, පොරසැලසි යනු ඊට විශේෂණයි, මගඅසලේ යනු අනුක්තාධාරයි, මතකොවුලේ යනු උපලකුණු අරුත්හි කරණ විබත්, හඬන යනු ඊට විශේෂණයි, තුරුවදලේ යනු අනුක්තාධාරයි, නිසි යනු ක්‍රියා විශේෂණයි, ගැවසි යනු ගුරුබැවුලේ යන්නට විශේෂණයි, විල් යනු අනුක්තකරණයි, පිපිකමලේ යනු කරණ විශේෂණයි, රිවිතැවුලේ යනු පිපි යන අතීක්‍රියා පදයහට අනුක්තකරණයි,

ස, වි—රිවිහුගේ තැවුල්=රිවිතැවුල්, ඒ-රිවිතැවුලේ, විබත් සමස්; පිපියාවූ කමල් යමෙක්හිද හෙතෙම=පිපිකමල්, ඒ-පිපිකමලේ, අන් අරුත් සමස්; මත්වූවාහුද ඔහු කොවුල්වූවාහුද= මතකොවුල්, ඒ-මතකොවුලේ, වෙසෙසුන් සමස්; තුරුන්ගේ වදල=තුරුවදල, ඒ-තුරුවදලේ, විබත් සමස්; වෙනෙහි සැවුල්= වනසැවුල්, ඒ-වනසැවුලේ, විබත් සමස්; මංහුගේ අසල=මග අසල, එහි-මඟඅසලේ, විබත් සමස්; සැලසි පොර යමක්හුගේද ඔහු=පොරසැලසි, අන් අරුත් සමස්;

සූර්‍ය්‍යතාපය කරණකොටගෙන පිපුනාවූ පද්මයන් ඇති විලින් ගැවසී ගත්තාවූ යෝග්‍යවූ වෘක්ෂමුවාවෙහි මත්ත කොකිලයන් නාද පවත්වන්නාවූ මාර්ගාසන්නයෙහි එළිකුළුන් යුද්ධකරන්නාවූ ගුරුබැවුල නම් ප්‍රදේශයෙහි කිසි අවුලක් නැතිව සව-යනු හාවයි—

වද්දල, ආසන්න, පහාර, ආකූල, යන ශබ්දයන්ගෙන් පිළිවෙළින් වදුල්, අසල්, පාර—පොර, අවුල් යන ශබ්දයෝ සිද්ධවෙති.

මතකොවුලේ—මත්තවූ කෝකිලයන් යනාර්ථයි. අධික ප්‍රීතිය පුෂ්ප මධුපානය මදය යන මේ කොකිලයන් මත්වීමට හේතුයි.

ගුරුබැවුල—මේ ප්‍රදේශය වනාහි උස්වූ භූමිප්‍රදේශයක්යයි මීට පොදු නිබන්ධ "ගුරුබැවුල නාම උන්නත භූමිප්‍රදේශයෙකි" යන අර්ථයත් හැකිස්.

මේය දූතයාගේ ගමන්මාර්ගයද වෘද්ධතර උතුමන්ගේ අදහසද සැසඳූ බලන විට වත්මනැ වාහගුරුගොඩැල්ලයයි ව්‍යවහාරයට පත්ව තිබෙන ප්‍රදේශය බැව් නිසැකව පිළිගත හැකිය.

### ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.

87 වන සිරි පියුමරා බඳ රනබරණයු රැ
වට පිරි සුපුල් දුනුකේ මල්මුරුතතු රැ
බිගු පිරි වැරූ ඔලුපුලැඹිලවල තබු රැ
හිම සරි සිහිල්දියගෙබ දක යන් මිතු රැ

37 වනසිරි, වනලක්‍ෂ්මියගේ; පියුම්රාබද, පද්මරාග මාණික්‍ය යෙන් බඳනාලද්දවූ; රනාබරණයුරු, ස්වර්ණාභරණයට බඳුවූ ආකාර ඇති; මල්මුරුතතුරු, පුෂ්ප සහිත අශ්වකර්ණ වෘක්‍ෂ යන්ගේ අන්තරයෙහි; සුපුල්දුනුකෝ, සුත්පුල්ලවූ රාජකෙතකී වෘක්‍ෂයන්; වට, භාත්පස්හි; පිරි, සම්පූර්ණවූ; බිගුපිරිවැරූ, භෘඞ්ග යන්විසින් පිරිවරනලද්දවූ; ඔලු, ශාලූක පුෂ්පය; උපුල්, උත්පලය; ඇඹුල, කෛරවය යන මෙයින්; අවල, ගැවසිගත්තාවූ; තඹුරු, තාමරසයන් ඇත්තාවූ; හිමසරිසිහිල්දිය, හිම (රාශියක්) මෙන් ශීතලවූ උදකයන් ඇත්තාවූ; හෙබ දුක, (මහා) හ්‍රදය දර්‍ශනය කොට; මිතුරු, මිත්‍රය; යත්, ප්‍රයාණය කරත්.

'තෝ යත්' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—යත් යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්‍තෘයි, දුක යනු පූර්වක්‍රියායි, හිමසරිසිහිල්දියහෙබ යනු ඊම කර්මයි, බිගුපිරිවැරූ ඔලුපුලැඹුලවල තඹුරු යනුද පිරි යනුද කර්මවිශෙෂණයි, සුපුල්දුනුකෝ යනු පිරියත්නට අනුක්ත කර ණයි, වට යනුද මල්මුරුතතුරු යනුද අනුක්තාධාරයි, මිතුරු යනු ආමන්ත්‍රණයි,—

උ, වි--වනද එම සිරිද=වනසිරි, වෙසෙසුන් සමස්; පියුම්රා යෙන්බද=පියුම්රාබද, විබත් සමස්; *රතින්කළ අබරණ=රන බරණ, විබත් සමස්; පියුම්රාබදද එම=රනබරණද පියුම්රාබද රනබරණ, වෙසෙසුන් සමස්; වනසිරියගේ පියුම්රාබද රනබරණ= වනසිරි පියුම්රාබද රනබරණ, විබත් සමස්; වනසිරි පියුම්රාබද රනබරණට බඳු අයුරු යමක්හුගේද හෙතෙම=වනසිරි පියුම්රා බද රනබරණ යුරු, අන්අරුත්සමස්; සුපුල්ද එම දුනුකෝද= සුපුල්දුනුකෝ, වෙසෙසුන් සමස්; මලින්යුත් මුරුත=මල්මුරුත; ඔවුන්ගේ අතුරු=මල්මුරුතතුරු, විබත් සමස් ගැබ් විබත් සමස්, බිගුන් විසින් පිරිවැරූ=බිගුපිරිවැරූ, විබත් සමස්; ඔලුද උපුල්ද ඇඹුල්ද=ඔලුපුලැඹුල්, ඔලුපුලැඹුලින් අවල=ඔලුපුලැඹුලවල, දූරුත් සමස් ගැබ් විබත් සමස්; ඔලුපුලැඹුලවලින් යුත් තඹුරු=ඔලුපුලැලවල තඹුරු, විබත් සමස්; බිගු පිරිවැරූ ඔලුපුලැඹුලවල තඹුරු යමෙක්හිද හෙතෙම=බිගු පිරිවැරූ ඔලුපුලැඹුලවල තඹුරු, අන්අරුත් සමස්; හිම හා සරි= හිමසරි, විබත් සමස්; සිහිල් වීද එම දියවීද=සිහිල්දිය, වෙසෙ සුන් සමස්; හිමසරිවූ සිහිල් දිය=හිමසරිසිහිල්දිය, වෙසෙසුන් සමස්; හිමසරි සිහිල් දියෙන් යුත් හෙබ=හිමසරසිහිල්දියහෙබ, විබත් සමස්;

* (මෙහි දක්වා තිබෙන ස මාස ගනි සමාසවුවත් ඉතා දීර්ඝ නිසා එසේ පාඨ නම් කෙදිමු.)

**පියුම්රා**—පද්මරාග නම් එක්තරා මාණික්‍ය භේදයකි. මේ වනාහි පද්මයකාව බඳු රක්තවර්ණයක් බබලන හෙයින් එනම් විය.

ධනුෂ්කේතකී, ශෝභිත, ඝන ශබ්දයන්ගෙන් පිළිවෙළින් දුනුකේ හෙබ යනු ගත්තාහි.

හෙබ — මෙහි දක්වා තිබෙන හෙබ කොලොන්නාවේ වැවයයි හැඟේ.

## රූපක උපමායෙන් සංසෘෂ්ටවූ ස්වභාවෝක්තියි.

38 සලා දුලා පියොවුරු තඹර රොන් ර ත
පුලා නිලා උපුලන් ලාගෙන කන ත
කලා පිලා නොව ඇල්ගෙවි කෙළින ඉ ත
බලා පලා යව අස්වන් ගුරුළුකෙ ත

38 දුලා, උජ්ජ්වලත්වූ; පියොවුරු, පයොධරයෙහි; තඹර, තාමරසයන්ගේ; රතරොන්, රක්තරේණූන්; සලා, විකිණි කොට; නිලාඋපුලන්, නීලොත්පලයන්; පුලා, ප්‍රඵුල්ල කොට හෙවත් පෙති විදා; කනත, කර්ණාන්තයෙහි; ලාගෙන, වින්‍යාස කොට ගෙන; කලාපිලා නො වැ, කලහපීඩාවක් නො වී; ඉත, අන්‍යොන්‍ය මිත්‍රව; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; ඇල්ගෙවි, ශාලිගොපිකාවන් ඇත්තාවූ; අස්වන්, ශස්‍යසමෘද්ධියෙන් යුක්තවූ; ගුරුළුකෙත, ගුරුළු කෙත නම්වූ ශාලික්ෂෙත්‍රය; බලා, නිරීක්ෂණය කොට; පලා යව, ප්‍රයාණය කරව.

**'නෝ පලා යව'** යනු ක්‍රි: කා: ප: ස:

**ද, වි—පලායව** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **බලා** යනු පූර්වක්‍රියායි, **ගුරුළුකෙත** යනු ඊට අනුක්ත කර්මයි, **අස්වන්** යනුද **කෙළින** යනුද කර්මවිශෙෂණයි, **ඇල්ගෙවි** යනු කෙළින යන අපර්ක්‍රියා පදයහට අනුක්ත කර්තෘයි, **ඉත** යනු ඊට විශෙෂණයි, **නොවැ** යනු පූර්වක්‍රියායි, **කලාපිලා** යනු ඊට අනුක්ත කර්මයි, **ලාගෙන** යනු පූර්වක්‍රියායි, **උපුලන්** යනු ඊට අනුක්ත කර්මයි, **පුලා** යනුද **නිලා** යනුද කර්මවිශෙෂණයි, **කනත** යනු අනුක්තාධාරයි, **සලා** යනු පූර්වක්‍රියායි, **තඹරරොන්** යනු ඊට අනුක්ත කර්මයි, **රත** යනු කර්මවිශෙෂණයි, **පියොවුරු** යනු අනුක්තාධාරයි, **දුලා** යනු ආධාර විශෙෂණයි;—

**ස, වි**—තඹරන්ගේ රොන්=තඹරරොන්, විබත් සමස්; කන් හුගේ අත්=කනත්, එහි කනත, විබත් සමස්; කලාද පිලාද=කලාපිලා, දරුත්සමස්; ඇල්ගෙවිද ඔමලියද=ඇල්ගෙවිලිය, විබත් සමස්; අස් ඇත්තේ=අස්වන්, ගුරුළු නම්වීද එම කෙත් වීද=ගුරුළුකෙත්, අස්වන්වීත් එම ගුරුළුකෙත් වීත් එමනුයි=අස්වන් ගුරුළුකෙත්, එය-අස්වන් ගුරුළුකෙත, වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්;

පසෙඩර, තාම්‍රස, රේණු, සැලහපිලා, සලිංගොපි, ශබ්‍දවත්, යන ශබ්දයන් ගෙන් පිළිවෙළින් පියොවුරු, තඹර, රොන්, කලාපිලා, ඇල්ගොම්, අස්වන්, යන ශබ්ද සිත්ත වෙත්. ඇල්ගෙ.වි යනු සන්ධිවශයෙහි ඇල්ගෙවි යනු වේ.

ගුරුළුසොන — ගුරුළුකෙත ශබ්දයෙන් ඉතා සම්බන්ධවූවක් බැව් මේ කවියෙන් පෙනේ. වත්මිතෑ මීට ගුරුල්ලකෙතයයි ව්‍යවහාර කරත්.

### ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

39 බ න් නේ මරාමිණිදුල පබළු මුතුප ට  
වැ න් නේ ගමබුගෙලෙ පලමල් කුමුකු ව ට  
ග න් නේ තසිත එබැවින් නොවැද කෙළිය ට  
ය න් නේ වෙළඳගොඩ දූක මඳකලක් සි ට

39 පල, (නිලවණී රක්තවණී) ඵලයෙන් හා; මල්, පුෂ්ප (පරිලිකාවන්) යුක්තවූ; කුමුකුවට, (පතුවගළ) වෘතිවූ පූගවෘක්ෂ; ගම්බුගෙලෙ, ග්‍රාම (භූමි) අම්බිකාවගේ (කාන්තාවගේ) කණ්ඨයෙහි; බන්, බඳනාලද; නේ, අනෙකවූ; මරාමිණි, මරකත මාණික්‍යයෙන්; දුල, බබළන්නාවූ; පබළු මුතුපට වැන්නේ, ප්‍රවාලමිශ්‍රවූ මුක්තාකලාපයක් වැන්නේය; එබැවින්, ඒහාවයෙන්; තසිත ගන්නේ, තාගේ මනොරඤ්ජනය කරන්නේය (එහෙයින්); කෙළියට නො වැද, ක්‍රීඩා පිණිස ප්‍රවිෂ්ට නොව; වෙළඳගොඩ, වෙළඳගොඩ නම්වූ ග්‍රාමය; දූක, දර්ශනය කොට; මඳකලක් සිට, ස්වල්ප කාලයක් අවස්ථානය කොට; යන්නේ, ගමනය කරන්නෙහි.

'කුමුකුවට තසිත ගන්නේ' යනුද 'නෝ යන්නේ' යනුද ක්‍රි: කා: ප: ස:

**උ, වි** – ගන්නේ යනු අනාකල් අන්කරු එකබස් කතුකිරියයි, කුමුකුවට යනු උක්ත කර්තෘයි, තසිත යනු අනුක්ත කම්යි, බන්නේ මරාමිණිදුල පබළු මුතුපට යනුද වැන්නේ යනුද පල මල් යනුද කර්තෘවිශෙෂණයි, ගම්බුගෙලෙ යනු අනුක්තාධාරයි, යන්නේ යනු විදිකිරියයි, නෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, දූක යනු පූර්වක්‍රියායි, වෙළඳගොඩ යනු අනුක්ත කම්යි, සිට යනු පූර්වක්‍රියායි, මඳකලක් යනු අසත්යෝගි කම් විබත්, නො වැද යනු පූර්වක්‍රියායි, කෙළියට යනු අනුක්ත කම්යි, එබැවින් යනු හෙතුවර්ථයෙහි අපාදනයි;—

**ස, වි**—*මරාවිත් එම මිණි වීත්=මරාමිණි, වෙසෙසුන් සමස්; නේද එම මරාමිණිද=නේ මරාමිණි, වෙසෙසුන් සමස්; නේ මරාමිණින් උදුල=නේමරාමිණිදුල, විබත් සමස්;

* පහසුව පිණිස සමාසයක් පාසා කාවි යෙදීමු.

මුතුයෙන් කළ පට=මුතුපට, විබත් සමස්; පබළුයෙන් යුත් මුතුපට=පබළු මුතුපට-විබත් සමස්; නේමරාමිණිදුලවින් එම පබළු මුතුපටවින්=නේමරාමිණිදුල පබළුමුතුපට, වෙසෙසුන් සමස්; බන්ද එම නේමරාමිණිදුල පබළු මුතුපටද=බන්නේ මරාමිණිදුල පබළු මුතුපට, වෙසෙසුන් සමස්; බන්නේ මරාමිණිදුල පබළු මුතුපට හා වැනිවූයේ=බන්නේ මරාමිණිදුල පබළුමුතුපට වැන්නේ, විබත් සමස්; ගම්මම අඹු=ගම්ඹු, ගම්ඹුව ගෙල=ගම්ඹුගෙල; එහි ගම්ඹුගෙලෙ, වෙසෙසුන්සමස් ගැබි විබත් සමස්; පලසියො මල්=පලමල්, විබත් සමස්; කුඹුකුන්ගේ වට=කුඹුකුවට, විබත්සමස්; තාගේ සිත්=තසිත්, එය තසිත, විබත් සමස්; එද එම බැව්ද=එබැව්, ඉන්-එබැවින්, වෙසෙසුන්සමස්; වෙළඳුන්ගේ ගොඩ=වෙළඳගොඩ, විබත් සමස්; මදද එම කල්ද= මදකල්, එය-මදකලක්, වෙසෙසුන් සමස්;

පවාල, කුම්භ, ගල, යන ශබ්දයන්ගෙන් පිළිවෙළින් පබළු, කුඹුකු, ගෙල යනු සිද්ධයි.

**ගන්නේ**—ගත් ධාතු හා නේ ප්‍රත්‍යයවැ සිඬයි.

**සන්නේ**--සා ධාතුවෙන් පරව අන්නේ ප්‍රත්‍යයවැ සිඬයි.

## උපමා රූපකාඛ්‍යානභාවොක්ති සංසෘෂ්ටියි.

40 අවට සුපිපි සපු දුනුකේ සල ලාන  
හඬන තැනින් තැන විලිකුළු කිර ලාන  
පැසී නැමි කරල් රත්හැල් සහ ලාන  
වඩින මැනවි මහවෙල මැද වෙර ලාන

40 අවට, හාත්පසින් හෙවත් ක්‍ෂේත්‍රය වටකොට; සුපිපි, සුපුෂ්පිතවූ; සපු, චම්පකවෘක්‍ෂය; දුනුකේ, රාජකෙතකීවෘක්‍ෂය; සලලාන, සරලවෘක්‍ෂය හෙවත් සොරගසය යන මේ ආදිවෘක්‍ෂයෙන් යුක්තවූ; තැනිග් තැන, ඒ ඒ ස්ථානයෙහි; හඬන, නාද කරන්නාවූ හෙවත් රැව්පිළිරැව් දෙන්නාවූ; විලිකුළුකිරලාන, කාදම්බ පක්‍ෂීන් හා කුරරපක්‍ෂීන් ඇත්තාවූ; පැසී, පරිණතභාවයට පැමිණ; නැමි, අග්‍රාවනතවූ; කරල්, සස්‍යමඤ්ජරීන් ඇත්තාවූ; රත්හැල්, රක්තශාලීයෙන්; සහලාන, යුක්තවූ; වෙරලාන, වෙරලාන නම්වූ; මහවෙල මැද, මහාක්‍ෂෙත්‍ර මධ්‍යයෙහි; වඩිනමැනවි, ප්‍රස්ථානය කිරීම යහපත්වන්නේයි.

'වඩින මැනවි' යනු ක්‍රි: කා: පැ: සඃ

උ, වි—මැනවි යනු ක්‍රියායි, වඩින යනු උක්තකර්තෘයි, මැද යනු අනුක්තාධාරයි, මහවෙල යනු අනුක්ත සම්බන්ධයි, වෙරලාන යනුද පැසි නැමි කරල් රත්හැල් සහලාන යනුද හඬන

යනුද සුපිපි සපු දුනුයෝ සලලාන යනුද සම්බන්ධ විශේෂණ යෝයි, අවට යනු අනුක්තාධාරයි, නැණින් යනු අදර අරුතැ කරණ විබති, නැනැ යනු අනුක්තාධාරයි, විලිකුළු කිරලාන යනු හඬන යන අසමාප්ත ක්‍රියාපදයහට අනුක්ත කර්තෘයි,

ස, වි—සපුද දුනුයෙන්ද සලලද=සපුදුනුයේ සලල,සු(මනාව) පිපි=සුපිපි, සුපිපි සපුදුනුයේ සලල යමෙක්හිද හෙතෙමි=සුපිපි සපුදුනුයේ සලලාන, දරුත් සමස්; අවිය සමස් ගැබ් අන්අරුත් සමස්; විලිකුළුද කිරල්ද=විලිකුළුකිරල්, උන්-විලිකුළු කිරලාන, දරුත්සමස්; පැසුණෝද එම නැමුණෝද=පැසීනැමි, පැසීනැමුණො හුද ඔහු කරල් වුවාහුද=පැසිනැම්කරල්, රත්වූවාහුද ඔහු හැල් වූවාහුද=රත්හැල්,පැසිනැම් කරල්වූවාහුද ඔහු රත්හැල් වූවාහුද= පැසිනැම් කරල් රත්හැල්, පැසිනැම් කරල් රත්හැලින් සහලාන= පැසිනැම් කරල් රත්හැල් සහලාන, වෙසෙසුන්සමස් ගැබ් විබත් සමස්; මහවූයේද එම වෙල්වූයේද=මහවෙල්, ඔහුගේ-මහවෙල, වෙසෙසුන් සමස්.

වෙරලාන —මෙ නමින් දක්වා තිබෙන වෙල කිත්සිරිමෙවන් කැරූ විහාරය අසල පිහිටා තිබෙන වැරැල්ලාන යයි දැන් ප්‍රකට ප්‍රදෙශය වේ.

ස්වභාවෝක්ත්‍යලංකාරයි.

41 ප ත් ගන පුල්මල් දෙඹතුරෙක පියකා රැ
සි ත් පිනවා ඉඳ සැළලිහිණින් අතු රැ
ග ත් සරතැස හැර විඳ සුවඳ මඳ ම රැ
කි ත් සිරිමේ වෙහෙරට වදුව පස්ව රැ

41 පත්ගන, පත්‍රයෙන් ඝනවූ; පුල්මල්, ප්‍රඵුල්ල පුෂ්පයෙන්; පියකරු, මනොඥවූ; දෙඹතුරෙක, පුන්නාග වෘක්ෂයෙක්හි; සැළලිහිණින් අතුරු, ශාරිකාපක්ෂීන්ගේ මධ්‍යයෙහි; ඉඳ, නිෂණ්ණකොට; සිත්පිනවා, චිත්තප්‍රීතියට පමුණුවා; සුවඳමඳමරු, සුගන්ධමන්දමාරුතයන්; විඳ, ස්පර්ශ කොට; ගත්සරතැස, ගාත්‍රයෙහි ශ්‍රාන්තභාවය; හැර, වර්ජිතකොට හෙවත් ගමන් විඩා දුරුකොට; පස්වරු, අපරාහ්ණකාලයෙහි; කිත්සිරිමේ වෙහෙරට, කීර්තිශ්‍රීමෙඝ නම් වූ විහාරයට; වදුව, ප්‍රවෙශ වව.

'තෝ කිත්සිරිමේ වෙහෙරට වදුව' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි - වදුව යනු විධික්‍රියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, කිත්සිරිමේවෙහෙරට යනු අනුක්ත කර්මයි, පස්වරු යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, හැර යනු පූර්වක්‍රියායි, ගත්සරතැස

යනු ඊට අනුක්තකර්මයි, ඉඳ යනුද පිනවා යනුද පූර්වක්‍රියායි, හිත් යනු පිනවා යන්නට අනුක්තකර්මයි, අතුරැ යනු අනුක්තාධාරයි, සැළලිහිණින් යනු අනුක්තසම්බන්ධයි, දෙඹතුරෙක යනු අනුක්තාධාරයි, පියකරු යනු ආධාර විශේෂණයි, පත්ගනපුල්මල් යනු අනුක්තකරණයි;

**ස, වි**—පතින්ගන=පත්ගන, පුල්මල් යමෙක්හිද හෙතෙම= පුල්මල්, පත්ගනවූයේත් එම පුල්මල්වූයේත් එමනුයි=පත්ගන පුල්මල්, දෙඹ වූයේද එම තුරුවූයේද=දෙඹතුරු, පත්ගන පුල්මල් වූයේද එම දෙඹතුරුද=පත්ගනපුල්මල් දෙඹතුරු, පත් ගනපුල් දෙඹතුරුද එම එක්ද=පත්ගනපුල්මල් දෙඹතුරෙක්; එහි පත් ගනපුල්මල් දෙඹතුරෙක, විබත්සමස් අන්අරුත්සමස් වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්; පියකරනුයේ=පියකරු, උපපද සමස්; සැළවූයේද එම ලිහිණිවූයේද=සැළලිහිණි, උන් සැළලිහිණින්, වෙසෙසුන්සමස්; ගතෙහි සරනැස=ගත්සරනැස, විබත් සමස්; මඳවීද එම මරුවිද=මඳමරු, සුවඳින් යුතු මඳමරු=සුවඳ මඳමරු, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; කිත්සිරිමේ විසින් කළ වෙහෙර=කිත්සිරිමේ වෙහෙර, විබත්සමස්; පසුද එම වරුද=පස් වරු, වෙසෙසුන්සමස්;

**කිත්සිරි මේ වෙහෙර**—මේ නමින් ප්‍රසිද්ධව තිබෙන්නාවූ විහාරස්ථානය කිත්සිරිමෙවන් රජතුමා විසින් කරවනලද්දකි, මේ නමින් රජවරු තිදෙනෙක් විසූ නිසා මේ විහාරය කරවන ලද්දේ කවර කිත්සිරිමෙවන් රජු විසින් දැයි නිශ්චය වශයෙන් කිව නොහේ. ගඟසිරිපුර (ගම්පල) රාජ්‍යය කළ විකුම බාහු රජුගේ අග්‍රාමාත්‍යවූ දසවෙනි අලගක්කෝනාර තෙමේ කැලණිපුරය සමෘද්ධිමත් කරවන කාලයෙහි මෙම විහාරය ප්‍රතිසංස්කරණය කළ බැව්ද සාහිත්‍ය විල්ගම්මූල සඞ්ඝරාජයන්වහන්සේගේ පරම්පරාවේ භික්ෂූන් මෙහි වැඩ විසූ බැව්ද මෙහි පිහිටුවා තිබෙන ශිලාලිපියෙන් පෙනේ.

**ශිලාලිපිය**—ශ්‍රී බුද්ධ වර්ෂ එක්වාදහස් අටසිය සත්‍යාසහවුරුද්දක් ගිය කල ශ්‍රීමත් ගඟතලාකරඹවලාන් පරපුරෙන් පැවිණි සාහිත්‍ය විල්ගම්මූල මාහිමි පැරැ කිත්සිරිමේ රජය පටන් ඤාති පරම්පරාවෙන් හා බන්ධුපරම්පරාවෙන් දසපරම්පරාවක් එක්සන්තානයෙ පැවත ආ කිත්සිරිමෙවන් කැලණි විහාරයේ පිළිමගෙයි ඇතුළු වාසල්තුන මඬපය දාගැබ බෝධිකොටු දෙක පවුරුපදනම් පසුමාලයේ තනගෙවල් පස ඇතුළුවූ සියලු ජරාවාස කර්මාන්ත කුසලය විශිෂ්ට පරපුරෙන් පැමිණි නිශ්ශංක අලගක්කෝනාර නම් අමාත්‍ය ශ්‍රේෂ්ඨයාණන්ගේ පරම්පරාවෙන් පැවත ආ දසවැනි අලගක්කෝනාර නම් අමාත්‍යනාථයාණන් උපස්ථම්භකරවාගෙන මුල පටන් කරවන්නාසේ කරවා මහාබෝධින්වහන්සේගේ කොත් දසතුනක් පැලඳවා නවකුලක් අන්මහා බෝධි කොටුව මුල පටන් කරවා නමින් කැරවූ බෝධිකොටුව හා බෝධින්වහන්සේ බොහෝ කලක් පැවැත්ත මනා වේදූයි සිතා රාජදත්තයෙන් ලත් මැද පාණබුත්තේ බද පොළොන්නාවෙන් කුඹුරු බිජුවට දෙයාල පසමුණක් හා මෙහි බද ගෙවතු ගස කොළවල් පිට ඇතුළුවූ තැන් හා පොළොන්නා මූන්ද දෙවා

ඇතුළුවූ ගැණු පිරිමි නිලයෙන් මිනිස් පසළොසක් හා රාත්‍රී බණ නිමෙන් රාජප්‍රසාදයෙන් ලත් මිනිසුන් ගෙන් කොත්නත් දෙවා මෙකුන් කොළවාද ඇතුළුවූ මිනිස් පසළොසක් ඇතුළුවූ මිනිස් නිලතිසක් හා සෑහී සියලු ගම් කුඹුරු මිනිසුන් ආදීවූ සදස පත්දසක් අවුරුදු පවතිනා ලෙස බෝධින්වහන් සේට ඉරසඳ පමුණුකොටැ පුදවා වදාළසේක.

මිතු ඇතිවන බන්ධු පරම්පරාවේ ගතාරා පිරිවෙන් සිටිතැනත් ඒසිනුත් සෙසු උභයවාසයේ මහා සංඝයාවහන්සේ විසිනුත් රජ යුවරජ මනැමිනි ආදීන් විසිනුත් මෙපින්කම අනුමෝදන් වැ චිරාත් කාලයක් පැවැත්විය යුතු.

**වඳුව**—වද-වැඳීමෙහි යන ධාතුයි. එයින් පරව උප්‍රත්‍යයනා වනාරාගම්ව සිඹයි.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

42 සොඳ මුනිරද පිඬුකල යස මෙරද ස ම
පු ද කල ඔහු නෙත් නිල්කැලුමෙව් බැර ම
ස ද යුරු සඳවෙලෙන් රැඳි රුසිරු මනර ම
ව ද නෙති තෝ දහගැප් මහබෝ පිළි ම

42 සොඳ, (සර්වගුණසෞන්දර්‍ය්‍යයෙන්) ප්‍රශස්තවූ; මුනිරජ, සර්වඥ රාජෝත්තමයාණන්වහන්සේගේ; පිඬුකළ, පිණ්ඩීකෘත වූ හෙවත් කැටිකරනලද්දවූ; යසමෙරදසම, යශෝමේරු හා සමානවූ ද; ඔහු, ඒ සර්වඥයන්වහන්සේ විසින්; පුදකළ, පූජාකරනලද්දවූ; බැරම, බෘහත්වූ (බොහෝවූ); නෙත්, නෙත්‍රයන්ගේ; නිල්කැලුමෙව්, නීල කාන්තීන් හා සමානවූ ද; සඳවෙලෙන් රැඳි, සන්ධ්‍යාවලාහකයෙන් රජිතවූ; සඳයුරු, චන්ද්‍රබිම්බයට බඳුවූ ආකාර ඇති; මනරම, මනොඥවූ; රුසිරු, රූපශ්‍රී ඇත්තාවූ ද; දහගැප් මහබෝ පිළිම, (යථාක්‍රමයෙන්) ධාතුගර්භචෛත්‍යය ද මහාබෝධීන්වහන්සේ ද ප්‍රතිමාරූපය ද; තෝ වඳනෙහි, තෝ නමස්කාර කරන්නෙහි.

**‘තෝ දහගැප් මහබෝ පිළිම වඳනෙහි’ යනු ක්‍රි: කා: ප: ස:**

**උ, වි**—වඳනෙහි යනු අනාකල් තසදකරු එකබස් කතු කිරියයි, තෝ යනු උක්තකර්තෘයි, දහගැප්මහබෝපිළිම යනු අනුක්ත කම්යි, රුසිරු යනුද මනරම යනුද අයුරු යනුද ප්‍රතිමාබද්ධ කම්යනට විශේෂණයි, සඳ යනු ගාසබදෙහි කතුවිබත්, රැඳි යනු සඳ යන්නට විශේෂණයි, සඳවෙලෙන් යනු රැඳි යන අසම්ක්‍රියා පදයනට අනුක්තකරණයි, එව් යනු උපමාද්‍යෝතක යෙහි අව්‍යයයි, නෙත්නිල්කැලුම් යනු මහබෝ යන කම්යනට විශේෂණයි, පුදකළ යනුද බැරම යනුද නෙත්නිල්කැලුම් යන්නට විශේෂණයි, ඔහු යනු පුදකළ යන අසම්ක්‍රියාපදයනට අනුක්තකර්තෘයි, සොඳමුනිරදපිඬුකලයසමෙරදසම යනු දහගැප් යන්නට විශේෂණයි;—

**ස, වි**—මුනිනට රද=මුනිරද, සොඳවීත් ඔහුම්ය මුනිරදවීත් ඔහුමනුයි=සොඳ මුනිරද, පිඩුකරනලද්දේ=පිඩුකල, යසම්මෙරද= යසමෙරද, පිඩුකෙළේත් එම යසමෙරද වූයේත් එම්නුයි පිඩුකළයසමෙරද, සොඳමුනිරදහුගේ-පිඩුකලයසමෙරද=සොඳ මුනිරදපිඩුකල යසමෙරද, සොඳ මුනිරද පිඩුකලයසමෙරද හා සම=සොඳමුනිරද පිඩුකලයසමෙරදසම, විබත්සමස් වෙසෙසුන් සමස් විබත්සමස් වෙසෙසුන්සමස් වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි විබත් සමස්; නිල් වූයේද එම කැලුම් වූයේද=නිල්කැලුම්, නේතුන්ගේ නිල්කැලුම්=නෙත්නිල්කැලුම්, වෙසෙසුන්සමස් ගැබි විබත්සමස්; සඳැහිවෙල=සඳවෙළු, ඉන්-සඳවෙලින්, විබත්සමස්; රුසිරෙන්මනරම=රුසිරුමනරම, විබත්සමස්; ගැබිහිද යමෙක්හිද හෙතෙම=දහගැප්, මහවීද එම බෝවීද=මහබෝ, දහගැප්ද මහ බෝද පිළිමද=දහගැප්මහබෝපිළිම, අන්අරුත්සමස් වෙසෙසුන් සමස් ගැබි දුරුත්සමස්;--

මේ කවියෙහි මුල්පාදත්‍රයෙන් දක්වන ලද විශෙෂණත්‍රය දහගැප් මහබෝ පිළිම යන විශෙෂ්‍යත්‍රයට පිළිවෙළින් යොදනබැව් සැලකිය යුතුයි.

**සොඳමුනිරද පිඩුකල යස මෙරද සම**—මෙය දහගැප් යන්නට විශෙෂණකොට යොදනලද්දයි, සර්‍වඥයන්වහන්සේගේ කීර්ති නැමති රශ්මිය එක ස්ථානයෙක්හි රැස්කළොත් ඉතා මහත් පුඤ්ජයක් වෙයි. කීර්තිය ශුභ්‍ර වර්‍ණයයි කවි සමයොක්ත හෙයින් කිත්සිරිමෙවන් අතිශය ශුභ්‍රවර්‍ණ දාගැබ ඊට සමාන කොට දක්වූහ.

**පුදකලබහුනෙත් නිල්කැලුමෙව්බැරම**—මේ වනාහි මහබෝ යන්නට විශෙෂණකොට යොදනලද්දයි. අනිමිෂලොචන සතියෙහි බුද්ධරජාණන් වහන්සේ විසින් පූජාකරන ලද්දවූ බොහෝ නෙත්‍රයන්ගේ නීලකාන්ති මෙන් නීලවර්‍ණවූ යයි යන මෙයින් මහාබොධියෙහි ප්‍රකෘති නීලවර්‍ණ නෙත්‍රයන් පිළිබඳ නීලකාන්තිය හා උත්ප්‍රෙක්‍ෂාකොට දක්වන ලදී. අනිමිෂලොචන සතිය නම් බුඬත්වයට පැමිණ වදාරා නොපියූ ඇසින් බොධි පූජාකොට ගතකළ දෙවෙනි සතියයි.

**මහාබොධිවංශයෙහි**--තතො ඔරුයහ මහාබොධිපල්ලඞ්කතො ඊස කං පාචීනනිස්සිතෙ උත්තරදිසාභාගෙ ඨත්වා ඉමස්මිං විත මෙ බොධිමූලෙ සබ්බඤ්ඤුතඤ්ඤාණං පටිවිඬ්ඪන්ති අපරිමිත සමය සමුපචිත පාරමිතා ඵලාධිගම ඨානං පල්ලඞ්කං බොධිරුක්ඛඤ්ච පඤ්ච්පසාභසමුදයසමුජ්ජලෙන පිනිමිසයි නෙත අනිමිසෙන පෙම්භාරනායනයුගලෙන පූජයමානො සත්තාහං තත්ථ අට්ඨාසි.

(සර්‍වඥයන් වහන්සේ) අනසින් බැස මහාබොධිපර්‍ය්‍යඞ්කයෙන් ඊසාන කොණෙහි සිට එකාන්තයෙන් මා විසින් මේ බොධිමූලයෙහිදී සර්‍වඥතාඥනය ප්‍රති වෙධ කරනලදැයි කිසා ප්‍රමාණාතික්‍රාන්ත කාලයක් මුළුල්ලෙහි රැස්කරනලද පාර මිතාවන්ගේ ඵලයට පැමිණි ස්ථානයද පර්‍ය්‍යඞ්කයද බොධිවෘක්‍ෂයද පස්වණක් පැහැයෙන් බබලන්නාවූ ප්‍රීතියෙන් විකසිතවූ නොසෙලනලද ඇසිපිය ඇති ප්‍රෙම යෙන් හරිතවූ නෙත්‍රයුගලයෙන් පූජා කෙරෙමින් එතැන්හි සතියක් මුළුල්ලෙහි වැඩසිටියේක-යනු භාවයි,

වදනෙහි--වද වැද්මෙහි යන ධාතුයි.

## උපමා උත්ප්‍රෙක්‍ෂා ගත් ක්‍රමාලඞ්කාරයි.

ක්‍රමාලඞ්කාරලක්‍ෂණ ශ්‍රී සඞ්ඝරක්‍ෂිත මහාස්වාමිපාදයො සුබොධා, ලඞ්කාරයෙහි:—

"උද්දිට්ඨානං පදත්ථානං අනුද්දෙසො යථාක්කමං
සඞ්ඛ්‍යාන න්ති නිද්දිට්ඨං යථාසඞ්ඛ්‍යං කමොපි ච"—යනුවෙන් කීහු.

පළමුකොට කියනලද කිසි වස්තූන්ගේ උද්දිෂ්ටක්‍රමය නොඉක්ම අන්‍යානතරයක් ඇසුරුකොට තැබන තීම සඞ්ඛ්‍යාන යථාසඞ්ඛ්‍ය නම් ලත් ක්‍රමාලඞ්කාරයි.

43 ස ල් සපු කීණ දෙඹරුරඟනා මිදෙ ලී
පු ල් එරහැඳි හෝ පලු මී අඹ පලො ලී
පොල් පුවකිගු රඹමලබුලත සලිම ලී
නි ල් ගනසා සෙවණලු දෙතෙර මනක ලී

43 සල්, ශාලවෘක්‍ෂය; සපු, චම්පකවෘක්‍ෂය; කීණ, තමෙරු වෘක්‍ෂය; දෙඹ, පුන්නාගවෘක්‍ෂය; රුරඟ, ඖෂධිවෘක්‍ෂය; නා, නාගවෘක්‍ෂය; මිදෙලි, නිචුලවෘක්‍ෂය; පුල්, ප්‍රඵුල්ලවූ; එරහැඳි, කෘතමාලවෘක්‍ෂය; හෝ, අශොකවෘක්‍ෂය; පලු, පීලුවෘක්‍ෂය; මීඅඹ, සහකාරවෘක්‍ෂය; පලොලි, පාටලිවෘක්‍ෂය, පොල්, නාරිකෙල වෘක්‍ෂය; පුවක්, පූගවෘක්‍ෂය; ඉගු, ඉක්‍ෂුවනය; රඹ, රම්භාවෘක්‍ෂය; මලබුලත, මලයනාම්බූලලතාලිඞ්ගිතවූ; සලිමලි, ශාල්මලිවෘක්‍ෂය යන මොවුන්ගේ; නිල්, නීලවර්‍ණවූ; ගන, සාන්ද්‍රවූ; සා, ශාඛා වන්ගේ; සෙවණලු, ඡායාමණ්ඩලයෙන්; මනකලි, මනොඥවූ; දෙතෙර, උභයතීරයෙහි-

උ, වි– දෙතෙර යනු අනුක්තාධාරයි, නිල්ගනසාසෙවණලු යනුද මනකලි යනුද ආධාරවිශෙෂණයි, පොල්පුවකිගුරඹමල බුලතසලිමලි යනුද පුල්එරහැඳිහෝපළුමීඅඹපලොලි යනුද සල්සපුකීණදෙඹරුරඟනාමිදෙලි යනුද අනුක්තසම්බන්ධයි;--

ස, වි—සල්ද සපුද කීණද දෙඹද රුරඟද නාද මිදෙල්ද සල්සපුකීණදෙඹරුරඟනාමිදෙලි, ද්‍රැත්සමස්; එරහැඳිද හෝද පළුද මීඅඹද (නොහොත්) මිද අඹද පලොල්ද=එරහැඳි හෝ පළුමී අඹ පලොලි, පුල්වූවාහුත් ඔහුමය එරහැඳිහෝපළුමී අඹපලොල්වූවාහුත් ඔහුම නුයි=පුල්එරහැඳි හෝපළුමීඅඹ පලොලි, ද්‍රැත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; මලයෙහිබුලත්= මලබුලත්, පොල්ද පුවක්ද ඉගුද රඹද මලබුලත්ද සලිමලිද=

පොල්පුවකිගුරඹමලබුලුතසලිමලි, විබත්සමස් ගැබි දුරුත් සමස්; නිල්වූයේද එම ගනවූයේද නිල්ගන, නිල්ගනයෙන් යුත් සා=නිල්ගනසා, ඔවුන්ගේසෙවණ=නිල්ගණසාසෙවණ, නිල් ගණසාසෙවණගේ අලු=නිල්ගණසාසෙවණලු, දුරුත්සමස් විබත් සමස් විබත් සමස් ගැබි විබත්සමස්; තෙරදෙකක් එක්කොට සලකනලදහු=දෙතෙර, වෙසෙසුන්සමස්; මතටකල්=මතකල්, එහි-මතකලි, විබත්සමස්;--

**සර්වභාවොකන්‍යලඞ්කාරයි.**

44 ගවසා සුපුල් කඩුපුල්මල් නිල්වර ල
සලසා උකුළුවට රසුදුළ මිණිමෙවු ල
සකසා දෙතන හරසඳුනෙන් කැරුසිහි ල
දෙපසා ඉසිත නිල්පැහැ නෙතැ දිගුපුළු ල

44 නිල්වරල, (භ්‍රමර) නීලවූ ධම්මිල්ලයෙහි; සුපුල්, සුත්‍පුල්ලවූ; කඩුපුල්මල්, කාණ්ඩොත්පලපුෂ්පයන්; ගවසා, (සිදුරු නොපෙනෙන පරිද්දෙන්) පුරා පැලඳ; රසුදුළ, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; මිණිමෙවුල, මාණික්‍යමෙඛලාදාමය; උකුළුවට, ජඝනවෘත්තයෙහි; සලසා යොජිත කොට; දෙතන, පයොධරයුග්මය හරසඳුනෙන්, මුක්තාහාරයෙන් හා (ගොශීර්ෂ) චන්දනයෙන්; සකසා, යහපත්ව; සිහිල කැරු, ශීතලභාවයට පමුණුවා; දිගුපුළුල නෙතැ, ආයතවිශාලනෙත්‍රයෙහි; නිල්පැහැ, නීලකාන්තින්; දෙපසා, උභයපාර්ශ්වයෙහි; ඉසිත, සෙවනය කරන්නාවූ-

උ, වි—ඉසිත යනු (45 වෙනි කවියෙහි නාමණෙවියන් යන කර්තෘට විශෙෂණයි,) නිල්පැහැ යනු ඉසිත යන අර්ථක්‍රියා පදය හට අනුක්තකර්මයි, දෙපසා යනු අනුක්තාධාරයි, නෙතැ යනු අනුක්තාධාරයි, දිගු යනුද පුළුල යනුද ආධාරවිශෙෂණයි, කැරු යනු පූර්වක්‍රියායි, සිහිල යනු අනුක්තවිකෘතිකර්මයි, දෙතන යනු අනුක්තප්‍රකෘතිකර්මයි, සකසා යනු පූර්වක්‍රියායි, හරසඳුනෙන් යනු අනුක්තකරණයි, සලසා යනු පූර්වක්‍රියායි, රසුදුලමිණිමෙවුල යනු ඊට අනුක්තකර්මයි, උකුළුවට යනු අනුක්තාධාරයි, ගවසා යනු පූර්වක්‍රියායි, කඩුපුල්මල් යනු අනුක්තකර්මයි, සුපුල් යනු කර්මවිශෙෂණයි, නිල්වරල යනු අනුක්තාධාරයි;—

ස, වි—කඩුද එම උපුල්ද=කඩුපුල්, කඩුපුල්විද එම මල්විද= කඩුපුල්මල්, (සු) මනාව පුල්=සුපුල්, සුපුල්ද එම කඩුපුල්මල්ද= සුපුල් කඩුපුල්මල්, වෙසෙසුන්සමස් වෙසෙසුන්සමස් ප ඇ සමස් ගැබි වෙසෙසුන්සමස්; නිල්වූයේද එම වරල්වූයේද=නිල්වරල් එහි-නිල්වරල, වෙසෙසුන්සමස්; උකුළුහුගේවට=උකුළුවට, විබත්

සමස්; රජුන්ගෙන් උදුල=රජුදුල, මිණියෙන්කළමෙවුල්=මිණිමෙවුල්, රජුදුලවිත් එම මිණිමෙවුල්වීත්=රජුදුලමිණිමෙවුල්, එහි-රජුදුල මිණිමෙවුල, විබත්සමස් විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්; තනදෙකක් එක්කොට සලකනලදහු=දෙතන, වෙසෙසුන්සමස්; හරවිත් එම සඳුන්වීත්=හරසඳුන්, එන්,-හරසඳුනෙන්, වෙසෙසුන්සමස්; දෙපසක් එක්කොට සලකන ලදහු=දෙපස්, එහි-දෙපසා, වෙසෙසුන්සමස්; දිගුද එම පුළුල්ද=දිගුපුළුල්, වෙසෙසුන්සමස්:—

කඩුපුල්මල්—නාගලෝකයෙහි හටගන්නා පුෂ්පවිශේෂයෙකි. දෙව්ලොව පරසතුරල් මෙන් නාගලොවෙහි අති ප්‍රසිද්ධ පුෂ්ප විශේෂය මෙය වේ.

## උදනතාලඞකාරයි.

45 ම න හර නාමණෙවියනිඳ ළවැලි පි ට
ගෙන මිණිවෙණ තත්නියගින් මැද රුව ට
ක න හෙවැ කියන බුදුගුණ ගී මියුරුකො ට
සැ න හෙව කැලණිගඟබඩ මඳ කලක් සි ට

45 මනහර, මනොඥවූ; නාමණෙවියන්, නාගමාණවිකාවන් විසින්; අළවැලිපිට, (තංවතුරෙන්) වඩනලද්දවූ නොහොත් (ගඞ්ගාප්‍රවාහයෙන්) අමුතුව රැස්කරනලද (ධවලවූ) පුලිනතලයෙහි; ඉඳ, නිෂද්‍යාව කොට; මිණිවෙණ, මාණික්‍යයෙන් අලඞකෘතවූ වීණාවන්; ගෙන, ග්‍රහණය කොට; තත්, තන්ත්‍රි (පඞක්තින්); නියගින්, නඛාග්‍රයෙන්; රුවට, (ස්වරොත්පාදනය පිණිස) මනොඥ කොට; මැද, මාර්ජනය කොට; මියුරු කොට, මධුරවන පරිද්දෙන්; කියන, කථනය කරනුලබන්නාවූ; බුදුගුණගී, බුද්ධගුණප්‍රතිසංයුක්ත ගීතිකාවන්; කනහෙව, කණියෙහි බහාහෙවත් කන් නමා අසා; කැලණිගඟබඩ, කල්‍යාණි නම් ගඞ්ගාව සමීපයෙහි; මඳකලක් සිට ස්වල්පකාලයක් අවස්ථානය කොට; සැනහෙව, (මාර්ගශ්‍රම දුරුකොට) සන්තර්පණයට පැමිණෙව.

'නෝ සැනහෙව' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—සැනහෙව යනු අකර්මකවිධික්‍රියායි, නෝ යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි, කැලණිගඟබඩ යනු අනුක්තාධාරයි, සිට යනු පූර්වක්‍රියායි, මඳකලක් යනු අත්‍යන්තසංයෝගී කම් විබත්, හෙවැ යනු පූර්වක්‍රියායි, කන යනු අනුක්තාධාරයි, බුදුගුණගී යනු හෙව යන පූර්වක්‍රියාවට කර්මයි, කියන යනු කර්මවිශේෂණයි, මියුරු කොට යනු සොපපද පූර්වක්‍රියායි, මැද යනු පූර්වක්‍රියායි, තත් යනු ඊට අනුක්ත කර්මයි, රුවට යනු ක්‍රියාවිශේෂණයි, නියගින්

යනු අනුක්තකරණයි, ගෙන යනු පූර්වක්‍රියායි, මිණිවෙණ යනු ඊට අනුක්තකර්මයි, ඉඳ යනු පූර්වක්‍රියායි, අලවැලිපිට යනු අනුක්තාධාරයි, නාමණෙවියන් යනු කියන යන අසමාප්තක්‍රියාවට අනුක්තකර්තෘයි:—

**ස, වි**—මනහරනුයේ=මනහර, නාද එම මණෙවිද=නාමණෙවි, මනහර වූවාහුද ඔව්හු නාමණෙවි වූවාහුද=මනහරනාමණෙවි, ඔවුන්-මනහරනාමණෙවියන්, උපපදසමස් වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන්සමස්; අළේත් එමනුයි වැලිවිත් එමනුයි=අළවැලි, අළුවැලින්ගේපිට=අළවැලිපිට, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; මිණියෙන්කළවෙණ=මිණිවෙණ, විබත්සමස්; නියනුගේ අග=නියග, ඉන්-නියගින්, විබත්සමස්; බුදුන්ගේ ගුණ=බුදුගුණ, බුදුගුණෙන් යුතු ගී=බුදුගුණගී, විබත්සමස් ගැබ් විබත්සමස්; කැලණිද එම ගඟද=කැලණිගඟ, කැලණිගඟනුගේබඩ=කැලණිගඟබඩ වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; මඳද එම කල්ද=මඳකල්, එය මඳකලක්, වෙසෙසුන්සමස්;—

මේ කවිතුන එක වාක්‍යත්වයෙන් හැළපූ නිසා,

ද්වාභ්‍යාන්තු යුග්මකං ඥෙයං
ත්‍රිභිරස්තු විශෙෂකං
චතුර්භිස්තු කලාපංස්‍යාත්
පඤ්චභිඃ කුලකං මතම්.

යනු කීහෙයින් විශෙෂකයයි දත්නා ලැබේ

මෙහි 43 වෙනි කවෙහි දෙතෙර යනු 45 වෙනි කවෙහි අලවැලි පිට යන්න හා සම්බන්ධවේ.

**නාමණෙවියන්**--පෘථිවියෙන් යට නාගලෝකය පිහිටා තිබේ. එයට පාතාලය රසාතලයයි කියනු ලැබේ. එහි වසන්නාවූ නාගයෝ ශ්‍රී සම්පත්තියෙන් දෙවියන් සමානයෝයි, ඔවුහු දිව්‍යගති ඇති හෙයින් දිව්‍ය නාගයෝයයි ව්‍යවහාර කරනු ලබත්. මොවුහු කැමැති රූපයක් නිර්මිත කරගැනීමෙහි සමර්ථයෝය. මනුෂ්‍ය රූපයෙන් පෙනී සිටිනාවිට ඉතා ප්‍රියකරු දකුම් ඇත්තෝය. මොවුන්ගේ ස්ත්‍රීහු ඉතා රූපශ්‍රීයෙන් යුක්ත වූවාහුය. ඔවුන්ගේ තරුණ ස්ත්‍රීන්ට **"නාගමාණවිකා"** යන මාගධශබ්දයෙන් කියනව සවභාෂාවෙහි නාමණෙවියයි ව්‍යවහාරවේ.

**අලවැලි**—ගංගාප්‍රවාහයෙන් රැස්වූ වැලි බැව් මෙයින් ප්‍රකාශවේ. ඉඳ අලවැලි යනු සඳහන්වූ තැන දෙළුවැලි කියා වේයයි සැලකිය යුතුයි.

### ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.

46 සපුමල් යොහොඹු ලා බැඳ වරල මනර හ
පැහැදුල් දෙඹ කැකුළු හර කරලා තන ග
රොනවුල් නෑ කුසුම් කන ලා කොඬොල් ර ග
දවහල් උයන් කෙළිකෙළැ සලෙළුන් සම නා

46 සපුමල්යොහොබු, චම්පකපුෂ්ප හා මාධවීපුෂ්පයන්; ලා, බහා; වරල, කේශකලාපය; මනරඟ, සිත්වූපරිද්දෙන්; බැඳ, බන්ධනය කොට; පැහැදුල්, (ධවල) වර්ණයෙන් බබළන්නාවූ; දෙබකැකුළු, පුන්නාගමුකුලයන්; තනග, පයෝධරාග්‍රයෙහි; හර කර ලා, මුක්තාහාර කොට පැලඳ; රොනවුල්, (සුවර්ණවර්ණවූ) පුෂ්පරේණුයෙන් ගැවසිගත්තාවූ; නාකුසුම්, නාගපුෂ්පයන්; කොඩොල්රඟ, කුණ්ඩලවිලාසයෙන්; කන ලා, කර්ණයෙහි බහා ප්‍රසාධනය කොට; සලෙළුන් සමඟ, තරුණ පුරුෂයන් හා එක්ව; දවහල්, දිවාභාගයෙහි; උයන්කෙළි කෙළෑ, උද්‍යාන ක්‍රීඩා කොට-

උ, වි—කෙළෑ යනු පූර්වක්‍රියායි, උයන්කෙළි යනු ඊට අනුක්ත කර්මයි, දවහල් යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, සමඟ යනු (මතුකවෙහි) ලියන්කැල යන්නට විශේෂණයි, සලෙළුන් යනු සමඟසබඳෙහි කතුවිබත්, ලා යනු පූර්වක්‍රියායි, නාකුසුම් යනු ඊට අනුක්තකර්මයි, රොනවුල් යනු කර්මවිශේෂණයි, කොඩොල්රඟ යනු උපමා කර්මවිශේෂණයි, ලා යනු පූර්වක්‍රියායි, හර යනු ඊට විකෘතිකර්මයි, දෙබකැකුළු යනු ප්‍රකෘතිකර්මයි. කර යනු අනුක්තාධාරයි, පැහැදුල් යනු කර්මවිශේෂණයි, තනග යනු අනුක්තාධාරයි, බැඳ යනු පූර්වක්‍රියායි, වරල යනු ඊට අනුක්තකර්මයි, මනරඟ යනු ක්‍රියා විශේෂණයි, ලා යනු පූර්වක්‍රියායි, සපුමල් යොහොබු යනු ඊට අනුක්තකර්මයි;—

ස, වි—සපුනුගේමල් සපුමල්, සපුමල්ද යොහොබුද=සපුමල් යොහොබු, විබත්සමස් ගැබි දරුත්සමස්; පැහැයෙන්දුල්=පැහැදුල්, විබත්සමස්; දෙබෙනිකැකුළු=දෙබකැකුළු, විබත්සමස්; තනෙහිඅග=තනග, විබත්සමස්; රොනින්අවුල්=රොනවුල්, විබත් සමස්; නාරුක්හි කුසුම්=නාකුසුම්, විබත්සමස්; කොඩොල්හුගේ රඟ=කොඩොල්රඟ, විබත් සමස්; උයන්හි කෙළි=උයන්කෙළි, විබත්සමස්;—

ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.

47 නු ව නි න් නිල්උපුල් මඳහසිනි හෙළැඹු ල
වු ව නි න් කමල් පෑ ලවනතිනි රතුපු ල
ප ව නි න් අඹල රනලියවන් ලියන්කැ ල
රු ව නි න් ලකළ ගඟදිය කෙළෑ නිමුණුක ල

47 නුවනින්, නෙත්‍රයෙන්; නිල්උපුල්, නීලොත්පලයන්ද; මඳහසිනි, මන්දහාස්‍යයෙන්; හෙළැඹුල, කුමුදයන්ද; වුවනින්, වක්ත්‍රයෙන්; කමල්, පද්මයන්ද; ලවනතිනි, අධරයෙන්; රතුපුල,

රක්තෝත්පලයන්ද; පෑ, (ගඞ්ගාජලයෙහි) දක්වා; පවනින්, මාරුතයෙන්; අඹල, ආවෘතවූ; රනලියවන්, ස්වර්ණලතාවන් හා සාදෘශ්‍යවූ; ලියන්කැල, කාන්තාසමූහයා; රුවනින් ලකළ, රත්නයෙන් අලඞ්කෘතවූ; ගඟදියකෙළැ, ගඞ්ගාජලයෙහි ක්‍රීඩා කොට; නිමුණුකල, සමාප්තවූ කාලයෙහි-

ළ, වි—නිමුණුකල යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, දිය කෙළැ යනු සොපපද පූර්වක්‍රියායි, ගඟ යනු ඊට අනුක්තාධාරයි, ලකළ යනු ආධාරවිශේෂණයි, රුවණින් යනු අනුක්තකරණයි, ලියන්කැල යනු නිමුණුකල යන කාලාර්ථ ක්‍රියාවට අනුක්තකර්තෘ හෙයින් අදර අරුතැ කම් විබත්, වන් යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, රනලිය යනු උපමාවිශේෂණයි, අඹල යනු රනලිය යන්නට විශේෂණයි, පවනින් යනු අනුක්තකරණයි, පෑ යනු පූර්වක්‍රියායි, රතුපුල යනුද කමල් යනුද හෙළැඹුල යනුද නිල්උපුල් යනුද පෑයන්නට අනුක්තකර්මයි, නුවනින් යනුද මඳ හසිනි යනුද වුවනින් යනුද ලවනතිනි යනුද අනුක්තකරණයි;-

ස, වි—නිල්වූයේද එම උපුල්වූයේද=නිල්උපුල්, වෙසෙසුන් සමස්; හෙළවූයේද එම ඇඹුලවූයේද=හෙළැඹුල, වෙසෙසුන් සමස්; ලවන්හුගේ අත්=ලවනත්, ඉනි-ලවනතිනි, විබත්සමස්; රත්වූයේද එම උපුල්වූයේද=රතුපුල්, ඒ රතුපුල, වෙසෙසුන්සමස්; රනින් කළ ලිය=රනලිය, විබත්සමස්; ගඟෙහි දිය=ගඟදිය, විබත් සමස්;—

උපමාසංසෘෂ්ටහෙතුරූපකාලඞ්කාරයි.

48 වදිමින් සවසතල හැසිරෙන දිගතුව ල
සොබමන් සුනිල්මිණි නිල් නුබතුර විපු ල
පතසන් අවරගිරි නැපියෙන් වැමෙන ක ල
විලිකුන් සුරත් පලවැනි වේ රිවිමඬ ල

48 ("ඝනකැන් සුනිල්පත් සඳවල නවකිසල" යනු අධ්‍යාහාරයි.) (ඝනකැන්, මෙඝසමූහ නමැති; සුනිල්පත්, අතිනීලවර්ණවූ පත්‍රයන් ඇති; සඳවල, සන්ධ්‍යාවලාහක නමැති; නවකිසල, අභිනවපල්ලව ඇත්තාවූ;) දිගතුවල, දිශානමැති ශාඛාවන්හි; වදිමින්, ආස්ඵාලනය වෙමින්; හැසිරෙන, සචාරය කරන්නාවූ; සවසතල, සායාහ්න මාරුතය ඇත්තාවූ; සොබමන්, ශොභමානවූ; සුනිල්මිණිනිල්, යහපත් ඉන්ද්‍රනීල මාණික්‍යයක් මෙන් නීලවූ; විපුල, මහත්වූ; නුබතුර, ආකාශ නමැති වෘක්ෂයෙහි; අවරගිරි, අපරපර්වත නමැති; නැපියෙන් වෘන්තයෙන්; වැමෙනකල, (සමුද්‍රයෙහි) පතනය වන්නාවූ කාලයෙහි; අසන්පත්, ආසන්නප්‍රාප්තවූ; රිවිමඬල, සූර්‍ය්‍යමණ්ඩලයතෙම; විලිකුන් සුරත්, පක්වාරුණවර්ණවූ; පල වැනි වේ, ඵලයක් හා සමානවන්නේයි.

රිවිමඬල විලිකුන් සුරත්පල වැනිවේ යනු ක්‍රි: කා: ප: ස:

උ, වි--වේ යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, රිවි මඬලයනු උක්තකර්තෘයි, විලිකුන්සුරත්පල යනු උපමාකර්තෘ විශෙෂණයි, වැනි යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, පත් යනු කර්තෘවිශෙෂණයි, අසන් යනු පත් යන අසමාප්ත ක්‍රියාවට අනුක්තකර්මයි, වැටෙනකල යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, අවරගිරි නැවි සෙන් යනු ඊට අනුක්තාපාදානයි, නුබතුරු යනු අනුක්තාධාරයි, විපුල යනුද සොබමන් යනුද සුනිල්මිණිනිල් යනුද ආධාර විශෙෂණයි, සවසනල යනු උපලකුණු අරුත්හි කරණ විබත්, හැසිරෙන යනු උපලක්‍ෂණයහට විශෙෂණයි, වදිමින් යනු මිශ්‍ර ක්‍රියායි, දිගතුවල යනු ඊට අනුක්තාධාරයි, (ගනකැන් සුනිල්පත් යනුද සඳවල නවකිසල යනුද අධ්‍යාහාර වශයෙන් ආධාර විශෙෂණයි;)--

ස. වි,—සවස්හිනල=සවසනල, විබත්සමස්; දිග්ම අතු= දිගතු, එහි-දිගතුවල, වෙසෙසුන්සමස්; (සු) මනානිල්=සුනිල්, ප අැ සමස්; සුනිල්වීද එම මිණිද=සුනිල්මිණි, වෙසෙසුන්සමස්; නුබ මතුරු=නුබතුරු එහි-නුබතුරු, වෙසෙසුන්සමස්; අවරෙහි ගිරි= අවරගිරි, අවරගිරිමනැවි=අවරගිරිනැවි; එන්-අවරගිරිනැවියෙන්, විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්; (සු) මනාරත්=සුරත්, ප අැ සමස්; රිවිහුගේමඬල=රිවිමඬල, විබත්සමස්;

මෙද පූර්වොක්ත පරිදි විශෙෂකායි.

**අවරගිරි**--චක්‍ෂුසුර්යයන් අස්තයට (අදෘශ්‍යයට) පැමිණෙන්නාවූ ස්ථානය අවරගිරියයි ව්‍යවහෘතවිය.

රූපකඋපමාසංකෂපියයි.

49 මහතුන් හසළ තමහට යස පිහිට ලෙ ස
නිසැකින් නොහළ යුතුබව පැමිණෙන වෙහෙ ස
සුදනන් පැවති සිරිතැයි දන්වන විල ස
නුබමින් සමඟ ගෙවෙනුය දවහල් දව ස

49 තමහට යසපිහිටලෙස, තමාහට සුප්‍රතිෂ්ඨාවිලාසයෙකින්; හසළ, සමරිතවූ; මහතුන්, මහාත්මයන්ට; වෙහෙස පැමිණෙන, විහිංසාවක් පැමිණිකල්හි; නිසැකින්, නිශ්චයෙන්; නොහළයුතු බව, පරිත්‍යාග නොකටයුතු භාවය හෙවත් හැර නොයායුතුබව; සුදනන්, සත්පුරු ජනයන් විසින්; පැවති සිරිතැයි, ප්‍රවෘත්තවූ චරිත්‍රයෙකැයි; දන්වනවිලස, විඥාපනය කරන්නාවූ විලාසයෙන්; නුබමින් සමඟ, සූර්‍ය්‍යමණ්ඩලය හා එක්ව; දවහල් දවස, දිවා භාගයතෙම; ගෙවෙනුය, ක්‍ෂය වන්නේයි.

දවහල් දවස ගෙවෙනුය යනු ක්‍රි: කා: ප: ස:

නොහල යුතුබව සිරිත්වෙයි යනු අන්තරවාක්‍යයෙහි ක්‍රි:කා:ප:ස:

උ, වි--ගෙවෙනුය යනු අනාකල් අන්කරු එකබස් කතු කිරියයි, දහවල්දවස යනු උක්තකර්තෘයි, සමග යනු සහාර්ථයෙහි අව්‍යයයි, නුබමින් යනු සමග සබඳෙහි කතුවිබත්, දන්වනවිලස යනු ක්‍රියා විශෙෂණයි, සිරිතැයි යනු දන්වන යන අසි ක්‍රියාවට අනුක්ත කර්මයි, වෙයි යනු අධ්‍යාහෘත ක්‍රියායි, සිරිත් යනු කර්තෘයි, නොහලයුතුබව යනු විශෙෂණයි, පැවති යනුද විශෙෂණයි, සුදනන් යනු පැවති යන ක්‍රියාවට සම්බන්ධයි, පැමිණෙන යනු අසම්භාව්‍ය ක්‍රියායි, වෙහෙස යනු ඊට අනුක්ත කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබත්, නිසැකින් යනු අනුක්තකරණයි, මහතුන් යනු අනුක්ත සම්ප්‍රදානයි, හසළ යනු සම්ප්‍රදාන විශෙෂණයි, යසපිහිටලෙස යනු අනුක්ත කරණයි, නමහට යනු අනුක්ත සම්බන්ධයි;—

ස, වි—යස (මනා) පිහිට=යසපිහිට, යසපිහිටගේ ලෙස=යසපිහිටලෙස, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; හළයුතුනොවන්නේ=නොහළයුතු, නොහළයුත්තගේ බව=නොහළයුතුබව; ප ඇ සමස් ගැබ් විබත්සමස්; (සු) මනා දන=සුදන, ඔවුන්-සුදනන්, ප ඇ සමස්; දන්වන්නනුගේ විලස=දන්වනවිලස, විබත්සමස්; මිණිඑව් මින්, නුබෙහි මින්=නුබමින්, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; දහවල් වූයේද එම දවස වූයේද=දවහල් දවස, වෙසෙසුන් සමස්;

නමහට යසපත් පිහිට ඇත්තන් ලෙස ඇසුරුකරනු ලැබූ උතුමන්ට වෙශෙසක් පත්කල්හි නිශ්චයෙන්ම අත්නොහැරිය යුතු බව සජ්ජනයන් විසින් පවත්වනලද චාරිත්‍රයකැයි දන්වන්නාක්මෙන් සූර්‍ය්‍යමණ්ඩලය හා සමග දහවල් දවසද ගෙවෙන්නේය යනු භාවයි.

**නුබමින්**—මේ සූර්‍ය්‍යපර්‍ය්‍යාය නාමයකි. අහසෙහි මාණික්‍යය වැනිය. යනාර්ථයි, සූර්‍ය්‍යා අහසෙහි ප්‍රධානව බබලන නිසා මේ නාමය ව්‍යවහෘතයි.

## උත්ප්‍රෙක්ෂා සහොක්ති සංසෘෂ්ට්‍ය ලඞ්කාරයි.

එහි උත්ප්‍රෙක්ෂා ලක්ෂණ ශ්‍රී මද්දණ්ඩ්‍යාචාර්‍ය්‍යවරයෝ:—

අන්‍යථෛවස්ථිතා වෘත්ති ශ්චෙතනස්‍යෙතරස්‍යවා
අන්‍යථොත්ප්‍රෙක්ෂ්‍යතෙ යත්‍ර තාමුත්ප්‍රෙක්ෂාං විදුර්‍ය්‍යථා

යනුවෙන් දක්වූහු.

සජීවයක්හුගේ හෝ අජීවයක්හුගේ අන්පරිද්දකින් සිටියාවූ පැවැත්ම යම් කථනයෙක්හි අන් පරිද්දකින් සම්භාවනා කරනු ලැබේද එය උත්ප්‍රෙක්ෂායයි දනිත්,

සහොක්ති ලක්ෂණ'—

සහොක්තිඃ සහභාවෙන කථනං ගුණ කර්මණාම්

යන්නෙන් දක්වූහු.

ගුණකර්ම ද්‍රව්‍යයන්ගේ සහභාවයෙන් කථනය කිරීම සහොක්ති නම්.

50 සැ දෑ ළෙන් වරුණ දෙව්රද මුහුද වි සූ
ස දෑ සහසකර එන මහවත සැල සූ
වි දෑ උපුල් පිළමෙන් රත්පටින් වැ සූ
සැ දෑ වලාපෙළ පැළදිග පෙනුණු ප සූ

50 මුහුද විසූ, සමුද්‍රයෙහි වාසය කළාවූ; සදෑ, (දෙවජාතිවශයෙන්) සමානජාතිඇත්තාවූ; වරුණදෙව්රද, වරුණදෙවරාජයා විසින්; සැදෑළෙන්, ශ්‍රද්ධාචිත්තයෙන්; සහසකර, සහස්‍රකිරණයා; එන, (තමාගේ වාසභවනයට) එන්නාවූ; මහවත, මහාපථයෙහි; සැලසූ, යොජනය කරන ලද්දවූ; රත්පටින් වැසූ, රක්තපට්ටාස්තරණයෙන් ඡාදනය කරනලද්දවූ; විදෑඋපුල්පිළ මෙන්, කුරුවින්දපාෂාණයෙන් බඩවූ වෙදිකාවක්මෙන්; සැදෑවලාපෙළ, සන්ධ්‍යාවලාහක පඞ්ක්තිය; පැළදිගැ, පශ්චිමදිශායෙහි; පෙනුණු පසු, දෘශ්‍යමානවුවාම පශ්චාත්කාලයෙහි-

උ, වි—පෙනුණුපසු යනු කාලාධාරයෙහි අනුක්තාධාරයි, පැළදිග යනු අනුක්තාධාරයි, සැදෑවලාපෙළ යනු අදර අරුතැකම් විබත්, මෙන් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, විදෑ උපුල්පිළ යනු උපමා විශෙෂණයි, වැසූ යනු උපමාන විශෙෂණයි, රත්පටින් යනු අනුක්තකරණයි, සැලසූ යනු උපමාන විශෙෂණයි, මහවත යනු අනුක්තාධාරයි, එන යනු ආධාර විශෙෂණයි, සහසකර යනු එන යන අඵක්‍රියාවට අනුක්ත කර්තෘයි, වරුණදෙව්රද යනු සැලසූ යන අඵක්‍රියා පදයහට අනුක්ත කර්තෘයි, සදෑ යනු කර්තෘ විශෙෂණයි, මුහුදවිසූ යනුද කර්තෘ විශෙෂණයි, සැදෑළෙන් යනු අනුක්ත කරණයි;

ස, වි—සැදෑයෙන් යුත් ළ=සැදෑළ, එන්-සැදෑළෙන්, විබත් සමස්; දෙව්නම රද=දෙව්රද, වරුණවූයේද එම දෙව්රදවූයේද=වරුණදෙව්රද, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; සියදෑ ඇතියේ යමකුහටද හෙතෙමේ=සදෑ, අන්අරුත් සමස්; සහසක් කර ඇතියේ යමකුහටද හෙතෙම=සහසකර, අන්අරුත්සමස්; මහ වූයේද එම වත්වූයේද=මහවත්, එහි-මහවත, වෙසෙසුන්සමස්; විදෑවිද එම උපුල්විද=විදෑඋපුල් විදෑඋපුලෙන් කළ පිළ=විදෑඋපුල් පිළ, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; රත්වූයේද එම පටවූයේද=රත්පට, ඉන්-රත්පටින්, වෙසෙසුන්සමස්; වලාවන්ගේ පෙළ=වලාපෙළ, සැදෑහි වලාපෙළ=සැදෑවලාපෙළ, විබත්සමස් ගැබ් විබත්සමස්; පැළවීත් ඔම දිග්වීත්=පැළදිග්, එහි-පැළදිග, වෙසෙසුන්සමස්; පෙනීමෙන් පසු=පෙනුණුපසු, විබත්සමස්;

**වරුණදෙව්වරද**—අපරදික්පතින් අතුරෙහිවූ මේ දිව්‍යරාජතෙම කාශ්‍යප නාම ඍෂිහුගේ අදිතිනම් භාර්‍ය්‍යාවගෙන් උපන්නේය, ජලයට අධිපතිවූ මේ තෙම් පශ්චිමදිශා පාලකද වෙයි, මොහුගේ වාසස්ථානය සමුද්‍රයයි, 'මුහුද මිසු' යත්හොත් ඒ බැව් ප්‍රකාශ වේ, සුගන්‍ධාගේ මාර්ගය සැදීම මොහුගේ කාර්‍ය්‍යයයි යනු පුරාණෝක්තියි.

**සහසකර**—මේ සූර්‍ය්‍යයාන නාමයකි. රශ්මි සහස්‍ර භාර්‍ය්‍යාවගෙන් උපන්නෙකි. එහෙයින් වරුණ හා සමාන ජාති ඇත්තේය යනු පුරාණයි. ඒ බැව් ප්‍රකාශකිරීම පිණිස සදසහසකරයයි කීහු.

### උපමා ගර්භ ස්වභාවෝක්ත්‍යලඞ්කාරයයි.

51 උ දු ළ සෝම්කැලුම් නිසයුරු හිමි පුව ළ
ප හ ල වන බැවින් තමවෙත නිසඹු දෙ ළ
ල ක ළ ගුවන්තල සිරියහනැ නිකස ළ
අ තු ළ කුසුම් විලසින් සැදෙත තුරුවැ ළ

51 උදුළ, උජ්ජවලිතවූ; සෝම්කැලුම්, සෞම්‍යකාන්ති ඇත්තාවූ; පුවළ, ප්‍රෞඪවූ; නිසයුරු, නිශාකර නමැති; හිමි, වල්ලභයා, තම වෙත, ආත්මසමීපයට; පහළවන බැවින්, ප්‍රකාශවන භාවය හෙතුකොටගෙන; දෙළ, සාභිලාෂිවූ; නිසඹු, නිශාඞ්ගනාව විසින්; නිකසළ, (අභ්‍රමහිකාදීන්ගේ අභාවයෙන්) කච්චරරහිතවූ; ලකළ, අලඞ්කෘතවූ; ගුවන්තල සිරියහනැ, ගගනතල නමැති ශ්‍රී ශයන මස්තකයෙහි; අතුළ, ආස්තරණය කරනලද්දවූ; කුසුම්විලසින්, පුෂ්පවිලාසයෙන්; තුරුවැළ, තාරකාවලීන්; සැදෙත, සජ්ජිත වන කල්හි-

**උ, වි**—**සැදෙත** යනු කාලාඛ්‍යයෙහි අසම්භාව්‍ය ක්‍රියායි, තුරුවැළ යනු ඊට අනුක්ත කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබත්, **කුසුම්විලසින්** යනු අනුක්තකරණයි, අතුළ යනු කරණ විශෙෂණයි, **ගුවන්තල සිරිසහනැ** යනු අනුක්තාධාරයි, **ලකළ** යනුද **නිකසළ** යනුද ආධාරවිශෙෂණයි, **නිසඹු** යනු අතුළ යන ක්‍රියාවට අනුක්තකර්තෘයි, දෙළ යනු අනුක්ත කර්තෘ විශෙෂණයි, **පහළවනබැවින්** යනු අනුක්තකරණයි, **තමවෙත** යනු අනුක්තාධාරයි, **නිසයුරුහිමි** යනු පහළවන බැවින් යන ක්‍රියාවට සම්බන්ධයි, **උදුළ** යනුද **සෝම්කැලුම්** යනුද කර්තෘ විශෙෂණයි,

**ස, වි**—සෝම්විද එම කැලුවුවිද=සෝම්කැලුම්, උදුළ සෝම්කැලුම් යමක්හුගේද හෙතෙම=උදුළ සෝම්කැලුම්, වෙසෙසුන් සමස් ගැබ් අන්අරුත්සමස්; නිස කරනුයේ=නිසයුරු, නිසයුරුම හිමි=නිසයුරුහිමි, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; පහළ වන්නගේ බව=පහළවනබව, ඉන්-පහළවනබැවින්, විබත්සමස්; තමන්ගේ වෙත්=තමවෙත්, එහි-තමවෙත, විබත්සමස්; නිසම අඹු=නිසඹු, වෙසෙසුන්සමස්; ගුවන්විද එම තලවිද=ගුවන්තල,

**සිරින් පුනු යහන්**=සිරියහන්, ගුවන්තලම සිරියහන්=ගුවන්තල සිරියහන්, වෙසෙසුන්සමස් විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; **කසලින් තොර**=නිකසළ, ප අැ සමස්; **අතුරනලදකුසුම්**=අතුළ කුසුම්, අතුළකුසුම්නුගේ විලස=අතුළකුසුම්විලස, ඉන්-අතුළ කුසුම්විලසින්, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; **තුරුන්ගේ වැල**=තුරුවැල, විබත්සමස්;

දිලෙණු සෞම්‍ය කාන්තිවිත් ඉතා දැවුණු චන්ද්‍රනමැති ස්වාමියා තමා වෙතට එන බැවින් කැමතිවූ රාත්‍රී නමැති කාන්තාව විසින් පිරිසිදු සිත්නලු අහස්තල නමැති ශ්‍රී යහනෙහි අතුරනලද මල් රැසක් මෙන් තාරකා සමූහය සැදේහ කල්හි—යනු භාවයි.

**නිසයුරු**—නිසයුරු නම් චන්ද්‍රයායි. චන්ද්‍රයා රාත්‍රී නැමති කාන්තාවගේ ස්වාමිත්වයෙන්ද රාත්‍රිය චන්ද්‍රයාගේ පත්නිභාවයෙන්ද කවි සමයෙහි ප්‍රසිද්ධයි.

## රූපකාලඞ්කාරයි.

52 ද න නෙ න වුත් දමන ගොදුරට නොහැකි ළි ය
පැ න පැ න දියෙන් ඔවුනොවුනැහෙහි පෙරැ ළි ය
ලෙ හෙ ලු න කෙළින කැරැ පෙණපිඩු රළරැ ළි ය
එ නැ නි න පියාසර කැරැ දකු මස්කෙ ළි ය

52 එනැනින, ඒ (පළමුවෙන් සිටියාවූ) කැලණිගඟබඩ සිට; පියාසරකැරැ, පක්ෂප්‍රසාරණය කොට; දන, ජනයන්විසින්; ගෙන වුත්, ග්‍රහණයකොට අවුත්; දමන, ක්ෂෙපණය කරනුලබන්නාවූ, ගොදුරට, ආහාරයට; නොහැකිළිය, සඞ්කුචිත නොව; දියෙන්, (නදී) ජලයෙන්; පැන පැන, උල්ලඞ්ඝනය කොට කොට; ඔවු නොවුනැහෙහි, අන්‍යොන්‍ය ශරීරයෙහි; පෙරැළිය, පරාවෘත්ත වූ; පෙණපිඩු, ඩිණ්ඩීරපිණ්ඩයන්ද; රළරැළිය, තරඞ්ගභඞ්ගයන්ද; කැරැ, (වර්තනය) කොට; ලෙහෙලුන, රොහිතමත්ස්‍යයන් විසින්; කෙළින, ක්‍රීඩාකරනුලබන්නාවූ; මස්කෙළිය, මස්කෙළිය නම්වූ නදීතීර්ථය; දකු, දශීනය කර.

**'නෝ මස්කෙළිය දකු'** යනු ක්‍රි: කා: ප: ස:

**ඵ, වි—දකු** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **මස්කෙළිය** යනු අනුක්තකර්මයි, **කැරැ** යනු පූර්වක්‍රියායි; **පියාසර** යනු ඊට අනුක්තකර්මයි, **එනැනින** යනු අනුක්තාපාදනයි, **කෙළින** යනු කර්ම විශෙෂණයි, **ලෙහෙලුන** යනු කෙළින යන අතීක්‍රියාපදයහට අනුක්තකර්තෘයි, **කැරැ** යනු පූර්වක්‍රියායි, **පෙණපිඩු** යනුද **රළරැළි** යනුද ඊට අනුක්තකර්මයි, **පැනපැන** යනු විරුක්ත පූර්වක්‍රියායි, **දියෙන්** යනු අනුක්තාපාදනයි, **පෙරැළිය** යනු පූර්වක්‍රියායි, **ඇහෙහි** යනු අනුක්තාධාරයි, ඔවුනො

වුන් යනු අනුක්ත සම්බන්ධයි, නොහැකිළිය යනු පූර්වක්‍රියායි, ගොදුරට යනු තාදර්ථ්‍යයෙහි අනුක්ත සම්ප්‍රදානයි, දමන යනු ගොදුරට යන්නට විශේෂණයි, අවුත් යනුද ගෙන යනුද පූර්වක්‍රියායි:—

ස, වි—රළන්ගේ රැළි=රළරැළි, එය-රළරැළිය, විබත්සමස්; මසුන්ගේ කෙළි යම්තැනෙක්හිද එය=මස්කෙළිය, අන්අරුත් සමස්;

1. 2. 3. පාදත්‍රයකාරය එළිවැට පිණිසයි.

### මෙද විශෙෂයායි.

මස්කෙළිය—මත්ස්‍යයන්ගෙන් ඉතා බහුලවූ කැලණිගඟෙහි විහාරාසන්න එක් ප්‍රදෙශයකට මේ නම ව්‍යවහාර කළ බැව් කොකිල සන්දෙශයෙහි:—

අැ ල ව ඉපිල පිලහත විදුලිග දු ළි ය
බ ල ව දිවන වරලින් දී දිය රැ ළි ය
හි ල ව කලක සිට කෙළිනා නොහැකි ළි ය
බ ල ව කැලණිගඟ මින් ගණ මස් කෙ ළි ය

යන කවියෙන්ද පෙනේ. කිත්සිරිමෙවන් කැලණිවිහාරාසන්නව බටහිර දෙසින් පිහිටි ගඟා ප්‍රදෙශය මස්කෙළිය වියයුතුයි කියති.

දකු—දිස් ධාතුවට දක්යි ඈදෙශව උප්‍රත්‍යයව සිඬයි.

### ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

53 පැ හැ ස ර ණි ය මි ණි පැ මි ණි ය කොත් අග ට
බ ඳ කි කි ණි ය ද ද ගි හි ණි ය විමන්ව ට
නොව පැරැ ණි ය ව න ර ම ණි ය විපින්වි ට
සැ ල ලි හි ණි ය ව දු කැ ල ණි ය පුරවර ට

53 කොත්අගට, සතුපිකාග්‍රයට; පැමිණිය, ප්‍රාප්තවූ; පැහැසරණිය මිණි, කිරණශ්‍රෙණියෙන් යුක්ත මාණික්‍ය ඇත්තාවූ; බඳකිකිණිය, බඳනාලද කිඞකිණික (ජාලාවෙන්) යුක්තවූ; දදගිහිණිය, ධවජයෙන් ගහනවූ; ව්ට, හාත්පස්හි; විමන්, ප්‍රාසාදයන් ඇත්තාවූ; පැරැණිය නොව, පුරාණභාවයකට නොපැමිණ; විපින්විට, ක්‍ෂණක්‍ෂණයෙහි; රමණියවන, මනොඥ වන්නාවූ; කැලණිය පුරවරට, කල්‍යාණිපුරප්‍රවරයට; සැළලිහිණිය, ශාරිකා පක්‍ෂිරාජය; වදු, ප්‍රවිශ්‍ට වව.

'(සැළලිහිණිය තෝ)කැලණිය පුරවරට වදු' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි වදු යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, කැලණියපුරවරට යනු අනුක්තකර්මයි, සැළලිහිණිය යනු සම්බොධනයි, රමණියවන යනුද විමන් යනුද කර්මවිශෙෂණයි,

විපින්විට යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, නොවැ යනු සොප පද පූර්වක්‍රියායි, පැරැණිය යනු ඊට අනුක්තකර්මයි, දදගිගිණිය යනුද පැහැසරණිසමිණි යනුද විමන් යන්නට විශේෂණයි, බඳකිකිණිය යනු දදගිගිණින යන්නට විශේෂණයි, පැමිණිය යනු පැහැසරණියමිණි යන්නට විශේෂණයි, කොත්අගට යනු පැමිණින යන්නට අනුක්තකර්මයි,

ස, වි—පැහැයන්ගේ සරණි=පැහැසරණි, පැහැසරණින් යුත් මිණි යමෙක්හිද එය=පැහැසරණියමිණි, විබත්සමස් ගැබි අන් අරුත්සමස්; කොත්හුගේ අග=කොත්අග, ඊට-කොත්අගට, විබත්සමස්; බඳනාලදකිකිණි යමෙක්හිද ඒ=බඳකිකිණි, අන් අරුත්සමස්, දෙදෙන් ගිගිණිහඬ=දදගිගිණි, එන-දදගිගිණින, විබත්සමස්; පුරනම වර=පුරවර, කැලණියද එම පුරවරද=කැලණි පුරවර, ඊට-කැලණියපුරවරට, විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්;

**කැලණියපුරවර**—මහානාග රජතුමාගේ පුත්‍රවූ යටාලතිස්ස කුමාරයා විසින් කැලණිපුරය ගොඩනගා එහි රජවිය. මේ රජතෙම සවකීය පිතෘරාජයාගේ ඇවෑමෙන් මාගම්පුරයෙහි රජවූ බැව් මහාවංශයෙහි:—

යට්ඨාලක තිස්සො සො තස්සපුත්තො තදච්චයෙ
තත්ථෙව රජ්ජං කාරෙසි තස්සපුත්තොභයො තථා-යි

යන ගාථාවෙන් පෙනේ. යටාලතිස්ස රජ කැලණිනුවර කරවා එහි වෙහෙරද කරවා රාජ්‍යය කෙළේය. "ඔහු පිත් ගොඨාභය රජ දෙවෙනිව රුණු මාගම රාජ්‍යය කෙළේය," යනුවෙන් රාජාවලියෙහි පෙනේ. මේ කියමන් එකිනෙකට විරුඬ බැව් පෙනෙන නමුත් යටාලතිස්ස රජතුමා සියපියරජහුගේ ජීවිත කාලයෙහි කැලණියෙහිද එතුමාගේ ඇවෑමෙන් මාගම්පුරයෙහිද රජකළ බැව් නිශ්චය වශයෙන් සිතන්ට පුලුවන. යටාලතිස්සරජතුමාගෙන් පසු කැලණිතිස්ස නම් කුමාරතෙම කැලණිපුරයෙහි රජවිය, මේ කාලයෙහි අග්‍ර රාජධානියව පැවතියේ අනුරාධපුරයයි, එහි රජතුමා ලඞ්කාවෙහි අගරජතුමා මෙන්ද කැලණිය මාගම ආදියෙහි විසූ රජවරු ප්‍රදෙශරාජවරු මෙන්ද රාජ්‍යය කළෝය. කැලණිතිස්ස රජුගේ රාජ්‍යකාලයෙන් පසු කැලණිපුරය අරාජකවිය. ඊට හෙතුව ඒ රජ විසින් නිවැරදි රහතන්වහන්සේ නමක් උනුතෙල් කටාරමකලා මරවනලද හෙයිනැයි කියනලදී. ඒ කථා ප්‍රවෘත්තිය 61 වෙනි කවියෙහි විස්තරයෙන් දත යුතුයි. කැලණිපුරය පූර්වකාන රජුන්ගේ කාලයෙහි පටන් ඉතා මෑත කාලය දක්වාම සමෘඬිමත්ව පැවති බැව් මේ සැලලිහිණි සන්දේශයෙහි කියමන්වලින් හැගේ. නිකායසඞ්ග්‍රහයෙහි කැලණිපුරය

පාසාද බොධි වරචඞ්කම මණ්ඩපෙහි
පාකාරසාල පටිමාලය චෙතියෙහි
කල්‍යාණිනාමනගරී රුචිරාපණෙහි
රාජේන්‍ද්‍ර චාරුතර ගොපුරතොරණෙහි—යනුවෙන්ද,

කෝකිල සන්දේශයෙහි:—

• කි ර ණී  නුදුල මිණ් කොත් කැරලි ලෙළදී  දී
පැ ර ණී  නොවන හැමසඳ නවහවිත් රැ  දී
ත ර ණී  පතව අසලට උසැති පාසැ  දී
කැ ල ණී  පුරට වදු දියනා ඔබා සි  දී - යනුවෙන්ද,

මයුර සන්දේශයෙහි:—

• කි ර ණ  විසිදි පහකුළුතුඟු කොතගින් සැ  දූ
හ ර ණ  ලියෙව් පියලන පියලියන් රැ  දූ
දෙ ර ණ  නුසුලනමෙන් සව්සිරින් සෙ  දූ
කා ල ණ  සිරින් පිරි මහ කැලණිපුරව  දූ

යනුවෙන්ද වර්ණනාකර ඇතිමේ.

* දූත් වනවාහල නමින් ප්‍රසිද්ධ ගමෙහි පිහිටි † ආවිත්තම් පොකුණ, ඊට සමීප ‡ කෙරඹග පොකුණ, ¶ බෝසත් වත්ත සහ දූනට එම විහාරයට

---

• වනවාහල යනු කැලණිපුරය සම්බිමින් කාලයෙහි සතරමහවාසල්න් එකක් විය යුතුයි.

† ආවිත්තම් පොකුණද වනවාහල යන ගමෙහිම පිහිටා තිබෙන කුඩා පොකුණක් හෙයින් මෙය කැලණිපුරවාසී ප්‍රභූන් හෝ අන්තඃපුර ස්ත්‍රීන් ජලස්නානයට පැමිණෙන පොකුණ විය යුතුයි.

‡ කැලණිතිස්ස රජතුමා සමුද්‍රෝත්පතනය බලන්ට ඇතුපිටින් යන කල්හි පොළොව පැලී නරකයට ගෙනාගිය බැව් රාජාවලියෙහි දක්වා තිබේ. ඒ රජු පොළොව පැලී නරකයට ගිය ස්ථානය කිරිගිය පොකුණ යන අර්ථයෙන් කෙරඹගෙ පොකුණ යයි විශ්වාසකල හැකිය. රජතුමා නරකයට ගෙනාගිය ස්ථානය ඇතුබුත් වලයයිද ව්‍යවහාරකර තිබූ බැව් කෝකිල සන්දේශයෙහි:—

ම තු  වනු හොඳන ගුරු එරහත් සිම්හිම  ල
සි තු  විකාලින් බිඳ නාගි ලඹිණී උණු නෙ  ල
ඇ තු  සහ හිරිඳු ගෙනාගිය මහපොළෝ නෙ  ල
ඇ තු  බුත් වලැයි යෙති ඒ දකු මිගඅස  ල

කෝකිල සන්දේශයෙහි ඇතුබුත්වල ප්‍රකාශව තිබෙත්තේත් වත්තලට නුදුරුවයි, කොරමගෙපොකුණ පිහිටා තිබෙන්නේත් වත්තලට ආසන්නව නිසා කෙරඹග පොකුණම ඇතුබුත්වලැයි එහි සඳහන්කල බැව් සිතියයුතුයි.

¶ බෝසත් වත්ත යනු නගරයේ මල් වත්ත වියයුතුයි. පොහොසත් වත්ත බෝසත් වත්ත කියා ව්‍යවහාරවීයයි හඟිමු. පොහොසත් යනු පුෂ්ප පර්යාය නාමයක් හෙයිනි.

ආසන්නව පිහිටි § බරණැස් කන්ද ‡‡ නාරම්මිණිය යනාදී මේ නගරය සම්බන්ධ ඓතිහාසික කරුණු දක්වන ස්ථාන මේ දක්වා තිබෙත්.

**සරණිය**—ශ්‍රෙණි ශබ්දයෙන්වූ තද්භව ප්‍රයෝගයකි.

**වදු**—වද-වැදීමෙහි යන ධාතුයි, උ ප්‍රත්‍යයවැ සිඬයි.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

54 දි ය ක ද ගැඹර පිරිපුවතර මහසයු ර
මු ව ර ද ලෙසින් වත අගතිසි කරතඹ ර
ම න න ද කරන මිණිගණමෙන් දිසි එව ර
පැ හැ න ද පහන් එහි මහවෙයැ බල මිතු ර

54 ගැඹර, ගම්භීරවූ; දියකඳ, ජලස්කන්ධයෙන්; පිරි, සම්පූර්ණවූ; පුවතර, (ජගත්) ප්‍රසිඬවූ; මහසයුර, මහාසාගරය; අගතිසි, අගස්තිමහාඍෂීහුගේ; කරතඹර, හස්තතාමරසයෙහි; මුවරදලෙසින්, පුෂ්පරසයක් මෙන්; වත, වනකල්හි හෙවත් සියලු සමුද්‍රජලය හස්තපුටයෙන් ගත්කල්හි; දිසි, දෘශ්‍යමානවූ; මනනද කරන, මනොනන්දනය කරන්නාවූ; මිණිගණමෙන්, මාණික්‍ය රත්න සමූහයක් වැනිවූ; එවර, ඒ කාලයෙහි හෙවත් ඒ තරැ පෙනෙන වේලෙහි; එහි, ඒ කල්‍යාණීපුරප්‍රවරයෙහි; මහවෙයැ, මහාවීථියෙහි; පැහැනද, ප්‍රභායෙන් ආර්ද්‍රවූ හෙවත් ස්නිග්ධවූ ප්‍රභා ඇති; පහන්, ප්‍රදීපයන්; මිතුර, මිත්‍රය; බල, නිරීක්ෂණය කර.

**'නෝ පහන් බල'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—**බල** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **පහන්** යනු අනුක්තකර්මයි, **පැහැනද** යනුද **දිසි** යනුද කර්මවිශෙෂණයි, **එහි** යනුද **මහවෙයැ** යනුද අනුක්තාධාරයි, **මිතුර** යනු සම්බොධනයි, **එවර** යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, **මෙන්** යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, **මනනද කරන මිණිගණ** යනු උපමා කර්මවිශෙෂණයි,

---

§ දූත් කැලණි ගමට යාබදව පිහිටා තිබෙන බරණැස් කන්දයයි ව්‍යවහාරවූ කුඩා කඳුගොඩැල්ලක් සහිත ගමක් දක්නා ලැබේ. එහි පොළොවයට තිබී සම්භවෙන පැරණි උළුකැට හැබලි ආදී ද්‍රව්‍යයන්ගෙන් පුරාණ ගොඩනැගිල්ලක් තිබූබවට නොයෙක් සාක්ෂ්‍යපෙනෙත්. මෙය පූර්වයෙහි කැලණිපුරය සමෘද්ධිමත් කාලයෙහි ස්කන්ධකුමාර දේවාලය පිහිටි ඉඩමයයි සිතන්ට පුළුවන. බරඇස්කඳ යන්නට ණකාරයක් ආගමව බරණැස්කඳ කියා හෝ බරනෙත්කඳ යන්න බරණැස්කඳ කියා හෝ වී තිබේ.

‡‡ නාරම්මිණිය යනු මිණිනාරම් යන්න පද විපර්‍ය්‍යාසව නාරම්මිණියයි සිදුවී තිබේ. මිණිනාරම් යනු මණිනාගාරාමය හෙවත් මණිඅක්ඛික නාරජුගේ ආරාමය යන අර්ථයි.

වන යන්නු කාලාඛයෙහි අසම්භාව්‍යක්‍රියායි, මුවරදලෙසින් යනු උපමා කරණයි, අගතිසිකරතඹර යනු අනුකතාධාරයි, දියකඳ ගැඹර පිරිපුවතර මහසයුර යනු වන යන ක්‍රියාවට කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබත්,

ස, වි—දියයේකඳ=දියකඳ, දියකඳින් ගැඹර=දියකඳගැඹර, පිරුණේද එම පුවතරද=පිරිපුවතර, දියකඳ ගැඹරද එම පිරිපුවතරද=දියකඳ ගැඹර පිරිපුවතර, දියකඳගැඹර පිරිපුවතරද එම මහසයුරද=දියකඳගැඹර පිරිපුවතරමහසයුර, විබත්සමස් ගැබ්වෙසෙසුන් සමස්; මුවරදන්ගේ ලෙස=මුවරදලෙස, ඉන්-මුවරදලෙසින්, විබත්සමස්; අගත්ද එම ඉසිද=අගතිසි, කරම තඹර=කරතඹර, අගතිසිනුගේ කරතඹර=අගතිසිකරතඹර, වෙසෙසුන්සමස් ගැබි විබත් සමස්; මිණින්ගේ ගණ=මිණිගණ, විබත් සමස්; එද එම වරද එවර, වෙසෙසුන්සමස්; පැහැයෙන් නද=පැහැනද, විබත්සමස්; මහවූයේද එම වේවූයේද=මහවෙ, එහි-මහවෙයැ, වෙසෙසුන් සමස්;

**අගතිසි**—අගස්ති ඍෂිතෙමේ චතාහි වෙද වෙදාන්තාදී නානා ශාස්ත්‍ර යන්හි පාරප්‍රාප්තයෙකි, "අගං (විනිධ්‍යං) ස්තම්භයතීති අගස්ත්‍යඃ" යනු හෙයින් විනිධ්‍යපර්වතය සංඛ්‍යාත කෙරේනුයි අගස්ති නම්, එක් කාලයෙක්හි මොහු විනිධ්‍යපර්වතය සමග කොපව්ය, එකල හැට පත් පර්වතය මොහුගේ පාමුල වැටී ක්ෂමාකරගත්තේල. එහෙයින් මොහුට අගස්ති යන නාමය ඇති විය. කුම්භයෙක්හි (කළයෙක්හි) උපත් හෙයින් මොහුට කුම්භසම්භවයයිදු කියත්. මොහුගේ භාර්‍ය්‍යා තොමෝ ලොපාමුද්‍රා නම් කාන්තාවකි, වසිෂ්ඨ තෙමේ මොහුගේ සහොදරයා විය, වරක් මොහු සමුද්‍රය හා කොපව සියලු සමුද්‍රජලය දෙහොතින් ගෙන පානය කල බැව් කියති.

අගස්ති ඍෂිහුගේ දෙඅත්ලට සමුද්‍රජලය ගත්කල මුහුදපත්ලෙහි පෙනෙන්නාවූ මාණික්‍ය සමූහය මෙන් කැලණිපුර මහ වීථියෙහි පෙනෙන පතස් බල යනු කවියෙහි අදහසයි.

**බල**—බල-බැලීමෙහි යනු ධාතුවෙන් අප්‍රත්‍යයව සිඬයි.

## උදාත්තාලඞ්කාරයි.

55 උ ද ය ග පියුම්රා පැහැ වැදමෙන් ඇ ලු ණු
පෙ ර දි ග පෙනෙන සඳ සඳකැල්මෙන් දි ලු ණු
ම න ර ඟ එපුර සඳකත ගෙහඹින් ගැ ලු ණු
සු ර ග ඟ පතිනි දම්රැකුමෙහි මැ තියැ ලු ණු

55 උදයග, උදයපර්වතශිඛරයෙහි; පියුම්රාපැහැ, පද්මරාග මාණික්‍ය ප්‍රභාව; වැද, සපශීව; ඇලුණුමෙන්, රංජිතවූවාක්මෙන්; සඳකැල්මෙන්, සන්ධ්‍යාකාන්තියෙන්; දිලුණු, විස්ඵුරිතවූ; සඳ,

චන්‍ද්‍රයා; පෙරදිග, පූර්වදිශාභාගයෙහි; පෙනෙන, දෘශ්‍යමාන වන කල්හි; එපුර, ඒ පුරයෙහි; මනරඟ, මනොඥවූ; සඳකතගෙහි, චන්‍ද්‍රකාන්තපාෂාණයෙන් නිර්මිතවූ ගෘහයෙහි; අඹින් ගැලුණු, ජලය කරණකොටගෙන වර්ධිතවූ; සුරගඟ, ආකාශගඞ්ගා තොමෝ; පතිනිදම්රැකුමෙහි මැ, පතිව්‍රතාධර්මරක්‍ෂාවෙහි ම; නිසැලුණු, තත්පර වූ.

**'සුරගඟ නිසැලුණු'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—**නිසැලුණු** යනු කර්තෘකාරක ප්‍රත්‍යයාර්ථ ක්‍රියායි, **සුර ගඟ** යනු උක්තකර්තෘයි, **පතිනිදම් රැකුමෙහි** යනු අනුක්තා ධාරයි, **ම** යනු අවධාරණයෙහි අව්‍යයයි, **ගැලුණු** යනු කර්තෘ විශෙෂණයි, **මනරඟඑපුර සඳකතගෙහඹින්** යනු අනුක්ත කරණයි, **පෙනෙන** යනු කාලාර්ථයෙහි අසමභාව්‍ය ක්‍රියායි, **සඳ** යනු ඊට කර්තෘ හෙයින් අදරඅරුතැ කම්විබත්, **දිලුණු** යනු චන්‍ද්‍ර විශෙෂණයි, **සඳකැල්මෙන්** යනු අනුක්තකරණයි, **පෙරදිග** යනු අනුක්තාධාරයි, **මෙන්** යනු උත්‍ප්‍රෙක්‍ෂණයෙහි අව්‍යයයි, **ඇලුණු** යනු චන්‍ද්‍ර විශෙෂණයි, **වැද** යනු පූර්වක්‍රියායි, **පියුම්රා පැහැ** යනු ඊට අනුක්තකරණයි, **උදසග** යනු අනුක්තාධාරයි,—

**ස, වි**--උදයෙහි අග=උදයග, විබත්සමස්; පියුමට බඳු රා යමෙක්හිද හෙතෙම=පියුම්රා, පියුම්රාවගේ පැහැ=පියුම්රාපැහැ, අන්අරුත්සමස් ගැබ් විබත්සමස්; පෙරද එම දිග්ද=පෙරදිග්, එහි-පෙරදිග, වෙසෙසුන්සමස්; සඳැයෙහි කැල්ම=සඳැකැල්ම, එන්-සඳකැල්මෙන්, විබත්සමස්; මනට රඟ=මනරඟ, විබත්සමස්; සඳම කත්=සඳකත් සඳකතින් කළ ගේ=සඳකත්ගේ, එහි-සඳකත ගෙහි, විබත්සමස් ගැබ් විබත්සමස්; සුරන්ගේ ගඟ=සුරගඟ, විබත් සමස්; පතිනියගේ දම්=පතිනිදම්, පතිනිදමගේ රැකුම=පතිනි දම්රැකුම, විබත්සමස් ගැබ් විබත්සමස්;—

**සඳකැල්ම**—සන්ධ්‍යා කාලයෙහි වලාකුළුවයන්හි හිරුරැස් වැද ඊහිදෙන රක්තවර්ණභාවය සන්ධ්‍යාකාන්තියයි.

චන්‍ද්‍රයා දුටිම් හෙතුවෙන් ගඟා වල්ලභවූ සමුද්‍රය ජලාභිවෘධියට පැමිණෙන කාලයෙහි ඒ පුරෙහි උස්වූ චන්‍ද්‍රකාන්ත පාෂාණමය ප්‍රාසාදයන්ගේ සලිලසංසගී යෙන් ආකාශ ගඟාවට ජලාභිවෘධියවූ හෙයින් සමාන සුඛදුඃඛතා ලක්‍ෂණවූ පති ව්‍රතා ධර්මය රක්‍ෂාකළාහුයයි කීහු, ආකාශ ගඟාව සමුද්‍රයාගේ පත්නියක යන්ද සමුද්‍රය ඇගේ වල්ලභයා යන්ද ශාස්ත්‍රයෙහි ප්‍රසිද්ධය. එහෙයින් හිමිහට පැමිණි දුකෙහි දුක්විමද සුවෙහි සුවපත්විමද පත්නියගේ සමාන සුඛදුඃඛතා ලක්‍ෂණ පතිව්‍රතා ධර්මයයි මෙහි කියනලදී.

**සඳකත**—18 වෙනි කවියෙහි සඳකතමිණ යනු බලනු.

**සුරගඟ**—27 වෙනි කවිය බලනු.

**උත්‍ප්‍රෙක්‍ෂාලඞ්කාරයි.**

56 සුනිල් වලා නවසඳ නිලුපුල් පබළු
විමල් සක් ගිජිඳුකුඹු සිරිවස බැබළු
විපුල් පුලින රඹ සිකිගල මුතුළදළු
ළකල් රතලියන් සරනා බල යහළු

56 සුනිල්, අතිනීලවූ; වලා, මේඝය; නවසඳ, අභිනවචන්ද්‍රයා; නිලුපුල්, නීලොත්පලය; පබළු, ප්‍රවාලය; විමල්, නිර්දොෂවූ; සක්, ශඞ්ඛය; ගිජිඳුකුඹු, ගජරාජකුම්භය; බැබළු, භ්‍රාජිතවූ; සිරිවස, ශ්‍රීවත්සය; විපුල්, මහත්වූ; පුලින, වාලුකාස්ථලය; රඹ කදලී ස්කන්ධය; සිකිගල මයූරකණ්ඨය; මුතු, මුක්තාඵලය; ළදළු, බාලපල්ලවය යන මෙයින්; ළකල්, මනොඥවූ; සරනා, සඤ්චාරය කරන්නාවූ; රතලියන්, ස්වර්ණලතාවන්; යහළු, මිත්‍රයා; බල, දර්ශනය කර.

**'තෝ රතලියන් බල'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි** —බල යනු විධිකිරියයි, **රතලියන්** යනු අනුක්ත කර්මයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **සරනා** යනුද **ළකල්** යනුද කර්මවිශෙෂණයි, **සුනිල්වලා** යනුද **නවසඳ** යනුද **නිලුපුල්** යනුද **පබළු** යනුද **විමල්සක්** යනුද **ගිජිඳුකුඹු** යනුද **සිරිවස** යනුද අනුක්තකරණයි, **බැබළු** යනු සිරිවස යන්නට විශෙෂණයි, **විපුල් පුලින** යනුද **රඹ** යනුද **සිකිගල** යනුද **මුතු** යනුද **ළදළු** යනුද අනුක්තකරණයි;—

**ස, වි**—ඉතා නිල්=සුනිල්, පඅැ සමස්; සුනිල්ද එම වලාද=සුනිල්වලා, වෙසෙසුන්සමස්; නවවිද එම සඳවිද=නවසඳ, වෙසෙසුන්සමස්; නිල්වූයේද එම උපුල්වූයේද=නිලුපුල්, වෙසෙසුන් සමස්; විමල්ද එම සක්ද=විමල්සක්, වෙසෙසුන් සමස්; ගජනට ඉඳු=ගිජිඳු, ගිජිඳුන්ගේ කුඹු=ගිජිඳුකුඹු, විබත්සමස් ගැබ් විබත් සමස්; ළයට කල්=ළකල්, විබත්සමස්; රනින් කළ ලිය=රනලිය, ඔවුන්-රනලියන්, විබත් සමස්; යහ (මනාවූ) ළ ඇතියේ යමෙක් හටද හෙතෙම=යහළු, අන්අරුත් සමස්;—

මේ කාව්‍යයෙහි වර්ණනීයවස්තුයෙන් අභිප්‍රෙත පුරාඞ්ගනාවන් නොදක්වා ඔවුන්ට සමානවූයෙන් උපමා පක්ෂය පමණක් ප්‍රස්තුත කොට උපමෙය වස්තුව කතෘගේ සිත්හි තබා අභිප්‍රෙතාර්ථය ප්‍රකාශකරනලදහ, මෙහි වර්ණනීයවස්තුයෙන් අභිමතවූවාහු නම් ඒ නගරයෙහි හැසිරෙන අඞ්ගනාවෝයි, එසේ නමුදු මෙහි කියනලද ලක්ෂණොපෙත ස්වර්ණලතා සඞ්ඛ්‍යාත උපමාව පමණක් කියෙයින් මේ **සමාසොක්ති** නම්.

මෙයින් උගත්වන අර්ථය නම් නිල්වලාබඳු ඉතා නිල්කෙශකලාපයෙන්ද බාලචන්ද්‍රයාට බඳු ලලාටයෙන්ද නිලොත්පල පෙති බඳු නෙත්‍රයෙන්ද පබළුසේ රත්වූ දෙතොලින්ද පිරිසිදු සක්සේ ධවලවූ දන්තයන්

තෙන්ද ඇත්කුඹුබඳු පයොධරයෙන්ද ශ්‍රීවත්සයබඳු වක්‍ෂෝරොදින්ද මහත් වැලිතලා වක් බඳු පුලුලුකුලින්ද කෙසෙල් කඳ බඳු වටොරින්ද මොනරකරබඳු ජඞ්ඝායෙන්ද මුහුබඳු නියපෙළින්ද ලදළුබඳු අතුල්පතුල් හා ඇඟිලියෙන්ද යුක්තවූ සිත් කලුවූ පුරඟනන් බලව යනුයි:—

**සිරිවස**—ශ්‍රී වත්ස ශබ්දයෙන් ගත්තයි. ශ්‍රී වත්සය නම් විෂ්ණු දිව්‍ය රාජයාගේ උරඃස්ථලයෙහි පිහිටා තිබෙන්නාවූ ලොමාවලියකි.

“ප්‍රභානුලිප්ත ශ්‍රී වත්ස ලක්‍ෂ්මී විභ්‍රමදර්පණම්”

යනු රඝු වංශොක්ති හෙයින්ද ශ්‍රී වත්සලාඤ්ඡන යනු විෂ්ණු පර්‍ය්‍යාය නාම යක් ඇතිහෙයින්ද මෙය විෂ්ණු චින්හයක් බැව් නිසැකයෙන් සැලකේ. මෙය දක්‍ෂිණාවර්තව ශුභ්‍රවර්ණයෙන් බබළයි. එයින් විෂ්ණුගේ වක්‍ෂස්ථලය අතිශය ශොභාමත්වේ. සර්ජ්කාන විසින් කෙළින් සිටුවනලද උඩැක්කියක හටහන් ඇත්තේය. සැළලිහිණි සන්දෙස පුරාණ සන්නයෙහි වක්‍ෂෝරෝදට උපමා ප්‍රස්ථාවෙහි මෙය දක්වූ නමුත් කවි සමයෙහි සිහින් ඉහට උපමා වශයෙන් දක්වා තිබේ.

“රත්සිරිවසනිගාය සිහිනියාය” යනු නිදසුනයි.

## සමාසොක්ත්‍යලඞ්කාරලක්‍ෂණ.

වස්තුකිඤ්චිදභිප්‍රෙත්‍ය තත්තුල්‍යස්‍යාන්‍ය වස්තුනඃ
උක්තිඃ සංක්‍ෂෙප රූපත්වාත් සා සමාසොක්තිරිෂ්‍යතෙ.

කිසි වස්තුවක් කල්පනාකොට ඊට සමානවූ අන් වස්තුවක්හුගේ කථනයක් වේද ඕතොමෝ සංක්‍ෂෙප ස්වරූප කථනහෙයින් සමාසොක්තියයි කැමතිවනු ලැබේ-යනු භාවයි.

57 ඔ ද වැඩි කෙළිමඟුල් ලැබ තුටු නිසාක ල
ස ද සක්මදෙසිනැද දෙත දුනුකැන් දුනු ල
සොඳ පුරඟන පහසුමුගින් පැහැ උදු ල
සෙ ද දුනඹරමතු ඇය රැස්මිණිමෙවු ල

57 ඔදවැඩි, ඔජොහුයිණුවූ; කෙළිමඟුල් ලැබ, (ඒ පුරාඞ්ගනාව විසින් පමුණුවනලද රාත්‍රිභාගයට යොග්‍යවූ මධුපානරත්‍යුත්සවාදි) ක්‍රීඩාමණ්ඩලයට ප්‍රාප්තවැ; තුටු, සන්තුෂ්ටවූ; නිසාකල, නිශා නමැති කාන්තාව විසින්; සඳසක්මදෙසින්, චන්ද්‍ර (මණ්ඩල) නමැති ශඞ්ඛමඤ්ජූෂායෙන් හෙවත් සක්පෙට්ටියෙන්; ඇද, ආකර්ෂණය කොට ගසාගෙන; දුනුකැන්, ජ්‍යොත්ස්නාසමූහ නමැති හෙවත් සඳපහන් නමැති; දුහුල, දුකූලය සුදුපට; දෙත, දානය කරන කල්හි; සොඳ, සුන්දරවූ; පුරඟන, පුරාඞ්ගනා තොමෝ; පැහැ උදුල, ප්‍රභායෙන් උජ්ජ්වලත්වූ; පහසුමුගින්, ප්‍රාසාදනමැති සමුද්ගයෙන් හෙවත් කරඬුවෙන් (හැරගෙන); රැස්මිණිමෙවුල, රශ්මි

නමැති මාණික්‍යමෙබලාදමය; ඇය, ඒ නිශාකාන්තාවගේ; අඹර මතු, වස්ත්‍රමස්තකයෙහි දෝහෝ නොහොත් ආකාශමස්තකයෙහි; සෙද, ශීඝ්‍රව; දුන්, ප්‍රදානය කළා.

'පුරඟන රැස්මිණිමෙවුල දුන්' යනු ක්‍රි: කා: ප: ස:

**ල, වි**--දුන් යනු කර්තෘකාරක ප්‍රත්‍යක්ෂ ක්‍රියායි, **සොඳ** පුරඟන යනු ඊට උක්තකර්තෘයි, **රැස්මිණිමෙවුල** යනු අනුක්ත කර්මයි, **අඹරමතු** යනු අනුක්තාධාරයි, **ඇය** යනු අනුක්ත සම්බන්ධයි, **සෙඳ** යනු ක්‍රියා විශේෂණයෙහි අව්‍යයයි, **පහසුමුගින්** යනු අනුක්තාපාදනයි, **පැහැළදුල** යනු අපාදන විශේෂණයි, **දෙන** යනු කාලාර්ථයෙහි අසම්භාව්‍යක්‍රියායි, **දුනුකැන්දුහුල** යනු ඊට අනුක්තකර්මයි, **ඇද** යනු පූර්වක්‍රියායි, **සඳසක්මදෙසින්** යනු අනුක්තාපාදනයි, **නිසාකල** යනු දෙන යන අසම්භාව්‍ය ක්‍රියාවට කර්තෘයි, **තුටු** යනුද **ඔදවැඩි** යනුද ඊට විශේෂණයි, **ලැබ** යනු පූර්වක්‍රියායි, **කෙළිමඟුල්** යනු ඊට අනුක්තකර්මයි;—

**ස, වි**—ඔදින්වැඩි=ඔදවැඩි, විබත්සමස්; කෙළිද එම මඟුල්ද= කෙළිමඟුල්, වෙසෙසුන්සමස්; නිසාමකල්=නිසාකල්, ඇය-නිසා කල, වෙසෙසුන් සමස්; සකෙන් කළ මදෙස්=සක්මදෙස්, සඳම සක්මදෙස්=සඳසක්මදෙස්, ඉන්-සඳසක්මදෙසින්, විබත්සමස් ගැබ් වෙහෙසුන්සමස්; දුනුන්ගේ කැන්=දුනුකැන්, දුනුකැන්ම දුහුල=දුනුකැන්දුහුල, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; පුරම අඟන=පුරඟන, සොඳ වූවාහුත් ඔහුමය පුරඟන වූවාහුත් ඔහුම හුයි=සොඳපුරඟන, වෙහෙසුන්සමස්; පහම සුමුගු=පහසුමුගු, ඉන්- පහසුමුගින්, වෙසෙසුන්සමස්; පැහැයෙන්උදුල=පැහැදුල, විබත් සමස්; මිණිමුවා මෙවුල්=මිණිමෙවුල්, රැස්ම මිණිමෙවුල්=රැස් මිණි මෙවුල්, එය-රැස්මිණිමෙවුල, වෙසෙසුන්සමස්;—

ඒ නාගරී නමැති කාන්තාව විසින් කරනලද ක්‍රීඩාමඞ්ගලයක් ලැබ සතුටුවූ රාත්‍රි නමැති කාන්තාවද සඳමඬල නමැති සක්පෙට්ටියෙන් නිකුත්කොට ගෙන සඳරැස් නමැති සුදුපටසලුව දෙන කල්හි ඒ ගෙහපත්වූ නාගරී නමැති කාන්තාවද පැහැගෙන් දිළෙන්නාවූ රත්නප්‍රාසාද නමැති කරඬුවෙන් හැරගෙන රශ්මි නැමති මෙවුල්දම ඒ රාත්‍රි නමැති කාන්තාවගේ වස්ත්‍ර මතුයෙහි හෝ ආකාශ මතුයෙහි වහාම පැළඳවූ—යනු භාවයි.

## රූපකාලඞ්කාරයි.

58 ත ව ර කැරළු කොකුම්සඳුනෙන් තුනුසිය ල
ප ව ර සුවඳ මල්දම් පැලඳ මතක ල
බැ හැ ර සිතුනොලූ හිමිනඹුවො කෙළිලො ල
එ පු ර ඉඳිති සඳපාණේ සඳලුව ල

58 කොකුම්සඳුනෙන්, කුඞ්කුමයෙන් යුක්තවූ චන්දනාඞ්ගරාගයෙන්; සියල තුනු, (ආමෙලපයොග්‍යවූ) සකල ශරීරය; තවරකැරැ, විලිප්ත කොට; පවර, උතුම් වූ; සුවඳ, (කස්තූරිකාදි) සුගන්ධ ද්‍රව්‍යයන්ද (මුව ලා); මනකල, මනොඥවූ; මල්දම්, පුෂ්පදාමයන්ද; පැලඳ, ප්‍රසාධනය කොට; බැහැර, අන්‍යවිෂයෙක්හි; සිතු නොලූ, චිත්තධාවනය නොකළාවූ; කෙළිලොල, ක්‍රීඩාලෞල්‍යයෙන් යුක්තවූ; හිමිනඹුවෝ, දම්පතීහු; එපුර, ඒ පුරයෙහි; සඳලුවල, චන්ද්‍රශාලාවන්හි; සඳපානේ, චන්ද්‍රාලොකයෙහි; ඉඳිති, නිෂද්‍යා කරන්නාහුය.

'හිමිනඹුවෝ ඉඳිති' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි—ඉඳිති** යනු වත්මන් අන්කරුබුහුබස් අකම්කිරියයි, **හිමිනඹුවෝ** යනු උක්තකර්තෘයි, **කෙළිලොල** යනුද **නොලූ** යනුද කර්තෘවිශෙෂණයි, **එපුර** යනුද **සඳලුවල** යනුද **සඳපානේ** යනුද අනුක්තාධාරයි, **සිතු** යනු **නොලූ** යන අපූර්වක්‍රියාපදයහට අනුක්තකර්මයි, **බැහැර** යනු ඊට අනුක්තාධාරයි, **පැලඳ** යනු පූර්වක්‍රියායි, **සුවඳමල්දම්** යනු ඊට අනුක්තකර්මයි, **පවර** යනුද **මනකල** යනුද කර්මවිශෙෂණයි, **තවරකැරැ** යනු සොපපද පූර්වක්‍රියායි, **තුනු** යනු ඊට කර්මයි, **සියල** යනු ඊට විශෙෂණයි, **කොකුම්සඳුනෙන්** යනු අනුක්තකරණයි;—

**ස, වි—**කොකුම්ද සඳුන්ද=කොකුම්සඳුන්, ඉන්-කොකුම්සඳුනෙන්, ද්වන්ද්වසමස්; සුවඳින් යුතු මල්=සුවඳමල්, සුවඳමලින් කළ දම්=සුවඳමල්දම්, විබත්සමස් ගැබි විබත්සමස්; නො ලූවෝ=නොලූ, අව්‍යයසමස්; හිමින් හා අඹු=හිමිනඹු, ඔව්හු-හිමිනඹුවෝ, විබත්සමස් (නොහොත්) හිමිද අඹුද=හිමිඅඹු, ඔව්හු-හිමිනඹුවෝ, ද්වන්ද්වසමස්; කෙළියෙහි ලොල්=කෙළිලොල්, විබත්සමස්; සඳුගේ පාන්=සඳපාන්, එහි-සඳපානේ, විබත්සමස්; සඳුගේ අළු යමෙක්හිද හෙතෙම=සඳළු, එහි-සඳළුවල, අන්අරුත්සමස්;—

සවභාවොක්ත්‍යලඞ්කාරයි.

59 මුවලඹ රඹ වලුබර රන්තැඹිලි තුරු
සැදි ගෙළයන් ගෙවමින් වේමඟ අතුරු
කරකැවෙමින් දකුණට අවුදින් මිතුරු
වඳු වෙහෙරට සිහිකැරැ නවගුණ මතුරු

59 මුවලඹ, මුඛාවලම්බනයෙන් උපලක්‍ෂිතවූ; රඹ, කෙසෙල් ගසින්ද; වලුබර, ඵලභරිතවූ; රන්තාඹිලිතුරු, කනකසන්නීර වෘක්‍ෂයෙන්ද; සැදි, අලඞ්කෘතවූ; ගෙළයන්, ගෘහොද්‍යාන ඇත්තාවූ; වේමඟඅතුරු, වීථිමාර්ගාන්තරය; ගෙවමින්, අවසාන කෙරෙමින්; දකුණට කරකැවෙමින්, දක්‍ෂිණාවෘත්ත වෙමින්; අවුදින්

ආගමනය කොට; නවගුණමතුරු, නවගුණමිත්‍රය; සිහිකැරැ, අනුස්මරණය කොට; මිතුරු, මිත්‍රය; වෙහෙරට, විහාරයට; වදු, ප්‍රවිෂ්ට වව.

'තෝ වෙහෙරට වදු' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—වදු යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **වෙහෙරට** යනු අනුක්තකර්මයි, **සිහිකැරැ** යනු සොපපද පූර්වක්‍රියායි, **නවගුණමතුරු** යනු ඊට අනුක්තකර්මයි, **අවුදින්** යනු පූර්වක්‍රියායි, **කරකැවෙමින්** යනු මිශ්‍රක්‍රියායි, **දකුණම** යනු ඊට කර්මයි, **මිතුරු** යනු සම්බොධනයි, **ගෙවමින්** යනු මිශ්‍රක්‍රියායි, **ගෙළයන්** යනු ඊට අනුක්ත කර්මයි, **සැදි** යනු කර්මවිශෙෂණයි, **වේමගඅතුරු** යනු අනුක්තාධාරයි, **මුවලඹරඹවලුබරරන්තැඹිලි තුරු** යනු සැදි යන්නට අනුක්ත කරණයි;—

**ස, වි**—මුවින්ලඹ=මුව ලඹ, මුවලඹද එම රඹද=මුවලඹරඹ, වලුයෙන් බර=වලුබර, තැඹිලිද එම තුරුද=තැඹිලිතුරු, රන්විද එම තැඹිලිතුරුවිද=රන්තැඹිලිතුරු, වලුබරවිද එම රන්තැඹිලි තුරුවිද=වලුබරරන්තැඹිලිතුරු, මුවලඹරඹද වලුබරරන්තැඹිලි තුරුද=මුවලඹරඹවලුබරරන්තැඹිලිතුරු, විබත්සමස් වෙසෙසුන් සමස් විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් දුරුත්සමස්; ගෙට තුදුරු උයන්=ගෙළයන්, විබත් සමස්; වෙයම මඟ=වේමඟ, වේ මඟෙහි අතුරු=වේමඟතුරු, වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්; ගුණනවයක් එක්කොට සලකනලද්දේ=නවගුණ, නවගුණම මතුරු=නවගුණමතුරු, වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන්සමස්;-

**වෙහෙරට**—මෙයින් ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරය අභිප්‍රෙතයි. රජමහ කැලණි විහාරය පළමුවෙන් කරවනලද්දේ යටාලතිස්ස රජතුමා විසිනි, දෙවානං පියතිස්සරජතුමාගේ මලණුවූ මහානාග කුමාරයාගේ පුත්‍රවූ යටාලතිස්ස කුමාර තෙමේ කැලණිනගරයෙහි රජසිරි පැමිණියේය. හෙතෙම ශුද්ධාබුද්ධි සම්පන්න වූයේ සැටරියන් උස්වූ එක්සිය හිසිරියන් වටවූ මහා චෛත්‍යය බඳවා කොත් පලඳවා සමාධිපිළිමගෙය නාපිළිමගෙය ත්‍රිවංකගෙය පස්මහල්පාය විභීෂණ දෙවාලය ආදීවූ සියලු විහාරාංගයන් සම්පූර්ණකොට ග්‍රාමක්ෂෙත්‍ර මුතුමැණික් හිරණ්‍ය සුවර්ණාදිය පුදකොට ලෝසසුන් වඩිනයකොට දෙව්ලෝ සැපත්වීය. මීට පසු කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජතුමා විසින්ද ප්‍රතිසංස්කරණ කරවනලද බැව් මහාවංශයෙහි මෙසේ දක්වා තිබේ.

"යටාලතිස්ස රජුවිසින් උතුම් කැලණිනුවර පූර්වකාලයෙහි කරනලද දිරාගිය පස්බුමු මහපාය බොහෝකොට ජීර්ණවිශොධනය කොට පසුව සුණුකම්විධාන යෙන් නැවත ප්‍රකෘතිමත් කෙළේය. මිහිපල්තෙමේ එහිම ඔත්පිළිමගෙයද ත්‍රිවංකපිළිමගෙයද සකස්කෙළේය. සතරැස් මහසැමිලුව මහත් ගලින් මොනවට සමතලාකොට ඒ ඉදිරියෙහි මහම්ඩුවක් කරවී, මිල්පහන්බක් පූජාගෙන්ද

පිත් රැස්කොළේය. විහාරයෙහි දීපපතා පහන් පූජාව පිණිස ඊට ආසන්න ප්‍රදේශයෙහි මනොරම්‍යවූ සශ්‍රීක මහපොල් උයනක් සිය නාමින් කරවා දෙවිය" යනුයි.

මීට පසු භුවනෛකබාහු ගජබාහු (කෝට්ටේ ශ්‍රී සඞ්ඝබොධි ශ්‍රී පරාක්‍රමබාහු ආදී රජුන් විසින්ද මෙම කැලණි වෙහෙර දියුණු කරවනලද බැව් පෙනේ. මෙහි පසුව ඇතිවූ ප්‍රතිසංස්කරණය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලයෙහිවේ. එකල්හි වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජෝත්තමයාණන්වහන්සේගේ ශිෂ්‍යවූ දෙහිගස්පේ අත්ථදස්සී නම් මහාස්ථවිරයන්වහන්සේ උන්වහන්සේගේ ශිෂ්‍යවූ මාපිටිගම බුද්ධරක්ඛිත තෙරපාණන් හා එක්ව කීර්ති ශ්‍රී මහරජතුමන්ගේ ආධාර ලදින් වෙහෙරවහන්සේ ප්‍රතිසංස්කාරණය කරවා විහාර පුෂ්පාරාම ඵලාරාම මණ්ඩප පණ්ණශාලා භොජනශාලාදිය කරවා වදාළෝය. පසුව ඇතිවූ මෙම ප්‍රතිසංස්කාරණය අද දක්වාත් වර්ධනය වෙමින් පවත්නේය. දැනට එම පරම්පරාවේ තුන්වැනි ධම්මරක්ඛිතවූ මාපිටිගම ධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ ස්ථාන දියුණුව පිණිස ප්‍රොත්සාහී අධිපතිභාවයෙන් වෙසෙසි.

---

## කෝට්ටේ රාජධානි සමයෙහි ප්‍රතිසංස්කරණාවසානයෙහි පිහිටුවන ලද ශිලාලේඛ්‍යය.

---

ස්වස්ති ශ්‍රී සද්ධර්මාධිරාජ ත්‍රිභුවනානන්දකර ශාක්‍යකුලතිලක සකලලොක දිවාකර අමෘතමහා නිර්වාණදායක ගෞතම සර්වඥරාජොත්තමයාණන් වහන්සේට දෙදස් එක්පණස්වනු ලඞ්කාරාජ්‍යශ්‍රියට පැමිණි ත්‍රිසිංහලාධීශ්වර පරරාජ රාජේශ්වර සාමන්තරාජ කිරීට රත්නසෙවිත පාදම්බුජ ශිශිරකර කිරණායමාන කීර්ති බන්ධ බන්ධුර ගුණරත්නාලඞ්කෘත විශුද්ධ බුද්ධාඞ්කුර සිරිමත් සිරිසඟබෝ ශ්‍රී පරාක්‍රමබාහු චක්‍රවර්ති ස්වාමීන්වහන්සේට දසනවවනු නාවමැ පුර එකොළොස්වක රජමහාකැලණි විහාරය නම් බුදුන් වැඩහිඳ වළඳා ධර්මදෙශනා කළාවූ උත්තමස්ථානයක එහි මෙදවසට ජරාවාසව තිබෙන පිත්කම් කවරේ දැයි චෛත්‍යාදිවූ සියලු තැන් ජීර්ණව තිබෙතැයි අසා රජගෙන් නොයෙක් වියදමුත් දී කරවන්ට කියා ගණනායක තැනට හා පරාක්‍රමබාහු විජයක්කෝනාර අමාත්‍යයාණන්ට භාරකළපසු චෛත්‍යයෙහි සුණුපිරියම් ආදිවූ සුත්බුත් කර්මාන්තයත් කරවා උතුරුදිග සැටරියන් කළුගල් පවුරක් හා නැගෙනහිර සඳකඩ පහනින් යුක්ත ගල්පඩියකුත් බඳවා සමාදි පිළිමගෙය හා පිළිමගෙය මෙම විහාරයෙහි පූර්විදිග වාසල මෙම තැන ගල්පඩිය කුඩා ත්‍රිවඞ්කගෙය තෙල් කවාරගෙය සාංඝික වැසිකිළිය බස්නාහිර වාසල ඇතුළුවූ තැන් මුල්පිය කරවා පස්මහල්පාය සලපිළිගෙය සිවුරුදගෙය යනාදිවූ මෙකී තැන් කටු කොහොල් හරවා අභිකුත් විහාරේ නොයෙක් සුත්බුත් කර්මාන්තත් පිරිමස්වා සම්පූර්ණකරවූ පසු ශ්‍රී නාමයෙන් මෙකියන විහාරයෙහි අපගේ විරුදු නාමයක් පවත්වන්ට වුවමැනවැයි ගෙණෙහි නායක තැනට ශ්‍රී රාජරත්න පිරිවන් තෙරන් අස්වා විහාරසන්තකයෙන් ඇත්තල අස්සල මුළුතැන්ගෙය උළුපැන් ගෙය ආදිවූ නොයෙක් බුරාවේ අයට හා දෙමළ සිංහල ආදීවූ නොයෙක් දෙනාට මිලයට සිටියෙන් හා අය ප්‍රවේණියට සිටියෙන් බිජුවට අමුණක වපට සතරතැලි ගන්නා ලාස්සෙන් වී දෙපෑලක් අය දෙනුවත් පොල්ගස් දසයකට

පණිවක් බැගින් පඩුරුදෙනුවන් නිදමකොට හිරසඳ පවත්නාතක් පවතිනා ලෙසට පිත්කම මුදුන්පත්කරවූ හෙයින් එනදවස පැමිණෙන රාජරාජමහාමාත්‍යාදීන් විසින් දියුණක්ව වර්ණනය කරවා පිහිටුවන ත්‍රිසාමයත් ජයවර්ධන කෝට්ටෙයෙහි මාලිගාවේ සිංහාසනයෙහි වැඩහිඳ මුදලිවරුන් මැදවැ වදාළ මෙමෙහෙවරින් මේ ශිලාලේඛනය සන්නස් තිරුවරනම් පෙරුමාළමහ.

රජමහා කැලණියට හිමි වත්තල මිල්ලගස්තොටයි, කුඩා මාබෝලයි, ගල් වලල්ලතොටයි, ගොන්ගිතොටයි, ගොඩරුබ ගල්පොත්තයි, උඳරාබොරුවැවලියද්ද ඇතුළුව ගොස් ගෝණසේනේ වැඹයි, රත්මුද්‍රඇලයි, කොස්සතොටුහලයි, වට ගලයි, ඇසලපැලුවයි, පසුරුතොට ඇතුලයි, දිවියාමුල්ලේ ඇතුලයි, කුරත් දෑලයි, ඉම්බවැඹයි, මිහගහයි—යනුයි.

**නවගුණමතුරු**—ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවා—යන නව බුඩගුණ දීපිත පාඨයයි.

## ස්වභාවොක්ත්‍යලංකාරයි.

60 දි න තෙ ක් පැතිර සිටි බුදුගුණ කියා හැ ම
සග මො ක් ලබනුවස් පියයුග ඔබා බි ම
සි ය ස ක් පුරා දුටුමෙන් තුටු වැ මුනිඳු ම
ව ඳු ල ක් තිලකයෙහි වැඩඋන් මහපිළි ම

60 හැම දිනතෙක්, සියලු ජගත්‍රයෙහි; පැතිර, ව්‍යාප්තව; සිටි, අවස්ථානය කළාවූ; බුදුගුණ, (ගාථාවිශෙෂයෙන් රචිතවූ) බුඩගුණයන්; කියා, කථනය කොට; සගමොක් ලබනුවස්, ස්වර්ග මොක්ෂ (සම්පත්ති ප්‍රතිලාභය) පිණිස; පියයුග, පාදද්වයුග්මය; බිම ඔබා, භූමියෙහි පිහිටුවා; මුනිඳුම, (ශ්‍රියමාණවූ) මුනීන්ද්‍රයන් වහන්සේ; සියසක්, ස්වකීය නෙත්‍රය; පුරා, (රූපවිලාසයෙන්) පරිපූර්ණ කොට; දුටු මෙන්, දර්ශනය කළාක් මෙන්; තුටු වැ, සන්තුෂ්ට වැ; ලක්තිලකයෙහි, ලංකාතිලක නම්වූ ප්‍රතිමාලයෙහි; වැඩඋන් මහපිළිම, (වජ්‍රාසනාරූඪ වැ) වැඩහුන් මහපිළිමවහන්සේ; වඳු, (මස්තකයෙන්) නමස්කාර කර.

'තෝ මහපිළිම වඳු' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වඳු යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, මහපිළිම යනු අනුක්ත කර්මයි, වැඩඋන් යනු කර්මවිශෙෂණයි, ලක්තිලකයෙහි යනු අනුක්තාධාරයි, තුටුවැ යනු සොප පද පූර්වක්‍රියායි, මෙන් යනු උත්ප්‍රෙක්ෂායෙහි අව්‍යයයි, දුටු යනු කර්තෘවිශෙෂණයි, මුනිඳුම යනු දුටු යන අර්ථක්‍රියාපදයහට අනුක්තකර්මයි, පුරා යනු පූර්වක්‍රියායි, සියසක් යනු එයම අනුක්ත කර්මයි, ඔබා යනු පූර්වක්‍රියායි, පියයුග යනු ඊට අනුක්තකර්මයි, බිම

යනු අනුක්තාධාරයි, ලබනුවස් යනු තාදර්ථ්‍යයෙහි චතුර්ථියි, සග මොක් යනු ලබනු යන ක්‍රියාපදයහට අනුක්තකර්මයි, කියා, යනු පූර්වක්‍රියායි, බුදුගුණ යනු ඊට කර්මයි, සිව් යනුද හැම යනුද කර්ම විශෙෂණයි, පැතිර යනු පූර්වක්‍රියායි, තොක් යනු අභිව්‍යාප්තයෙහි අව්‍යයයි, දිස යනු තොක් යොගයෙහි අවදිවිබති, නොහොත් දිසතොක් යනු අවදිවිබති.

**ස, වි**—බුදුන්ගේ ගුණ=බුදුගුණ, විබත්සමස්; සගද මොක්ද= සගමොක්, දුරුත්සමස්; පියන්ගේ යුග=පියයුග, විබත්සමස්; සියද එම සක්ද=සියසක්, වෙසෙසුන්සමස්; මුනිනට උතුම්=මුනිතුම්, හේ-මුනිතුම, විබත්සමස්; ලකට තිලකක් වැනිනුයි=ලක්තිලක, ලක්තිලකවිද එම ගේ විද=ලක්තිලකගේ, එහි-ලක්තිලකගෙහි, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; මහවිද එම පිළිමවිද=මහපිළිම, වෙසෙසුන්සමස්;

**ලක්තිලකගෙය**—එකල විහාරාභ්‍යන්තර සීමායෙහිම තිබුණු ගෙනම් ප්‍රතිමා ගෘහයයි:—

**වඳු**—'වන්‍ද' යන පාලිභාෂාමය ධාතුවෙන් සිත්නවූ 'වඳ වැඳිමෙහි' යන ධාතු හා උප්‍රත්‍යයව සිඹයි.

### සවභාවොක්ත්‍යලඞ්කාරයි.

61 පෙ ර ද ල  නිඳු දියකඳ රටබිම් ගල  න
සු ර කු ල  හිමි රකිනුව ලක මැවූ ස  න
ම න ක ල  ඒ සමුදුර පැහැයෙන් දිමු  න
ව ඳු ස ල  පිළිමහිමි සිරිසරණ සියප  න

61 පෙර, පූර්වකාලයෙහි හෙවත් කැලණිතිස් රජ සමයෙහි; දලනිඳු, ජලනිධිහුගේ; දියකඳ, ජලස්කන්ධය; රටබිම් ගලන, ජනපද භූමිප්‍රදෙශයන් නිමග්න කරනකල්හි; ලකසන, ලඞ්කා වාසි සත්වයන්; රකිනුව, රක්ෂාකරනු පිණිස; සුරකුලහිමි, ශක්‍ර දෙවේන්‍ද්‍රයා විසින්; මැවූ, නිර්මිතකළාවූ; මනකල, මනොඥවූ, ඒ සමුදුරපැහැයෙන්, ඒ සමුද්‍රයාගේ වර්ණයෙන්; දිමුන, දීප්තිමත්වූ; සලපිළිමහිමි, ශිලාප්‍රතිමාස්වාමින්ගේ; සිරිසරණ සියපත, ශ්‍රීපාද නමැති පද්මය; වඳු, නමස්කාර කර.

**'තෝ සිරිසරණසියපත වඳු'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වඳු**—යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **සිරිසරණසියපත** යනු අනුක්තකර්මයි, **සලපිළිමහිමි** යනු අනුක්ත සම්බන්ධයි, දිමුන යනුද මැවූ යනුද සම්බන්ධ විශෙෂණයි,

මනකල ඒ සමුදුර පැහැයෙන් යනු අනුක්තකරණයි, සුරකුලහිමි යනු මැවූ යන අභික්‍රියාවට අනුක්තකර්තෘයි, රකිණුව යනු නාදන්ත්‍යයෙහි චතුර්ථියි සත යනු රකිනුව යන අභික්‍රියාපදයහට අනුක්තකර්මයි, ලක යනු අනුක්තාධාරයි, ගලන යනු කාලාන්තයෙහි අසම්භාව්‍යක්‍රියායි, දලනිඳුදියකඳ යනු ඊට අනුක්තකර්තෘ හෙයින් අදර අරුතැ කම් විබති, රටබිම් සනු ඊට කර්මයි, පෙර යනු කාලාන්තයෙහි අව්‍යයයි;

ස, වි--දල මෙහි නිධාන වනු ලැබෙත්නුයි=දලනිඳු, දියගේ කඳ=දියකඳ, විබත්සමස්; රටෙහි බිම්=රටබිම්, විබත්සමස්; සුරන් ගේ කුල=සුරකුල, සුරකුලට හිමි=සුරකුලහිමි, විබත්සමස් ගැබි විබත්සමස්; මනට කල්=මනකල්, ඒද එම සමුදුරද=ඒ සමුදුර, ඒ සමුදුරගේ පැහැ=ඒ සමුදුරපැහැ, මනකල්වූ ඒ සමුදුරපැහැ=මන කල් ඒ සමුදුරපැහැ, එන්-මනකල් ඒ සමුදුර්පැහැයෙන්, විබත් සමස් වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්; සලින් කළ පිළිම=සලපිළිම, සලපිළිමද එම හිමිද=සලපිළිමහිමි, විබත් සමස් ගැබි වෙසෙසුන්සමස්; සිරින් යුතු සරණ=සිරිසරණ, පත් සියගණන් ඇතියේ යමක් හටද හෙතෙම=සියපත්, සිරිසරණම සියපත් සිරිසරණ සියපත්=එය-සිරිසරණ සියපත, විබත්සමස් අන්අරුත් සමස් ගැබි වෙසෙසුන්සමස්,

පෙරයි මෙහි දක්වා තිබෙන්නේ කැලණිතිස්ස රජතුමාගේ රාජ්‍යානුශාසන කාලයයි, ඒ කාලයෙහි මෙහි ප්‍රකාශිත සමුද්‍රොත්පතනය සිදුවිය. අපරාධ රහිත රහතන්වහන්සේ නමක් උණුතෙල් සැළක ලා මරවා මුහුදට දැමීම ඊට හේතුවිය. ඒ මෙසේ දතයුතුයි:—

කැලණිතිස්සරජුගේ මලණුවූ උත්තිය නම් කුමාරතෙමේ කැලණිවෙහෙර වැසි කැලණිතිස්සතෙරුන්වහන්සේ වෙතින් අක්ෂරාභ්‍යාසාදිය කොට නුවරජව වසනුයේ රාජමහෙසිකාව සමඟ හවහත් විස්වස් ඇත්තේ විය. මේ බව දත් රජතෙමේ ඔහු අල්වා දඬුගෙහි ලවයි ඇමතියන් යෙදවූ හෙයින් හෙතෙම පලා ගොස් පසල්දනව්වක * වසනුයේ දිනක් බිසොව සඳහන්කොට එක් ලදරු පුරුෂයෙකු කැඳවා ශ්‍රමණවෙස් ගන්වා බිසොවට දෙනසේ පතක් දී යැවීය. ඔහුද ගොස් කැලණිතිස්ස තෙරුන්වහන්සේ රජගෙට වඩනා දැක තෙමේද ඒ සමඟම රජගෙට වැදී, රජතෙම තෙර අතවැසි නමකැයිද තෙරුන්වහන්සේ රාජකුලූපග භික්ෂුවකැයිද සිතූහ. ඉක්බිති දෙදෙනා වහන්සේම රජගෙහිදී වළඳා වඩනාහු පසු ගමන්ගත් රජ හා රජ්ජේ මෙහෙසි දෙදෙනාගෙන් මෙහෙසියට පෙනෙනසේ ඒ සාරමහණතෙම පත බිම හෙළීය. රජතෙමේ පත හුණු හඬ අසා බලනුයේ පත දැක අකුරු බලා තෙරුන්වහන්සේගේ ලිපියකැයි සැකකොට ඒ දෙදෙනාම මරණසේ නියෝගකෙළේය. කුමාරතෙම තෙරුන්වහන්සේගෙන් ඉගෙනගත් නිසා අක්ෂරයන්ගේ සමානත්වය මෙහි සිතියයුතුයි, කැලණිතිස්ස මහ

* ඒ උඹුගම්පල බව සමහර පොතක තිබේ.

තෙරුන්වහන්සේ උණුතෙල් සැලක ලා මරවන්ට නියම්කළ හෙයින් රන්ව පෙණ දම දමා කකියමින් තිබූ තෙල් සැළට ලංකරහ සල්සිම විදර්ශනා වඩා රහත්ව එහි බැස ඉඳුනිලමිණි අතලෙක හුන් රාජහංස ලීලාවෙන් එහි වැඩහිඳ

ලද්ධිස්සරො ජයතු වාරණරාජගාමී
භොගින්ද භොග රුචිරා යත පීන බාහු
සාධූපචාර නිරතො ගුණසන්නිවාසො
ධම්මෙ ඨිතො විගතකොධමදවලෙපො.

යනාදී ගාථා කියයක් වදාරා නොනාවත්නා කර්මවිපාකයකැයි දැන තෙල්කටාරයෙහි වැඩහුන් සේක්ම පිරිනිවී සේක. මෙසේ තෙරුන්වහන්සේද පනගෙන ආ සොරම්හණද යන දෙදෙනා මරවා මුහුදට දැමූහ. එයින් කිපියාවූ දෙවතාවෝ මේ රජු සමග මොහුගේ රාජ්‍යයද නසම්හයි මුහුද දිය උතුරුවන්ට පටන්ගත්හ. ඒ ජලගැල්මෙන් කුඩා දිවයින් නවයක් හා තිස්පන්දස් පන්සිය හතරක් පටුන් ගම්ද වැව් අමුණු කෙත්වත් ආදී සියල්ලද මුහුද ගිලුණාහුය. මෙකියන ජලභයා හටගත් කල්හි සක්දෙව් රජතෙමේ ලඞ්කාරක්ෂණය පිණිස ශෛලමය ප්‍රතිමාවක් මැවූ බැව් මේ කවියෙන් ප්‍රකාශිතයි. ඒ නිර්මිත ප්‍රතිමාවහන්සේ මෙකල කැලණි විහාරාභ්‍යන්තරයෙහි වැඩසිටින එක සමාන සමාධි පිළිමදෙනමගෙන් එක් නමකැයි කියති.

## රූපක සංසෘෂ්ටවූ ස්වභාවොක්තියි.

62 ගි ලි ය නොදී සැටමහණන් බව මහ ණ
ම ලි ය දෙව්තෙරිඳු වැඩහිඳ දෙසූ බ ණ
දි ලි ය පස්මහල් පායෙහි මිණිකිර ණ
බැ ලි ය හැකි වි නම් දූක වැඳ යා කල ණ

62 සැටමහණන්, සැටක් පමණ ශ්‍රමණයන්වහන්සේ; බව මහණ, සංසාරමහාර්ණවයෙහි; ගිලිය නොදී, නිමග්නවන්ට නොහැර; මලියදෙව් තෙරිඳු, මලියදෙව ස්ථවිරයන්වහන්සේ විසින්; වැඩහිඳ, උපවේශනය කොට; බණදෙසූ, ඡජ්ජක සූත්‍රය දෙසනා කළාවූ; පස්මහල් පායෙහි, පචහුමක ප්‍රාසාදයෙහි; දිලිය, උජ්ජ්වලිතවූ; මිණිකිරණ, මාණික්‍යරශ්මීන්; බැලිය හැකිවි නම්, දක්‍ෂිතක්‍ෂම වී නම්; දූක, නිරීක්‍ෂණය කොට; වැඳ, නමස්කාර කොට; කලණ, කල්‍යාණය හෙවත් සුභදරාබගය; යා, යාත්‍රා කර.

'නෝ යා' යනු ක්‍රි: කා: ජ: ස:

උ, වි--යා යනු විදිකිරියයි, නෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, කලණ යනු සම්බොධනයි, දූක යනුද වැඳ යනුද පූර්ව ක්‍රියායි, නම් යනු අනියමාර්ථයෙහි අව්‍යයයි, හැකිවි යනු කර්තෘ විශෙෂණයි, බැලිය යනු අසම්භාව්‍ය ක්‍රියායි, මිණිකිරණ යනු බැලිය යන අසම්භාව්‍ය ක්‍රියාවට කර්මයි, දිලිය යනු ඊට විශෙෂණයි, පස්මහල්පායෙහි යනු අනුක්තාධාරයි, වැඩහිඳ යනු පූර්වපද

පූර්වක්‍රියායි, මලියදෙව්තෙරිඳු යනු දෙසූ යන අසමාපන ක්‍රියාවට කර්තෘයි, දෙසූ යනු ආධාර විශේෂණයි, බණ යනු දෙසූ යන අසමාපන ක්‍රියාවට අනුක්තකර්මයි, නොදී මනු පූර්වක්‍රියායි, ගිලිය යනු ඊම කර්මයි, බවමහණ යනු අනුක්තාධාරයි, සැටමමහණන් යනු ප්‍රත්‍යයාර්ථ ක්‍රියායෝගයෙහි සබඳ විබත්;

ස, වි—සැටක් වූවාහුද ඔහු මහණවූවාහුද=සැටමමහණ, ඔවුන්-සැටමමහණන්, වෙසෙසුන්සමස්; මහවිද එම අණවිද=මහණ, බවම මහණ=බවමමහණ, වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන් සමස්; තෙරනව ඉඳු=තෙරිඳු, විබත්සමස්; තොහොත් තෙරද හෙම ඉඳුද=තෙරිඳු, මලියදෙව්ද එම තෙරිඳුද=මලියදෙව්තෙරිඳු, වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන්සමස්; මගල් පසක් එක්කොට සලකනලද්දේ පස්මගල්, පස්මගලින් යුත් පා=පස්මගල් පා, එහි-පස්මගල් පායෙහි, වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන්සමස්; මිණින්ගේ කිරණ=මිණිකිරණ, විබත්සමස්;

මෙහිදී මලියදෙව මහරහතන් වහන්සේ ඡජක්කසූත්‍ර දේශනාව කළ අවස්ථාවෙහි භික්ෂූන් සැටනමක් අර්හත් මාර්ගඵලාවබෝධය කළ බැව් අන්‍ය කථායෙහි දක්වා තිබේ.

### ස්වභාවෝක්ත්‍යලඞ්කාරයි.

63 පෙර උවිඳ ගෙන ගිරිඳ සිඳු සල තා
නැගි පැහැද පෙණ සමුද සැපි නුමු තා
මෙන උළිඳ පැහැ විහිද නෙදිගුබි තා
සැදි වටද ගෙහි වඳු ද ගැබ දිමු තා

63 පෙර, පූර්වකාලයෙහි; උවිඳ, උපේන්ද්‍රයා; ගිරිඳ, මන්දර පර්වත රාජයා; ගෙන, ග්‍රහණය කොට; සිඳු, (ක්ෂීර) සාගරය; සලත, මථනයකරන්කල්හි; පැහැද, ප්‍රසන්න වැ; නැගි, උද්ගතවූ; පෙණ සමුද, ඵෙණ රාශියක්හුගේ; සැපි, සංස්ථානය; නුමුත, නොහැරියාවූ; උළිඳමෙන, චන්ද්‍රයා හා සමානවූ; පැහැ, ප්‍රභාව; නෙදිගුබිත, නොයෙක් දිශාභිත්තියෙහි; විහිද, විස්තීර්ණ කොට; සැදි, සැරහුණාවූ; වටදගෙහි, වෘත්තධාතුගෘහයෙහි; දිමුත, දීප්තිමත්වූ; දගැබ, ධාතුගර්භය; වඳු, නමස්කාර කර.

'තෝ දගැබ වඳු' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වඳු යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, දගැබ යනු අනුක්තකර්මයි, දිමුත යනුද සැදි යනුද සැපි නුමුත යනුද කර්මවිශේෂණයි, වටදගෙහි යනු අනුක්තාධාරයි,

විහිද යනු පූර්වක්‍රියායි, පැහැ යනු අනුක්තකර්මයි, මෙන යනු උපමායෙහි අව්‍යයයි, උළිඳ යනු මේන යන නිපාතයොගයෙහි කර්මවිබත්ති, කර්මයහටද උපමාන විශෙෂණයි, නෙදිගුබිත යනු අනුක්තාධාරයි, පෙණසමුද යනු අනුක්තසම්බන්ධයි, නැගී යනු සම්බන්ධවිශෙෂණයි, පැහැද යනු පූර්වක්‍රියායි, සලකා යනු කාලාර්ථයෙහි අසම්භාව්‍යක්‍රියායි, සිඳු යනු ඊට අනුක්තකර්මයි, උවිඳ යනු අසම්භාව්‍යක්‍රියාවට කර්තෘ හෙයින් අදර අරුතැ කම් විබති, ගෙන යනු පූර්වක්‍රියායි, ගිරිඳ යනු අනුක්තකර්මයි, පෙර යනු අතීතාර්ථයෙහි අව්‍යයයි,

**ස, වි**—ගිරිනට ඉඳු=ගිරිඳු, විබත්සමස්; පෙණහුගේ සමුද=පෙණසමුද, විබත්සමස්; සැටියෙන් නුමුත්=සැටිනුමුත්, එය-සැටිනුමුත, විබත්සමස්; උළුනට ඉඳු=උළිඳු, ඔහු-උළිඳ, විබත්සමස්; නොයෙක් දිගු=නෙදිගු, නෙදිගුද ඔහු බිත්ද=නෙදිගුබිත්, එහි-නෙදිගුබිත, වෙසෙසුන්සමස් ගැබි වෙසෙසුන්සමස්; දණන්ට=ගේ දගේ, වටද එම දගේද=වටදගේ, එහි-වටදගෙහි, විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්;

**පෙර උවිඳ ගෙනගිරිඳ සිඳු සලකා**—පූර්වකාලයෙහි දුර්වාසස් සෘෂිහුගේ සාපයෙන් සක්දෙව්හුගේ බලය හීනවිය. දෙවියන්ගේ බලය හීනවීමෙන් දෙව ශත්‍රුවූ අසුරයන්ගේ බලය වර්ධනයවිය. එකල දෙවියෝ එක්ව ලොකාරක්‍ෂකවූ විෂ්ණුහු කරා එළඹ තමන්ට උපකාර යාඥාකළාහුය, විෂ්ණුදෙවි තෙමේ දෙවියෙහි තොප අසුරයන් සමග සමාදනයට පැමිණ ක්‍ෂීරසාගරයෙහි නොයෙක් ඔසු බහා වාසුකිනාරජ මත්රැහැනක්කොට මන්දරපර්වතය මන්ථනයක් (දණ්ඩක්) කොට අලලව්. එසේවූ කල අමෘතයාගේ පහළවීම වන්නේය. ඒ අමෘත පානයෙන් තොපගේ වියසීය වැඩෙයි යනු කීය. මේ උපදෙස් පරිදි දෙවියෝ අසුරයන් හා එක්ව ක්‍ෂීරසාගරය අලළත්තාහු පූර්වොක්ත අමෘතයද වාරුණීදෙවඟනද පාරිජාත වෘක්‍ෂයද චන්ද්‍රයාද ශ්‍රී දෙවියද ධන්වන්තරී දිව්‍ය වෛද්‍යවරයාද එයින් උද්භූතවූ බැව් විෂ්ණු පුරාණයෙහි දක්වා තිබේ.

## උපමාලඞ්කාරයි.

64 දිගුනෙත් නිලුපුලෙව් රතදර පබළර ඟ
සිරිමත් සුපුන්සඳ වැනි වුවන මනර ඟ
පැහැපත් ලකළ රන්වන් විලසින් ලොව ග
වැද හොත් පිළිම්හිමි වඳු පාසැ පැළඳි ග

64 නිලුපුලෙව්, නිලොත්පලයම බඳුවූ; දිගුනෙත්, ආයත නෙත්‍ර ඇත්තාවූ; පබළරඟ, ප්‍රවාලාකාරවූ; රතදර, රත්නාභරයෙන් යුක්තවූ; සිරිමත්, ලක්‍ෂ්මීමත්වූ; සුපුන්සඳ වැනි, සම්පූර්ණ චන්ද්‍රයාට බඳුවූ; මනරඟ, මනොරඤ්ජනය කරන්නාවූ; වුවන, ශ්‍රීමුඛමණ්ඩලයක් ඇත්තාවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තියෙන්; ලකළ,

අලඞ්කෘතවූ; රන්වන් විලසින්, සුවර්ණවර්ණවූ (රූප) විලාසයෙන්; ලොව්ග, ලෝකෝත්තමවූ; පැළදිග පාසැ, පශ්චිම දිශාභාගයෙහි (පිහිටි) ප්‍රාසාදයෙහි; වැදහොත්, අයනප්‍රාප්තවූ; පිළිමහිමි, ප්‍රතිමා ස්වාමින්වහන්සේ; වඳු, නමස්කාර කර.

**'නෝ පිළිමහිමි වඳු'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—**වඳු** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **හොත්පිළිමහිමි** යනු අනුක්ත කර්මයි, **වැද** යනු පූර්ව ක්‍රියායි, **පාසැ** යනු අනුක්තාධාරයි, **පැළදිග** යනු ආධාර විශේෂණයි, **ලොව්ග** යනු කර්මවිශේෂණයි, **රන්වන් විලසින්** යනු අනුක්තකරණයි, **ලකළ** යනු කරණවිශේෂණයි, **පැහැපත්** යනු අනුක්තකරණයි, **වුවන** යනු කර්මවිශේෂණයි, **දිගු නෙත්** යනුද **රතදර** යනුද **වුවන** යන්නට විශේෂණයි, **වැනි** යනු උපමායෙහි අව්‍යයයි, **සිරිමත්සුපුන්සඳ** යනු උපමාවක්ත්‍ර විශේෂණයි, **එව්** යනු උපමායෙහි අව්‍යයයි, **නිලුපුල්** යනු දිගු නෙත් යන්නට උපමා විශේෂණයි, **පබලරඟ** යනු රතදර යන්නට විශේෂණයි,

**ස, වි**—දිගුද එම නෙත්ද=දිගුනෙත්, වෙසෙසුන්සමස්; නිල්ද එම උපුල්ද=නිලුපුල්, වෙසෙසුන්සමස්; රත්ද එම අදරද=රතදර, වෙසෙසුන්සමස්; පබළගේ රඟ යමෙක්හිද හෙතෙම=පබලරඟ, අන්අරුත්සමස්; ඉතා පුන්=සුපුන්, සුපුන්ද එම සඳද=සුපුන්සඳ, ප අෑ සමස් ගැබ් වෙසෙසුන්සමස්; මනට රඟ=මනරඟ, විබත් සමස්; පැහැයට පත්=පැහැපත්, විබත්සමස්; රනට බඳු වන් යමෙක්හිද හෙතෙම=රන්වන්, රන්වන්ද එම විලස්ද=රන්වන් විලස්, ඉන්-රන්වන්විලසින්, අන්අරුත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; ලොවට අග=ලොව්ග, විබත්සමස්; පිළිමවූයේද එම හිමි වූයේද=පිළිමහිම, හොත්ද හෙම පිළිමහිමි වූයේද=හොත් පිළිම හිමි, වෙසෙසුන්සමස්; පැළද ඔම දිග්ද=පැළදිග්, එහි-පැළදිග, වෙසෙසුන්සමස්;

## උපමාලඞ්කාරයි.

65 අ ඟ සින් අවුත් මිණිඅක්නයිඳු යැදුම ට
ර ඟ තන් මැදෙහි මුනි හිඳ මිණිපලඟ පි ට
ද ඟ මුත් දෙසු තැනැ කළ සැමරියන් කො ට
ම ඟ දගැප් හිමින් වඳු සොළොස තැන් සි ට

65 මිණිඅක්නයිඳු, මණිඅක්ඛික නම් නාගරාජයාගේ; යැදුමට, යාච්ඤාවට; මුනි, සර්වඥයන්වහන්සේ; අහසින් අවුත්, ආකාශයෙන් වැඩ; රඟතන් මැදෙහි, (පන්සියක්) ක්ෂීණාශ්‍රවයන් මධ්‍ය

යෙහි; මිණිපලඟපිට, රත්නමය පර්‍යඞ්කමස්තකයෙහි; හිඳ, උපවේශනප්‍රාප්තවූ; දහමුත් දෙසූතැන, ධර්මයන් දේශනා කළාවූ ස්ථානයෙහි; සැටරියන් කොට, ෂෂ්ටිහස්තප්‍රමාණ කොට; කළ, කරනලද්දාවූ; මහදගැප් හිමින්, මහාචෛත්‍යස්වාමින් වහන්සේ; සොළොසතැන් සිට, ෂොඩශස්ථානයෙක්හි සිට; වඳු, වන්දනාය කර.

**'තෝ මහදගැප් හිමින් වඳු'** ක්‍රි: කා: ප: ස:

**උ, වි** — වඳු යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **මහදගැප්හිමින්** යනු අනුක්ත කර්මයි, **කළ** යනු කර්මවිශේෂණයි, **සිට** යනු පූර්වක්‍රියායි, **සොළොසතැන්** යනු අනුක්තාධාරයි, **කොට** යනු පූර්වක්‍රියායි, **සැටරියන්** යනු අනුක්ත කර්මයි, **තැන** යනු අනුක්තාධාරයි, **දෙසූ** යනු ආධාරවිශේෂණයි, **දහමුත්** යනු දෙසූ යන අ[illegible]ක්‍රියාවට උක්ත කර්මයි, **මුනි** යනු ඊට අනුක්ත කර්තෘයි, **මිණිපලඟපිට** යනු අනුක්තාධාරයි, මැදෙහි යනු අනුක්තාධාරයි, **රහතන්** යනු අනුක්තසම්බන්ධයි, **සැදුමට** යනු පිණිස නිසිතැන සපදන් විබත්, **මිණිඅක්නයිඳු** යනු අනුක්තසම්බන්ධයි, **අවුත්** යනු පූර්වක්‍රියායි, **අහසින්** යනු අනුක්තකරණයි;

**ස, වි** — මිණට බඳු අක් යමක්හුගේද හෙතෙම=මිණිඅක්, නයිනට ඉඳු=නයිඳු, මිණිඅක්ද එම නයිඳුද=මිණිඅක් නයිඳු, අන් අරුත්සමස් විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; මිණියෙන් කළ පලඟ=මිණිපලඟ, මිණිපලඟගේ පිට=මිණිපලඟ පිට, එහි-මිණිපලඟපිට, විබත්සමස් ගැබ් විබත්සමස්; සැටරියන් පමණවූයේ යමක්හටද හෙතෙම=සැටරියන්, අන්අරුත් සමස්; මහවූයේද එම දගැබ් වූයේද=මහදගැබ්, මහදගැබ් වීද එම හිමිවීද=මහදගැබ් හිමි, ඔවුන්-මහදගැබ් හිමින්, වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන් සමස්; සොළොස වූවාහුද ඔහු තැන්වූවාහුද=සොළොසතැන්, වෙසෙසුන් සමස්;

මේ කවියෙන් දක්වා තිබෙන්නේ සර්වඥයන් වහන්සේ ලක්දිවට වැඩමවා වදාල තුන්වෙනි ගමනයි. සම්බෝධියෙන් නවවෙනි මාසයෙහි ලක්දිව් වැඩමවා යක්ෂමර්ධනය කර වදාළසේක. සම්බෝධියෙන් පස්වෙනි වර්ෂයෙහි චූලෝදර මහෝදර නාගරාජයන් දෙදෙනා සහපිරිවරින් සඞ්ග්‍රාමාභිමුඛවූ කල්හි නාගදීපයට වැඩවදාරා යුද්ධ සන්සිඳුවා වදාළසේක ඒ දෙවෙනි ගමන වූයේය. එහිදී මහෝදර නාරජුගේ මයිලණුවූ මණිඅක්ඛික නම් නාරජ

මහතී අනුකම්පා නො කතා නාථ තයා අයං
තවානාගමනෙ සබ්බෙ මයං භස්මී භවාමහෙ.

ඉත්‍යාදිය ප්‍රකාශකොට ඔහුගේ භවනයවූ කල්‍යාණි නාගභවනයට වැඩමවීමට ආරාධනා කෙළේය, ඔහුගේ ආරාධනාව ඉටුකරනු පිණිස සම්බෝධියෙන් අටවෙනි වර්ෂයෙහි පන්සියයක් භික්ෂූන් සමග අහසින් මිණිඅක් නාරජුගේ නිවෙසට

යව වැඩිසේක. නාරජතෙමේද අලඞ්කාර රත්න මණ්ඩපයක් සාද බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂුසංඝයා එහි වඩා හිඳුවා ප්‍රණීතාහාර පානාදියෙන් සන්තර්පණය කොළේය. සර්වඥයන්වහන්සේ වළඳා අනතුරෙහි එහි වැඩහිඳ ධර්මදේශනා කළසේක. ඒ ධර්මදේශනා කළ ස්ථානයෙහි කැලණි මහා චෛත්‍යය බැඳවා තිබෙන බැව් මෙයින් ප්‍රකාශිතයි.

සොළොස් ස්ථානයක සිට චෛත්‍ය වන්දනාව මෙහි නියමය වේ. සතර තැන අටතැන සොළොස්තැන දෙතිස්තැන සූසැටතැන වශයෙන් සිට ඒ ඒ චෛත්‍යයන්ගේ ප්‍රමාණ පරිදි වන්දනාකිරීම සාධුසම්මතය. එහෙයින් මේ චෛත්‍යයාගේ ප්‍රමාණයෙන් සොළොස් තැනෙකහි සිට වඳනා කිරීම නියම කර තිබේ.

## ස්වභාවොක්ත්‍යලංකාරයි.

66 ස ව න සතියැ වැසි වසි නා දස දි ගෙ හි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ ගෙ හි
ස ව න හිඳිනු දන නඳනා නෙතු යු ගෙ හි
ව ඳි න මැනවි පි ළි ම ය නා පිළිම ගෙ හි

66 දස දිගෙහි, දශදිශායෙහි; වැසිවසිනා, (සත්තාහවද්දලිකා වසයෙන්) වර්ෂණය කරන්නාවූ; සවන සතියැ, (බුදුවූ) සවන සප්තාහයෙහි; පෙණින, ඵණමණ්ඩලය කරණකොටගෙන; සෙවෙනි, ඡදනය ඇත්තාවූ; මුදලිඳුනා, මුචලින්දනම් නාගරාජයාගේ; දරණගෙහි, භෝගාවලිගෘහයෙහි; සවන, සර්වඥයන්වහන්සේගේ; හිඳිනු, වැඩහිඳිනා භාවය; දනන්, සත්වයන්ගේ; නෙතුයුගෙහි, නෙත්‍රයුග්මයෙහි; අඳනා, අඤ්ජනයකරන්නාවූ හෙවත් දක්වන්නාවූ; නාපිළිමගෙහි, නාගප්‍රතිමාලයෙහි; පිළිමය, ප්‍රතිමාව; වඳින මැනවි, නමස්කාර කරනු යහපති.

'වඳින මැනවි' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—මැනවි ක්‍රියායි, වඳින යනු කර්තෘයි, පිළිමය යනු වඳින අර්ථක්‍රියාපදයට අනුක්තකර්මයි, නාපිළිමගෙහි යනු අනුක්තාධාරයි, අඳනා යනු කර්මවිශේෂණයි, නෙතුයුගෙහි යනු අනුක්තාධාරයි, දනන් යනු අනුක්තසම්බන්ධයි, හිඳිනු යනු අඳනා යන අර්ථක්‍රියාපදයහට අනුක්තකර්මයි, සවන යනු අනුක්ත සම්බන්ධයි, මුදලිඳුනාදරණගෙහි යනු හිඳිනු යන අර්ථක්‍රියා පදයහට අනුක්තාධාරයි, සෙවෙනි යනු ආධාරවිශේෂණයි, පෙණින යනු අනුක්තකරණයි, සවනසතියැ යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, වැසි වසිනා යනු ආධාරවිශේෂණයි, දසදිගෙහි යනු අනුක්තාධාරයි;

**ස, වි**—දික්දසයක් එක්කොට සලකන ලද්දේ=දසදිග්, එහි-දසදිගෙහි, වෙසෙසුන්සමස්; සවනද එම සතිද=සවනසති, එහි සවනසතියෑ, වෙසෙසුන්සමස්; මුදලිඳුද එම නාද=මුදිලිඳුනා, මුදලිඳුනාහුගේ දරණ=මුදලිඳුනාදරණ, මුදලිඳුනාදරණින් සැදි ගේ=මුදලිඳුනාදරණගේ, එහි-මුදලිඳුනාදරණගෙහි, වෙසෙසුන් සමස් විබත්සමස් නැබි වෙසෙසුන්සමස්; නෙතුන්ගේ යුග=නෙතුයුග, එහි-නෙතුයුගෙහි, විබත්සමස්; නාදරණින් වටකළ පිළිම=නාපිළිම, නාපිළිමෙන් යුත් ගේ=නාපිළිමගේ, එහි-නාපිළිමගෙහි, (මධ්‍යපදලොපි) විබත්සමස් ගැබි විබත්සමස්;

අප තථාගතයන්වහන්සේ සම්‍යක්සම්බොධියට පැමිණී පළමුවෙනි සතිය බොධිමූලයෙහි විඳුරසුන්හිද දෙවෙනි සතිය අනිමිෂලොචන පූජාවෙන්ද තුන්වන සතිය රත්නචඞ්ක්‍රමණයෙන්ද සතරවන සතිය රත්නාගෘහයෙහිද පස්වන සතිය අජපාලරුක්මුලද ගතකර වදාළසේක.

මෙයින් ඉක්බිති සර්‍වඥප්‍රාදුර්භාවයට සතුටෙන් මෙන් සතියක් මුළුල්ලෙහි ධාරානිපාත මහාවර්‍ෂාවක් ආරම්භවිය. එකල මුචලින්දනාරජතෙමේ සර්‍වඥයන් වහන්සේට වර්‍ෂාවෙන් සවල්පමාත්‍ර පිඩාවකුදු නොවේවයි සිතා තම දෙහය දරණලා දරණ ගර්භයෙහි වැඩහුන් සර්‍වඥයන් වහන්සේ මතුයෙහි පෙණ මඩුල්ල සෙෘවතියක්මෙන් ඡාදනයකොට සිටියේය. සර්‍වඥයන්වහන්සේ පීඩා රහිතව එහි සවනසතිය ගතකර වදාළසේක. එයින් කීහ:—

තතෝ සත්තාහ වද්දලිකාය උප්පන්නාය සීතාදිපටිබාහනත්ථං මුචලින්දෙන නාගරාජේන සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිත්තො අසම්බාධගන්ධකුටියං විහරන්තොවිය විමුත්තිසුඛ පටිසංවෙදී නිසිදී'ති.

### සවභාවොක්ත්‍යලඞ්කාරයි.

67 ස ස රි න් මුද ලෙව් සදහම් අ මා දී
එ ක ගි න් මුනිඳු උන්වැනි නිපර මා දී
ලකු ණෙ න් සපිරි පිළිමය දුක ස මා දී
වැ ද ග න් මිතුර තුන්සිත කැරැ ස මා දී

67 සදහම් අමාදී, සඞර්‍ම නමැති අමෘතය (විභාග කොට) දී; ලෙව්, සත්‍වලොකයා; සසරින් මුද, සංසාර (බන්ධන) යෙන් මොව නය කොට; නිපරමාදී, සමෘතිවිප්‍රවාසයක් නැත්තාවූ; මුනිඳු, මුනීන්ද්‍රයාණන්වහන්සේ; එකගින්, චිත්තෛකාග්‍රතායෙන් යෙදී; උන්වැනි, වැඩ උන්නාක් වැනිවූ; ලකුණෙන්, (උත්තම දර්‍ශනීය) ලක්‍ෂණයෙන්; සපිරි, සම්පූර්‍ණවූ; සමාදි පිළිමය දුක, සමාධි නම්වූ ප්‍රතිමාව දර්‍ශනය කොට; මිතුර, යහළුව; තුන්සිත, ත්‍රිවිධ චිත්තය; සමාදී කැරැ, එකඟ කොට නොහොත් ප්‍රසන්න කොට; වැඳගන්, නමස්කාර කොට (කුශල) ග්‍රහණය කර.

'(නෝ) වැඳ (කුසල්) ගන්' යනු ක්‍රි: කා: පා: සා:

උ, වි—ගන් යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **කුසල්** යනු අධ්‍යාහෘත අනුක්තකර්මයි, **වැද** යනු පූර්ව ක්‍රියායි, **කැරැ** යනු පූර්වක්‍රියායි, **තුන්සිත** යනු ඊට අනුක්තකර්මයි, **සමාදි** යනු කර්මවිශෙෂණයි, **මිතුර** යනු සම්බොධනයි, **දැක** යනු පූර්වක්‍රියායි, **සමාදි පිළිමය** යනු ඊට අනුක්තකර්මයි, **සපිරි** යනු කර්මවිශෙෂණයි, **ලකුණෙන්** යනු සපිරි යන්නට අනුක්තකරණයි, **වැනි** යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, **උන්** යනු උපමාකර්ම විශෙෂණයි, **මුනිඳු** යනු උන් යන ක්‍රියාවට අනුක්තකර්තෘයි, **නිපරමාදී** යනු මුනිඳු යන්නට විශෙෂණයි, **එකඟින්** යනු උපලක්‍ෂණ හෝ ක්‍රියාවිශෙෂණයි, **මුදු** යනු පූර්වක්‍රියායි, **සසරින්** යනු ඊට අනුක්තාපාදානයි, **ලෙව්** යනු අනුක්තකර්මයි, **දී** යනු පූර්වක්‍රියායි, **සදහම්අමා** යනු ඊට අනුක්තකර්මයි,

**ස, වි**—සතන්ගේ දහම්=සදහම්, සදහම් ම අමා=සදහම්අමා, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; එක්අරමුණක් අගවූයේ යමක් හටද එය=එකඟ, (විඥතයයි) ඉන් එකඟින්, අන්අරුත්සමස්; මුනිනට ඉඳු=මුනිඳු, විබත්සමස්; පරමාදීනුවූයේ=නිපරමාදී, අන්අරුත් සමස්; සිත්තුනක් එක්කොට සලකනලද්දේ=තුන්සිත්, එය තුන්සිත, වෙසෙසුන්සමස්;

**සසරින්**--සංසාරයෙන් යනාර්ථයි. සංසාරය නම්:—

ඛන්ධානං පටිපාටි ධාතු ආයතනානිච
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති.

නොසිඳී පවත්නා ස්කන්ධ පටිපාටියද, ධාතුපටිපාටියද, ආයතන පටිපාටියද සංසාරයයි කියනු ලැබේ-යනු භාවයි.

**තුන්සිත**--කාමයාගේ ආදි මධ්‍ය පර්යවසානය යන ත්‍රිවිධ ස්ථානයෙහි ඇතිවන්නාවූ චිත්තය තුන්සිත නම්.

යටාලතිස්ස රජතුමා විසින් කරවනලද සමාධිපිළිමගෙහි වැඩසිටි ප්‍රතිම, වහන්සේ මෙයින් නිර්දිෂ්ටයි. 59 වෙනි කවිය බලනු.

### රූපක උපමාවෙන් සංසෘෂ්ටවූ සමාසොක්තියි.

68 අප මුනිඳු බුදුවන දින මූරුන් පි ඳු
පැහැවි හිඳු දිලි කලඳේ යටින් යෙ දු
සැදි සිනිදු ඉඳුනිල්මිණිසතොක බ ඳු
වැද දුම්ඳු වන පින්පල නඅත් බ ඳු

68 **අප මුනිඳු,** අපගේ (ගෞතම) සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ; බුදුවන දින, සර්වඥපදප්‍රාප්ත වන දිනයෙහි; මුරුත් පිදු, දෙවතාවන් විසින් පූජාකරනලද්දාවූ; පැහැවිහිදු, ආලෝක පතුරුවනලද; දිලි, දීප්තිමත්වූ; කලදෝ යටින්, කලධෞත යෂ්ටියෙන් හෙවත් රිදීමිටකින්; යෙදු, යොජිතවූ; සැදි, අලඞ්කෘතවූ; සිනිඳු, ස්නිග්ධවූ; ඉඳුනිල්මිණිසතෙක බඳු, ඉන්ද්‍රනීලමාණික්‍යච්ඡත්‍රයක් හා සමානවූ; දුම්ඳු, බොධිද්‍රැමරාජයන්වහන්සේ; වැඳ, නමස්කාර කොට; වන, සම්භව වන්නාවූ; පින්පල, පුණ්‍යඵලය; තා අත් බඳු, තාගේ හස්තප්‍රාප්ත කර නොහොත් තාගේ චිත්තයෙහි බන්ධනය කර.

**'(නෝ) පින්පල (තඅත්) බඳු'** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—බඳු යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **පින්පල** යනු අක්ත කර්මයි, **තඅත්** යනු අනුක්තාධාරයි, **වන** යනු කර්මවිශෙෂණයි, **වැඳ** යනු පූර්වක්‍රියායි, **දුම්ඳු** යනු ඊට අනුක්ත කර්මයි, **පිදු** යනුද **සෙදු** යනුද **සැදි සිනිඳු ඉඳු නිල්මිණි සතෙකබඳු** යනුද කර්මවිශෙෂණයි, **කලදෝයටින්** යනු අනුක්ත කරණයි, **පැහැවිහිදු** යනුද **දිලි** යනුද කරණවිශෙෂණයි, **මුරුත්** යනු පිදු යන අපූර්වක්‍රියාවට අනුක්තකර්තෘයි, **බුදුවනදින** යනු කාලාධාරයෙහි අනුක්තාධාරයි, **අපමුනිඳු** යනු බුදුවන යන අපූර්වක්‍රියාපදයහට අනුක්ත කර්තෘයි,

**ස, වි**—මුනිනට ඉඳු=මුනිඳු, අපගේ මුනිඳු=අපමුනිඳු, විබත් සමස්; ගැබ් විබත්සමස්; බුදුවීමේ දින=බුදුවනදින, විබත්සමස්; විහිදු පැහැ යමක්හුගේද හෙතෙම=පැහැවිහිදු, අන්අරුත්සමස්; කලදෝයෙන් කළ යට=කලදෝයට, ඉන්-කලදෝයටින්, විබත්සමස්; ඉඳුමෙන් නිල යමක්හුගේද හේ=ඉඳුනිල, ඉඳුනිලද එම මිණිද=ඉඳුනිල්මිණි, ඉඳුනිල් මිණියෙන් කළ සත්=ඉඳුනිල්මිණිසත්, ඉඳුනිල්මිණිසතක් හා එකබඳුවූයේ=ඉඳුනිල්මිණිසතෙකබඳු, සිනිඳු වීත් එම ඉඳුනිල්මිණි සතෙකබඳු වීත් එමනුයි=සිනිඳු ඉඳුනිල්මිණි සතෙකබඳු, සැදියේත් එම සිනිඳු ඉඳුනිල්මිණිසතෙක බඳුවූයේත් එමනුයි=සැදි සිනිඳු ඉඳුනිල්මිණිසතෙකබඳු, අන් අරුත් සමස් වෙසෙසුන්සමස් විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; පිනගේ පල=පින්පල, විබත්සමස්; තාගේ අත්=තඅත්, විබත්සමස්;

**කලදෝ**— කලධෞත ශබ්දයෙන් තද්භව කලදෝ ශබ්දයෙන් රජතයද සුවර්ණයද කියනු ලැබේ. මෙහි බොධිද්‍රැම ස්කන්ධයට උපමා ප්‍රස්තාව හෙයින් රජතය අභිමතයි.

**ඉඳුනිල්**—ඉන්ද්‍රනීල ශබ්දයෙන් තද්භව ඉඳුනිල් ශබ්දය "ක්ෂීරමධ්‍යෙ ක්ෂිපෙත්නීලං, ක්ෂීරංචෙත්නීලතාංනයෙත්, ඉන්ද්‍රනීලමිතිඛ්‍යාතම්," යන ලක්ෂණ ඇති මරකත මාණික්‍යයෙකි වැටේ.

## අද්භූතොපමා (නොහොත්) අභූතොපමා නම්.

69 විටංක පැකිලිඳු දකුණස දෙරටුයෙ න
නිසංක යෙන් පුදනන් තුරුගොසසමී න
කලංක නොවැ කළ සුබලකුණු බබළ න
තිවංක නම් දෙපිළිම නැමද බැසග න

69 විටංක, කොබෝගෙඩි වළල්ලෙහි; පැකිලි, ප්‍රස්ඛලිතවූ; ඉඳු, චන්ද්‍රයා ඇත්තාවූ; දකුණසදෙරටුයෙන, දක්ෂිණදිශාභාගයෙහි ගොපුරවාරයෙන් (නික්ම); නිසංකයෙන්, නිශ්ශඞ්කායෙන් හෙවත් සැක නැතිව; පුදනන්තුරුගොසසමින, පූජාපිවූ නොයෙක් තූර්‍ය්‍ය ඝොෂයන් ශ්‍රවණය කෙරෙමින්; කලංක නොවැ, දෙෂයක් නැතිව; කළ, කරනලද්දවූ; සුබලකුණු බබළන, ශුභලක්ෂණයෙන් භ්‍රාජිත වන්නාවූ; තිවංක නම්, ත්‍රිවඞ්ක යන නමින් ප්‍රසිඬවූ; දෙපිළිම, ප්‍රතිමාවයට; නැමද, නමස්කාර කොට; බැසගන, (මාර්ගයට) අවතීර්ණව-

**උ, වි**—බැසගන යනු පූර්වක්‍රියායි, විටංකපැකිලඳු දකුණස දෙරටුයෙන යනු ඊට අනුක්තාපාදනයි, නැමද යනු පූර්වක්‍රියායි, දෙපිළිම යනු ඊට අනුක්තකර්මයි, තිවංකනම් යනුද කළසුබලකුණුබබළන යනුද කර්මවිශෙෂණයි, නොවැ යනු සොපපද පූර්වක්‍රියායි, කලංක යනු ඊට අනුක්තකරණයි, නොහොත් කලංකනොවැ යනු ක්‍රියාවිශෙෂණයි, අසමින යනු මිශ්‍රක්‍රියායි, පුදනන්තුරුගොස් යනු ඊට අනුක්තකර්මයි, නිසංකයෙන් යනු ක්‍රියාවිශෙෂණයි,

**ස, වි**—විටංකයෙහි පැකිලි=විටංකපැකිලි, විටංකපැකිලි ඉඳු යමක්හිද ඒ විටංකපැකිලිඳු, විබත්සමස් ගැබි අන්අරුත්සමස්; දකුණද එම අසද=දකුණස, දකුණසෙහි දෙරටු=දකුණසදෙරටු, විටංකපැකිලිඳුත් එමය දකුණසදෙරටුත් එමනුයි=විටංකපැකිලිඳු දකුණසදෙරටු, ඉන්-විටංක පැකිලිඳු දකුණස දෙරටුයෙන්, වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි වෙසෙසුන්සමස්; නිකුත් සංක යමක්හුගේද හෙතෙම=නිසංක, ඉන් නිසංකයෙන්, අන්අරුත් සමස්; නන්ද එම තුරුද=නන්තුරු, නන්තුරුන්ගේ ගොස්= නන්තුරුගොස්, පුදපිණිස නන්තුරුගොස්=පුදනන් තුරුගොස්, වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි විබත්සමස්; සුබද එම ලකු

ණුද=පුබලකුණු, කළාවූ පුබලකුණු=කළපුබලකුණු, කළපුබලකුණෙන් බබළනුයේ=කළපුබලකුණුබබළන, වෙසෙසුන්සමස් වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; වංකතුනක් ඇතියේ යමෙක් හටද හෙතෙම=තිවංක, තිවංක යි නම් යමක්හටද හෙතෙම=තිවංකනම්, අන්අරුත්සමස් ගැබ් අන්අරුත්සමස්; පිළිම දෙකක් එක්කොට සලකනලද්දේ=දෙපිළිම; වෙසෙසුන් සමස්;

•දෙම විහාරයද සවාලතිස්ස රජතුමා විසින් කරවන ලද්දේය.

අතිශයොභනි සභාවොභනි සංසාජ්ජිසි.

70 ස ම නො ළ ගිරිගිජිඳු දිගුකළ සොඬක සැ පි
සි හි ල ළ ගඟැ සිලිල් සනහා මුනි නොගැ පි
පැ හැ දු ළු තුන්සිවුරු ඇඳ පෙරවැ වැඩසි පි
තැ නැ ක ළු සිවුරු දෘගැබ වඳු නොපෑ පි

70 සමනොළගිරි, සමනතකූට පර්වත නමැති; ගිජිඳු, ගජේන්ද්‍රයා විසින්; දිගුකළ, ප්‍රසාරිතවූ; සොඬකසැපි, ශුණ්ඩාදණ්ඩකට බඳුවූ සටහන් ඇති; සිහිලල ගඟැ, ශීතලසපර්ශවූ ගඞ්ගායෙහි; නොගැපි, වීතරාගවූ; මුනි, සර්වඥයන්වහන්සේ; සිලිල් සනහා, ජලස්නානය කොට; පැහැදුළු, (සන්ධ්‍යාවලාහක) ප්‍රභායෙන් දිලිහෙන්නාවූ; තුන්සිවුරු, ත්‍රිචීවරය; ඇඳ පෙරෙවැ, නිවාසනප්‍රාවරණය කොට; වැඩසිටි, සම්ප්‍රාප්තවූ; තැනැ, ස්ථානයෙහි; කළ, විරචිතවූ; සිවුරුදෘගැබ, චීවරධාතුගර්භයට; පිටිනොපෑ, පරාඞ්මුඛ නොවී, වඳු, නමස්කාර කර.

'(තෝ) සිවුරුදෘගැබ වඳු' යනු ක්‍රි: කා: ප: ස:

ප, වි—වඳු යනු විදික්‍රියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, සිවුරුදෘගැබ යනු අනුක්ත කර්මයි, කළ යනු කර්මවිශේෂණයි, වැඩසිටිතැනැ යනු අනුක්තාධාරයි, ඇඳ යනුද පෙරෙවැ යනුද පූර්වක්‍රියායි, තුන්සිවුරු යනු ඊට අනුක්තකර්මයි, පැහැදුළු යනු කර්මවිශේෂණයි, සනහා යනු පූර්වක්‍රියායි, සිලිල් යනු ඊට අනුක්තකර්මයි, ගඟැ යනු අනුක්තාධාරයි, සිහිලල යනුද සමනොළ ගිරිගිජිඳු දිගුකළ සොඬක සැපි යනුද ආධාරවිශේෂණයි, මුනි යනු වැඩසිටි යන අතීත ක්‍රියා පදයට අනුක්ත කර්තෘයි, නොගැපි යනුද නොපෑපිටි යනුද කර්තෘවිශේෂණයි,

ස, වි—සමන්හුගේ කුළ=සමනොළ, සමනොළද එම ගිරිද=සමනොළගිරි, ගජනට ඉඳු=ගිජිඳු, සමනොළගිරිම ගිජිඳු=සමනොළගිරිගිජිඳු, සමනොළගිරි ගිජිඳු විසින් දිගුකරනලද්දේ=

සමනොළගිරිගිජිඳු දිගුකල, සමනොළ ගිරිගිජිඳු දිගුකලෙත් එමන සොඬ වීත් එමනුයි=සමනොළ ගිරිගිජිඳු දිගුකල සොඬ, සමනොළ ගිරිගිජිඳු දිගුකළ සොඬ හා එක සැටිවූයේ=සමනොළ ගිරිගිජිඳු දිගුකළ සොඬෙකසැටි, විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; සිහිල් අලේ=සිහිලළ, ගැටි නොවූයේ=නොගැටි, අන්අරුත්සමස්; පැහැයෙන් උදුළ=පැහැදුල, විබත් සමස්; සිවුරු තුනක් එක් කොට සලකනලද්දේ=තුන්සිවුරු, වෙසෙසුන්සමස්; සිවුරුද එම දද=සිවුරුද, සිවුරුද ගැබෙහි වූයේ යමකගේද එය=සිවුරු දගැබ්, වෙසෙසුන්සමස් ගැබ් අන්අරුත්සමස්;

**තුන්සිවුරු**--තනිපටසිවුර, දෙපටසිවුර, අඳනය යන මොහු තුන්සිවුරු නම් වෙත්.

**සිවුරුදගැබ**--සර්වඥයන්වහන්සේ ශ්‍රී කල්‍යාණීපුරයට වැඩම්වාවදාළ දිනයෙහි කැලණි ගඟෙන් ජලස්නානය කර වදුරා ගොඩනැගී තිවිවර නිවාසන ප්‍රාවෘතවැ සිටි ස්ථානයෙහි කරවනලද සිවුරු දගැබ මඳු යනු මේහි අභිප්‍රෙතාර්ථයැ, මෙම දගැබ පිහිටි ස්ථානය කැලණිගඟ අසබඩ කැලණි විහාරාසන්නව පිහිටා තිබූ බැව්ද ඒ ස්ථානය පසු කාලයෙහි ශිවකෝවිලක්ව තිබී නටබුන්වී ගිය බැව්ද මුඛපරම්පරා කථායි. කැලණිවිහාරය ඉදිරියෙහි තිබෙන තොටුපලේ සිට ඉතා සවල්පයක් බටහිරදිශාවෙහි මෙය පිහිටා තිබේ, එය පිහිටා තිබූ ස්ථානයෙහි සවල්ප වශයෙන් නෂ්ටාවශෙෂයෝද දක්නට ලැබෙත්.

### රූපකොපමා සංසෘෂ්ට ස්වභාවොක්තියි.

71 නි රි ඳු න් කැලණිතිස් නිවැරදි රහත් තැ න
සැ ක යෙ න් ලැවූ හුණුතෙල් සැළ තුබූ තැ න
බැ ති යෙ න් පිනැතියන් කළ විසිතුරු විම න
වැ ඩ උ න් පිළිමහිමි නමදින් යහදස න

71 කැලණිතිස් නිරිඳුන්, කල්‍යාණිතිස්ස රජහුවිසින්; නිවැරදි රහත්තැන, නිරාපරාධ රහත්කෙනකුන්වහන්සේ; සැකයෙන්, (අග්‍රමහිෂින් කෙරෙහි සම්බන්ධ) ශඞ්කායෙන්; ලැවූ, ප්‍රක්ෂෙප කරවූ; හුණුතෙල් සැළ, තප්තතෛලස්ථාලිය; තුබූ තැන, ස්ථාපිත ස්ථානයෙහි; පිනැතියන්, පුණ්‍යාර්ථීන් විසින්; බැතියෙන්, භක්තියෙන්; කළ, කරනලද්දාවූ; විසිතුරු විමන, විචිත්‍ර (කර්මාන්තයෙන් යුක්තවූ) විමානයෙහි; වැඩඋන්, උපවෙශනප්‍රාප්තවූ; පිළිමහිමි, බුඩප්‍රතිමාස්වාමින්; යහදසන, ප්‍රියදර්ශිනය; නමදින්, නමස්කාර කරන්.

'(නෝ) පිළිමහිමි නමදින්' යනු ශ්‍රී: කා: පා: සං:

**උ, වි**—නමදින් යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි, **පිළිමගිම්** යනු අනුක්තකර්මයි, **සහදසන** යනු සම්බොධනයි, **වැඩලන්** යනු කර්මවිශෙෂණයි, **විසිතුරුවිමන** යනු අනුක්තාධාරයි, **සාල** යනු ආධාරවිශෙෂණයි, **පිනැතිසන්** යනු කළ යන ක්‍රියාවට අනුක්තකර්තෘයි, **බැතිසෙන්** යනු අනුක්ත කරණයි, **තුබූනැන** යනු අනුක්තාධාරයි, **හුණුතෙල්සැල** යනු තුබූ යන ක්‍රියාවට කර්මයි, **ලැවූ** යනු කර්මවිශෙෂණයි, **නිවැරදි රහන්නැන** යනු ලැවූ යන අපි ක්‍රියාවට උක්තකර්මයි, **නිරිඳුන්** යනු ඊට අනුක්තකර්තෘයි, **සැලණිතිස්** යනු කර්තෘවිශෙෂණයි, **සැසසෙන්** යනු අනුක්තකරණයි,

**ස, වි**—නරනට ඉඳු=නිරිඳු, ඔහු-නිරිඳුන්, විබත්සමස්; වැරදි නොවූයේ=නිවැරැදි, රහත්වූයේද එම තැනවූයේද=රහත්තැන, නිවැරැදිවූයේත් හෙමය රහත්තැනවූයේත් හෙමනුයි=නිවැරදි රහත්තැන, අවියසමස් වෙසෙසුන්සමස් ගැබි වෙසෙසුන්සමස්; හුණුවූ තෙල්=හුණුතෙල්, හුණුතෙලින් යුතු සැළ=හුණුතෙල් සැළ, විබත්සමස් ගැබි විබත්සමස්; පින් ඇත්තේ යමකුහටද හෙතෙම=පිනැති, ඔවුන්-පිනැතියන්, අන්අරුත්සමස්; විසිතුරු වූයේද එම විමනවූයේද=විසිතුරුවිමන්, එහි-විසිතුරු විමන, වෙසෙසුන්සමස්; පිළිමවූයේද එම හිමිවූයේද=පිළිමහිමි, වෙසෙසුන් සමස්;

61 වෙනි කවිය බලනු.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

72 පි රි සි ද නොහැකි මෙවැඳුම් පුදපින්පඬු රු
මෙන බැ ඳ රැගෙන දෙනලෙස දූක එසුරවි රු
සු ර ර ද පායවන් විජයොත් නම් මහ රු
එ ම ස ඳ වඩන රජගෙට මිතුර වැඩක රු

72 පිරිසිඳ නොහැකි, පරිච්ඡෙදයක් කොට ගත නොහැක් කාවූ;මෙ වැඳුම්පුද, මේ නමස්කාර පූජායෙන් (ජනිතවූ); පින්, පුණ්‍ය චෙතනා නමැති; පඬුරු, ප්‍රාභෘතය; එසුරවිරු, ඒ විභීෂණ නම් සුරවිරයා; දූක, දර්ශනය කොට; දෙනලෙස, දානයකරන පරිද්දෙන්; මෙන, චිත්තයෙහි; බැඳ, බන්ධනය කොට; ඇරැගෙන, ආභරණග්‍රහණය කොට; සුරරද, ශක්‍රදෙවරාජයාගේ; මහරු, මහාහීවූ; විජයොත්නම්, වෛජයන්තනම්වූ; පායවන්, ප්‍රාසාදය හා සමානවූ; රජගෙට, (දෙව) රාජභවනයට; වැඩකරු, අභිවෘද්ධි කරවූ; මිතුර, මිත්‍රය; එම සඳ, ඒ ක්ෂණයෙහිම; වඩන, ගමන ප්‍රාප්ත වන්නෙහි.

**'(තෝ) රජගෙට වඩන' යනු ක්‍රි: කා: ප: ස:**

**උ, වි**—වඩන යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, රජගෙට යනු අනුක්ත කර්මයි, මිතුර යනු සම්බෝධනයි, වැඩකරු යනු සම්බෝධන විශේෂණයි, එමසඳ යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, වන් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, පාය යනු උපමාකර්ම විශේෂණයි, විජයොත්නම් යනු පාය යන්නට විශේෂණයි, මහරු යනු උපමාහට විශේෂණයි, සුරරද යනු අනුක්ත සම්බන්ධයි, දැක යනු පූර්වක්‍රියායි, එසුරවිරු යනු ඊට කර්මයි, ඉදනලෙස යනු ක්‍රියාවිශේෂණයි, රැගෙන යනුද බැඳ යනුද පූර්වක්‍රියායි, මෙවැඳුම් පුදපින්පඩුරු යනු ඊට අනුක්තකර්මයි, නොහැකි යනු ඊට විශේෂණයි, මන යනු අනුක්තාධාරයි, පිරිසිඳ යනු සොපපද පූර්වක්‍රියායි,

**ස, වි**—වැඳුම්ද පුදද=වැඳුම්පුද, මෙද එම වැඳුම්පුදද=මෙවැඳුම්පුද, පින්ම පඩුරු=පින්පඩුරු, මෙවැඳුම් පුදයෙන් (ජනිත) පින්පඩුරු=මෙවැඳුම් පුදපින්පඩුරු, දරුත්සමස් වෙසෙසුන් සමස් ගැබි මධ්‍යපදලෝපි විබත්සමස්; එද එම සුරවිරුද=එසුර විරු, වෙසෙසුන්සමස්; සුරනට රද=සුරරද, සුරරදහුගේපාය=සුර රදපාය, විබත්සමස් ගැබි විබත්සමස්; රජහුගේ ගෙ=රජගෙ, ඊට රජගෙට, විබත්සමස්;

විජයොත්පාය—සුරරද යන්නෙන් දක්වා තිබෙන සක්දෙව්රජහුගේ පාය මෙහි දක්වා තිබෙන විජයොත් නම් ප්‍රාසාදයයි. මේ වනාහි සක්දෙව් රජ විසින් පෙර අත්බැවෙහි (මඝමාණවකව උපන් සමයෙහි) කරනලද ආගන්තුග සාලාවෙහි පිහිත් උපන්නේය. දිව්‍යාසුර සඞ්ග්‍රාමයෙහි අසුරයන් පරාජිතවූව්ව තිපත් බැවින් වෛජයන්ත හෙවත් විජයොත්පායයයි කියත්. සත්සියයක් යොදුන් උසැත්තේය. තුන්සියයක් යොදුන් උසැති සප්තරත්න ධ්වජයන්ගෙන් හෙබියේය.

**වඩන**—වඩ-වැඩිමෙහි යන ධාතුයි, වඩධාතුවෙන් පරව න ප්‍රත්‍යයව වඩන යනු සිඬේවි.

**උපමාවෙන් සංසෘෂ්ටවූ සමාසොක්තියි.**

73 පු ලා සුවඳමලවුල් කැරැ වරල් බැ ඳ
දු ලා රන්පතින් සරසා සවන් සො ඳ
නි ලා දිගු නුවන් රසඳුන් කතා ඇ ඳ
බ ලා සිටු රඟන රඟමඬල කල්බ ඳ

73 පුලා, ප්‍රඵුල්ලවූ; සුවඳමල්, (ජාතිකන්ලාරාදි) සුගන්ධපුෂ්පයෙන්; අවුල් කැරැ, ආකූල කොට (ගවසා); වරල්, කෙශකලාපය; බැඳ, බන්ධනය කොට; සොඳ, සුන්දරවූ; සවන්, කර්ණප්‍රාන්තය; දුලා, ප්‍රභාස්වරවූ; රන්පතින්, කනකපත්‍රයෙන්; සරසා, අලඞ්කෘත

කොට; නිලා, නීලවර්ණවූ; දිගු, දීර්ඝවූ; නුවන්, නෙත්‍රයන්හි; රසඳුන්, රසාඤ්ජනයන්; තනා, අලඞ්කෘත කොට; ඇඳ, අඤ්ජිත කොට; රඟමඬල, රඞ්ගමණ්ඩලයෙහි; රඟන, නෘත්‍යය කරන්නාවූ; කල්බඳ, (නාටක) ස්ත්‍රීන්; බලා, සිටු; අවලොකනය කොට, අවස්ථානය කර.

'(තෝ) කල්බඳ බලාසිටු යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—සිටු යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **බලා** යනු පූර්වක්‍රියායි, **කල්බඳ** යනු ඊට අනුක්තකර්මයි, **රඟන** යනු කර්මවිශෙෂණයි, **රඟමඬල** යනු අනුක්තාධාරයි, **ඇඳ** යනුද **තනා** යනුද පූර්වක්‍රියායි, **රසඳුන්** යනු ඊට අනුක්තකර්මයි, **නුවන්** යනු අනුක්තාධාරයි, **දිගු** යනුද **නිලා** යනුද ආධාරවිශෙෂණයි, **සරසා** යනු පූර්වක්‍රියායි, **සවන්** යනු ඊට අනුක්තකර්මයි, **රන් පතින්** යනු ඊට අනුක්තකරණයි, **දූලා** යනු කරණවිශෙෂණයි, **සොඳ** යනු කර්මවිශෙෂණයි, **බැඳ** යනු පූර්වක්‍රියායි, **වරල්** යනු ඊට අනුක්තකර්මයි, **අවුල්කැරැ** යනු සොපපද පූර්වක්‍රියායි, **සුවඳමල්** යනු ඊට අනුක්තකරණයි, **පුලා** යනු ඊට විශෙෂණයි,

**ස, වි**—සුවඳින් (යුතු) මල්=සුවඳමල්, රනින් (කළ) පත්= රන්පත්, මධ්‍යපදලොපී විබත්සමස්; රසද එම අඳුන්ද=රසඳුන්, වෙසෙසුන් සමස්; (නොහොත්) රසින් කළ අඳුන්=රසඳුන්, විබත් සමස්;

**ස්වභාවොක්ත්‍යලංකාරයි.**

74 විදෙන ලෙළෙන නරැබර පුළුලුකුළැ රැ දී
හෙළන නහන අතැ නුවනග බැලුම් දි දී
රුවන දිලෙන අබරණ කැලුම ගතැ යෙ දී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැ දී

74 පුළුලුකුළැ, පෘථුලවූ ජඝනස්ථලයෙහි; රැඳී, රඤ්ජිතවූ; විදෙන, (සඞ්කාවභාවය හැර) විකශිත වන්නාවූ; ලෙළෙන, ලිලොපෙතවන්නාවූ; නරැබර, අචලභාරයෙන් යුක්තවූ; හෙළන නහන, උත්ක්ෂෙපණාවක්ෂෙපණ කරන්නාවූ; අතැ, හස්තයෙහි; නුවනගබැලුම් දිදී, නෙත්‍රප්‍රාන්තදර්ශනය පවත්ව පවත්වා; රුවන, (පද්මරාගමරකතාදි) රත්නයෙන්; දිලෙන, ජ්වලමාන වූ; අබරණ කැලුම, භූෂණකාන්තියෙන් ගතැ, (හස්තපාදාදි) ගාත්‍රයෙහි; යෙදී, යුක්ත වැ; සැදී, (නාටිකාවෙශයෙන්) අලඞ්කෘත වැ; රඟන, නෘත්‍යය කරන්නාවූ; ලිය, කාන්තාවෝ; සැලෙන, චලත්වූ; පහන සිළුවැනි, ප්‍රදීපශිඛාවන් මෙනි.

**රඟන ලිය සැලෙන පහන සිළු වැනි (වෙත්)යනු ක්‍රි: කා: ප: ස:**

**උ, වි—වෙත්** යනු අධ්‍යාහෘතක්‍රියායි, **රඟනලිය** යනු උක්ත කර්තෘයි, **සැලෙන පහනසිළු** යනු උපමාකර්තෘවිශෙෂණයි, **වැනි** යනු උපමාද්‍යොතකයෙහි අව්‍යයයි, **සැදී** යනුද **සෙදී** යනුද කර්තෘවිශෙෂණයි, **ගතැ** යනු අනුක්තාධාරයි, **අබරණ කැලුම** යනු අනුක්තකරණයි, **දිලෙන** යනු කරණවිශෙෂණයි, **රුවන** යනු ඊට අනුක්ත කරණයි, **දිදී** යනු විරූකතපූර්වක්‍රියායි, **නුවනගබැලුම්** යනු ඊට කර්මයි, **හෙළන නඟන අතැ** යනු අනුක්තාධාරයි, **නරුබර** යනු උපලක්ෂණයෙහි කතුවිබත්, **රැඳි** යනුද **විදෙන ලෙලෙන** යනුද නරුබර යන්නට විශෙෂණයි, **පුළුලුකුළැ** යනු **රැඳි** යන අපික්‍රියාවට අනුක්තාධාරයි.

**ස, වි**—නරුයෙහිබර=නරුබර, විබත්සමස්; පුළුල්වූයේද එම උකුළුවූයේද=පුළුලුකුළු, එහි-පුළුලුකුළැ, වෙසෙසුන්සමස්; හෙළනේත් එමය නඟනේත් එමනුයි=හෙළනනඟන, හෙළන නඟනේත් එමය අතත් එමනුයි-හෙළනනඟනඅත, එහි-හෙළන නඟන අතැ; වෙසෙසුන් සමස් ගැබි වෙසෙසුන් සමස්; නුවනයේ අඟ=නුවනඟ, (නොහොත්) නුවන්හි අඟ=නුවනඟ, නුවනඟින් බැලුම්=නුවනගබැලුම්, (නොහොත්) නුවනඟෙහි බැලුම්=නුවනඟ බැලුම්, විබත්සමස් ගැබි විබත්සමස්; අබරණෙහි කැලුම=අබරණ කැලුම, විබත්සමස්; පහනගේ සිළු=පහනසිළු, විබත්සමස් (නොහොත්) පහනද එම සිළුද=පහනසිළු, සැලෙන්නේත් එමය පහනසිළුවූයේත් එමනුයි=සැලෙනපහනසිළු, වෙසෙසුන් සමස්;

### උපමාලඞ්කාරයි.

75 ළකල පුළුලුකුළැ බඳමිණි මෙවු ල්ලා
සමඟ රන්සලඹ රැව්දී වෙවු ල්ලා
වයන පදට තබමින් පද කම ල්ලා
රඟන ළඳුන් බල රූසිරි සිය ල්ලා

75 ළකල, මනොඥවූ; පුළුලුකුළැ, විශාලවූ ශ්‍රොණිභාගයෙහි; බඳ, බන්ධනය කරනලද; මිණිමෙවුල්ලා, මාණික්‍යමෙඛලාදාමය හා; සමඟ, එක්ව; රන්සලඹ, ස්වර්ණ නූපුරය; වෙවුල්ලා, කම්පා කොට; රැව් දී, ශබ්ද පවත්වා; වයන පදට, අනෝන්‍යා (මද්දලධ්වනි) ශබ්දයට; පදකමල්ලා, පාදපද්මයන්; තබමින්, වින්‍යාස කෙරෙමින්; රඟන, නෘත්‍යයකරන්නාවූ; ළඳුන්, කාන්තාවන්ගේ; රූසිරි සියල්ලා, සකලරූපසම්පත්තිය; බල, නිරීක්ෂණය කර.

**‘(තෝ) රූසිරි සියල්ලා බල’** යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි—බල** යනු විදිකිරියයි, **තෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **රූසිරිසියල්ලා** යනු අනුක්තකර්මයි, **රඟනළඳුන්** යනු අනුක්තසම්බන්ධයි, **තබමින්** යනු මිශ්‍රක්‍රියායි, **පදකමල්ලා** යනු

ඊට කර්මයි, වයනපදට යනු අනුක්තසම්ප්‍රදානයි, දී යනු පූර්ව ක්‍රියායි, රුව යනු ඊට කර්මයි, මෙවුල්ලා යනු පූර්වක්‍රියායි, රන්සලඹ යනු ඊට කර්මයි, සමග යනු සහාර්ථයෙහි නිපාතයි, බඳමිණි මෙවුල්ලා යනු සමග යන නිපාත යොගයෙහි කතුවිබත්, ළකල පුළුලුකුළැ යනු අනුක්තාධාරයි.

ස, වි—පුළුල්වූයේද එම උකුළුවූයේද=පුළුලුකුළු, ළකල වූයේත් එමය පුළුලුකුළුවූයේත් එම්නුයි=ළකල පුළුලුකුළු, එහි- ළකලපුළුලුකුළැ, වෙසෙසුන්සමස්; මිණියෙන් කළ මෙවුල=මිණිමෙවුල, බඳනාලද මිණිමෙවුල=බඳමිණිමෙවුල, එය-බඳමිණිමෙවුල්ලා, මධ්‍යපදලොපි විබත්සමස් ගැබ් වෙසෙසුන්සමස්; රනින් කළ සලඹ=රන්සලඹ, මධ්‍යපදලොපි විබත්සමස්; පදම කමල=පදකමල, එය-පදකමල්ලා, වෙසෙසුන්සමස්; රඟනාහුත් ඔනුමය ළදවූවාහුත් ඔනුම්නුයි=රඟනළද, උන්-රඟනළඳුන්, වෙසෙසුන් සමස්; රුවගේ සිරි=රුසිරි, විබත්සමස්;

සවභාවොක්ත්‍යලඞකාරයි.

76 ව ස් දඬු බිඟු කොවුල් විණා නද මියු රැ
රැ ස් වූ සෙයින් සත්සරරස ගී සොඳු රැ
අ ස් වන ලියන් දක ළිය කිඳුරඟන යු රැ
තොස් කර තසිත සවනත නුවනත මිතු රැ

76 වස්දඬු, වස්කුලල්ය; බිඟු, භෘඞගය; කොවුල්, කොකිලය; විණා, විපඤ්චිකාය යන මොවුන් සම්බන්ධිවූ; නද, නාදයන්ගේ; මියුරැ, මාධුර්‍ය්‍යගුණය; රැස්වූ සෙයින්; රාශිභූතවූවාක් මෙන් හෙවත් එක්තැන් වූවාක් මෙන්; සත්සරරස, ස-රි-ග-ම-ප-ධ-නි යන සප්තස්වරරසයෙන් යුක්තවූ; සොඳුරු, (එහෙයින් ම) මනොඥවූ; ගී, ගීතිකාවන්; අස්වන, ශ්‍රාවණය කරන්නාවූ; ලිය කිඳුරඟනයුරු, ලියකිඳුරු අඞගනාවන් වැනිවූ; ලියන්, කාන්තාවන්; දක, දර්‍ශනය කොට; මිතුරු, මිත්‍රය; තසිත, තාගේ චිත්තයද; සවනත, ශ්‍රවණයද; නුවනත, නෙත්‍රයද; තොස්කර, සන්තොෂ කර.

'(තෝ) තසිත සවනත නුවනත තොස්කර' යනු ක්‍රි: කා: ප: ස:

ද, වි—කර යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, තසිත යනුද සවනත යනුද නුවනත යනුද අනුක්ත කර්මයෝයි, තොස් යනු කර්මවිශෙෂණයි, මිතුරු යනු සම්බොධනයි, දකැ යනු පූර්වක්‍රියායි, ලියන් යනු ඊට අනුක්තකර්මයි, අස්වන යනු කර්මවිශෙෂණයි, යුරු යනු උපමාද්‍යොතකයෙහි අව්‍යයයි,

ලියකිඳුරඟන යනු උපමකාමිවිශේෂණයි; සත්සරරසගී යනු අස් වන යන ක්‍රියාවට කර්මයි, සොඳුරු යනුද රුස්වූ යනුද ඊට විශේෂණයි, සෙසින් යනු උපමාද්‍යොතකශබ්ද අව්‍යයයි, මියුරු යනු රුස්වූ යන කෘදන්ත ක්‍රියාවට අනුක්තකර්තෘයි, වස්දඬු බිඟු කොවුල් වීණානද යනු අනුක්ත සම්බන්ධයි.

ස, වි—වස්දඬුද බිඟුද කොවුල්ද වීණාද=වස්දඬුබිඟුකොවුල් වීණා, වස්දඬුබිඟුකොවුල්වීණාවන්ගේ නද=වස්දඬුබිඟුකොවුල් වීණානද, දරුත් සමස් ගැබ් විබත් සමස්; සරසතක් එක්කොට සලකනලදනු=සරසත් (පදවිපර්‍යාසව) සත්සර, සත්සරන්ගේ රස=සත්සරරස, සත්සරරසින් යුතු ගී=සත්සරරසගී, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් විබත් සමස්; ලියද එම කිඳුරුද=ලිය කිඳුරු, ලියකිඳුරන්ගේ අඟන=ලියකිඳුරඟන, ලියකිඳුරඟන හා අයුරු සමක්හුගේද ඔහු=ලියකිඳුරඟනයුරු, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් අන්අරුත් සමස්; තාගේ සිත=තාසිත, විබත් සමස්;

වස්දඬු—වංශදණ්ඩ ශබ්දයෙන්වූ තද්භව ශබ්දප්‍රකෘතියි, මෙයින් හුණ බට ආදි රන්ධ්‍රවත් දණ්ඩන් කරනුලැබ පිඹින එනම් වාද්‍යොපකරණය කියන ලදී. වංශ යනු සිදුරු ඇති හුණ බට ආදී තෘණ විශේෂයන්ට නම්. එයම දණ්ඩයයි විශේෂණ සමාස විධියෙන් වංශදණ්ඩ ශබ්දය සිද්ධකටයුතු වේ.

සත්සර—වීණාවෙහි ශ්‍රැත්‍යන්තරව ඇතිවන්නාවූ ස්වරසතෙක එනම් ෂඩ්ජ, ඍෂභ, ගාන්ධාර, මධ්‍යම, පංචම, ධෛවත, නිෂාද යන මොහු වෙත්.

එහෙයින් කීහ,

ශ්‍රැතිභ්‍යඃ ස්‍යුඃ ස්වරාඃ ෂඩ්ජර්ෂභගාන්ධාරමධ්‍යමාඃ
පඤ්චමෝ ධෛවතශ්චාථ නිෂාදශ්චෙති සප්ත තෙ-යි.

"ඒතෙෂාං සංඥාඃ සරිගම පධනීත්‍යපරාමතාඃ" යනුවෙන් ස: රි: ග: ම: ප: ධ: නි: යි ඔවුන්ටම සංඥිත අපර නාමයෝද කියන ලදහ, ඒ වනාහි ෂඩ්ජාදි ශබ්දයන්ගේ මූලාක්ෂරසන්නිවෙසය මැයි.

## උපමාලඞ්කාරයි.

77 මෙ සේ පැවති අනතුරු ගී රැඟුම් පු ද
තොසේ සිතින් වැඩසිටි සුරවිමන් මැ ද
ය සේ පතළ දියතුළ උතුළ මන්නා දී
ඇ සේ පුරා දකු විබිසණ සුරිඳු ස ඬ

77 මෙසේ, යථොක්තප්‍රකාරයෙන්ම; පැවති, පැවැත්තාවූ; ගී රැඟුම්පුද අනතුරු, ගීතනෘත්‍යපූජාවට අනන්තරව; තොසේ සිතින්, සන්තොෂ චිත්තයෙන්; සුරවිමන්මැද, දෙවවිමානමධ්‍ය

යෙහි; වැඩසිටි, ස්ථානප්‍රාප්තාවූ; දියතුළ, ජගදභ්‍යන්තරයෙහි; පතල, ව්‍යාප්තවූ; උතුළ, ඉතිරගියාවූ; මනනඳ, මනොනන්දනීයවූ; යසස්, කීර්ති ඇති; විබිසණසුරිඳුසඳ, විභීෂණ නම් සුරෙන්ද්‍රතෙමයා; ඇසේ පුරා, දෘෂ්ටිපූරණය කොට; දකු, දර්ශනය කර.

**උ, වි—'(නෝ) විබිසණ සුරිඳුසඳ දකු' යනු ක්‍රි: කා: ප: ස:**

**උ, වි—දකු** යනු විදිකිරියයි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **විබිසණසුරිඳුසඳ** යනු අනුක්ත කර්මයි, **යසස්** යනුද **සිටි** යනුද කර්මවිශෙෂණයි, **පුරා** යනු පූර්වක්‍රියායි, **ඇසේ** යනු ඊට අනුක්තාධාරයි, **වැඩ** යනු පූර්වක්‍රියායි, **පතල** යනුද **උතුල** යනුද **මනනඳ** යනුද යසස් යන්නට විශෙෂණයි, **දියතුල** යනු පතල උතුල යන අප්‍රධාන ක්‍රියාවන්ට අනුක්තාධාරයි, **සුරවිමන්මැද** යනු වැඩසිටි යන අප්‍රධාන ක්‍රියාවට අනුක්තාධාරයි, **නොසේසිතින්** යනු උපලක්ෂණ අරුත්හි කරණ විබත්, **අනතුරු** යනු අනන්තරාර්ථයෙහි නිපාතයි, **ගිරගුම්පුද** යනු අවදි අරුත්හි කම් විබත්, **පැවති** යනු ඊට විශෙෂණයි, **මෙසේ** යනු ප්‍රකාරාර්ථයෙහි නිපාතයි.

**ස, වි—**අතුරු නොවූයේ=අනතුරු, නාරුත් සමස්; ගිරගුම්ද පුදද=ගිරගුම්පුද, දුරුත් සමස්; සුරහුගේ විමන=සුර විමන, සුරවිමනගේ මැද=සුරවිමන්මැද, එහි-සුරවිමන්මැද, විබත් සමස් ගැබ් විබත් සමස්; දියගේ ඇතුල=දියතුළ, විබත් සමස්; සුරනට ඉඳු=සුරිඳු, විබිසණද එම සුරිඳුද=විබිසණසුරිඳු, විබිසණ සුරිඳුද එම සඳද=විබිසණසුරිඳුසඳ, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්;

**දකු**—දිස් ධාතුහට දක්යි ආදෙශව උප්‍රත්‍යයව සිඩයි.

**ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.**

78 පැ මි ණ සිටි අඳුන් ගිරිකුළු මුදුන් වෙ ත
රෙහෙ ණ නකත් ගැල සිරි විලසින් දිමු ත
ස ර ණ මුළුලොවට එසුරිඳු සිරස ප ත
ක ල ණ කිරුළ දිසි මුතුලැල් රුවන් යු ත

78 අදුන්ගිරිකුළු මුදුන්වෙත, අඤ්ජනපර්වතකූටමස්තකාග්‍රහු ගේ සමීපයෙහි; පැමිණසිටි, ප්‍රාප්තවූ සිටියාවූ; රෙහෙණනකත් ගැලසිරි, රොහිණීනක්ෂත්‍රශකටශ්‍රීහුගේ; විලසින්, විලාසයෙන්; දිමුත, දීප්තිමත්වූ; මුළුලොවට, සමස්තලොකයට; සරණ,

ප්‍රතිෂ්ඨාධාරවූ; එසුරිඳු, ඒ විභීෂණනම් පුරෙන්ද්‍රයාගේ; සිරස පත, මූර්ධයෙහි නියුක්තවූ; මුතුලැල්, මුක්තාලඞ්කාරයෙන් හා; රුවන් යුත, රත්නයෙන් යුක්තවූ; කලණ කිරුළ, ස්වර්ණකිරීටයතෙම; දිසි, දෘශ්‍යමාන වී.

'කලණකිරුළ දිසි වේ' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—වේ යනු අධ්‍යාහෘත ක්‍රියායි, **කලණ කිරුළ** යනු ප්‍රථම කර්තෘයි, **දිසි** යනුද **මුතුලැල්රුවන්යුත** යනුද **පත** යනුද **දිමුත** යනුද කර්තෘවිශේෂණයි, **සිරස** යනු පතයන්තට අනුක්තාධාරයි, **එසුරිඳු** යනු අනුක්තසම්බන්ධයි, **සරණ** යනු සම්බන්ධ විශේෂණයි, **මුළුලොවට** අනුක්තසම්ප්‍රදානයි, **රෙහෙණනකත්ගැළසිරි විල සින්** යනු උපලක්ෂණයෙහි කරණ විබත්, **සිඳි** යනු කරණ විශේෂණයි, **පැමිණ** යනු පූර්වක්‍රියායි, **අඳුන්ගිරිකුළුමුදුන්වෙත** යනු අනුක්තාධාරයි.

**ස, වි**—අඳුන්වන් ගිරි=අඳුන්ගිරි, අඳුන්ගිරයේ කුළ=අඳුන්ගිරි කුළු, අඳුන්ගිරිකුළුයේ මුදුන්=අඳුන් ගිරිකුළු මුදුන්, අඳුන්ගිරි කුළු මුදුනගේ වෙත්=අඳුන්ගිරිකුළුමුදුනවෙත්, එහි-අඳුන්ගිරිකුළු මුදුනවෙත, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් විබත් සමස්; රෙහෙණවීද එම නකත්වීද=රෙහෙණනකත්, රෙහෙණ නකත්ද එම ගැළද=රෙහෙණනකත්ගැළ, රෙහෙණනකත්ගැළයේ සිරි= රෙහෙණනකත්ගැළසිරි, රෙහෙණනකත්ගැළසිරියේ විලස= රෙහෙණනකත්ගැළසිරිවිලස, ඉන්-රෙහෙණනකත් ගැළසිරි විල සින්, වෙසෙසුන්සමස් ගැබ් විබත් සමස්; එද එම සුරිඳුද=එසුරිඳු, එසුරිඳුගේ සිරස=එසුරිඳුසිරස, එහි-එසුරිඳු සිරස, වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්; කලණද එම කිරුළද=කලණකිරුළ, වෙසෙසුන්සමස්; මුතුයෙන් කළ ලැල්=මුතුලැල්, මුතුලැල්ද රුවන්ද=මුතුලැල්රුවන්, මුතුලැල් රුවණින් යුතුවූයේ යමක්ද එය මුතුලැල්රුවන්යුත, විබත්සමස් දුරුත්සමස් ගැබ් අන් අරුත්සමස්;

**රෙහෙණ නකත්**—මේ වනාහි සප්තවිංශති නක්ෂත්‍රයන් අතුරෙහි චතුර්ථ නක්ෂත්‍රයයි. තාරකා පසකින් යුක්තයි. ආකාර වශයෙන් ශකටාකාරය ධරයි. එහෙයින් මෙයට රෙහෙණනකත්ගැළයයි කීහු.

## අභූතොපමාලඞ්කාරයි.

| | | | |
|---|---|---|---|
| 79 | සු නි ලේ | පැහැය හැර සුදුවනුය ගන වෙ | ලේ |
| | වි දු ලේ | එයින් වියොවට පැමිණ වියවු | ලේ |
| | නි ස ලේ | එමේසිරිගත් සුරිඳු නැමක | ලේ |
| | උ දු ලේ | දෙහෝ රන්පටමෙන් නළල් තෙ | ලේ |

79 ඝන, සාන්ද්‍රවූ; වෙළේ, වලාහකතෙම; සුනිලේ, අතිනීලවූ; පැහැය, ප්‍රභාව; හැර, හරණය කොට හෙවත් පරිත්‍යාග කොට; සුදුවනුය, ශුභ්‍රවර්ණ වන්නේය; එසින්, ඒ (වර්ණවිපර්‍ය්‍යාස වන්නාවූ) කාරණයෙන්; විදුලේ, විද්‍යුල්ලතාතොමෝ; වියොවට පැමිණ, (ඒ මෙඝ නමැති වල්ලභයා හා එක්ව ශරත්කාලාදියෙහි) වියොගයට පැමිණ; වියවුලේ, ව්‍යාකුලයෙන්; ඇමකලේ, සදකාලයෙහි; නිසලේ, නිශ්චලවූ හෙවත් අන්‍යවර්ණයකට නොපැමිණෙන්නාවූ; මේ සිරි ගත්, මෙඝශ්‍රීය ධැරුවාවූ; එ සුරිඳුන්, ඒ සුරෙන්ද්‍රයාණන්ගේ; නළල්තෙලේ, ලලාටඵලයෙහි; රන්පටමෙන්, උෂ්ණීෂපට්ටාකාරයෙන්; උදුලේ දෙ හෝ, බබලන්නී දෝ හෝ.

වෙළේ සුදුවනුය යනුද විදුලේ උදුලේ (වෙයි) දෙහෝ යනුද ක්‍රි: කා: ප: ස:

උ, වි—වෙයි යනු ආධ්‍යාහාර ක්‍රියායි, විදුලේ යනු උක්ත කර්තෘයි, උදුලේ යනු කර්තෘවිශෙෂණයි, දෙහෝ යනු උත්ප්‍රෙක්ෂා ව්‍යඤ්ජක නිපාතයි, මෙන් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, රන්පට යනු උපමාකර්තෘ විශෙෂණයි, නළල්තෙලේ යනු අනුක්තාධාරයි, ඇමකලේ යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, සුරිඳුන් යනු අනුක්තසම්බන්ධයි, එ යනුද නිසලේ යනුද මේසිරිගත් යනුද සම්බන්ධ විශෙෂණයි, වියවුලේ යනු අනුක්තකරණයි පැමිණ යනු පූර්වක්‍රියායි, වියොවට යනු ඊට අනුක්ත කර්මයි, එසින් යනු අනුක්තකරණයි,

සුදුවනු යනු සොපපද කෘදන්ත කර්තෘකාරකක්‍රියායි, ඝන වෙළේ යනු උක්තකර්තෘයි, හැර යනු පූර්වක්‍රියායි, පැහැය යනු ඊට අනුක්ත කර්මයි, සුනිලේ යනු කර්මවිශෙෂණයි.

ස, වි—සු ඉතා නිල්=සුනිල්, එය-සුනිලේ, පඅැසමස්; මේහුගේ සිරි=මේසිරි, මේසිරි ගත්තේ=මේසිරිගත්, විබත් සමස්; ඝනද එම වෙලද=ඝනවෙල, ඒ ඝන වෙළේ, වෙසෙසුන් සමස්; සුරනට ඉඳු=සුරිඳු, ඔහු-සුරිඳුන්, විබත්සමස්; රනින් කළ පට=රන් පට, විබත් සමස්; නළල්හුගේ තල=නළල්තල, එහි-නළල්තෙලේ, විබත් සමස්;

ස්වභාවයෙන් නීලවර්ණ විභීෂණ සුරෙන්ද්‍ර ප්‍රතිරූපයෙහි නළල් තෙලෙහි පලඳවන ලදුව පිහිටි රන්පට මෙඝයාගේ වර්ණවිපර්‍ය්‍යාසය නිසා කලකිරී මොහුගේ නිශ්චල මේඝශ්‍රීය නිසා ඕහුවෙත ඇලී ස්වර්ණපට්ට ව්‍යාජයෙන් බබළන විද්‍යුල්ලතාව දෙහෝයි කවිහුගේ උත්ප්‍රෙක්ෂායි.

## උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි.

80 රු වි නේ උතුම් එසුරිඳු මිණි ඊල මෙ නේ
ස ව නේ රුදුණු රසුදුල තෝඩු ගතර නේ
වු ව නේ වැජඹි සිරිසරසවිය හැමදි නේ
සොබි නේ කතා කැමපත් සුවළ විලසි නේ

80 රුවිනේ උතුම්, රූපයෙන් උත්තමවූ; එ සුරිඳු, ඒ සුරේන්ද්‍රයාගේ; මිණිඊල මෙන්, (ඉන්ද්‍රනීල) මාණික්‍ය දෙලාවන් වැනිවූ; සවනේ, කර්ණපාශයෙහි; රැඳුණු, රඤ්ජිතවූ; රසුදුළ, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; ගනරනේ, ඝනකනකමයවූ; තෝඩු, තාඩඞ්ක (යුග්මය) තෙම; මුවනේ, මුඛ (පද්ම) යෙහි; හැමදිනේ, සදාකාල යෙහි; වැජඹි, විජෘම්භිතවූ; සිරිසරසවිය, ශ්‍රී සරස්වතී දෙදෙනාගේ; කනාකැටපත්යුවළ, ස්වර්ණමයවූ දර්පණයුග්මයක්හුගේ; විලසිනේ, විලාසයෙන්; සොබනේ, ශොභමානවන්නේයි.

**තෝඩු සොබනේ වේ යනු ක්‍රි: කා: ප: ස:**

**උ, වි**—වේ යනු අධ්‍යාහාරක්‍රියායි, **තෝඩු** යනු උක්තකර්තෘයි, **සොබනේ** යනුද ගනරනේ යනුද **රසුදුළ** යනුද **රැඳුණු** යනුද කර්තෘවිශෙෂණයි, **මිණිඊලමෙනේ** යනු උපමා කර්තෘවිශෙෂණයි. **කනා කැටපත්යුවළ විලසිනේ** යනු අනුක්ත කරණයි, නොහොත් උපලක්ෂණයෙහි කරණවිබත්ති, **සිරිසරසවිය** යනු අනුක්තසම්බන්ධයි, **වැජඹි** යනු සම්බන්ධ විශෙෂණයි, **හැමදිනේ** යනු කාලාර්ථ අනුක්තා ධාරයි, **මුවනේ** යනු වැජඹි යන ක්‍රියාවට අනුක්තාධාරයි, **සවනේ** යනු රැඳුණු යන්නට අනුක්තාධාරයි, **එසුරිඳු** යනු අනුක්ත සම්බන්ධයි, **උතුම්** යනු ඊට විශෙෂණයි. **රුවිනේ** යනු අනුක්ත කරණයි.

**ස, වි**—සුරනට ඉඳු=සුරිඳු, එද එම සුරිඳුද=එසුරිඳු, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; මිණියෙන් කළ ඊල=මිණිඊල, විබත් සමස්; රසින් උදුළ=රසුදුළ, විබත් සමස්; ගනවූයේද එම රන්වූයේද=ගනරන්, වෙසෙසුන්සමස්; සිරිද සරසවියද=සිරිසර සවිය, ඔවුන්-සිරිසරසවිය, දරුත්සමස්; කනායෙන් කළ කැට පත්=කනාකැටපත්, කනාකැටපත්හුගේ යුවළ=කනාකැටපත් යුවළ, මධ්‍යපදලොපී විබත් සමස් ගැබ් විබත් සමස්;

**මිණිඊල**—ඊල යනු දෙලාර්ථවාචීවූ තද්භව ශබ්දප්‍රකෘතියකි. මිණියෙන් කළ ඊල මිණිඊල නම් වේ. විභීෂණසුරේන්ද්‍රයාගේ කර්ණපාශයෙහි රඤ්ජිතවූ ඉඳුනිල්මිණිදෙලාවන් වැනි තෝඩු යුග්මය මුවයෙහි නිතර රැඳුණාවූ ශ්‍රී සරස්වතී දෙදෙනාගේ ස්වර්ණමය කැටපත් යුග්මයක්හුගේ විලාසයෙන් ශොභමාන වන්නේය-යනු භාවයි-

**සොබනේ**—සොබ-හෙබීමෙහි යන ධාතුවෙන් පරව කර්තෘ අර්ථයෙහි ක්ප්‍රත්‍යය හා ප්‍රථමා ඒ ප්‍රත්‍යයවැ සිඩයි. ධාතුවෙන් පරවැ අනාගත කාලික නෙප්‍රත්‍යයවැ අඛ්‍යාත ක්‍රියාවක් වද සිඬවිය හැකිවේ.

**උපමාලඞ්කාරයි.**

81 නමකළ සතහැලේ සිහිලේ සැපසිලි, ලී
බියසෙණ රුපුකැලේ තුමුලේ දෙන නොක ලී
නළලත ගිරිතෙලේ සුනිලේ රැසිනිපි ලී
සුරරද දෙබැමලේ ගනලේ සිරි කිය ලී

**81** නමකළ, නමස්කාර කළාවූ; සත, සත්‍ව නමැති; හැලේ, ශාලික්ෂෙත්‍රයන්ට; සිහිලේ, ශීතලවූ; සැපසිලිලි, සම්පත්ති නමැති ජලධාරාවන්ද; තුමුලේ, මහත්වූ; රුපුකැලේ, ශත්‍රුගුල්මයට හෙවත් සතුරු නමැති වනලැහැබට; නොකලි, අමනොඥවූ, බියසෙණ, භය නමැති නිර්ඝාතයන්ද; දෙන, දානය කරන්නාවූ; නළලත, ලලාටතල නමැති; ගිරිතෙලේ, පර්වතතලයෙන්; සුනිලේ රැසින්, අතිනීල කාන්තියෙන් (උපලක්ෂිතවූ); ඉපිලී, උද්ගතවූ; සුරරද දෙබැමලේ, සුරේන්ද්‍රයාගේ භ්‍රැලෙඛායුග්මයතෙම, ගනලේ සිරි කියලි, මේඝාවලින් (දෙදෙනකුන්ගේ) ශොභාව ප්‍රකාශ කෙළේයි.

**සුරරද දෙබැමලේ ගනලේසිරි කියලී** යනු ක්‍රි: කා: ප: ස:

**ල, වි—කියලී** යනු අයුකල් අන්කරු එකබස් කතුකිරියයි, **සුරරද දෙබැමලේ** යනු උක්තකර්තෘයි, **ගනලේසිරි** යනු අනුක්ත කර්මයි, **ඉපිලි** යනුද **දෙන** යනුද කර්තෘවිශෙෂණයි, **සුනිලේරැසින්** යනු උපලක්ෂණයෙහි කතුවිබත්. **නළලතගිරිතෙලේ** යනු ඉපිලී යන අජීක්‍රියාවට අනුක්තාපාදානයි, බියසෙණ යනු දෙනයන අජීක්‍රියාවට අනුක්තකර්මයි, **නොකලි** යනු ඊට විශෙෂණයි, **රුපුකැලේ** යනු අනුක්ත සම්ප්‍රදානයි, තුමුලේ යනු ඊට විශෙෂණයි, **සැපසිලිලී** යනුද දෙනයන අජීක්‍රියාවට අනුක්තකර්මයි, **සිහිලේ** යනු ඊට විශෙෂණයි, **නමකළසතහැලේ** යනු සම්ප්‍රදානයි.

**ස, වි—**නමකළේ=නමකළ, නමකළාහුත් ඔහුමය සතවූවාහුත් ඔහුමහුයි=නමකළසත, නමකළ සතවූවාහුත් ඔහුමය හැල් වූවාහුත් ඔහුමහුයි=නමකළ සතහැලේ, වෙසෙසුන්සමස්; ගැබි වෙසෙසුන්සමස්, සැපම සිලිල්=සැපසිලිල්, එය-සැපසිලිලී, වෙසෙසුන්සමස්; බියමසෙණ=බියසෙණ, වෙසෙසුන්සමස්; රුපුමකැලේ=රුපුකැලේ, වෙසෙසුන්සමස්; කලනොවූයේ=නොකල, (ඊ) නොකලී, නාරුත්සමස්; ගිරිහුගේ තල=ගිරිතල, (නළලගේ අත නළලත,) නළලතම ගිරිතල=නළලතගිරිතල, එයින්-නළලත ගිරිතෙලේ, විබත් සමස් විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්;

**කියලී**—කියාලී යන තන්හි යකාර හ්‍රස්වවූ "කියලී" යනු වේ. කියා යන පූර්වක්‍රියාව පූර්වපදකොට ඇති ලා-ලීමෙහි යන ධාතුවෙන් පරව ඊ ප්‍රත්‍යයවූ සිඬයි.

**රූපක උපමා අතිශයොක්ති සංසෘෂ්ටියි.**

82 ස තු රු  සුර අඳුරු එක පැහැර දුරු ක  ළ
මි තු රු  තඹුරුවන නිරතුරු පුබුදු ක  ළ
අ තු රු  තුසර සිඳුවන දැකුමෙන් පහ  ළ
ල හි රු  සිරින් දිලිහිණි හිමි නෙත් සහ  ල

82 සතුරු, විරුඬවූ; සුර, දෙවතා නමැති; අඳුරු, අන්‍ධකාරය; එකපැහැර, එකප්‍රහාරයෙන්; දුරුකළ, නිරාසන්තය කළාවූ; මිතුරු තඹුරුවිත, මිත්‍ර නමැති තාමරසවනය; නිරතුරු, නිරන්තරයෙන්; පුබුදුකළ, ප්‍රබුඬ කළාවූ; පහළ, ප්‍රකාශවූ; අතුරු, අන්තරාය නමැති; තුසර, තුෂාරබින්දුන්; දැකුමෙන්, දර්‍ශනයෙන්; සිඳුවන, ශුෂ්ක කරවන්නාවූ; හිමි, ස්වාමිහුගේ; නෙත් සහල, නෙත්‍රයුග්මයතෙම; ලහිරු සිරින්, බාලාර්ක (මණ්ඩල) ශොභායෙන්; දිලිහිණි, ජවලිත විණි.

හිමි නෙත්සහල දිලිහිණි යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—දිලිහිණි යනු නිරුත්සාහ ක්‍රියායි, හිමිනෙත්සහල යනු ඊට කර්‍තෘයි, සිඳුවන යනුද පුබුදුකළ යනුද දුරුකළ යනුද කර්‍තෘවිශෙෂණයි, ලහිරුසිරින් යනු උපලක්‍ෂණ අරුත්හි කරණ විබත්, අතුරු තුසර යනු සිඳුවන යන ක්‍රියාවට අනුක්‍ත කර්‍මයි, දැකුමෙන් යනු ඊට අනුක්‍ත කරණයි, පහළ යනු අතුරු තුසර යන කර්‍මයට විශෙෂණයි, මිතුරු තඹුරුවන යනු පුබුදු කළ යන ක්‍රියාවට අනුක්‍ත කර්‍මයි, නිරතුරු යනු ක්‍රියා විශෙෂණයි, සතුරුසුරඅඳුරු යනු දුරුකළ යන අර්‍ථක්‍රියාවට අනුක්‍ත කර්‍මයි, එකපැහැර යනු ක්‍රියාවිශෙෂණයි.

**ස, වි**—සතුරුවූ සුර=සතුරුසුර, සතුරුසුරම අඳුරු=සතුරුසුරඅඳුරු, විබත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; තඹුරුන්ගේ වන=තඹුරුවන, මිතුරුම තඹුරුවන=මිතුරුතඹුරුවන, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; අතුරුම තුසර=අතුරුතුසර, වෙසෙසුන් සමස්; ළද එම හිරුද=ළහිරු, ළහිරුගේ සිරි=ළහිරුසිරි, ඉන්-ළහිරුසිරින්, වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; නෙත්හුගේ සහළ=නෙත්සහල, හිමිහුගේ නෙත්සහල=හිමිනෙත්සහල, විබත් සමස් ගැබ් විබත් සමස්;

රූපකාලංකාරසංක්‍ෂිප්තියි.

හෙතුරූපක වචන නොමැත්තේද අර්‍ථවශයෙන් මෙහි හෙතුරූපකත්වය දක්නාලැබේ.

83 ය ස ගා  න කළ තැන තැන සිඳ ගතන් සැ  දි
නොළහා  එහිමි දිගුතුගු නැහැයම වොරැ  දි
ස ම හා  රදුන් දෙවියන් සෙවුමින් තිසැ  දි
මූ ර හා  අඟෝ මිණිකාලම වෙහෙසැ වි  දී

83 සැදි, අලඞ්කෘතවූ; සිඳගතන්, සිඞාඞ්ගනාවන් විසින්; තැන තැන, ඒ ඒ ස්ථානයෙහි; ගාන කළ, ගානය කරනලද්දවූ; යස, කීර්ති ඇත්තාවූ; එහිමී, ඒ (දිව්‍ය) රාජයාගේ; දිගු, දීඝීවූ; තුඟු, උත්තුඞ්ගවූ; වොරැඳි, විරාජමානවූ; නැහැයට, නාසිකාවට; නොලහා, (ආකාරසාදෘශ්‍යයෙන්) ආසන්න නොවී; මිණිකාලම, මාණික්‍යකාහලයතෙම; රදුන්, රජදරුවන් හා; දෙවියන්, දෙවතාවන් හා; සමඟ, එක්වැ; නිසැදි, නිරන්තරයෙන්; සෙවුමින්, සෙවනය කෙරෙමින්; මුරගා, උද්ඝොෂණය කොට; වෙහෙසවිඳි, දුක් විඳින්නේය; අහෝ, ඛෙදයකි.

'මිණිකාලම වෙහෙස විඳි' යනු ක්‍රි: කා: ප: ස:

**උ, වි**—විඳි යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, **මිණිකාලම** යනු උක්තකතෘයි, **වෙහෙස** යනු අනුක්තකර්මයි, **අහෝ** යනු ඛෙදාර්ථයෙහි නිපාතයි, **මුරගා** යනු පූර්වක්‍රියායි, **සෙවුමින්** යනු මිශ්‍රක්‍රියායි, **නිසැදි** යනු ක්‍රියාවිශෙෂණයි, **සමගා** යනු සහාර්ථයෙහි නිපාතයි, **රදුන්** යනුද **දෙවියන්** යනුද සමඟ සබ දෙහි කතුවිබත්, **නොලහා** යනු සොපපද පූර්වක්‍රියායි, **නැහැයට** යනු ඊම අනුක්තකර්මයි, **වොරැඳි** යනුද **දිගු** යනුද **තුඟු** යනුද කර්මවිශෙෂණයි, **එහිමි** යනු අනුක්තසම්බන්ධයි, **යසගානකළ** යනු සම්බන්ධවිශෙෂණයි, **තැන තැන** යනු අනුක්තාධාරයි, **සිඳගනන්** යනු ගානකළ යන ක්‍රියාවට අනුක්තකතෘයි, **සැදි** යනු කතෘ විශෙෂණයි.

**ස, වි**—ගානය කෙළේ=ගානකළ, ගානකළ යසස් යමක්හු ගේද හේ=යසගානකළ, විබත්සමස් ගැබි අන්අරුත්සමස්; සිඳුන්ගේ අඟන=සිඳඟන, ඔවුන්-සිඳඟනන්, විබත් සමස්; එද එම හිමිද=එහිමි, වෙසෙසුන් සමස්; මිණියෙන් කළ කාලම=මිණිකාලම, මධ්‍යපදලොපි විබත් සමස්;

**මිණිකාලම**-හොරනෑ නම් වාද්‍යභාණ්ඩ විශෙෂයයි. මෙහි "කාලම" යනු "කාලම්" යන ද්‍රවිඩ වචනයෙන් තද්භව ශබ්ද ප්‍රකෘතියි.

**ප්‍රතිෂෙධොපමා මිශ්‍රිත ව්‍යාඛ්‍යව්‍යඤ්ජක පරිකල්පනාලඞ්කාරයි.**

**උත්ප්‍රෙක්ෂා සනුද මිටම නම්.**

84 සි රි ස ර හිගුල්විලැ සේහසවැලෙවි ග ත
සු ර ව ර සලෙළ රතලවනත දළ දුල ත
ම න හ ර සඳවලාපෙළ කෙළවර පෙනෙ ත
පැහැස ර ළසඳ යුවලෙක් ඇත්නම් එමෙ ත

84 සිරිසර, ශ්‍රීසාරවූ; හිඟුල්විලැ, ජාතිහිඞ්ගුලතටාකයෙක්හි; ගන, සාන්‍ද්‍රවූ; සේහසවැලෙව්, ශෝභනහංසාවලි (යුග්මයක් හා සමානවූ; සුරවර, දිව්‍යරාජයාගේ; සලෙළ, ලීලාසහිතවූ; රත ලවනත, රක්තාධරාන්තයෙහි; උදුලන, දිලිහෙන්නාවූ; දළ, දංෂ්ට්‍රා (යුග්මය) තෙම; මනහර, මනොඥවූ; සඳවලාපෙළ, සන්ධ්‍යාබ්‍රපඞ්ක්තින්ගේ; කෙළවර, අවසානයෙහි; පෙනෙන, දෘශ්‍යමානවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ළසඳයුවළෙක්, බාලචන්‍ද්‍ර යුගලයෙක්; ඇත්නම්, විද්‍යමාන වීනම්; එමෙන, ඒ හා සමානයි.

'දළ එමෙන වේ' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි — වේ යනු අධ්‍යාහෘත ක්‍රියායි, දළ යනු උක්තකර්තෘයි, මෙන් යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, එ යනු උපමා කර්තෘ විශෙෂණයි, නම් යනු පරිකල්පාර්ථයෙහි නිපාතයි, ඇත් යනු ක්‍රියාප්‍රතිරූපක අව්‍යයයි, පැහැසර ළසඳයුවළෙක් යනු අසත්‍යාර්ථ ක්‍රියාවට කර්තෘයි, පෙනෙන යනු ඊට විශෙෂණයි, මනහර සඳ වලාපෙළ කෙළවර යනු අනුක්තාධාරයි, දුලන යනු කර්තෘ විශෙෂණයි, එව් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, සේහස වැල යනු උපමාකර්තෘ විශෙෂණයි, ගන යනු සේහසවැළ යන්නට විශෙෂණයි, රතලවනත යනු උදුලන යන අසමාප්ත ක්‍රියාවට අනුක්තාධාරයි, සලෙළ යනු ආධාරවිශෙෂණයි, සුරවර යනු අනුක්තසම්බන්ධයි, සිරිසරහිඟුල්විලැ යනු අනුක්තාධාරයි.

ස, වි — සිරියෙන් සර=සිරිසර, හිඟුලෙන් නිපන්විල්=හිඟුල්විල්, සිරිසරවූයේත් හෙමය හිඟුල්විල් වූයේත් හෙමනුයි=සිරිසර හිඟුල් විල්, එහි-සිරිසර හිඟුල්විලැ, විබත්සමස් විබත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; සේවූයේද එම හස්වූයේද=සේහස්, එය-සේහස, සේ හසුන්ගේ වැළ=සේහසවැළ, වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්; සුරනට වර=සුරවර, විබත් සමස්; ලෙල සහිතවූයේ=සලෙළ, අන් අරුත්සමස්; රත්වූයේද එම ලවන වූයේද=රතලවන, රතල වනයේ අත්=රතලවනත්, එහි-රතලවනත, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; (රත්ලවනත කියයුතු තැන අකාරාගමව "රතලවනත" කියා වේ.) මනහරනුයේ=මනහර, උපපදසමස්; වලාවන්ගේ පෙළ=වලාපෙළ, සැඳැයෙහි වලාපෙළ=සැඳැවලා පෙළ, මනහරවූවාත් එමය සැඳැවලාපෙළවූවාත් එම්නුයි=මන හර සැඳැවලාපෙළ, විබත් සමස් විබත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; පැහැයෙන් සර=පැහැසර, ළවූයේද එම සඳවූයේද=ළසඳ, ළසඳගේ යුවළ=ළසඳයුවළ, පැහැසර වූයේත් එමය ළසඳයුවළ

වූයේත් එමතුයි=පැහැසර ළසඳපුවල, ඒ-පැහැසර ලසඳ පුව ළෙක්, විබත් සමස් වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් වෙසෙ සුන් සමස්;

මේ පද්‍යය වාක්‍යාර්ථෝපමා අද්භූතෝපමා යන අලඞ්කාර දෙකින් අල ඞ්කෘතයැ. පළමුවන අලඞ්කාරයෙහි උපමෙයවූ අධරයුග්මයට තිඹුල්මල උපමායැ. උපමෙයවූ දංෂ්ට්‍රායුග්මයට සේහසවැල උපමායි. දෙවන අලඞ්කාර යෙහි අධරයුග්මයට සඳවලංපෙල උපමායැ. දංෂ්ට්‍රායුග්මයට ළසඳපුවළ උපමායි.

**වාක්‍යාර්ථෝපමාලක්ෂණ,**

> වාක්‍යාර්ථෙනෙව වාක්‍යාර්ථඃ කොපියදුපමීයතෙ
> එකානෙකෙව ශබ්දත්වාත්සාවාක්‍යාර්ථෝපමා ද්විධා'ති.

කිසි වාක්‍යයක් වාක්‍යාර්ථයකින්ම අනුමිතකරනු ලැබේද ඕතොමෝ වාක්‍යාර්ථෝපමා නම්. එය එක් අනෙක් ඉව ශබ්දයන්ගේ අස්තිත්වයෙන් දෙවැදෑරුම් වේ.

**අද්භූතෝපමාලක්ෂ්‍යලක්ෂණ,**

> යදිකිඤ්චිද්භවෙත් පද්මං සුභ්‍රැවිභ්‍රාන්ත ලොචනම්
> තත්තෙ මුඛශ්‍රියං ධත්තා මිත්‍යසාවද්භූතොපමා'ති.

පිත්වත්වූ යහපත් භ්‍රෑ ඇත්තිය ඉදින් චචලවත්හාවූ ඇස් ඇති කිසියම් පද්මයක් වන්නේනම් ඒ පද්මය තිගේ මුඛශොභාව උසුලාවයි යන මේ තොමෝ අද්භූතොපමා නම් යනු භාවයි.

85 ක නා මිණිවලලු නැඟිරැස් මල් කැනැ ති
ම නා දිගු ඇඟිලි නව තඹ ළපලු ඇ ති
ද නා කැමැති දෙනපලඹන එසුරප ති
දි නා දිමුතු අතුසිරි සුරතුරු පැවැ ති

85 කනාමිණිවලලු, කනකමාණික්‍ය නිර්මිතවූ කටකයෙන්; නැඟි, උද්ගතවූ; රැස්, රශ්මි නමැති; මල්කැනැති, පුෂ්පස්තව කයන් ඇත්තාවූ; මනා, යහපත්වූ; දිගුඇඟිලි, දීර්ඝාඞ්ගුලි නමැති; නව, අභිනවවූ; තඹ, රක්තවර්ණවූ; ළපලුඇති, බාලපල්ලවයන් ඇත්තාවූ; දනා, ජනයන්ට; කැමති දෙන, අභිමතවස්තුප්‍රදානය කරන්නාවූ; එසුරපති පලඹන, ඒ විභීෂණසුරේන්ද්‍රයාගේ ප්‍රලම්බ හස්තයතෙම; සුරතුරු පැවැති, කල්පවෘක්ෂයෙහි ප්‍රවෘත්තවූ; දිමුතු, දීප්තිමත්වූ; අතුසිරි, ශාඛාවන්ගේ විභූතිය; දිනා, ජය ගන්නේයි.

**'පලඹන දිමුතු අතුසිරි දිනා'** යනු ක්‍රි: කා: පඃ සඃ

**උ, වි—දිනා** යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, **පලඹන** යනු උක්තකර්තෘයි, දිමුතු අතුසිරි යනු අනුක්තකර්මයි, පැවැති යනු කර්මවිශෙෂණයි, සුරතුරු යනු අනුක්තාධාරයි, එසුර

පති යනු අනුක්තසම්බන්ධයි. දෙන යනුද කනාමිණිවළලුනැඟි රුස්මල්කැනැති යනුද මනා දිගුඇඟිලිනවතඹලපලු ඇති යනුද කර්තෘවිශේෂණයි, කැමැති යනු දෙන යන අන්ක්‍රියාවට අනුක්තකර්මයි, දනා යනු අනුක්ත සම්ප්‍රදානයි.

ස, වි—කනාද මිණිද=කනාමිණි, කනාමිණියෙන් කළ වළලු=කනාමිණිවළලු, නැඟියේත් එමන රුස්වූයේත් එම්තුයි=නැඟි රුස්, කනාමිණිවළලුයෙන් නැඟිරුස්=කනාමිණිවළලු නැඟිරුස්, කනාමිණිවළලුනැඟි රුස්ම මල්කැන්=කනාමිණිවළලුනැඟි රුස් මල්කැන්, කනාමිණිවළලුනැඟිරුස් මල්කැන් ඇතියේ යමක් හටද ඒ=කනාමිණි වළලු නැඟි රුස් මල්කැනැති, දරුත් සමස් විබත් සමස් වෙසෙසුන් සමස් විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් අන් අරුත් සමස්; දිගුවූ ඇඟිලි=දිගුඇඟිලි, මනාවූ දිගු ඇඟිලි=මනාදිගුඇඟිලි, තඹවන් ලපලු=තඹලපලු, නවවූ තඹ ලපලු=නවතඹලපලු, මනාදිගුඇඟිලිම නවතඹලපලු=මනාදිගු ඇඟිලි නවතඹලපලු, මනාදිගුඇඟිලි නවතඹ ලපලු ඇතියේ යමක් හටද ඒ මනාදිගු ඇඟිලි නවතඹලපලු ඇති, වෙසෙසුන් සමස් ගැබ් අන්අරුත් සමස්; පලඹවූයේද එම අතවූයේද=පලඹත, වෙසෙසුන් සමස්; සුරනට පති=සුරපති, එද එම සුරපතිද=එසුරපති, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; අතුන්ගේ සිරි=අතුසිරි, විබත් සමස්; පුරන්ගේතුර=පුරතුර, එහි පුරතුරු, විබත් සමස්;

### රූපකෝපමා සංසෘෂ්ටියි.

86 පා නා සෙනේ සසිනිඳු මදලස බැ ල්ම
ගා නා නිමහමෙව් දෙවඟන නෙත් කැ ල්ම
නා නා සුරිඳු පුළුපුර සිරිසඳ ඇ ල්ම
නු නා කෙළන ගලතල වැනි ඉඳුනි ල්ම

86 දෙවඟන, දිව්‍යාඞ්ගනාවන්ගේ; සෙනේ පානා, ස්නේහය ප්‍රකාශ කරන්නාවූ; සසිනිඳු, සුස්නිග්ධවූ; මදලසබැල්ම, මන්දාලස්‍ය නිරීක්ෂණය කරණකොටගෙන; ගානා, ආලේප කරන්නාවූ; නිමහමෙව්, සමාපත්තිකර්මයෙහි කරනලද අඤ්ජනරේඛාවන් හා සමානවූ; නෙත් කැල්ම, නෙත්‍රකාන්ති නමැති (ජලයෙන්); නානා, ස්නානය කරන්නාවූ; සුරිඳු පුළුපුර, (ඒ) සුරේන්ද්‍රයාගේ පෘථුලවූ වක්ෂඃස්ථලය; සිරිසඳ, ශ්‍රී කාන්තාව විසින්; ඇල්ම, අනුරාගය; නුනා, විමුක්ත නොකොට; කෙළනා, ක්‍රීඩාකරන්නාවූ; ඉඳු නිල්ම, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ; ගලතල වැනි, ශිලාතලයක් මෙනි,

'සුරිඳුපුළුපුර ගලතල වැනි වේ' යනු ක්‍රි: කා: ප: ස:

 උ, වි—වේ යනු අධ්‍යාහෘත ක්‍රියායි, සුරිඳුපුළුලුර යනු උක්ත කර්තෘයි, ගලතල යනු උපමාකර්තෘයි, වැනි යනු උපමාද්‍යොතක වූයෙහි අව්‍යයයි, ඉඳුනිල්ම යනුද කෙළන යනුද උපමාකර්තෘ විශෙෂණයි, සිරිසඳ යනු කෙළන යන ක්‍රියාවට අනුක්ත කර්තෘයි, කුනා යනු පූර්වක්‍රියායි, ඇල්ම යනු ඊට අනුක්ත කර්මයි, නානා යනු කර්තෘ විශෙෂණයි, නෙත්කැල්ම යනු අනුක්ත කරණයි, නිමහම් යනු උපමාකරණ විශෙෂණයි. එව් යනු උපමාද්‍යො තකයෙහි අව්‍යයයි, ගානා යනු උපමාකරණ විශෙෂණයි, සසි නිඳු මදලසබැල්ම යනුද අනුක්ත කරණයි, පානා යනු කරණ විශෙෂණයි, සෙනේ යනු පාතා යන අසීක්‍රියාවට අනුක්ත කර්මයි, දෙවඟන යනු අනුක්ත සම්බන්ධයි.

ස, වි—දෙවියන්ගේ අඟන=දෙවඟන, විබත්සමස්; සිනිඳු සහවූයේ=සසිනිඳු, අන් අරුත් සමස්; නෙතුන්ගේ කැල්ම=නෙත් කැල්ම, විබත් සමස්; සුරනට ඉඳු=සුරිඳු, පුළුල්වූයේද එම උර වූයේද=පුළුලුර, සුරිඳුගේ පුළුලුර=සුරිඳුපුළුලුර, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; සිරිවූවාද ඔම සඳවූවාද= සිරිසඳ, වෙසෙසුන් සමස්; ගල්හුගේ තල=ගල්තල, විබත්සමස්;

සුරිඳුපුළුලුර සිරිසඳ ඇල්ම—විභීෂණ සුරෙන්‍ද්‍රයාගේ පෘථුලවූ වක්‍ෂ ස්ථලයෙහි ශ්‍රී කාන්තාව අනුරාගය නොහැර ක්‍රීඩාකරන බැව් මෙයින් ප්‍රකාශිතයි. ශ්‍රීකාන්තාව නම් විෂ්ණු පත්නිවූ දෙවඟනකැයි බාහිර මතයෙහි ප්‍රකාශයි, ඕ තොමෝ විෂ්ණුගේ වක්‍ෂස්ථලයෙහි වසන්නිය එහෙයින් විෂ්ණුගේ උරඃස්ථලය අතිශය සොබනේය. ශොභමාන පෘථුල උරඃස්ථලයක් හුගේ වර්ණිතාවෙහි ශ්‍රීකාන්තා සම්බන්ධය ඇති බැව් කීම කව්සමයෙහි ප්‍රසිද්ධයි.

## උපමාලඞකාරයි.

87 ල කු ළු පුළුලුකුළු වටබිම එසුරවි රූ
වෙ ර ළු මිණිකැලුම් පතරින් මෙවුලතු රූ
නැ ඹු ළු සොඳුරු සසිලිටු වටොර රඹ තු රූ
බැ බ ළු සිලිල් ඉසිනා විලස සිරි දූ රූ

87 එසුරවිරූ, ඒ විභීෂණනම් සුරෙශ්වරයාගේ; පුළුලුකුළුවට බිම, පෘථුලවූ ශ්‍රොණිවෘත්ත නමැති භූමියෙහි; ලකළු, අලඞකෘත වූ; මෙවුලතුරූ, මෙඛලාභාරයෙහි; වෙරළුමිණිකැලුම්පතරින්, වෛදූර්‍ය්‍යමාණික්‍යකාන්ති සමූහය කරණකොටගෙන; නැඹුළු, මහත්වූ; සොඳුරූ, සුන්‍දරවූ; සසිලිටු, සුශ්ලිෂ්ටවූ; වටොරරඹතුරූ, වෘත්තවූ ඌරූ (මන්වය) නමැති රම්භාවෘක්‍ෂයෝ දෙදෙන; බැබළු, භ්‍රාජිතවූ; සිලිල්ඉසිනා විලසිරි, ජලසෙවනය කරනුලබන්නාවූ; විලාසශොභාව, දූරූ, ධැරූවාහුයි.

උ, වි—දුරු යනු අනුකල් අන්කරු බුහුවිස් කතෘකිරියයි, වතෝරරඹතුරු යනු උක්තකර්තෘයි, විලසසිරි යනු අනුක්ත කර්මයි, ඉසිනා යනු කර්මවිශෙෂණයි, සිලිල් යනු ඉසිනා යන ක්‍රියාවට අනුක්තකර්මයි, බැබළ යනු සිලිල් යන කර්මයට විශෙෂණයි. සසිලිවු යනුද සොඳුරු යනුද නැඹුළ යනුද කර්තෘවිශෙෂණයි, වෙරළ මිණි කැලුම් පතරින් යනු අනුක්ත කරණයි, මෙවුලතුරු යනු අනුක්තාධාරයි, ලකුළ යනු ආධාර විශෙෂණයි, පුළුලුකුළ වට බිම යනු අනුක්තාධාරයි, එසුරවිරු යනු අනුක්තසම්බන්ධයි,

ස, වි—පුළුල්වූයේද එම උකුළුවූයේද=පුළුලුකුළ, වටම්බිම= වටබිම, පුළුලුකුළු වටබිමවූයේ යමක්හටද හෙතෙම=පුළුලුකුළ වටබිම, වෙසෙසුන් සමස් ගැබි අන්අරුත් සමස්; සුරද එම විරුද=සුරවිරු, එද එම සුරවිරුද=එසුරවිරු, වෙසෙසුන් සමස් ගැබි වෙසෙසුන් සමස්; වෙරළද එම මිණිද=වෙරළමිණි, වෙරළ මිණිහුගේ කැලුම්=වෙරළමිණිකැලුම්, වෙරළමිණි කැලුම්හුගේ පතර=වෙරළමිණිකැලුම්පතර, වෙසෙසුන් සමස් විබත් සමස් ගැබි විබත් සමස්; මෙවුල්හුගේ අතුරු=මෙවුලතුරු, එකි-මෙවුලතුරු, විබත් සමස්; සිලිවු සහවූයේ=සසිලිවු, අන් අරුත් සමස්; රඹ පිළිබඳ තුරු=රඹතුරු, වතොරම රඹතුරු=වතොර රඹතුරු; විබත් සමස් ගැබි වෙසෙසුන් සමස්; විලස්හුගේ සිරි= විලසසිරි, විබත් සමස්;

## රූපකොපමා සංසෘෂ්ටියි.

88 ව ද නා සුරන් කිරුළඟ රුවන කැලුමෙ නා
බ ද නා කොමළ ලතුවිලසල රතින් ම නා
ම ඬ නා බැවින් සියපත එගිම්පතුලෙ නා
බියෙ නා ලතඹ හෝපලු සදිසි වෙවුල නා

88 වඳනා, නමස්කාර කරන්නාවූ; සුරන්, දෙවතාවන්ගේ; කිරුළඟ, කිරීටාග්‍රයෙහි; රුවනකැලුමෙනා, (පද්මරාග) මාණික්‍ය කාන්තීන් හෙතුකොටගෙන; බඳනා, බන්ධනය කරන්නාවූ; කොමල, මනොඥවූ; ලතුවිලසළ, අලක්තකරසවිලාසය එළවූ; රතින්, රක්තවර්ණයෙන්; මනා, යහපත්වූ; එගිම්පතුලෙනා, ඒ ස්වාමිහුගේ පාදතලයෙන්; සියපත, පද්මය දෙහෝ නොහොත් පද්මපීඨය; මඬනාබැවින්, මර්දනය කරන භාවයෙන්; ලතඹ හෝ පලු, බාලවූ රක්තාශොකපල්ලවයෝ; බියෙනා, භීතියෙන්; වෙවුලනා සදිසි, කම්පාවන්නවුන් වැන්නාහුයි.

'ලතඹ හෝපලු වෙවුලනා සදිසි වෙන්' යනු ක්‍රි: කා: පැ: සැ:

උ, වි—වෙත් යනු අධ්‍යාහෘත ක්‍රියායි, ලතඹ හෝපලු උක්ත කර්තෘයි, වෙවුලනා යනු උපමාකර්තෘවිශෙෂණයි, සදිසි යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි, මඩනාබැවින් යනු අනුක්ත කරණයි, සියපත යනු මඩනා යන ක්‍රියාවට අනුක්තකර්මයි, බිසෙනා යනු අනුක්තකරණයි, එහිමි පතුලෙනා යනු මඩනා යන්නට අනුක්තකරණයි, මනා යනු ඊට විශෙෂණයි, රතින් යනු අනුක්ත කරණයි, බඳනා යනුද කොමල යනුද ලතුවිලසල යනුද කරණ විශෙෂණයි; රුවනසැලුමෙනා යනු හෙත්වර්ථයෙහි තෘතීයායි, කිරුළඟ යනු අනුක්තාධාරයි, සුරන් යනු අනුක්ත සම්බන්ධයි, වදනා යනු සම්බන්ධවිශෙෂණයි.

ස, වි—කිරුළුනුගේ අග=කිරුළග, විබත් සමස්; පත්සියයක් ඇතියේ යමක්හටද හෙතෙම=සියපත්, ඔහු-සියපත, අන්අරුත් සමස්; එද එම හිමිද=එහිමි, එහිමිහුගේ පතුල=එහිමි පතුල, එන්-එහිමි පතුලෙන්, වෙසෙසුන් සමස් ගැබි විබත් සමස්; ලවුයේද එම තඹවුයේද=ලතඹ, හෝහුගේ පලු=හෝපලු, ලතඹවුයේද එම හෝපලුවුයේද=ලතඹහෝපලු, වෙසෙසුන්සමස් විබත්සමස් ගැබි වෙසෙසුන් සමස්;

## උත්ප්‍රෙක්ෂා ලඞ්කාරයි.

89 වෙසෙසින් පහන් පැහැසර ගැඹුරු පිවිතු රැ
බැලුවන් ඇලුම් කරවන යළිදු බියක රැ
සිරිපින් රුවන් පිරි එසුරිඳු සයුර යු රැ
මුවෙකින් කියා නිමවිය හැකිද රුසි රැ

89 වෙසෙසින්, විශෙෂයෙන්; පහන්, ප්‍රසන්නාවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ගැඹුරු, ශීතොෂ්ණාදිදුඃඛපීඩා සහනය කරන හෙයින් ගම්භීරවූ; පිවිතුරු, පවිත්‍රවූ; බැලුවන්, අවලොකනය කරන්නවුන්; ඇලුම්කරවන, ප්‍රෙම ඇතිකරවන්නාවූ; යළිදු, නැවතද; බියකරු, භයඞ්කරවූ; සිරිපින්, ශ්‍රීසෞභාග්‍යපුණ්‍යසම්පත්ති නමැති; රුවන් පිරි, රත්නයෙන් සම්පූර්ණවූ; නොහොත්=සිරි, ලක්ෂ්මියගෙන් භා; පින්, පවිත්‍රවූ; රුවන්, රත්නයෙන්; පිරි, සම්පූර්ණවූ; සයුරසුරු, සාගරයට බඳුවූ ආකාර ඇති; එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; රුසිරු, රූපසම්පත්තිය; මුවකින්, එකමුඛයෙකින්; කියා, කථනය කොට; නිමවියහැකිද, සමාප්තියට පැමිණවිය හැක්කේද? (නොහැක්කේ මැයි.)

'හැකිවෙද' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වෙ යනු අධ්‍යාහෘත ක්‍රියායි, හැකි යනු උක්තකර්තෘයි, ද යනු ප්‍රශ්නයෙහි නිපාතයි, නිමවිය යනු අසම්භාව්‍ය ක්‍රියායි, කියා යනු පූර්වක්‍රියායි, රුසිරු යනු ඊට අනුක්තකර්මයි, එසුරිඳු

යනු අනුක්තසම්බන්ධයි, සයුරයුරු යනු සම්බන්ධ විශේෂණයි, පිරි යනු සුරිඳු යන්නට හෝ සයුර යන්නට විශේෂණයි, සිරිපින් රුවන් යනු පිරියන්නට අනුක්තකරණයි, කිඤ්කරු යනුද කරවන යනුද පිවිතුරු යනුද ගැඹුරු යනුද පහන් යනුද පැහැසර යනුද සුරිඳු යන්නට හෝ සයුර යන්නට විශේෂණයි, වෙසසින් යනු විශේෂණාර්ථයෙහි තෘතීයායි, මුවෙකින් යනු අනුක්තකරණයි, ඇලුම් යනු කරවන යන ක්‍රියාවට අනුක්තකර්මයි, බැලුවන් යනු අනුක්ත සම්බන්ධයි, නොහොත් කරවන යන්නට ප්‍රයෝජ්‍ය කර්තෘයි, සළිඳු යනු නිපාත සමුදායයි.

ස, වි—සිරිවූයේද එම පින්වූයේද=සිරිපින්, සිරිපින්ම රුවන්= සිරිපින් රුවන්, වෙසෙසුන් සමස් ගැබ් වෙසෙසුන් සමස්; (නොහොත්) පින්ම රුවන්=පින්රුවන්, සිරිද පින්රුවන්ද=සිරි පින්රුවන්, සිරිපින් රුවනින් පිරි=සිරිපින් රුවන් පිරි; වෙසෙසුන් සමස් ගැබ් දෑරුත් සමස් ගැබ් විබත් සමස්; සුරනට ඉඳු=සුරිඳු, එද එම සුරිඳුද=එසුරිඳු, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; සයුරට බඳු අයුරු යමකුගේද හෙතෙම=සයුරයුරු, අන් අරුත් සමස්;

### ශ්ලේෂාලඞ්කාරයි.

90 ලෙව් හට තමන් නමකිව රිසිදෙන වි සි ති
දෙ ව් තුරු සුරබි සුරිමිණි සරිද කෙලෙ සි ති
ප ව් රෝ දුකුදු දුරලන පොකුරඹ හ සි ති
දෙ ව් වෙද ඇසෙන පමණෙකි වියතුන් බ සි ති

90 තමන් නම කිව, තමන්ගේ (විභීෂණයයි යන) නාමය උච්චාරණය කළකල්හි; ලෙව්හට, ලොකවාසීන්ට; රිසිදෙනවිසිනි, අභිමතාර්ථ ප්‍රදානය කරන හෙයින්; දෙව්තුරු, මන්දාරාදි කල්ප වෘක්ෂය; සුරබි, කාමධෙනුය; සුරමිණි, චින්තාමාණික්‍යය යන මොහු; කෙලෙසිනි, කවර ප්‍රකාරයෙකින්; සරිද, සදෘශ වෙත්ද; පොකුරඹහසිනි, පුෂ්කරපත්‍රයෙහි (ලග්න නොවන්නාවූ) ජලයක් මෙන්; පව්රෝදුකුදු, පාපදුඃඛය හා රොගදුඃඛයද (යන දෙෂයෙන්;) දුරලන, නිරාකරණය කරන්නාවූ; දෙව්වෙද, නාසත්‍යයන යන දෙවවෛද්‍යයන් දෙදෙනකු (ඇතැයි කියා); වියතුන් බසිනි, ශාස්ත්‍රකාරකයන්ගේ වචනයෙන්; ඇසෙන පමණෙකි, ශ්‍රවණ විෂය වන මාත්‍රයෙක්මැයි.

‘ඇසෙන පමණෙක් වේ’ යනුද
‘දෙව්තුරු සුරබි සුරමිණි සරි වෙත්’ යනුද ක්‍රි: කා: ප: ස:

උ, වි—වේ යනු අධ්‍යාහෘත ක්‍රියායි, ඇසෙන පමණෙක් යනු උක්තකර්තෘයි, දෙව්වෙද යනු අනුක්තසම්බන්ධයි, බසිනි යනු අනුක්තකරණයි, වියතුන් යනු අනුක්තසම්බන්ධයි, දුරලන යනු

දෙව්වෙද යන්නට විශෙෂණයි, (නොහොත්) හෙත්වර්ථයෙහි පචමියි, පව්රෝදුකුදු යනු දුරලන යන අසමාප්තක්‍රියාවට අනුක්ත කර්මයි, පොකුරඹහසිති යනු අනුක්තකරණයි,

වෙත් යනු අධ්‍යාහෘත ක්‍රියායි, දෙව්තුරුසුරබිසුරමිණී යනු උක්තකර්තෘයි, සදි යනු කර්තෘවිශෙෂණයි, ද යනු ප්‍රශංසායෙහි අව්‍යයයි, සොලෙසිනි යනු අනුක්තකරණයි, දෙනාවිසිනි යනු හෙත්වර්ථයෙහි කරණයි, පිසි යනු දෙන යන අසමාප්තක්‍රියාවට අනුක්තකර්මයි, කිව යනු කාලාර්ථයෙහි අසම්භාව්‍යක්‍රියායි, නාම යනු ඊට අනුක්තකර්මයි, ලෙව්හට යනු අනුක්තසම්ප්‍රදානයි, කමන් යනු අනුක්තසම්බන්ධයි.

ස, වි—දෙවියන්ගේ තුරු=දෙව්තුරු, සුරන්ගේ මිණි=සුරමිණි, දෙව්තුරුද සුරබිද සුරමිණිද=දෙව්තුරු සුරබි සුරමිණි, විබත් සමස් ගැබ් ද්වන්ද්ව සමස්; පව්ද රෝද=පව්රෝ, පව්රෝයෙන්වූ දුක්=පව්රෝදුක්, එය-පව්රෝදුකුදු, ද්වන්ද්ව සමස් ගැබ් විබත් සමස්; පොකුරෙහි අඹ=පොකුරඹ, පොකුරඹගේ අහස=පොකුරඹ හස, ඉති-පොකුරඹහසිති, විබත්සමස් ගැබ් විබත්සමස්; දෙව් වූයේද එම වෙදවූයේද=දෙව්වෙද-වෙසෙසුන්සමස්;

## උපමාලඞකාරයි.

91 ම න් පිනවන යසසිරි තෙදනැණ විපු ල
සෙන් යුදජය රජබව තනතුරු සිය ල
දෙ න් තෙන් පැතුවිට සුබවැඩ දිගා බ ල
පි න් නම් සතුන්කළ දෙව්රජමය මෙක ල

91 මන්පිනවන, මනඃප්‍රීණනය කරවන්නාවූ; යස, කීර්තිය; සිරි, ඓශ්වර්යය; තෙද, තෙජසය; විපුල නැණ, මහත්වූ ප්‍රඥාය; සෙන්, සෙනාව; ‍යුදජය, යුඩයෙහි ජයගැන්මය; රජබව, රාජ්‍ය ප්‍රාප්තිය; සියලතනතුරු, (සෙනාපත්‍යාදි) සකලස්ථානාන්තරය; සුබවැඩ, මඞගල්‍යාභිවෘඩිය; දිගා, දීර්ඝායුෂය; බල, කායශක්තිය යන අභිමතාර්ථයන්; පැතුවිට, ප්‍රාර්ථනා කළ කාලයෙහි; දෙන්නෙන්, ප්‍රදානය කරනහෙයින්; සතුන් කළ පින් නම්, සත්‍වයන්විසින් කරනලද (අනවද්‍ය ඉෂ්ටවිපාක ලක්‍ෂණවූ) කුශලය නම්; මෙකල, මේ කාලයෙහි; දෙව්රජමය, විභීෂණ දිව්‍යරාජයා මැයි.

'පින් නම් දෙව්රජම වේ' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වේ යනු අධ්‍යාහෘතක්‍රියායි, පින් යනු උක්ත විකෘති කර්තෘයි, දෙව්රජ යනු උක්ත ප්‍රකෘති කර්තෘයි, ම යනු අවධාරණයෙහි අව්‍යයයි, නම් යනු ප්‍රසිඬාර්ථයෙහි අව්‍යයයි, මෙකල

යනු කාලාපිශයෙහි අනුක්තාධාරයි, කළ යනු ප්‍රකෘතිකර්තෘ විශෙෂණයි, සතුන් යනු කල යන අතීක්‍රියාවට අනුක්ත කර්තෘයි, දෙන් නෙන් යනු හෙතුවර්ථයෙහි අනුක්ත කරණයි, සුබවැඩදිගාබල යනුද මන්පිනවනයසසිරිතෙදනැණවිපුලසෙන්යුදජයරජබව තනතුරුසියල යනුද දෙන්නෙන් යන අතීක්‍රියාවට අනුක්ත කර්මයි, පැතුවිට යනු කාලාපිශයෙහි අනුක්තාධාරයි.

ස, .වි—මනපිනවන්නේ=මන්පිනවන, උපපදසමස්, යසද සිරිද තෙදද නැණවිපුලද සෙන්ද යුදජයද රජබවද තන තුරුසියලද=යසසිරිතෙද නැණවිපුලසෙන්යුදජය රජබවතනතුරු සියල, මන්පිනවන්නේත් එමය යසසිරි තෙද නැණ විපුල සෙන් යුද ජය රජබව තනතුරු සියලවූයේත් එමනුයි=මන්පිනවනයස සිරිතෙදනැණවිපුලසෙන්යුදජයරජබවතනතුරුසියල, දුරුත් සමස් ගැබි වෙසෙසුන්සමස්; සුබවූයේද එම වැඩවූයේද=සුබවැඩ, සුබවැඩද දිගාද බලද=සුබවැඩදිගාබල, වෙසෙසුන් සමස්ගැබි දුරුත්සමස්; දෙවිනමරජ=දෙව්රජ, විබත්සමස්;

තුල්‍යයොගිතාලඞ්කාරයි.

92 තු න් ලෝ තමා නතුකළ රවුළු සොහොවු රු
තු න් කල් බලා රම්ඳුටවූ ඉටු මිතු රු
තු න් වේ ඇදුරු පුලතිසිකුල මිණි මිතු රු
තු න් විමෙකම වඳුව එසුරිඳු පා තඹු රු

92 තුන්ලෝ, ස්වර්ග මර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත භුවනත්‍රය වාසීන්; තමා නතුකළ, තමහට අවනතකළාවූ; රවුළු සොහො වුරු, රාවණමහා රාජයාහට සහොදරවූ; තුන්කල් බලා, (භූත භවිෂ්‍යද් වර්තමානය යන) කාලත්‍රය පරීක්‍ෂා කොට; රම්ඳුට, ශ්‍රී රාමචන්‍ද්‍රයාහට; ඉටුමිතුරුවූ, කල්‍යාණ මිත්‍රවූ; තුන්වේඇදුරු, (ඍග් යජුස් සාම යන) වෙදත්‍රයට ගුරුවූ; පුලතිසිකුල, පුලස්ත මහර්ෂිහුගේ වංශයට; මිණිමිතුරු, රත්නප්‍රදීපායමානවූ; එසුරිඳු, ඒ (විභීෂණ) දෙවරාජයාගේ; පාතඹුරු, පාදපද්මය; තුන්විමෙකම, ත්‍රිවාරයක්ම; වඳු, නමස්කාර කර.

'(තෝ) පාතඹුරු වඳුව' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වඳුව යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, පාතඹුරු යනු අනුක්තකර්මයි, තුන්විමෙක යනු ක්‍රියා විශෙෂණයි, ම යනු අවධාරණයෙහි අව්‍යයයි, එසුරිඳු යනු අනුක්ත සම්බන්ධයි, තුන්වේ ඇදුරු පුලතිසිකුල මිණි මිතුරු යනුද සොහොවුරු යනුද ඉටුමිතුරුවූ යනුද සම්බන්ධවිශෙෂණයි,

රම්ඳුට යනු අනුක්ත සම්බන්ධයි, බලා යනු පූර්ව ක්‍රියායි, තුන්කල් යනු ඊට අනුක්ත කර්මයි, රවුළු යනු අනුක්ත සම්බන්ධයි, කල යනු රවුළු යන්නට විශේෂණයි, තුන්ලෝ යනු කල යන ක්‍රියාවට අනුක්ත කර්මයි, නතු යනු ඊට විශේෂණයි, තමා යනු අනුක්ත සම්බන්ධයි.

ස, වි—ලෝ තුනක් එක්කොට සලකන ලදහු=තුන්ලෝ, වෙසෙසුන් සමස්; කල්තුනක් එක්කොට සලකනලදහු=තුන්කල්, වෙසෙසුන් සමස්; රම්වූයේද හෙම ඉඳුවූයේද=රම්ඳු, ඔහුට-රම්ඳුට, විබත්සමස්; ඉටුවූයේද එම මිතුරුවූයේද=ඉටුමිතුරු, වෙසෙසුන් සමස්; වේ තුනක් එක්කොට සලකනලදහු=තුන්වේ, තුන්වේ යට ඇදුරු=තුන්වේ ඇදුරු, පුලතිවූයේද හෙම ඉසිවූයේද පුලතිසි, තුන්වේ ඇදුරුවූයේද එම පුලතිසි වූයේද=තුන්වේ ඇදුරු පුලතිසි, ඔහුගේ කුල=තුන්වේ ඇදුරු පුලතිසි කුල, මිණියෙන් කල මිතුරු=මිණිමිතුරු; තුන්වේ ඇදුරු පුලතිසිකුලට මිණිමිතුරු වැනිහුයි=තුන්වේ ඇදුරු පුලතිසිකුල මිණිමිතුරු, වෙසෙසුන් සමස් විබත්සමස් වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් අන් අරුත් සමස්; විටතුනක් එක්කොට සලකනලදහු=තුන්විට, එහි-තන් විමෙක, වෙසෙසුන් සමස්; සුරනට ඉඳු=සුරිඳු, පාම තඹුරු=පාතඹුරු, සුරිඳුගේ පාතඹුරු=සුරිඳු පාතඹුරු, විබත් සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්;

**රවුළු**—රාවණ තෙමේයි, මොහු පුලස්ති සෘෂිවරයාගේ මුණුබුරෙකි, මොහුගේ පරම්පරා කථාව පුරාණෝක්ත පරිදි මෙසේ දතයුතු. ආදි කල්පයෙහි මනු නම් ස්වයම්භූ පුරුෂයෙක් විය. ශතරූපා නම් කන්‍යාවක් තොමෝ ඔහුගේ භාර්‍යා වූවා ප්‍රියව්‍රත, උත්තානපාද, යන නම් ඇති පුතුන් දෙදෙනෙකුන් හා 'දෙවහූති, ආකූති, ප්‍රසූති,' යන නම් ඇති දූන් තුන්දෙනෙක්ද ලද්දීය. මොවුනතුරෙන් දෙවහූති තොමෝ කර්දම නමැත්තා විසින් පාවාගත්තා ලද්දී කපිල මහාමුනිවරයාද දුහිතෘන් නවදෙනෙක්ද ප්‍රසූත කළා. මේ පරම්පරාවෙහි පුලස්ති සෘෂිවරයා ජනිතවිය. පුලස්ති සෘෂිහුගේ පුත්‍ර තෙමේ විශ්‍රවස් නම්. කෛකසී තොමෝ විශ්‍රවස්හුගේ භාර්‍යා වූවාය. ඔවුහු රාවණ කුම්භකර්ණ විභීෂණ යන නම් ඇති පුතුන් තුන්දෙනෙක්ද ශූර්පනඛා නම් දියණියක්ද ලදහ. මොවුන්ගෙන් දෙටු තැනැත්තාවූ රාවණ තෙමේ අතිශය වික්‍රමාන්විත වූයේ නානා ශාස්ත්‍රයන්හි පාරප්‍රාප්ත වූයේද විය. විශේෂයෙන් රසායන ශාස්ත්‍රයෙහි හසළ බුද්ධිමතෙකැයි සිතිමට කරුණු පෙනේ. ස්වර්ග, මර්ත්‍ය, පාතාල, යන ලෝකත්‍රයම ජයගෙන විසූබැව් "තුන්ලෝ තමා නතුකල රවුළු" යන මේ කීමෙන්ම පෙනේ. මොහු ඉස් දසයකින් හා අත් විස්සකින්ද යුක්ත වූවෙකි. මොහුගේ ප්‍රධානරාජධානිය නම් අටදිග රජනවිය වාර අටක්ද සාරලක්ෂයක් මහාවීථින්ද නවකෙළක් දෙවාලයන්ද තුන්කෙළක් අට්ටාලද ඇති මහාප්‍රාසාදදී නානාවිධ නගරාඞ්ගයන්ගෙන් හෙබි දෙව්පුරය පරදවා සිටි ලඞ්කා පුරයයි.

**රම්ඳු**—පෙර දඹදිව දසරථ නම් සූර්‍ය්‍යවංශික රජෙක් විය. ඔහට කෞශල්‍යා, කෛකෙයී, සුමිත්‍රා යයි බිසෝවරු තුන්දෙනෙක් වූහ. ඔවුන්ට පුත්‍රයන් නොලත්හෙයින් පසුකාලයෙහි එක් යාගයක් කොට පුත්‍රයෝ සතර දෙනෙක්

ලබන ලද්දැහ. ඔව්හු නම් රාම, ලක්ෂමණ භරත ශත්‍රුඝ්න යන සොහොයුරුයි. රාම තෙමේ අති වික්‍රමාන්විතවූයේ රූපශ්‍රීයෙන්ද යුක්ත වූයේය. ඒ රවිදුගේ භාර්‍ය්‍යාව සීතා නම්. ඔහු පිතෘ ආඥායෙන් සිය භාර්‍ය්‍යාවත් ලක්ෂමණත් සමඟ වනයෙහි වසනකල තුන්ලෝ ජයගෙන වශග කළ රාවණ තෙම සීතාව සොරාගෙන ලක්දිවට පැමිණියේය. ඒ නිමිත්ත කොට ඔහු රාවණයා සමඟ බිහිසුණු සටනක් කොට බලසම්පන්න රාවණයා මරා සීතාව රැගෙන පෙරළා සියරට ගියේය. ඒ යුද්ධයෙහිදී රාවණයාගේ සහෝදරවූ විභීෂණ රාමහට මිත්‍ර වූයේය. ඒ මිත්‍රභාවය මේ කවියෙහි ප්‍රකාශයි.

රාවණාදේර්බාධායා චතුර්භූත් ස්වයං හරිඃ
රාමෙ දශරථාද්‍රාමඃ කෞශල්‍යායාං බභූවන.

යනු රාමායණොක්ත හෙයින් රාමතෙම විෂ්ණුගේ එක් අවතාරයක්යයි වෛෂ්ණවයෝ සලකත්.

## උපමාරූපකගර්භකලදන්තාලංකාරයි.

93 අ න තු රු   බලා අදහස අවසර විග   ස
යු හු සු ලු   නොවී සලකා පසු පළමු බ   ස
පෙ ර දූ රි   කොට සුරිඳුට තියු වදන් ගො   ස
සැ ල ක ර   නගිය කටයුතු සිට එකත් ප   ස

93 අනතුරු, තදනන්තරවූ; අදහස, (ඒ දෙවරාජයාගේ) අධ්‍යාශයද; අවසරවිගස, අවකාශක්ෂණයද; බලා, අවලෝකනය කොට; යුහුසුලු නොවී, ත්වරිතභාවයෙන් චාපල්‍යයට නොපැමිණ; පසුපළමුබස, පූර්වාපර වාක්‍ය (සම්බන්ධය); සලකා, විමර්ශනය කොට; සුරිඳුට, (ඒ) සුරේන්ද්‍රයාහට; තියුවදන්ගොස, ස්තුතිවචනඝෝෂණය; පෙරදූරිකැර, පූර්වඞ්ගම කොට; එකත්පස සිට, එකපාර්ශ්වයෙක්හි අවස්ථිතවූ; නගිය කටයුතු, නා ගියාවූ කර්තව්‍යය; සැලකර, විඥාපනය කර.

'(තෝ) කටයුතු සැලකර' යනු ක්‍රි: කා: ප: ස:

ල, වි—සැලකර යනු සොපපදවිධික්‍රියායි, තෝ යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි, කටයුතු යනු අනුක්තකර්මයි, ගිය යනු කර්ම විශේෂණයි, නා යනු ගමන ක්‍රියාවට අනුක්ත කර්තෘයි, සිට යනු පූර්ව ක්‍රියායි, එකත්පස යනු අනුක්තාධාරයි, පෙරදූරිකොට යනු සොපපද පූර්වක්‍රියායි, තියුවදන්ගොස යනු ඊට අනුක්ත කර්මයි, සුරිඳුට යනු අනුක්ත සම්ප්‍රදානයි, නොවී යනු පූර්ව ක්‍රියායි, යුහුසුලු යනු කර්තෘ විශේෂණයි, සලකා යනු පූර්වක්‍රියායි, පසු පළමුබස යනු ඊට අනුක්තකර්මයි, බලා යනු පූර්ව ක්‍රියායි, අදහස අවසර විගස යනු ඊට අනුක්තකර්මයි, අනතුරු යනු අනන්තරාර්ථයෙහි අව්‍යය නම්,

**ස, වි**—අතුරු නොවූයේ=අනතුරු, න අරුත්සමස්; අදහසද අවසරවිගසද=අදහසඅවසරවිගස, ද්‍වරුත්සමස්; සුරනට ඉඳු= සුරිඳු, ඔහුට-සුරිඳුට, විබත්සමස්; තියුවෙන් යුත් වදන්=තියු වදන්, තියුවදන්හි ගොස=තියුවදන් ගොස, විබත්සමස් ගැබ් විබත්සමස්.

**එකාන්පස සිට**—අටවැදුරුම්දෙෂයන්ගෙන් මෙන්වූ පසෙහි සිටීම එකාන්පස සිටීම නම් වේ.

එයින් කීහු.

> නපච්ඡතො නපුරතො නාව ආසන්නදූරතො
> නකච්ඡෙ නොපටිවාතෙ නචාපි ඔනතුන්නතෙ
> එතෙදෙසෙ විවජ්ජෙත්වා එකමන්තං ඨිතා වුච්චති, යි.

සාර අඹරා තම්දෙස බලනසේ පිටිපස සිටීමය. කථාකරනකල ඇඟ කෙල ඉසෙනසේ ඉතා ළංව සිටීමය, ශබ්දනගා කථාකරනසේ ඈත්ව සිටීමය, තමා ඇඟගත් සුළං අන්‍යයා ඇඟ ගන්නාසේ උඩුසුළඟෙහි සිටීමය. අන්‍යයා ඇඟගත් සුළං තමා ඇඟගන්නාසේ යටිසුළඟෙහි සිටීමය, සාරඹසවා බලනසේ උස්තැනක සිටීමය, සාරහෙළා බලනසේ පහත් තැනක සිටීමය යන අටවැදුරුම් දෙෂයන්ගෙන් වෙන්ව සිටීම එකාන්පස සිටීමය, යනු මෙහි භාවයි.

### ස්වභාවොක්ත්‍යලඞ්කාරයි.

94 න ර ස ර සු නෙ ර නදනෙද දිමුතු දිව යු ර
පු ව න ර ගැ ඹ ර සමුදුර කැලුම නිලඹ ර
සොම්බර ප ව ර නිසයුර නුවණ සුරගු ර
සු ර ව ර දෙ සැ ර විබිසණ නම් කැලණි පු ර

94 නරසර, සපිරසාර ගුණයෙන්; සුනෙර, මහාමෙරුපර්වත රාජයා වැනිවූ; නදනෙද, සන්‍බිධතෙජසින්; දිමුතු, දීප්තිමත්වූ; දිවයුර, දිවාකරයා වැනිවූ; පුවතර, ප්‍රසිඬවූ; ගැඹර, ගම්භීර ගුණයෙන්; සමුදුර, සමුද්‍රය වැනිවූ; කැලුම, (දෙහ) කාන්තියෙන්; නිලඹර, නීලාම්බරය හා සමානවූ; සොම්බර, සෞම්‍යභාරයෙන්; පවර, උත්තමවූ; නිසයුර, චන්‍ද්‍රයා වැනිවූ; නුවණ, ප්‍රඥයෙන්; සුරගුර, වෘහස්පතියා වැනිවූ; කැලණිපුර, කල්‍යාණිපුරප්‍රවරාධිපතිවූ; විබිසණ නම් සුරවර, විභීෂණ නම්වූ දෙව්මහරජාණන්වහන්ස; සැරදෙ, චිරකාලයක් ජීවත්වුව මැනවි.

'සුරවර (නෝ) සැරදෙ' යනු ක්‍රි: කා: ප: ස:

**ල, වි**—සැරදෙ යනු ආශීර්ගර්භ විධික්‍රියායි, **නෝ** යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි, **සුරවර** යනු සම්බොධනයි, **නම්** යනු ප්‍රසිද්ධාර්ථයෙහි නිපාතයි, **විබිසණ** යනු සම්බොධන විශෙෂණයි,

කැලණිපුර යනු අනුප්‍රාසාධාරයි, සුරගුරු යනුද නිසපුර යනුද නිලඹර යනුද සමුදුර යනුද දිවපුර යනුද සුනෙර යනුද උපමා සම්බාධනවිශේෂණයි, නුවණ යනු අනුකතකරණයි, පවර යනු නිසපුර යන්නට විශේෂණයි, සොම්බර යනුද කැළුම යනුද ගැඹර යනුද අනුකතකරණයි, පුවතර යනු සමුදුර යන්නට විශේෂණයි, තදතෙද යනුද තරසර යනුද අනුකතකරණයි, දිමුතු යනු දිවපුර යන්නට විශේෂණයි,

ස, වි—තරද සරද=තරසර, දෘරූත් සමස්; තදද එම තෙදද=තදතෙද, වෙසෙසුන් සමස්; දිපැතියේ=දිමුතු, දිවකරතුගේ=දිවපුරු, උපපදසමස්; ගැඹර වූයේද එම සමුදුර වූයේද=ගැඹර සමුදුර, වෙසෙසුන් සමස්; පුවතර වූයේත් එමය ගැඹරවූයේත් එම නුයි=පුවතර ගැඹර, නිල්වූයේද එම අඹරවූයේද=නිලඹර, වෙසෙසුන්සමස්; සොමින් බර=සොම්බර, විබත්සමස්; සුරනට ගුරු=සුරගුරු, විබත් සමස්; සුරනට වර=සුරවර, විබත් සමස්; කැලණිද එම පුරද=කැලණිපුර, වෙසෙසුන් සමස්.

පීරසාර, සිනෙරු, දිවාකර, සමුද්‍ර, නිසාකර යන ශබ්දයන්ගෙන් පිළිවෙළින් තර, සර, සුනෙර, දිවපුරු, සමුදුර, නිසපුරු යන ශබ්ද භින්න වෙත්.

හෙතු රූපකාශිඃ සංසෘෂ්ටියි.

95 රජකුල සුපුල් විලැ රජහසවන් සර ත
පෙර මල වියාවන් රුසිරෙන් මන නද න
හැම කල විපුල සව්සැපතින් නොහඩු ව න
තෙද බල විකුම් ගුණමිණිබරණින් තෙවු න

95 රජකුල, රාජවංශ නැමැති; සුපුල්විලැ, සුපුල්වූ පද්මවනයෙහි; සරන, සඤ්චාරයකරන්නාවූ; රජහසවන්, රාජහංසයකු වැනිවූ; මනනදන, මනොනන්දනීයවූ; රුසිරෙන්, රූපශ්‍රීයෙන්; පෙර මලවියාවන්, පූර්වමන්මථයා හා සමානවූ; හැමකල, සර්වකාලයෙහි; විපුල, මහත්වූ; සව්සැපතින්, සකලසම්පත්තියෙන්; නොහඩුවන, ඌනත්වයක් නැත්තාවූ; තෙදබලවිකුම්ගුණ, තෙජොබලවික්‍රමගුණ නමැති; මිණිබරණින්, මාණික්‍යාභරණයෙන්; තෙවුන, විරාජමාන වන්නාවූ-

96 ගරුතර නන්නුරුතුනයා නමැති මැ ති
සිහි කැර නිතර මහපුද පඬුරු දී රැ කි
නොවිසිර ඔබව දන්වනලෙස කී සිතැ ති
සුරවර මදක්කල් එපවත් ඇසිය යු ති

96 ගරුතර, අතිශයින් මහත්වූ ගුණ ඇති; නන්නුරුතුනයා නමැති, නන්නුරුතුනයාභිධානවූ; මැති, (සේනානායක) අමාත්‍ය තෙම; නිතර සිහිකැර, නිරන්තරයෙන් (ඔබවහන්සේ) සඳහන් කොට; රුකි, අභිමත වූ; මහපුදපඬුරු දී, මහත්වූ පූජාපීප්‍රාභෘතයන් ප්‍රදානය කොට; සිතැති, (ස්වකීය) චිත්තසන්තානවර්තිවූ අභිප්‍රාය; නොවිසිර, විශිණී නොකොට–හෙවත් අන්‍යවිහිත නො වී; ඔබට, ඔබවහන්සේට; දන්වනලෙස, විඥාපනය කරන පරිද්දෙන්; කී, කථනය කෙළේය; සුරවර, දෙවරාජෝත්තමයාණන්වහන්ස; එපවත්, (ඔහු විසින් කියා එවනලද); ඒ ප්‍රවෘත්තිය; මඳක්කල්, ස්වල්පමාත්‍ර කාලයක් මුළුල්ලෙහි; ඇසියුතු, ශ්‍රවණය කටයුත්තීය.

'ගරුතර නන්නුරුතුනයානැමතිමැති සිතැති කී' යනුද

'එපවත් ඇසියුතු (වේ,' යනුද ක්‍රි: කා: ප: ස:

ව, වි—කී යනු අයුකල් අන්කරු එකබස් කතුකිරියයි, ගරුතර නන්නුරුතුනයානමැතිමැති යනු උක්ත කර්තෘයි, සිතැති යනු අනුක්තකර්මයි, නෙවුන යනුද නොහඩුවන යනුද මනනඳන යනුද කර්තෘ විශේෂණයි, තෙදබලවිකුම් ගුණමිණි බරණින් යනු නෙවුන යන්නට අනුක්ත කරණයි, සව්සැපතින් යනු නොහඩුවන යන්නට අනුක්ත කරණයි, විපුල යනු ඊට විශේෂණයි, හැමකල යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි, රුසිරෙන් යනු මනනඳන යන්නට අනුක්තකරණයි, වන් යනු උපමාද්‍යෝතනයෙහි අව්‍යයයි, පෙර මලවියා යනුද රජහස යනුද උපමාකර්තෘ විශේෂණයි, සරන යනු ඊට විශේෂණයි, රජකුල සුපුල්විල, යනු සරන ක්‍රියාවට අනුක්තාධාරයි, දන්වනලෙස යනු අනුක්ත කරණයි, ඔබට යනු අනුක්ත සම්ප්‍රදානයි, නොවිසිර යනුද දී යනුද පූර්වක්‍රියායි, මහපුදපඬුරු යනු දානක්‍රියාවට කර්මයි, රුකි යනු කර්මවිශේෂණයි, සිහිකර යනු පූර්ව ක්‍රියායි. නිතර යනු සමරණක්‍රියාවට විශේෂණයි.

(වේ) යනු අධ්‍යාහෘත ක්‍රියායි, එපවත් යනු උක්ත කර්තෘයි, ඇසියුතු යනු කර්තෘවිශේෂණයි, සුරවර යනු සම්බොධනයි, මඳක්කල් යනු අත්‍යන්තසංයොගයෙහි විතීයායි,

ස, වි—රජුන්ගේ කුල=රජකුල, සු(මනා) පුල්=සුපුල්, සුපුල් වූයේද එම විල වූයේද=සුපුල්විල, රජකුලම සුපුල්විල=රජකුල සුපුල්විල, එහි-රජකුල සුපුල්විල, විබත්සමස් ප ඇසමස් වෙසෙසුන්සමස් ගැබි වෙසෙසුන් සමස්; හස්නම රජ=රජහස, විබත් සමස්, මල් අවිවූයේ යමකුටද හෙතෙම=මලවි, පෙර මලවි=පෙර

මලවී, ඔහු-පෙරමලවියා, අන්අරුත්සමස්ගැබ් විබත්සමස්, රුවණගේ සිරි=රූසිරි, ඉන්-රුසිරෙන්, විබත්සමස්; සව්ද එම සැප තද=සව්සැපත, ඉන්-සව්සැපතින්, වෙසෙසුන් සමස්; තෙදද බලද විකුම්ද ගුණද=තෙදබල විකුම්ගුණ, මිණියෙන් කළ බරණ= මිණිබරණ, තෙදබලවිකුම්ගුණම මිණිබරණ=තෙදබල විකුම්ගුණ මිණිබරණ, ඉන්-තෙදබල විකුම්ගුණමිණිබරණින්, දුරුත්සමස් විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්;

ස, වි—තන්නුරුතුනයා යන නම=තන්නුරුතුනයා නම, තන්නුරුතුනයාතම ඇතියේ=තන්නුරුතුනයා නමැති, ගරුතර වූයේත් හෙමය තන්නුරුතුනයා නමැතියේත් හෙමනුයි= ගරුතර තන්නුරුතුනයා නමැති, ගරුතර තන්නුරුතුනයා නැමැති වූයේත් හෙමය මැතිවූයේත් හෙමනුයි=ගරුතර තන්නුරුතුනයා නමැති මැති, අන්අරුත්සමස් ගැබ් වෙසෙසුන්සමස්, නොරනොවූයේ=නිතර, අව්ය සමස්; පුදද පඬුරුද=පුදපඬුරු, මහ වූයේද එම පුදපඬුරුවූයේද=මහපුදපඬුරු, දුරුත්සමස් ගැබ් වෙසෙසුන් සමස්; සුරවූයේද එම වර=වූයේද සුරවර, වෙසෙසුන් සමස්;

**පෙරමලවියා**—මලවිතම් අනඞ්ගයායි. පුෂ්පමයවූ හී පසක් අම්කොට ඇතිහිසා ඔහට මලවියයි කියත්. "පුෂ්පබාණ" යනු ඊට පර්‍ය්‍යාය සංස්කෘත නාමය වේ. මේතෙම තමහට අභිමතවූවෙකුට තම අත තිබෙන්නාවූ එක් ඊය කින් විදියි. එවිට එයින් ඇතිවන වේදනාව නම් රාගචෙතනාවකි. ඊශ්වරයා එක් දවසක් ධ්‍යානයෙන් සිටිනකල මලවිතෙම සැඟවී සිට ඔහුගේ හෘදයට විද්දේය. එයින් කෝපවූ ඊශ්වරයා විසින් තම නයනාග්නියෙන් දවනු ලැබූ වේය. ආදියෙහි විශිෂ්ට රූපවත් මොහු ඊශ්වරයා විසින් දවනු ලැබ ශරීරය විරූපවූ හිසා අනඞ්ග නම්වීය. ඊශ්වරදහනයට පූර්වයෙන් ඉතා ලක්‍ෂණ හිසා කාව්‍ය වර්ණනීය රූප සෞන්දර්‍ය්‍යයෙන් යුතුවූවාහු පෙර මලවියා හා (හෙවත්) ඊශ්වරදහනයට පූර්වවූ මලවියා හා සමානකොට වර්ණනා කරනු ලැබෙත්. එහෙයින් තන්නුරුතුනයා නමැති මැතිඳුන් පූර්ව කාමදෙවයා මෙනැයි මෙහි දක්වූහ.

**තන්නුරු තුනයා**—"තන්නූර් තුනයියාර්" යන ද්‍රවිඩ නාමයෙන් සිංහලට තද්භවවූ නාමයකි-පරාක්‍රමබාහු රජතුමාගේ බෑණණුවන්වූ මොහු (ලොකනාථා) උලකුඩය දෙවියගේ වල්ලභයාය. මොහු ද්‍රවිඩ කුමාරයෙකි, දෙවෙනි ජයබාහු රජතුමා මොහුගේ පුත්‍රතෙමේයි.

### 95 රූපකළපමාසංසෘෂ්ටියි.

### 96 සවභාවොක්ත්‍යලඞ්කාරයි.

97 රි වි කු ල ලමැණියොත් පිරිසිදු ගුවන් මැ ද<br>
පැ හැ දු ල සරාකල් පත් සහසකර බ ද<br>
කි වි කැ ල ගලට මුතුහරවන් යස පබ ද<br>
සි රි කා ල කුලනිවෙස් දිය පතළ තද තෙ ද

97 රවිකුල, සූර්‍ය්‍යවංශයෙහි (ප්‍රවෘත්තවූ); ලමැණිගොත්, ලම්බකණ්ණවංශ නම්වූ; පිරිසුදු, නිර්මලවූ; ගුවන්මැද, ගගනමධ්‍යයෙහි; සරාකල්පත්, ශරත්කාලයට ප්‍රාප්තවූ; පැහැදුල, ප්‍රභායෙන් දිලියෙන්නාවූ; සහසකරබඳ, සිහස්‍රකිරණයා වැනිවූ; කිවිකැල, කවිසමූහයාගේ; ගලට, කණ්ඨයට; මුතුහරවන්, මුක්තාහාරයක් බඳුවූ; යසපබඳ, කීර්තිප්‍රබන්ධ ඇති; සිරිකල, ශ්‍රීකාන්තාවට; කුලනිවෙස්, කුලගෘහයක් බඳුවූ; දියපතල, ජගද්ව්‍යාප්තවූ; තදතෙද, ඝනබද්ධ තෙජස් ඇත්තාවූ-

**103 කවිය හා සම්බන්ධයි.**

**උ, වි**— **දියපතල තද තෙද** යනුද **සිරිකල කුලනිවෙස්** යනුද **මුතුහරවන්** යනුද **යසපබඳ** යනුද **සහසකරබඳ** යනුද 99 වෙනි කවියෙහි පැරකුම්නිරිඳුට යන්නට විශෙෂණයි, **කිවිකැල ගලට** යනු අනුක්තසම්බන්ධයි, **සරාකල්පත්** යනුද **පැහැදුල** යනුද සහසකර යන්නට විශෙෂණයි, **රිවිකුල ලමැණිගොත්පිරිසිඳු ගුවන්මැද** යනු අනුක්තාධාරයි,

**ස, වි**— රිවිහුගේ කුල=රිවිකුල, විබත් සමස්, ලමැණිද එම ගොත්ද=ලමැණි ගොත්, වෙසෙසුන්සමස්; රිවිකුලෙහි ලමැණි ගොත්=රිවිකුල ලමැණිගොත්, විබත්සමස්; පිරිසිදුවූ ගුවන්=පිරිසිදු ගුවන්, රිවිකුලලමැණි ගොත්ම පිරිසිදු ගුවන්=රිවිකුල ලමැණි ගොත් පිරිසිදු ගුවන්, රිවිකුල ලමැණි ගොත් පිරිසිදු ගුවනගේ මැද=රිවිකුල ලමැණි ගොත් පිරිසිදු ගුවන් මැද, පැහැයෙන් දුල=පැහැදුල, විබත්සමස්; සරාද එම කල්ද= සරාකල්, සරාකල්හි පත්=සරාකල්පත්, වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; සහසක් කර යමක්හටද හෙතෙම=සහසකර, අන් අරුත්සමස්; කිවින්ගේ කැල=කිවිකැල, කිවිකැලගේ ගල=කිවිකැලගල, විබත්සමස් ගැබ් විබත්සමස්; මුතුයෙන් කළ හර=මුතුහර, විබත්සමස්; යසගේ පබඳ=යසපබඳ; විබත්සමස්; සිරිවූවාද ඔම කලවූවාද=සිරිකල, කුලයාගේ නිවෙස්=කුලනිවෙස්, සිරිකලගේ කුලනිවෙස්=සිරිකලකුලනිවෙස්; වෙසෙසුන් සමස් විබත් සමස් ගැබ් විබත් සමස්; තදවූ තෙද යමෙක්හටද හෙතෙම= තදතෙද, අන්අරුත්සමස්;

**රිවිකුල**— 20 වෙනි කවිය බලනු.

**ලමැණිගොත්**— එලෙසකත්ඇති අර්ථයෙන් "ලම්බකණ්ණ" නම්ලද ගොත්‍රයයි, මේ ශාක්‍යවංශයටම අභ්‍යනුගත අපරනාමයක් වේ. "ලමැණි" යනු "ලම්බකණ්ණ" ශබ්දයෙන් තද්භවවිය මේ වංශය ලක්දිවට සම්ප්‍රාප්තවූයේ මහබෝ වඩා ආ සුමිත්‍ර නම් රාජකුමාරයාගෙන් වේ, සඞ්ඝබොධි වංශය යනුද

මීටව හැම්. මේ වංශයෙහි පළමුවෙනි රජවූයේ ධාතුසෙන රජුය. සෝවෙවි රජකළ මෙහි ප්‍රකාශිත සවැනි පරාක්‍රමබාහු රජුගේ ඇවෑමෙන් මේ වංශයෙහි බුජ්වක් රාජ්‍යපදප්‍රාප්ත නොවීය.

98 හ ළ දුසිරි දුන තෙවළා මුනිඳු බ ණ
කෙ ළ පත් සියල් අවිසිප් කිවිනළු සත ණ
ඔ ළ මොල රුපුන් දප මැඩ පෑ උපානැ ණ
ක ල මුළු ලක්දිව එකසේසත් සෙව ණ

98 තෙවළාමුනිඳුබණ, ත්‍රිපිටක බුඩවචනය; දුන, (ශ්‍රැතමය ඥානයෙන්) අවබොධ කොට; දුසිරි, දුශ්චරිතයන් හෙවත් දශ අකුශල කර්මපථයන්; හළ, පරිත්‍යාග කළාවූ; සියල් අවිසිප්, (චාප චක්‍රප්‍රාසාදි) සියලු ආයුධශිල්ප හා; කිවිනළුසතණ, කාව්‍යනාටක (තර්කව්‍යාකරණාදි ශාස්ත්‍ර) නමැති සමුද්‍රයෙහි; කෙළපත්, කොටි ප්‍රාප්තවූ; උපානැණ පෑ, (සාමදානාදි චතුර්විධ) උපායඥනය දක්වා; ඔළමොල රුපුන්, උද්දාම ගුණයෙන් ප්‍රචණ්ඩවූ ශත්‍රූන් ගේ; දප මැඩ, දර්ප මර්දනය කොට; මුළුලක්දිව, සමස්ත ලඞ්කාද්වීපය; එකසේසත් සෙවණකළ, එකච්ඡත්‍රච්ඡායාවට පැමිණවූ-

ඌ, වි—කළ යනුද කෙළපත් යනුද හළ යනුද මතු කෙවෙහි පැරකුම් නිරිඳුට යන්නට විශෙෂණයි, මුළු ලක්දිව යනු කළ යන අර්ථ ක්‍රියාවට ප්‍රකෘතිකර්මයි, එකසේසත් සෙවණ යනු ඊට විකෘති කර්මයි, මැඩ යනු පූර්ව ක්‍රියායි, දප යනු ඊට අනුක්ත කර්මයි, ඔළ මොල රුපුන් යනු අනුක්ත සම්බන්ධයි, පෑ යනු පූර්වක්‍රියායි, උපා නැණ යනු ඊට කර්මයි, සියල් අවිසිප් කිවිනළු සතණ යනු අනුක්තාධාරයි, දුසිරි යනු හළ යන අර්ථ ක්‍රියාවට අනුක්ත කර්මයි, දුන යනු පූර්වක්‍රියායි, තෙවළා මුනිඳුබණ යනු ඊට අනුක්ත කර්මයි.

ස, වි—මුනිනට ඉඳු=මුනිඳු, මුනිඳුගේ බණ=මුනිඳු බණ, වළා තුනක් එක්කොට සලකනලද්දේ=තෙවළා, තෙවළා වීද එම මුනිඳු බණ වීද=තෙවළා මුනිඳුබණ, විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන් සමස්; අවියෙන් කරන සිප්=අවිසිප්, කිවිද නළුද= කිවිනළු, කිවිනළුද එම සතද=කිවිනළුසත, අවිසිප්ද කිවිනළුසතද= අවිසිප්කිවිනළුසත, අවිසිප් කිවිනළුසතම අණ=අවි සිප් කිවිනළු සතණ, සියල්ද එම අවිසිප් කිවිනළුසතණද=සියල් අවිසිප් කිවි නළුසතණ, විබත්සමස් දුරුත්සමස් වෙසෙසුන්සමස් ගැබ් වෙසෙ සුන්සමස්;

උපායෙන් යුතු නැණ=උපානැණ, විබත්සමස්; ලක්වීද එම දිව වීද=ලක්දිව, වෙසෙසුන්සමස්; සේවීද එම සත් වීද=සේසත්, එකසේසත්හුගේ සෙවණ යමක්හටද හේ=එකසේසත් සෙවණ, වෙසෙසුන්සමස් ගැබ් අන් අරුත් සමස්;

**කෙවලා මුනිඳු බණ**—සූත්‍රාභිධර්මවිනය සඞ්ඛ්‍යාත ත්‍රිපිටක බුද්ධවචනය, එනම්-අඞ්ගුත්තරනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, දීඝනිකාය, ඛුද්දක නිකාය, යන මේ පඤ්චනිකාය සූත්‍රපිටක නම්.

ධම්මසඞ්ගණී ප්‍රකරණය, විභඞ්ග ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය, ධාතුකථා ප්‍රකරණය, යමක ප්‍රකරණය, පට්ඨාන ප්‍රකරණය යන සප්තප්‍රකරණය අභිධර්මපිටක නම්.

මූලවග්ගපාලි, මහාවග්ගපාලි, පාරාජිකාපාලි, පාචිත්තියපාලි, පරිවාරපාලි, යන පඤ්චකය විනය පිටක නම්.

**රූපක සංසෘෂ්ට උදෘතාලඞ්කාරයි.**

99 සතනෙත දුන් රුසිරු රස අ ඳු න් ව න
පත නරලොව පුරඳරසිරි හ ඳු න් ව න
විකුමෙන් මෙදඹදිවු නිරිඳුන් මු දු න් ව න
අප පැරකුම් නිරිඳුට දූ ළ ඳු න් ව න

99 සතනෙත දුන්, (සකල) සත්වයාගේ නෙත්‍රයට (ආලම්බන වශයෙන්) දෙනලද්දාවූ; රසඅඳුන්වන, රසාඤ්ජනයක් හා සමානවූ; රුසිරු, රූපශ්‍රී ඇත්තාවූ; නරලොව පත, මනුෂ්‍යලොක ප්‍රාප්තවූ; පුරඳරසිරි, පුරන්දරශ්‍රිය; හඳුන්වන, ප්‍රත්‍යභිඥානය කර වන්නාවූ; විකුමෙන්, වික්‍රමයෙන්; මෙදඹදිවු නිරිඳුන්, මේ ජම්බුද්වීපයෙහි නරෙන්ද්‍රයන්ට; මුදුන්වන, ශිරොභූතවූ; අපගේ ශ්‍රීපරාක්‍රම බාහු මහාරාජොත්තමයාණන්ට; දූළඳුන්වන, දුහිතෘභාවයට පැමිණ තරුණ වයසෙහි සිටියාවූ-

**උ, වි**—**දූළඳුන්වන** යනු මතු 102 කවියෙහි උලකුඩය දෙවී නම් යන්නට විශෙෂණයි, අප පැරකුම් නිරිඳුට යනු අනුක්ත සම්බන්ධයි, මුදුන්වන යනුද හඳුන්වන යනුද රුසිරු යනුද සම්බන්ධ විශෙෂණයි, රසඅඳුන්වන යනු රුසිරු යන්නාට විශෙෂණයි, දුන් යනු රස අඳුන්වන යන්නට විශෙෂණයි, සතනෙත යනු දුන් යන අප්‍රධානක්‍රියාවට අනුක්තසම්ප්‍රදානයි, සිරි යනු හඳුන්වන අප්‍රධානක්‍රියාවට අනුක්තකර්මයි, පුරඳර යනු අනුක්තසම්බන්ධයි; පත යනු සම්බන්ධවිශෙෂණයි, නරලොව යනු පත යන අප්‍රධානක්‍රියාවට අනුක්තකර්මයි, නිරිඳුන් යනු අනුක්තසම්බන්ධයි, මෙදඹදිව යනු අනුක්තාධාරයි, විකුමෙන් යනු අනුක්ත කාරණයි.

**ස, වි**—සතුන්ගේ නෙත=සතනෙත, විබත් සමස්, රුවගේ සිරි=රුසිරි, (පිළිපෙරළිවූ) රුසිරු, රසයෙන් (වූ) අඳුන්=රස අඳුන්, රසඅඳුන් වන=රසඅඳුන්වන, විබත් සමස් ගැබි විබත්

සමස්; නරන්ගේ ලොව=නරලොව, විබත්සමස්, පැරකුම්ද ඔහු නිරිඳුද=පැරකුම් නිරිඳු, අපගේ පැරකුම් නිරිඳු=අප පැරකුම් නිරිඳු, වෙසෙසුන් සමස් ගැබි විබත්සමස්;

## උපමාලඞ්කාරයි.

100 සිරිසඳවන් සව්සිරි දියුණුවැ රඳ   න
සිතුමිණවන් යදි යදිහට දනින් දෙ   න
සරසවිවන් නුවණින් පහළවැ පෙනෙ   න
නවසඳවන් ලෙව්වැසි අදරින් වඳ   න

100 සව්සිරි, සියලු (ත්‍රිවර්ග) සම්පත්තිය; දියුණුවැ, අධිකවැ; රඳන, රඤ්ජමානවූ; සිරිසඳවන්, ශ්‍රීකාන්තාව හා සමානවූ; යදි, යාචකකළාවූ; යදිහට, යාචකසමූහයහට; දෙන, පරිත්‍යාග කරන්නාවූ; දනින්, දෙයධර්මය කාරණකොටගෙන; සිතුමිණවන්, චින්තාමාණික්‍යයක් බඳුවූ; නුවණින්, බුද්ධියෙන්; පහළවැ පෙනෙන, ප්‍රකාශව දෘශ්‍යමානවූ; සරසවිවන්, සරස්වතිය හා සමානවූ; ලෙව්වැසි, ලොකවාසීන්; අදරින්, ආදරයෙන්; වඳන, නමස්කාර කරනුලබන්නාවූ; නවසඳවන්, අභිනව චන්ද්‍ර (රෙඛාවක) බඳුවූ-

උ, වි—සිරිසඳ යනුද, සිතුමිණ යනුද, සරසවි යනුද, නවසඳ යනුද මතු 102 කවෙහි සසිරි උලකුඩය දෙවිහට යන්නට උපමා විශෙෂණයි, රඳන යනු සිරිසඳ යන්නට විශෙෂණයි, දියුණුවැ යනු සොපපද පූර්ව ක්‍රියායි, සව්සිරි යනු ඊට අනුක්තකරණයි, දනින් යනු අනුක්තකරණයි, දෙන යනු කරණ විශෙෂණයි, යදිහට යනු දෙන යන අර්ථක්‍රියාවට අනුක්තසම්ප්‍රදානයි, යදි යනු සම්ප්‍රදාන විශෙෂණයි, පෙනෙන යනු සරසවි යන්නට විශෙෂණයි, පහළවැ යනු සොපපද පූර්වක්‍රියායි, නුවණින් යනු ප්‍රකාශන ක්‍රියාවට අනුක්තකරණයි, වඳන යනු නවසඳ යන්නට විශෙෂණයි, ලෙව්වැසි යනු වන්දන ක්‍රියාට අනුක්ත කර්තෘයි, අදරින් යනු ඊට අනුක්තකරණයි, (නොහොත්) වන්දන ක්‍රියාවට විශෙෂණයි, (සිවුපෙදෙහිම) වන් යනු උපමාද්‍යොතනයෙහි අව්‍යයයි.

ස, වි—සිරිවූවාද ඔම සඳවූවාද=සිරිසඳ, වෙසෙසුන්සමස්; සව්ද එම සිරිද=සව්සිරි, වෙසෙසුන්සමස්; සිතුද්‍ද දෙන මිණ=සිතුමිණ, විබත්සමස්; නවවූද එම සඳවිද=නවසඳ, වෙසෙසුන්සමස්; ලෙව්හි වැසි=ලෙව්වැසි, විබත්සමස්;

**සිරිසඳවන් සව්සිරි දියුණුව රඳන**—ශ්‍රී කාන්තාව විෂ්ණුගේ කලඑළැවූ දෙවඟන තොමෝය, මෝ තොමෝ කාන්තාවන් අතුරෙන් දිව්‍යමය

ධර්මාර්ථකාම සංඛ්‍යාත ත්‍රිවර්ග සම්පත්තීන්ගෙන් අග්‍රසරවූ හෙයින් ධර්මාර්ථකාම සම්පත්යෙන් ආඪ්‍යවූ වර්ණිතය මානුෂ්‍යත්‍රිත්‍ව ඇය හා උපමාකොට කවින් විසින් මෙසේ වර්ණනා කරනු ලැබෙත්.

**සිතුමිණවන් සදි සදිහට දනින් දෙන**—පුණ්‍යවන්තයන් හට කෘතපුණ්‍ය බලයෙන් පහළවන සිතූදූපහළකරන මාණික්‍ය විශෙෂය "සිතුමිණ" නම්, ත්‍යාග ගුණයෙන් අර්පිත් තෘප්තියට පමුණුවන හෙයින් ප්‍රභූ ජනයා ඒ සිතුමිණ සදෘශකොට මෙසේ වර්ණනා කරත්.

**සරසවිවන් නුවණින් පහළවූ පෙනෙන**—සරසවතී තොමෝ දෘතාධිෂ්ඨිත බ්‍රහ්ම භාර්‍ය්‍යාවවූ දිව්‍යකාන්තාවක යනු ලොකොක්තියයි. සවසම සානුරූපවූ වාග් තොමෝම බුද්ධිපරිපාක හේතුවෙන් දෙවතා රූපක කොට ගෙන වාග්දෙවතාතොමෝ සරසවතියයි කියයුතුවේ. කවීහු නුවණින් වැණිය යුතු ස්ත්‍රීන් ඇය හා උපමාකොට වණත්.

**නවසඳ වන් ලෙව්වැසි අදරින් වඳන**—නවසඳ නම් අභිනව චන්ද්‍රයායි, පුරපස පෑලවිග පටන් වර්ධනය වන චන්ද්‍රතෙමේයි, පුරාණ ලොකයෙහි ධර්මශාස්ත්‍රානුකූල පරිදි ඒ චන්ද්‍රතෙමේ වඳනිය වස්තුවක්වේය.

### හෙතූපමාලඞ්කාරයි.

101 යෙහෙ ළි න් කෙරේ සකිසැප සමඟ සි ත් මේ
කුලු ණේ න් දුසිදසුන් වෙතැ වසින ව ත් මේ
ර කි මි න් පතිනි දම් යහපත් සිරි ත් මේ
සි හි ණේ න් නිපන්වන් දසපින් පැවැ ත් මේ

101 යෙහෙළින්කෙරේ, සඛිජනයා කෙරෙහි; සකිසැප සමඟ, සවකීය සම්පත්තියෙහි (වෙනසක් නැතිව) සමඟව පවත්නාවූ; සිත්මේ, චිත්තයක්ම ඇති; කුලුණෙන්, කරුණායෙන්; දුසිදසුන් වෙතැ, දුශිදශ ජනයා කෙරෙහි; වත්මේ, වස්තු නමැති මෙඝය; වසින, වර්ෂණය කරන්නාවූ; පතිනිදම්, පතිව්‍රතාධර්මය හා; මේ, මෙධ්‍යවූ හෙවත් පවිත්‍රවූ; යහපත්සිරිත්, මනොඥවූ චාරිත්‍රයන්; රකිමින්, රක්‍ෂාකෙරෙමින්; දසපින් පැවැත්මේ, (දානශීලාදි) දශ පුණ්‍යක්‍රියා වස්තූන් ප්‍රවර්තනයෙහි; සිහිණෙන් නිපන්වන්, සිහි නුවණින් උපන්නියක වැනිවූ-

**උ, වි—නිපන් යනුද, වසින යනුද, සකිසැප සමඟසිත් යනුද, මතුකවෙහි උලකුඩය දෙව්හට යන සම්ප්‍රදානයට උපමා විශෙෂණයි, වන් යනු උපමාද්‍යොතකයෙහි අව්‍යයයි, දසපින්පැවැත්මේ යනු අනුකතාධාරයි, සිහිණෙන් යනු උපලක්‍ෂණයෙහි කරණයි, රකිමින් යනු මිශ්‍ර ක්‍රියායි, පතිනිදම් යනුද සිරිත් යනුද ඊට අනුකත කර්මයි, මේ යනුද යහපත් යනුද කර්මවිශෙෂණයි, වත්මේ**

යනු වසිත යන අපික්‍රියාවට අනුගතකම්යි, වෙනැ යනු සම්පාප්ති යෙහි ආධාරයි, දූසිඳසුන් යනු වෙත් යොගයෙහි කම්විබත්, කුලුණෙන් යනු අනුගතකරණයි, සොරේ යනු සම්පාප්තියෙහි ආධාරයි, සෙහෙළින් යනු කරයොගයෙහි කම්විබත්,

ස, ඕ—යහ (මනා) ළ යමකුගේද හෙතෙම=යහළු (ස්ත්‍රීලිඞ්ග යෙහි) යෙහෙළි, අන්අරුත්සමස්; සකිපුද එම සැපද=සකිසැප, සමග වූයේත් එමය සිත් වූයේත් එමනුයි=සමහසිත්, සකි සැපෙහි සමග සිත් යමක්හටද ඕ=සකි සැපසමහසිත්, වෙසෙ සුන් සමස්ගැබ් අන්අරුත් සමස්; දූසිද දස්ද=දූසිදස්, එන්- දූසිදසුන්, දරුත්සමස්; වත්ම මේ=වත්මේ, වෙසෙසුන්සමස්; පතිනිඝගේ දම්=පතිනිදම්, විබත්සමස්; යහපත්ද එම සිරිත්ද= යහපත්සිරිත්, වෙසෙසුන්සමස්; සිහිද එම ණේද=සිහිණේ, එන්- සිහිණෙන්, වෙසෙසුන්සමස්; පින් දසයක් එක්කොට සලකන ලද්දේ=දසපින්, දසපිනගේ පැවැත්ම=දසපින් පැවැත්ම, එහි- දසපින් පැවැත්මේ, වෙසෙසුන් සමස් ගැබ් විබත්සමස්;

**සිහිණෙන්**—සිහි-ණේ යන ශබ්දවයගේ සමාස ප්‍රකෘතියි, ණේ යනු ඥාණ ශබ්දයෙන් සිත්ත ශබ්ද ප්‍රකෘතියි. ඥාණශබ්දයෙන් "නැණ" කියාද සිත්තවේ. එසේත් එක් ප්‍රකෘතියකින් කතිපය ශබ්ද සෙතාකුත්ගේ තද්භව විධිය බොහෝ තැන්වල දක්නා හෙයින් ඒ විශෙෂයක් නොවේ.

**දසපින්**—දානං සීලං ච භාවනා පත්තිපත්තානු මෝදනා
දෙසනා සවනං පූජා වෙය්‍යාවච්චං පසංසනා.

යනු හෙයින් දානය, සීලය, භාවනාය, පින්දීම, පින් අනුමෝදනාව, දහම් දෙසීම, දහම් ඇසීම, පූජාව, වතාවත් කිරීම, පැසසීම, යනු දසපින්කිරියයි.

## රූපකඋපමාසංසෘෂ්ට උදාත්තාලඞ්කාරයි.

102 මි හි රි තෙපලැ තන්වැසි කිවිකම් පුරැ ඳු
ඉ ති රි බැතිපෙමැති පෙළදහමෙහි මුනි ඳු
නොහැ රි පෝය අටසිල් රැකුම පිරිසු ඳු
ස සි රි ඵලකුඩය දේවීහට පසි ඳු

102 මිහිරිතෙපලැ, මධුරවචනයෙහි; තන්වැසි, නොපිපිසරවූ ප්‍රෞඪවූ හෙවත් ප්‍රසන්නාවෝජිත කොට ප්‍රියතෙපුල් කිමෙහි දක්ෂවූ; කිවිකම්පුරුදු, කවිකර්මයෙහි පරිචිතවූ-හෙවත් ගද්‍යපද්‍යබන්ධන යෙහි යමක ප්‍රහෙලිකා ක්‍රියාගුප්තක අක්ෂරච්‍යුතක ගූඪචතුර්ථාදි වූ අනෙකකවික්‍රියායෙහි දක්ෂවූ; මුනිඳු, මුනීන්ද්‍රවූ සර්වඥයන්වහන්සේ ගේ; පෙළදහමෙහි, (ත්‍රිපිටක) පාලිධර්මයෙහි; ඉතිරි, අධිකවූ, බැති පෙමැති, භක්තිප්‍රෙම ඇත්තාවූ; පෝයැ, පෝෂෙධදිනයෙහි; පිරිසුදු,

නිම්ලවූ; අමසිල්රැකුම, අෂ්ටාඞ්ගශීලරක්‍ෂණය; නොහැරි, වර්ජනය නොකළාවූ; පසිදු, ප්‍රසිද්ධවූ; සසිරි, සශ්‍රීකවූ; උලකුඩය දේවීහට, ලෝකනාථා නම්වූ රාජකුමාරිකාවට–

උ, වි–සසිරිඋලකුඩය දේවිහට යනු අනුක්ත සම්ප්‍රදානයි, පසිදු යනුද නොහැරි යනුද ඉතිරිබැති පෙමැති යනුද තන් වැසි යනුද, කිවිකම්පුරුදු යනුද සම්ප්‍රදාන විශෙෂණයි, අම සිල්රැකුම යනු නොහැරි යන ක්‍රියාවට අනුක්තකර්මයි, පිරිසිඳු යනු කර්මවිශෙෂණයි, පෝයැ යනු අනුක්තාධාරයි, මුනිඳු යනු අනුක්තසම්බන්ධයි, පෙළදහමෙහි යනු අනුක්තාධාරයි, මිහිරි තෙපලැ යනු අනුක්තාධාරයි—

ස, වි–මිහිරිවූයේද එම තෙපුල්වූයේද=මිහිරිතෙපුල්, එහි-මිහිරිතෙපලැ, වෙසෙසුන්සමස්; තන්හි වැසි=තන්වැසි, විබත් සමස්; කිවිනුගේ කම්=කිවිකම්, කිවිකම්හි පුරුදු=කිවිකම්පුරුදු, විබත්සමස් ගැබ් විබත්සමස්; බැතිද පෙම්ද=බැතිපෙම්, ඉතිරිවූ බැතිපෙම්=ඉතිරිබැතිපෙම්, ඉතිරිබැතිපෙම් අත්තේ යමක් හටද හි=ඉතිරි බැතිපෙමැති, දරුත්සමස් වෙසෙසුන්සමස් ගැබ් අන් අරුත් සමස්; සිල් අටක් එක්කොට සලකනලද්දේ=අටසිල්, වෙසෙසුන් සමස්; උලකුඩයවූවාද ඔම දේවිවූවාද=උලකුඩයදේවි, සසිරි වූවාත් ඔමය උලකුඩයදේවිවූවාත් ඔමනුයි=සසිරි උලකුඩයදේවී, හට–සසිරි උලකුඩයදේවීහට, වෙසෙසුන්සමස්;

සබ්භාවොක්ත්‍යලඞ්කාරයි.

103 දි ත් රුපුකිරුළු මල්දම් සුවද මි වැ ස
තෙත් සිරිපායුත් සුරිඳුනි තිලෝ ඇ ස
සි ත් පිනවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුන මැනැවි නිසිලෙ ස

104 දිත්රුපුකිරුළු, දෛත්‍යාරිදෙවරාජයන්ගේ කිරීටයන්හි; මල්දම්, මාලාදාමයන්ගේ; සුවඳම් වැස, සුගන්ධමකරන්දවර්ෂණය කොට; තෙත්, ආර්ද්‍රවූ; සිරිපායුත්, ශ්‍රීපාදයෙන් යුක්තවූ; තිලෝ ඇස, ත්‍රෛලොක්‍යනෙත්‍රවූ; සුරිඳුනි, එබා විභීෂණ නම් දෙවරාජ යාණනි; සිත්පිනවන, ජනමනොරඤ්ජනය කරවන්නාවූ; ආ, ආයුෂය; සිරි, (ත්‍රිවර්ග) සම්පත්තිය; නුවණ, ප්‍රඥාය; යස, කීර්තිය යන මෙකී ගුණයන්; ඇති, විද්‍යමානවූ; සොද, සුන්දරවූ; පුත්රුව නක්, පුත්‍රරත්නයක්; නිසිලෙස, යොග්‍යවූ පරිද්දෙන්; දුනමැනැවි, ප්‍රදානය කළ මැනැවි.

'මැනවි' යනු ක්‍රි: කා: ප: ස:

**ල, වි—** වී යනු ක්‍රියායි, මැන යනු උක්ත කර්තෘයි, දුන යනු අසම්භාව්‍ය ක්‍රියායි, **පුත්රුවනක්** යනු ඊට අනුක්ත කර්මයි **නිසිලෙස** යනු ක්‍රියා විශෙෂණයි, **සොඳ** යනුද **සිත්පිනවන** යනුද **ඇති** යනුද කර්මවිශෙෂණයි, **ආසිරිනුවණයස** යනු අසමාප්ත ක්‍රියාවට අනුක්තකර්තෘයි, **සුරිඳුනි** යනු සම්බොධනයි, **තෙත්සිරිපායුත්** යනුද **තිලෝඇස** යනුද සම්බොධන විශෙෂණයි, **වැස** යනු පූර්වක්‍රියායි, **දිත්රුපුකිරුළුමල්දම්සුවඳ මී** යනු ඊට අනුක්ත කර්තෘයි—

**ස, වි**—දිතුන්ගේ රුපු=දිත්රුපු, දිත්රුපුන්ගේ කිරුළු=දිත් රුපු කිරුළු, දිත්රුපුකිරුළුවල මල්දම්=දිත්රුපුකිරුළු මල්දම්, සුවඳින් යුතු මී=සුවඳමී, දිත්රුපුකිරුළුමල්දම්හි සුවඳ මී=දිත්රුපු කිරුළු මල්දම් සුවඳ මී, විබත් සමස් ගැබ් විබත් සමස්; සිරින් යුත්පා=සිරිපා, තෙත්වූ සිරිපා=තෙත්සිරිපා, තෙත්සිරිපායෙන් යුත්=තෙත්සිරිපායුත්, විබත්සමස් වෙසෙසුන් සමස් ගැබ් විබත් සමස්; සුරනට ඉඳු=සුරිඳු, විබත්සමස්; ලෝතුනක් එක්කොට සලකනලද්දේ=තිලෝ, (ඇසක් වැනි ඇස-උපචාර වාක්‍යයි.) තිලොවට ඇස=තිලෝ ඇස, වෙසෙසන්සමස් ගැබ් විබත් සමස්; ආද සිරිද නුවණද යසද=ආසිරිනුවණයස, දරුත්සමස්; පුත්ද එම රුවනද=පුත්රුවන, එය-පුත්රුවනක්, වෙසෙසුන්සමස්;

## ආශිරලඞ්කාරයි.

104 බි සො ව ට  පළමු රත්නාවලි නම් සොඳු  රු
ස හ තු ට  දෙවූ හිමි දිවැසින් කුලුණුපි  රු
මෙ ල ක ට  ඉසුරු වී පැරකුම් රජකුම  රු
ප ළ කො ට  කිමෙක ඔබ සොඳ තෙදබල මහ  රු

104 පළමු, පූර්වකාලයෙහි; සොඳුරු, සෞන්දර්‍ය්‍යයෙන් යුක්තවූ; රත්නාවලි නම් බිසොවට, (මහලු විජයබාහු නම් රජ්ජුරුවන්ගේ දූ වූ; මානාභරණ රජ්ජුරුවන්ට බිසෝවූ) රත්නාවලි නම් බිසො වුන්ට; හිමි, ස්වාමිහුවිසින්; කුලුණුපිරු, කරුණාපූර්ණවූ; දිවැසින්, දිව්‍යදෘෂ්ටිප්‍රභායෙන්; සහතුට, සන්තොෂ සහිතවැ; දෙවූ, ප්‍රදානය කරවූ; පැරකුම්රජකුමරු, පරාක්‍රමබාහු නම් රාජකුමාර තෙම; මෙලකට ඉසුරු වී, මේ ලඞ්කාවිපයට අධිපති වූයේය; ඔබ, තත්‍රභවත්වූ නුඹවහන්සේගේ; සොඳ, සුන්දරවූ; මහරු, මහාර්හවූ; තෙද බල, තෙජොබලය; පළකොට කිමෙක, ප්‍රකාශකොට (කියනුමැ) කවරේද ?

**'පැරකුම්රජ කුමරු මෙලකට ඉසුරුවී'** යනුද,

**'කිමෙක (කවර ප්‍රයොජන වේද)'** යනුද ක්‍රි: කා: ප: ස;

උ, වි—කිමෙක යනු නිෂේධාර්ථයෙහි නිපාත පදයෙකි, පලසොට යනු සොපද පූර්වක්‍රියායි, සොඳ තෙදබල යනු ඊට අනුක්ත නාමයි, මහරු යනු නාම විශේෂණයි, ඔබ යනු අනුක්ත සම්බන්ධයි, වී යනු අයුකල් අන්කරු එකබස් කතුකිරියයි, පැරැකුම් රජකුමරු යනු උක්ත කර්තෘයි; ඉසුරු යනු ඊට විශේෂණයි, මෙලකට යනු අනුක්ත සම්බන්ධයි, දෙවූ යනු කර්තෘවිශේෂණයි, හිමි යනු දෙවූ යන ක්‍රියාවට අනුක්ත කර්තෘයි, සහතුට යනු හිමි යන කර්තෘට විශේෂණයි, දිවැසින් යනු අනුක්ත කරණයි, කුලුණු පිරූ යනු කරණවිශේෂණයි, බිසොවට යනු අනුක්ත සම්ප්‍රදානයි, රත්නාවලිනම් යනුද සොඳුරු යනුද සම්ප්‍රදානවිශේෂණයි, පලමු යනු කාලාර්ථයෙහි අනුක්තාධාරයි—

ස, වි—රත්නාවලි යන නම යමකුටද ඕ=රත්නාවලිනම්, අන් අරුත්සමස්, තුට සහිතවූයේ=සහතුට, අන්අරුත්සමස්; දෙවියන්ගේ ඇස=දිවැස, (නොහොත්) දිව්මයවූ ඇස=දිවැස, ඉන්-දිවැසින්, විබත්සමස්, (නොහොත්) වෙසෙසුන් සමස්, කුලුණෙන් පිරූ=කුලුණුපිරූ, විබත්සමස්; මෙද එම ලකද=මෙලක, ඊට-මෙලකට, වෙසෙසුන්සමස්; රජවූයේද එම කුමරවූයේද=රජකුමර, පැරැකුම්ද එම රජකුමරුද=පැරැකුම්රජකුමරු, වෙසෙසුන් සමස්; තෙදද බලද=තෙදබල, දෑරුත් සමස්;

### නිදර්ශනාලඞ්කාරයි.

105 එ සෙ සි න් දෑසමන් මහනෙල් කුසුම් ගෙ න
පු ද මි න් එසුරවර සිරිසරණ වදිමි න
බු හු ම න් කරන රජදූ සඳව මෙකිය න
දු න පි න් සමඟ යසසිරි වඩි පුත්රුව න

105 එසෙයින්, ඒ කාරණයෙන්; දෑසමන් මහනෙල් කුසුම් ගෙන; ජාතිසුමනපුෂ්ප රක්තොත්පල පුෂ්පයන් ග්‍රහණය කොට; පුදමින්, පුෂ්පාඤ්ජලි කොට අර්චනය කෙරෙමින්; එසුරවර, ඒ (විශිෂ්ට) සුරෝත්තමයාගේ; සිරිසරණ වදිමින, ශ්‍රීපාදය නමස්කාර කෙරෙමින්; බුහුමන්කරන, භක්තිබහුමාන කරන්නාවූ මෙකියන, මේ යථොක්තවූ; රජදූසඳුව, උත්තමවූ රාජපුත්‍රියව; පුත් රුවන, පුත්‍රරත්නයක්; දුන, ප්‍රදානය කළහොත්; පින් සමඟ, ධර්මය හා සමඟ; යසසිරි වඩි, කීර්තිශ්‍රී වර්ධනය වන්නේයි.

'යසසිරි වඩි' යනු ක්‍රි: කා: ප: ස:

උ, වි—වඩි යනු වත්මන් අන්කරු එකබස් කතුකිරියයි, යසසිරි යනු උක්ත කර්තෘයි, සමඟ යනු සහාර්ථයෙහි නිපාතයි, පින් යනු සමඟ යෝගයෙහි කතුවිබති, දුන යනු අසම්භාව්‍ය ක්‍රියායි,

**පුත්රුවන** යනු ඊට අනුක්තකර්මයි, **රජදූසඳුට** යනු අනුක්තසම්ප්‍රදානයි, **මෙකියන** යනුද **කාරන** යනුද සම්ප්‍රදානවිශෙෂණයි, **බුහුමන්** යනු **කරන** ක්‍රියාවට අනුක්තකර්මයි, **වඳිමින** යනුද **පුදමින්** යනුද මිශ්‍රක්‍රියායි, **සිරිසරණ** යනු ඊට අනුක්තකර්මයි, **එසුරවර** යනු අනුක්තසම්බන්ධයි, **ගෙන** යනු පූර්වක්‍රියායි, **දූසමන් මහනෙල් කුසුම්** යනු ඊට අනුක්තකර්මයි, **එසෙයින්** හෙතුවර්ථයෙහි තෘතීයායි—

**ස, වි**—දූසමන්ද මහනෙල්ද=දූසමන්මහනෙල්, දූසමන්මහනෙල්ද එම කුසුම්ද=දූසමන් මහනෙල්කුසුම්, ද්වන්ද්ව සමස් ගැබ් වෙසෙසුන්සමස්; සුරනට වර=සුරවර, එද එම සුරවරද=එසුරවර, සිරින් යුතු සරණ=සිරිසරණ, එසුරවිරගේ සිරිසරණ=එසුරවර සිරිසරණ, විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් විබත්සමස්; රජුගේ දූ=රජදූ, රජදූද ඔම සඳද=රජදූසඳ, ඇට-රජදූසඳුට, විබත් සමස් ගැබ් වෙසෙසුන් සමස්; යසද සිරිද=යසසිරි, ද්වන්ද්ව සමස්; පුත්ම රුවන=පුත්රුවන, වෙසෙසුන් සමස්;

සහොක්තාලඞ්කාරයි.

106 මෙහසුන් සුරිඳුහට සැලකැරැ මෙ සේයා
වඳිමින් බැතින් පැදකුණුකොට තො සේයා
දකිමින් බිසෝ දෙවියන් නොවල සේයා
කියමින් යදින් සකිසඳ මෙම ලෙ සේයා

106 මෙහසුන්, මේ (යථොක්තවූ) සන්දෙශය; සුරිඳුහට; (විභීෂණ නම්) සුරෙන්ද්‍රයාහට; මෙසේයා, එතත්ප්‍රකාරයෙන්; සැලකරැ, විඥාපනය කොට; බැතින්, භක්තියෙන්; වඳිමින්, නමස්කාර කෙරෙමින්; තොසේයා, සන්තොෂචිත්තයෙන්; පැදකුණු කොට, ප්‍රදක්ෂිණා කොට; බිසෝ දෙවියන්, (ඒ සුරෙන්ද්‍රයාහට) අග්‍රමහිෂිවූ දෙවතාදුව; දකිමින්, දර්ශනය කෙරෙමින්; නොවලසේයා, (එතන්හි) ප්‍රමාද නොවී; සකිසඳ, මිත්‍රොත්තමය; මෙම ලෙසේයා, මේ ලෙශයෙන්ම; කියමින්, කථනය කෙරෙමින්; යදින්, යාචඤා කරන්.

'නෝ (ඇය පුත්රුවනක්) යදින්' යනු ක්‍රි: කා: ප: ස:

**ල, වි**—**යදින්** යනු විධික්‍රියායි, **නෝ** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, **සකිසඳ** යනු ආමන්ත්‍රණයි, **මෙසේයා** යනුද **තොසේයා** යනුද **නොවලසේයා** යනුද **මෙමලෙසේයා** යනුද ක්‍රියා විශෙෂණයෙහි කතුවිබත්, **කියමින්** යනුද **වඳිමින්** යනුද **දකිමින්** යනුද මිශ්‍ර ක්‍රියායි, **බිසෝ දෙවියන්** යනු **දකිමින්** යන මිශ්‍ර

ක්‍රියාවට අනුක්තකර්මයි, පැදකුණුකොට යනු පූර්වක්‍රියායි, බැතින් යනු අනුක්තකරණයි, සැලකැරැ යනු පූර්වක්‍රියායි, මෙහසුන් යනු ඊට අනුක්තකර්මයි, සුරිඳුහට යනු අනුක්තසම්ප්‍රදානයි—

**ස, වි**—මෙද එම හසුන්ද=මෙහසුන්, වෙසෙසුන් සමස්; සුර නම් ඉඳු=සුරිඳු, ඔහට-සුරිඳුහට, විබත්සමස්; බිසෝද ඔම දෙව්ද= බිසෝදෙව්, ඔවුන්-බිසෝදෙවියන්, වෙසෙසුන්සමස් අලසනො වූයේ=නොවලස, එයින්-නොවලසේයා, අව්‍යයසමස්; සඛිද එම සඳද=සඛිසඳ, වෙසෙසුන්සමස්; මෙද එම ලෙසද=මෙම ලෙස, වෙසෙසුන් සමස්;

සවභාවොක්ත්‍යලඞ්කාරයි.

107 පැ හැ ප ත් පුන් සදෙව් කිරිසමුදුරැ පල ට
සි ය ගො ත් බබුළුවන දෙව්රජ කුමර හ ට
නැ ව ත ත් එකලාව අවසර ලැබුණු වි ට
මෙ ප ව ත් කියව සැලකරනුව සුර රදු ට

107 කිරිසමුදුරැ, ක්ෂීරසාගරයෙහි; පළට, ප්‍රකටවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; පුන්සඳෙව්, පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන්; සියගොත් සවකීයවූ (පෞලස්ත්‍ය) ගොත්‍රය; බබුළුවන, දීප්තිමත් කරවන්නාවූ; දෙව්රජ කුමරහට, ඒ දෙව්රජහුගේ පුත්‍රවූ කුමාරදෙවියන්ට; නැවතත්, නිවෘත්තවත් හෙවත් දෙවෙනිවත්; එකලාව, එකාකීව; අවසර ලැබුණුවිට, අවසර ප්‍රාප්තවූ කල්හි හෙවත් ප්‍රාප්තාවසර යෙහි; සුරරදුට, (ඒ විභීෂණ) නම් සුරරාජයාහට; මෙපවත්, මේ ප්‍රවෘත්තිය; සැලකරනුව, විඥප්තය කරනු පිණිස; කියව, කථනය කරව.

'(තෝ) මෙපවත් කියව' යනු ක්‍රි: කා: ප: ස:

**ඵ, වි**—කියව යනු විදිකිරියයි, තෝ යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි, මෙපවත් යනු අනුක්තකර්මයි, සැලකරනුව යනු තාදර්ථ්‍යයෙහි චතුර්ථියි, දෙව්රජ කුමරහට යනු අනුක්ත සම්ප්‍රදානයි; සුරරදුට යනුද මෙපවත් යනුද සංලක්ෂණ ක්‍රියාවට අනුක්තකර්මයි, අවසර ලැබුණුවිට යනු කාලාර්ථ යෙහි අනුක්තාධාරයි, එකලාව යනු සොපපදපූර්වක්‍රියායි, නැවතත් යනු පශ්චාදර්ථයෙහි නිපාතයි, බබුළුවන යනු දෙව් රජ කුමරහට යන්නට විශේෂණයි, සියගොත් යනු බබුළුවන යන ක්‍රියාවට අනුක්ත කර්මයි, එව් යනු උපමාද්‍යෝතකයෙහි අව්‍ය යයි, පැහැපත් පුන්සඳ යනු උපමා කර්මවිශෙෂණයි, පළට යනු ඊට විශෙෂණයි, කිරිසමුදුරැ යනු අනුක්තාධාරයි—

**ස, වි**—පැහැයට පත්=පැහැපත්, පුන්වීද එම් සඳ වීද=පුන්සඳ, පැහැපත් වූයේත් එම්ය පුන්සඳ වූයේත් එම්නුයි=පැහැපත් පුන්සඳ, විබත්සමස් වෙසෙසුන්සමස් ගැබ් වෙසෙසුන් සමස්;

කිරෙන් පිරි සමුදුර=කිරිසමුදුර, විබත්සමස්; සියද එම ගොත්ද=සියගොත්, වෙසෙසුන් සමස්; දෙව්නට රජ=දෙව්රජ, විබත් සමස්; දෙව් රජගේ කුමර=දෙව්රජකුමර, ඔහට-දෙව්රජ කුමර හට, විබත් සමස් ගැබි විබත් සමස්; මෙද එම පවත්ද=මෙපවත්, වෙසෙසුන් සමස්; සුරනට රද=සුරරද, ඔහුට-සුරරදුට, විබත් සමස්;

## උපමාලඞ්කාරයි.

108 මේ සි ය ලුම අදහස කුලුණෙන් ගිහි ණි
සේ සි ය පත සලසා උදයැ දිනම් ණි
නැ සි ය ඉටු මිතුරු සමගින් සැළලිහි ණි
වා සි ය පවතු සිතුලෙස සැපතින් පැම් ණි

108 සැළලිහිණි, එම්බා ශාරිකාපක්ෂිරාජොත්තමය; මේ සිය ලුම අදහස, මේ (යථොක්ත ප්‍රකාරයෙන් නිර්දිෂ්ටවූ) සියලු අධ්‍යාශයම; ගිහිණි, (විඥාතයෙන්) ග්‍රහණය කරනලද්දවූ-තොගොත් ගත්තාවූ; කුලුණෙන්, කරුණාවිශෙෂය හෙතුකොටගෙන; දිනමිණි, තමොරත්නවූ සහස්‍රරශ්මිහුගේ; උදයැ, ප්‍රාදුර්භූතවන්නාවූ කාලයෙහි; සියපතසේ, ශතපත්‍රයක් මෙන්; සලසා, සංශ්ලෙෂභාවයට-අවික්‍රියාසම්බන්ධයට පමුණුවා; හෙවත් යම්සේ හිරු උදවූ පමණින් ඒ හිරුහුගේ අන්‍ය ප්‍රයොගයක් නැතිව පද්මය තෙම පත්‍ර විකසනාදිකාර්‍ය්‍යයෙන් යුක්තව ප්‍රබුඬ වේද එසේම මෙහි කීවාවූ වචන සංක්ෂෙප වුවද විස්තරවශයෙන් ප්‍රස්තාවානුරූප කොට තමාගේ ස්වානොචිත ප්‍රඥයෙන් අනුක්තකාර්‍ය්‍යද විස්තර කොට පරීක්ෂා කිරීමෙන් නිෂ්පත්තියට පමුණුවා; සිතුලෙස, චිත්තානුකූලවූ පරිද්දෙන්; පැමිණි, සම්ප්‍රාප්තවූ; සැපතින්, (යොගක්ෂෙම) සම්පත්තියෙන් යුක්තවැ; නැසිය ඉටුමිතුරු සමගින්, ඥාතිජනයා හා ස්වකීය පරිවාරජනයා හා ඉෂ්ටමිත්‍රයන් සහිතවැ; වාසිය පවතු, වර්ෂශතයක් මුළුල්ලෙහි සැපසේ ජීවත්වා.

**'සැළලිහිණි (තෝ) පවතු' යනු ක්‍රි: කා: ප: සඃ**

**උ, වි—පවතු** යනු ආශිර්වාද ක්‍රියායි, **තෝ** යනු අධ්‍යාහෘත උක්තකර්තෘයි, **සැපතින්** යනු උපලක්ෂණයෙහි කරණයි, **පැමිණි** යනු කරණ විශෙෂණයි, **සිතුලෙස** යනු ක්‍රියා විශෙෂණයි, **වාසිය** යනු අසත්යෝගි කම්විබත්, **සමගින්** යනු සහාර්ථයෙහි නිපාතයි, **නැසිය ඉටුමිතුරු** යනු සමයොගයෙහි තෘතීයායි, **සැළලිහිණි** යනු ආමන්ත්‍රණයි, **සලසා** යනු පූර්වක්‍රියායි, **මේ සියලුම අදහස** යනු ඊට අනුක්තකර්මයි, **සියපත** යනු උපමාකර්ම විශෙෂණයි, **සේ**

යනු උපමාද්‍යෝතක නිපාතයි, උදසැ යනු කාලාර්ථයෙහි ආධාරයි, දිනමිණි යනු අනුයාතසම්බන්ධයි, කුලුණෙන් යනු හෙත්වර්ථයෙහි තෘතීයායි, ගිහිණි යනු ඊට විශෙෂණයි,

ස, වි—සිය ගණන් පත් ඇතියේ යමක්හටද හෙතෙමේ=සිය පත්, එය-සියපත; අන්අරුත් සමස්; දිනට මිණි එව්=දිනමිණි, විබත් සමස්; ඉටුවූයේද එම මිතුරු වූයේද=ඉටුමිතුරු,නැද සියද ඉටුමිතුරුද=නැසියඉටුමිතුරු, වෙසෙසුන්සමස් ගැබි ' දුරුත් සමස් —

### උපමාගර්භාශීරලඞ්කාරයි.

109 පැ රැ කු ම් රජුම පන්තිස් වනු නවම් ම ස
ම න ර ම් කැරැ බඳුතු මෙහසුන් තොවිල ස
අ යැ දු ම් ලෙසට සිදුකැරැ කිවිඳු අදහ ස
දෙ වි ර ම් මිතුරු දුන් ගැබ බිසොවම සක ස

110 ස ති ස් වනු නවමැ පුර අස්ලිස නක ත
ප හ ස් ලැබ සුපුන් සඳ තුබතුරු පැනෙ ත
ස හ ස් කර කුලට වැඩවන ලෙස සත ත
වෙ සෙ ස් රජකුමරු විලසින් දුකුම් ප ත

111 ක ද වු රු කුල මැඳුරු මිණි පහනෙව් සුසැ දි
නැ ණ ගු රු සබස සමයද දූනුමෙහි වොරැ දි
ර ජ ගු රු විජයබා පිරුවන් හිමි පැහැ දි
මෙ මි පු රු පදූනි සැලලිහිණිය අස්න යෙ දි

සි ධි ර ස්තු.